සැ. යු. - 2022.12.16 දින පළ වූ අංක 2311 ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොකරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,312 - 2022 දෙසැම්බර් මස 23 වැනි සිකුරාදා - 2022.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV(අ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව
තනතුරු- ඇබෑර්තු	—
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—
බඩුබාහිරාදිය විකිණීම්	—
පළාත් පාලන නිවේදන	5650
අතුරු ව්‍යවස්ථා	—
පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ..	—
ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	—
අයවැය ලේඛන	—
දේපළ විකිණීම්	—
විවිධ දැන්වීම්	5661

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 0 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ජනවාරි 11 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 දෙසැම්බර් මස 30 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්නාක් සේ සැලකිය යුතු ය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

5649- B 82394 — 5,403 (2022/10)

පළාත් පාලන නිවේදන

මීරිගම ප්‍රාදේශීය සභාව

පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් පනවන ලද අංක 1947/6 හා 2015.12.28 දින *විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ පහත සඳහන් සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීමටත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත් මීරිගම ප්‍රාදේශීය සභාවේ 2022.07.26 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී අංක 6.08 දරන යෝජනාව මගින් සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. සැරසිලි විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව
2. බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
3. පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදයක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදයක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
4. හෝටල් හා ලැඟුම්හල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
5. ආදහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
6. භෝජනශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
7. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
8. සභා බල ප්‍රදේශයන්හි මාර්ග වල වාහන පාලනය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව
9. සංචාරක වෙළඳාම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
10. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
11. ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
12. ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
13. සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
14. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

සරත් නන්දසිරි රණතුංග,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

2022 ක් වූ අගෝස්තු මස 30 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

12-574

ආණමඩුව ප්‍රාදේශීය සභාව

ආදහනාගාර ගාස්තු සංශෝධනය කිරීම

ආණමඩුව ප්‍රාදේශීය සභාව විසින් 2022 දෙසැම්බර් මස 08 වැනි දින පවත්වන ලද ආණමඩුව මහා සභා රැස්වීමේ දී යෝජනා අංක 17 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කර ඇති බව මෙයින් දන්වමි.

ආර්. එච්. එම්. ප්‍රියන්ත බණ්ඩාර රාජකරුණා,
සභාපති,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 08 වන දින,
ආණමඩුව ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

ආණමඩුව ප්‍රාදේශීය සභාව විසින් ආණමඩුව නිසල අරණ ආදහනාගාරයේ ගාස්තු අයකිරීම 2022.12.09 දින සිට පහත සඳහන් පරිදි අය කළ යුතු බවට යෝජනා කරන්නීය.

අනු. අංකය	*විස්තරය*	*ගෙවියයුතු ගාස්තුව රු.*
01	බල ප්‍රදේශය තුළ පදිංචිකරුවෙකුගේ එක් මෘත ශරීරයක් ආදහනය කිරීම සඳහා ආදහනාගාරය ලබා දීම	15,000 0
02	බල ප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවෙකුගේ එක් මෘත ශරීරයක් ආදහනය කිරීම සඳහා ආදහනාගාරය ලබා දීම	18,000 0

12-501

වරකාපොල ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය අනුව දියුණු ගම් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති උපලේඛන අංක 01 යටතේ සඳහන් කර ඇති ප්‍රදේශ සඳහා එහි සඳහන් වරිපනම් ප්‍රතිශත අය කිරීම සුදුසු බවට වූ යෝජනාව 2022.02.08 වන දින වරකාපොල ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීමේ දී තීරණ අංක 08 යටතේ සභා සම්මත වී ඇත. එම ප්‍රතිශයන් අනුව වරිපනම් අය කිරීම සඳහා 2022.10.07 වන දින සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් උපලේඛන අංක 01 යටතේ සඳහන් ප්‍රදේශයන් හි තක්සේරු කරන ලද දේපලවලින් 2023 වර්ෂයේ ජනවාරි මස සිට පහත පරිදි වරිපනම් බදු අය කරනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
වරකාපොළ ප්‍රාදේශීය සභාව.

වරිපනම් බදු - 2023 වර්ෂය

2023 වර්ෂය සඳහා පනවන ලද එකී වරිපනම්, 2023 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දීම සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවද වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2023 වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද එක් එක් කාර්තුවට අදාළ වරිපනම් බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට පෙරාතුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (05%) වට්ටමක්ද ද ගෙවනු ලැබේ.

උපලේඛනය

කාර්තුව	*ගෙවියයුතු දිනය*	*5%ක වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2023 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා	2023 ජනවාරි 31
දෙවන කාර්තුව	2023 අප්‍රේල් 01 සිට ජුනි 30 දක්වා	2023 අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2023 ජූලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා	2023 ජූලි 31
හතරවන කාර්තුව	2023 ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා	2023 ඔක්තෝබර් 31

උපලේඛන අංක 01

දියුණුගම් ප්‍රදේශ

• පිලාඩුව පන්සල පාර	වම/දකුණ	7%
• පිලාඩුව පන්සල පාර පළමු පටුමග	වම/දකුණ	7%
• පිලාඩුව පාර	වම/දකුණ	7%
වාරියගොඩ		
• නෙලුන්දෙණිය පාර	වම/දකුණ	6%
• වද්දෙනිය පාර	වම/දකුණ	6%
මෙනේරිපිටිය		
• මෙනේරිපිටිය පළමු පටුමග	වම/දකුණ	6%
• මෙනේරිපිටිය පන්සල පාර	වම/දකුණ	6%
• ඔත්නාපිටිය පාර	වම/දකුණ	6%
• ඔත්නාපිටිය උඩුකුඹුර පාර	වම/දකුණ	6%
තෝලංගමුව		
• නුවර පාර	වම/දකුණ	6%
• ඉඹුලෝවිට පාර	වම/දකුණ	6%
• පළමුපටුමග ඉඹුලෝවිට පාර	වම/දකුණ	6%
කඹුරාදෙණිය		
• කොළඹ පාර	වම/දකුණ	6%
• මාහේන පාර	වම/දකුණ	6%
• මාහේන පාර පළමු පටුමග	වම/දකුණ	6%
• මාහේන පාර දෙවන පටුමග	වම/දකුණ	6%
• කුඩාඔය අඹගල පාර	වම/දකුණ	9%
• කුඩාඔය අඹගල පාර පළමු පටුමග	වම/දකුණ	9%
• කුඩාඔය අඹගල පාර දෙවන පටුමග	වම/දකුණ	9%
• නව රෝහල පාර	වම/දකුණ	7%
• නව රෝහල පාර පළමු පටුමග	වම/දකුණ	7%
අල්ගම		
• නිට්ටඹුව පාර	වම/දකුණ	6%
• වරකාපොල පාර	වම/දකුණ	6%
• උඩුවක පාර	වම/දකුණ	6%
• මීරිගම පාර	වම/දකුණ	9%
පැණිහෙල		
• කොළඹ පාර	වම/දකුණ	6%

කුරුණෑගල ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරිය)
ගෝඝාතක බලපත්‍ර ලබාදීම සම්බන්ධ විරෝධතා කැඳවීම

කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මෙහි පහත උපලේඛනයේ සඳහන් එළුමස් කඩයක් පවත්වාගෙන යාම සඳහා 2023 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බැවින් ගෝඝාතක ආඥාපනතේ 7(2) වැනි උපවගන්තිය ප්‍රකාරව විරෝධතා කැඳවීමට 2022 වර්ෂයෙහි ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද කුරුණෑගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 17 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මෙම ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම පිළිබඳ කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එකී විරුද්ධ වීමට හේතු සඳහන් කර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත ඒ බව ලේඛනගත තැපෑලෙන් මා වෙත එවන මෙන් දන්වා සිටිනු ලැබේ.

ආර්. පී. අචල නිමන්ත වික්‍රමතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයෙහි ඔක්තෝබර් මස 18 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු ගෝඝාතක ආඥාපනතේ (272) අධිකාරියේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය ප්‍රකාරව මස්කඩ බලපත්‍රයක් අයදුම්කර ඇති පහත උපලේඛනයේ සඳහන් ස්ථාන සඳහා එකී බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ගෙන් අයෙක් විරුද්ධ වන්නේ නම් ඒ සඳහා දින 14 ක කාලයක් තුළ විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීමට මා විසින් තීරණය කරමි.

උපලේඛනය

01. මල්ලවපිටිය එළු මස් කඩය

12-496

කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

විනෝද බදු පැනවීම

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් පනවා අය කිරීමට 1946 අංක 12 විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව විසින් 2021 ජූලි මස 08 වැනි දින මහ සභා තීරණ අංක 05.01 යටතේ සම්මත කර ඇති යෝජනාව, වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී අති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට්,
වසන්ත කරන්නාගොඩ,
වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර.

2022 දෙසැම්බර් මස 06 වැනි දින.
කොබෙයිගනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව කොබෙයිගනේ සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුලුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් සියයට දහයක (10%) ට සමාන බද්දක් පනවා අයකළ යුතු යැයි ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වන වගන්තියේ විධිවිධාන අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ *ගැසට් පත්‍රයේ* පළ කිරීමටත්, පෙර කී ගැසට් පත්‍රය පළ කරන මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ පළමුවැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යැයිද මහ සභාව යෝජනා කරන්නීය."

12-462

මාතර මහා නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවට බලපත්‍ර දීමේ පනත

මෙකී පහත උපලේඛනයේ සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයේ පැවැත්වීම සඳහා 2023 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම සඳහා මා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලා වලට බලපත්‍ර දීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලාව අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල හෝ පදිංචි යම් තැනැත්තකු එම ක්‍රීඩා සමාජශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන්නේ නම් එම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 04 ක් ඇතුළත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දනුම් දෙනු ලැබේ.

ඩී. ජී. යසරත්න,
පුරපති,
මහා නගර සභාව,
මාතර.

2022 නොවැම්බර් මස 13 වැනි දින,
මහා නගර සභාව,
මාතර.
(උපලේඛනය පහත දක්වේ.)

උපලේඛනය

අයදුම්කරුගේ නම	*සමාජශාලාවේ ලේකම් සභාපති/කළමනාකරු*	*සමාජ ශාලාවේ නම*	*සමාජශාලාවේ කටයුතු කරගෙන යන ස්ථාන*
සුනිල් මොහොට්ටි	ලේකම්	මාතර ක්‍රීඩා සමාජය	උයන්වත්ත ක්‍රීඩාංගනය, මාතර

12-533

කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත 272 වන අධිකාරිය යටතේ කරන දැනුම් දීමයි

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම සඳහන් වන අය විසින් ඔහුගේ නමට ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානයෙහි ඌරු මස් අලෙවි සැලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම්පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතුව

ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බවත් ගෝ ඝාතක ආඥාපනතේ 272 වන අධිකාරයේ අංක 7(2) වන වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය	*ස්වභාවය*	*ඉදිකරන ස්ථානය*
ඩබ්. ඒ. ප්‍රියංකර කුරේරා, කබලෑව, දීගල්ල	ඌරු මස් අලෙවි සැල	අංක 21853 සහ 2020.10.06 දිනැති ඔප්පුවේ සඳහන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොළ හත්පත්තුවේ යටිකහ උතුරු කෝරලයේ කරන්තිප්පල පිහිටි බොරලුවලගාවහේන ඉඩම.

ආර්. ඩී. කල්‍යානී අමරජීව,
ලේකම්,

2022 දෙසැම්බර් මස 12 වැනි දින දී ය,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව,
කුලියාපිටිය.

12-471

පලාගල ප්‍රාදේශීය සභාව

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව පලාගල ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින සභා රැස්වීමේ දී තීරණ අංක 198/2019 යටතේ සභා සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් වෙත ලැබී ඇති බලතල යටතේ අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් එල්. එච්. වී. ඉරෝෂණී වන ම විසින් අනුමැතිය දෙනු ලැබ ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. වී. ඉරෝෂණී,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්,
අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කය.

2022 නොවැම්බර් මස 28 වැනි දින,
අනුරාධපුර පළාත් පාලන කාර්යාලයේ දී ය

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත උපලේඛනයේ විස්තර කෙරෙන ප්‍රදේශ, දියුණු කළ ප්‍රදේශ වශයෙන් පිළිගත යුතු බවත්,

එම පිළිගැනීමේ යෝජනා සම්මුතියට අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියාකළ යුතු බවටත්, පලාගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

පුබ්බෝගම

උතුරට	-	බී. එම්. රියාස් මහතාගේ ව්‍යාපාරය
නැගෙනහිරට	-	පුබ්බෝගම උපතැපැල් කාර්යාලය
දකුණට	-	පුබ්බෝගම මහජන ක්‍රීඩාංගනය



බළළුවැව

උතුරට	-	පී. එම්. ජින්නා මයාගේ නිවස
නැගෙනහිරට	-	අබ්දුල් කපූර්ගේ මහතාගේ ඉඩම
දකුණට	-	යූ. චන්ද්‍රිකා සිල්වා මහත්මියගේ නිවස
බස්නාහිරට	-	ලක්මාල් කුමාරසිංහ මහතාගේ ව්‍යාපාරය



කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත 272 වන අධිකරය යටතේ කරන දැනුම් දීමයි

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම සඳහන් වන අය විසින් ඔහුගේ නමට ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානයෙ හි ඌරු මස් ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම්පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතුව ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(අ) කොසේ පළ වූ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බවත් ගෝ ඝාතක ආඥාපනතේ 272 වන අධිකාරියේ අංක 7(2) වන වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය	*ස්වභාවය*	*ඉදිකරන ස්ථානය*
ඩබ්. එන්. ක්‍රිෂාන්ත ප්‍රනාන්දු, කබලෑව, දිගල්ල හත්පත්තුවේ	ඌරු මස් ඝාතකාගාරය	අංක 25157 සහ 2001/04/10 දිනැති ඔප්පුවේ සඳහන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල කටුගම්පොල උතුරු කෝරළයේ කබලෑව පිහිටි තල්ගස්කටුවෙහේන් යාය ඉඩම

ආර්. ඩී. කල්‍යානී අමරජීව,
ලේකම්.

කුලියාපිටිය ප්‍රාදේශීය සභාව,
කුලියාපිටිය.
2022 දෙසැම්බර් මස 12 වැනි දින දීය.

12-472

කරෙයිනගර් ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 134 සහ 146 වන වගන්ති යටතේ කරෙයිනගර් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2022.10.12 දින අංක 739 සහ තීරණ මගින් ලබා ඇති තීරණය මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගනේෂපිල්ලයි බාලචන්ද්‍රන්,
කරෙයිනගර් ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 15 වැනි දින,
කරෙයිනගර් ප්‍රාදේශීය සභාව,
කරෙයිනගර්.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අංක 146 වන වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ කරෙයිනගර් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර ව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019.07.19 දිනැති *ගැසට්* පත්‍රයේ දැන්වීමට අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති නිවාස ගොඩනැගිලි ඉඩම් සහ කුඩා නිවාස යනාදී දේපළවල වාර්ෂික වටිනාකම මත 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු නිවැරදි කර සකස් කළ යුතු බවත් එම ඇස්තමේන්තුව පදනම් කරගෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 134/01 උපවගන්තිය මගින් හිමිකර දී ඇති බලතල ප්‍රකාරව එම දේපළ මත ඉහතින් දක්වා ඇති ඇස්තමේන්තු මත වූ වාර්ෂික වටිනාකම මත බද්දක් අයකර ගත යුතු වේ.

1. කාරෙයිනගර් උතුර ප්‍රාදේශීය කාර්යාලය - 6%
2. කාරෙයිනගර් දකුණ ප්‍රාදේශීය කාර්යාලය - 6%

තවද, 2023 වර්ෂයේ පහත උපලේඛනයේ දක්වා ඇති එක් එක් කාර්තුවකට අදාළව සඳහන් කර ඇති දිනට පෙර වාර්ෂික ඇස්තමේන්තු බද්දක් කාරයිනගර් ප්‍රාදේශීය සභාවේ අරමුදලට ගෙවිය යුතු බවත් එසේ එම වර්ෂය සඳහා වන වාර්ෂික බදු ප්‍රතිශතය 2023 වර්ෂයේ ජනවාරි මස 31 දිනට හෝ ඊට ප්‍රථම ගෙවා ඇත්නම් වාර්ෂික බදු ප්‍රතිශත මුදලින් 10% ක වට්ටමක්ද එසේ උපලේඛනයේ දක්වා ඇති එක් එක් කාර්තු ඉදිරියේ දී තුන්වන තීරයේ සඳහන් කර ඇති දිනට පෙර යෝග්‍ය බදු ප්‍රමාණය කරෙයිනගර් ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවන්නේ නම් එක් කාර්තුවකට අදාළ වන මුදලින් 5% වට්ටමක් ද කරෙයිනගර් ප්‍රාදේශීය සභාවෙන් ලබාදිය යුතු බවත්, 2023 වර්ෂය සඳහා වන වාර්ෂික බද්ද අදාළ වර්ෂයේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඉදිරි වර්ෂවල දී පදිංචි දේපළ මත 15% බදු ප්‍රතිශතයක් ද ව්‍යාපාරික දේපළ මත 20% ප්‍රතිශතයක් ද දඩ මුදලක් ලෙස අයකර ගත යුතු බව මෙයින් සභාව ඒකමතිකව තීරණය කරනු ලැබේ.

උපලේඛනය

1 තීරය	*2 තීරය* *ගෙවිය යුතු දිනය*	*3 තීරය* *5%ක වට්ටමක් හිමිවන අවසන් දිනය*
පළමු කාර්තුව	2023.03.31	2023.01.31
දෙවන කාර්තුව	2023.06.30	2023.04.30
තුන්වන කාර්තුව	2023.09.30	2023.07.31
සිව්වන කාර්තුව	2023.12.31	2023.10.31

12-578

හක්මණ ප්‍රාදේශීය සභාව

අන්තරාදායක හා අප්‍රසන්න වෙළඳාම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ උපලේඛනය සඳහා ව්‍යාපාර කර්මාන්ත ඇතුලත් කිරීම

හක්මණ ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 06:04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වී. පී. කේ. අනුරාධ ප්‍රේමරත්න,
සභාපති,
හක්මණ ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 18 වැනි දින.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලදුව අංක 520/7 හා 1988.08.23 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද, 1989 අංක 12 දරන පළාත් පාලන (අනුශාංගික විධිවිධාන) පනතේ බලතල අනුව දකුණු පළාත් සභාව විසින් පිළිගත් බවට අංක 648 හා 1991.02.01 දින ගැසට් පත්‍රය මගින් නිවේදනය කරන ලද්දා වූ හා හක්මණ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන අංක 1769 හා 2012.07.27 දින ගැසට් පත්‍රයේ නිවේදනය කරමින් ප්‍රකාශයට පත් කළ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය 2022.12.31 දිනෙන් අවලංගු කිරීමටත් 2022.01.01 දින සිට පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපාර කර්මාන්ත ඇතුළත් කර ප්‍රකාශයට පත් කිරීමටත් යෝජනා කරමි.

උපලේඛනය

01. වී මෝලක් පවත්වාගෙන යාම
02. මස් පිණිස එළුවන්, ඌරන් ආදී සත්ත්ව ගොවිපළක් හෝ කොටුවක් පවත්වාගෙන යාම
03. සුරතල් සතුන් පක්ෂීන් හෝ මසුන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
04. පොල් තෙල් මෝලක්/පොල් තෙල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
05. පරණ පුවත්පත්, යකඩ, බෝතල්, ප්ලාස්ටික් රැස්කරන ස්ථානයක් පවත්වාගෙන යාම

06. මෝටර් රථ ගරාජයක් පවත්වාගෙන යාම
07. මෝටර් රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
08. යතුරුපැදි හා ත්‍රීරෝද රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
09. කෘෂි රසායන ද්‍රව්‍ය/රසායනික පොහොර තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
10. කිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම
11. වැල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම
12. එළවළු, පලතුරු අලෙවිසැලක් හෝ මැස්සක් පවත්වාගෙන යාම
13. ගිණිපෙට්ටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14. වීදුරු කපා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15. මස් හෝ බිත්තර පිණිස කුකුල් කොටුවක් පවත්වාගෙන යාම
16. කුරුඳු සකස් කර ගෙන්දගම් දුම් ගැස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
17. රතිඤ්ඤා නිපදවන හෝ ගබඩා කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18. මිනී පෙට්ටි නිපදවීම හා ගබඩා කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19. රස කැවිලි හෝ බයිට් වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

12-594

මීරිගම ප්‍රාදේශීය සභාව

පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් පනවන ලද අංක 1947/6 හා 2015.12.28 දින අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දවූ පහත සඳහන් සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීමටත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත් මීරිගම ප්‍රාදේශීය සභාවේ 2022.07.26 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී අංක 6.08 දරන යෝජනාව මගින් සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. සැරසිලි විධිමත් කිරීම සඳහාවන අතුරු ව්‍යවස්ථාව
2. බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
3. පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදයක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදයක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
4. හෝටල් හා ලැගුම්හල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
5. ආදහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
6. භෝජන ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
7. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
8. සභා බල ප්‍රදේශයන්හි මාර්ගවල වාහන පාලනය කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව
9. සංචාරක වෙළඳාම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
10. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
11. ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
12. ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
13. සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
14. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

සරත් නන්දසිරි රණතුංග,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

2022 ක් වූ අගෝස්තු මස 30 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

12-474

වඩමාරච්චි දකුණ බටහිර ප්‍රාදේශීය සභාව - කරවෙඩ්ඩි

1975 අංක 17 දරන සමාජ ශාලා සඳහා බලපත්‍ර ලබා දීම පනත සහ 1987 අංක 38 දරන පනතේ සංශෝධනය

පහත උපලේඛනයේ නම සඳහන් අය ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති සමාජ ශාලාව 2022 වර්ෂයේ පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබාදෙන ලෙස පනතේ 06 වැනි වගන්තියට අනුව දැනුම් දෙනු ලබේ.

මෙම බලපත්‍ර ලබා ගැනීමට යෝජනා කර ඇති සමාජශාලාව පවත්වාගෙන යාමට තීරණය කර ඇති ඉඩම අසල පදිංචිකරුවන් කිසිවෙක් මේ සම්බන්ධයෙන් විරෝධතා පළ කරන්නේ නම් ගැසට් නිවේදනය පළ කර ඇති දින සිට සති හතරක් ඉක්ම යාමට පෙර ලිඛිත පිටපත් දෙකකින් මා වෙත එවිය යුතු බව දන්වමි.

උපලේඛනය

අයදුම්කරුගේ නම හා ලිපිනය	*සමාජශාලාවේ සභාපති ද, ලේකම් ද, කළමනාකරු ද යන වග*	*සමාජශාලාවේ නම*	*සමාජශාලාව පවත්වාගෙන යාමට අදහස් කර ඇති ස්ථානය*
එයාතුරෙයි විග්නේෂ්වරන් එංකරාපදි නේවරයාල් නෙල්ලියම්	කළමනාකරු	එංකරන් විනෝදාංශ සමාජය	ප්‍රධාන වීදිය, නෙල්ලියඩි, කරවෙඩ්ඩි

ත. එංකරන්,
සභාපති,
වඩමාරච්චි දකුණ බටහිර ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 15 වැනි දින.

12-597

විවිධ දැන්වීම්

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මඳුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 07 වැනි දින පවත්වන ලද මඳුරාවල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද 2023 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2023 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර, ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මඳුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන් ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත 2023 වර්ෂය සඳහා රුපියල් දහය (10) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළයුතු යැයි යෝජනා කරමි.

12 - 487/1

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මඳුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 07 වැනි දින පවත්වන ලද මඳුරාවල ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් 2023 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2023 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර, ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම්, ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මඳුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2023 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා 2022 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වරිපනම් බද්දක් පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

12 - 487/2

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ මඳුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 07 වැනි දින පවත්වන ලද මඳුරාවල ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, මදුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

	I තීරුව *කර්මාන්තයේ ස්වභාවය*	*II තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම* *අවස්ථාවක ගෙවිය යුතු වාර්ෂික බද්දේ ප්‍රමාණය රුපියල්*		
		රු. 750 ට නොවැඩි	*රු. 751 ඉක්මවන රු. 1,500 ට අඩු*	*රු. 1,501ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
02.	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
03.	කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	තේ කොල, කුළු බඩු, බෙහෙත් බඩු වර්ග, පහන් තිර පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
05.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	අවමංගල්‍ය භාණ්ඩ නිෂ්පාදනය පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	හඳුන්කුරු නිෂ්පාදනය පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	පොලිතින් නිෂ්පාදනය ආශ්‍රිතව භාණ්ඩ නිපදවීම පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	කුෂන් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	මෙට්ට නිෂ්පාදනය පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	පින්තූර රාමු කිරීම පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	රබර් මුද්‍රා,අංක තහඩු හෝ නාම පුවරු නිෂ්පාදනය පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14	ලී බීරළු හා කැටයම් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	සපත්තු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	පපඩම් සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	උළු ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	බීඩි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ගමන් මළු, ජර්කින්, වැහිකබා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	ත්‍රී රෝද රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	රබර් මැෂිම දුම්ගෙය පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	වීදුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	කුළු බඩු වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	බිම් මල් නිෂ්පාදනය පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	ඇඟළුම් ආම්පන්න නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	කුළියට ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ මඳුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 07 වැනි දින පවත්වන ලද මඳුරාවල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

6.1.4 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මඳුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් මඳුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

I තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ*	*II තීරුව* *ගෙවිය යුතු බද්ද* *ව්‍යාපාරයේ ලත් ලැබීම් ප්‍රමාණය* *රු. ශත*
01. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
02. රු. 6,001 ඉක්මවන නමුත් 12,000 නොඉක්මවන විට	90.00
03. රු. 12,001 ඉක්මවන නමුත් 18,750 නොඉක්මවන විට	180.00
04. රු. 18,751 ඉක්මවන නමුත් 75,000 නොඉක්මවන විට	360,00
05. රු. 75,001 ඉක්මවන නමුත් 1,50,000 නොඉක්මවන විට	1,200.00
06. රු.1,50,001 ඉක්මවන විට	3,000.00

12 - 487/4

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ මඳුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 07 වැනි දින පවත්වන ලද මඳුරාවල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනත යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2015 සැප්තැම්බර් 22 වන දින බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කරන ලද 2015.12.28 දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සහ හෝටල් හා ලැගුම් හල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යන අතුරු ව්‍යවස්ථාවන්හි විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2023 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2022 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2023 වර්ෂය සඳහා නියම විය යුතු බව ද යෝජනා කරමි.

I තීරුව	*II තීරුව*		
කර්මාන්තයේ ස්වභාවය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 ට නොවැඩි	*රු. 751 ඉක්මවන රු.1500 ට අඩු*	*රු. 1501ට වැඩි*
	අවස්ථාවක ගෙවිය යුතු වාර්ෂික ගාස්තුවේ ප්‍රමාණය රුපියල්		
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
පීඩාකාරී ව්‍යාපාර ඨ			
1. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.	500 0	750 0	1,000 0
2. සම් පදම් කිරීම.	500 0	750 0	1,000 0
3. සම් විකිණීම	500 0	750 0	1,000 0
4. සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
5. ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7. විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
8. කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
9. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
10. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11. සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12. පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
13. සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14. සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
15. අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම.	500 0	750 0	1,000 0
16. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
17. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
18. වේවැල් භාණ්ඩ නිදවීම	500 0	750 0	1,000 0
19. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20. සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
21. රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
22. පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0

I තීරුව	*II තීරුව*		
කර්මාන්තයේ ස්වභාවය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 ට නොවැඩි	*රු. 751 ඉක්මවන රු.1500 ට අඩු*	*රු. 1501ට වැඩි*
	අවස්ථාවක ගෙවිය යුතු වාර්ෂික ගාස්තුවේ ප්‍රමාණය රුපියල්		
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
23. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
24. දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
25. රා එකතු කිරීම	500 0	750 0	1,000 0
26. විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
27. යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
28. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
29. සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
30. සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
31. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
32. මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංෂභෝග, කුළුබඩු හෝ කිරි පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
33. ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
34. කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
35. අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
36. රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
37. ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
38. සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
39. පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
40. ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
41. ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
42. ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
43. සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගඩබාකර තබාගැනීම.	500 0	750 0	1,000 0
44. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
45. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
46. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
47. පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
48. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම	500 0	750 0	1,000 0
49. ධාන්‍ය හෝ මාංෂභෝග කිලෝ ග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගඩබාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
1. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණක් ගබඩාකර තබාගැනීම.	500 0	750 0	1,000 0
2. මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
3. මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4. කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු ගාලක් හෝ කුකුළු කොටුවක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
5. එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
6. ගඩොල් හෝ උළු ගබඩාකර තබාගැනීම.	500 0	750 0	1,000 0
7. දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8. කළු ගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0

	I තීරුව	*II තීරුව*		
	කර්මාන්තයේ ස්වභාවය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 ට නොවැඩි	*රු. 751 ඉක්මවන රු.1500 ට අඩු*	*රු. 1501ට වැඩි*
		අවස්ථාවක ගෙවිය යුතු වාර්ෂික ගාස්තුවේ ප්‍රමාණය රුපියල්		
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
9.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
10.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
12.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
13.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
14.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
15.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම.	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
17.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	500 0	750 0	1,000 0
18.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබාගැනීම.	500 0	750 0	1,000 0
19.	පා පැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
21.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
22.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩාකිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0
23.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
24.	ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
25.	දැව ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
	පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර ඨ			
1.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම	500 0	750 0	1,000 0
2.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
3.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
4.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩාකිරීම	500 0	750 0	1,000 0
6.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
9.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම.	500 0	750 0	1,000 0
13.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
15.	කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම.	500 0	750 0	1,000 0
16.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම.	500 0	750 0	1,000 0
17.	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පැවැත්වීම.	500 0	750 0	1,000 0

I තීරුව කර්මාන්තයේ ස්වභාවය	*II තීරුව* ස්ථානයේ වාර්ෂික වටිනාකම		
	රු. 750 ට නොවැඩි රු. ශත	*රු. 750 ඉක්මවන රු.1500 ට අඩු රු. ශත*	*රු. 1500ට වැඩි රු. ශත*
18. පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් බණිජතෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම.	500 0	750 0	1,000 0
19. කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම.	500 0	750 0	1,000 0
20. වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.	500 0	750 0	1,000 0
21. විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22. කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
වෙනත් ඵ			
01. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. හෝටලයක් හෝ ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03. මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04. සංචාරක වෙළෙඳාමක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05. මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06. අවමංගල්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08. භෝජන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 - 487/5

මදුරාවල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති ප්‍රකාර, 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 07 වැනි දින පවත්වන ලද මදුරාවල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මදුරාවල ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
මදුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මදුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මත ම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙ හි නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

01. (i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක් , මෝටර් ලොරියක් මෝටර් බයිසිකලයක් , කරත්තයක් , ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	රු.	25.00
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා		
	(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	රු	18.00
	(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	රු.	4.00
(iii)	සෑම කරත්තයක් සඳහා	රු.	20.00
(iv)	සෑම අත් කරත්තයක් සඳහා	රු.	10.00
(v)	සෑම රික්ෂෝවක් සඳහා	රු.	7.50
(vi)	සෑම අශ්වයෙකු , පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	රු.	15.00
(vii)	සෑම ඇතෙකු සඳහා	රු.	50.00

(2) විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ"

12 - 487/6

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තිය ප්‍රකාරව, පැවරී ඇති බලය යටතේ මඳුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂය තුළ විනෝද කටයුතු සිදු කරනු ලබන ස්ථානයකට ඇතුළු වීමට නිකුත් කරන ටිකට්පත්වල මුදල් වටිනාකමින් 20%ක විනෝද බද්දක් අයකළ යුතු ය.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

267 වැනි අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, මඳුරාවල ප්‍රාදේශීය සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයේ පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට විස්සක (20%) සමාන බද්දක් 2023 වර්ෂය වෙනුවෙන් පනවා අයකළ යුතු යැයි ද මෙම යෝජනා සම්මත *ගැසට් පත්‍රයේ* පළකරන ලද මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද යෝජනා කරමි.

එසේ වුව ද මෙම යෝජනා සම්මතය ක්‍රියාත්මක වන පළමු දෙවසර ඇතුළත චිත්‍රපටයක් නැරඹීමට ගෙවනු ලබන ගාස්තුවක් මත අයකළ යුතු බදු මුදල එසේ ගෙවන ලද ගාස්තුවෙන් 7.5%ක් විය යුතු ය.

12 - 487/7

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන් සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1989 අංක 15 දරන වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන් පිළිබඳ ආඥාපනතේ විධිවිධානවලට අනුව මඳුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙන්දේසිකරුවෙකු, බ්‍රෝකර්කරුවෙකු වශයෙන් කටයුතු කරයි නම් පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි ගාස්තු ගෙවා

බලපත්‍රයක් 2023.01.01 දින සිට ලබා ගත යුතු යැයි 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 07 වැනි දින පවත්වන ලද මඳුරාවල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණය කර ඇති බැව් මෙයින් නිවේදනය කරමි.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 15 දරන වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන් පිළිබඳ ආඥාපනතේ විධිවිධානවලට අනුව මඳුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙන්දේසිකරුවෙකු, බ්‍රෝකර්කරුවෙකු වශයෙන් කටයුතු කරයි නම් පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි ගාස්තු ගෙවා බලපත්‍රයක් 2023.01.01 වැනි දින සිට ලබා ගත යුතු යැයි යෝජනා කරමි.

		රු. ශත
වෙන්දේසිකරුවෙකු හා බ්‍රෝකර්වරයෙකු	-	60.00
වෙන්දේසිකරුවෙකු	-	50.00
බ්‍රෝකර්වරයෙකු	-	50.00

12 - 487/8

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ඛනිජ තෙල් ආඥාපනත යටතේ වූ බලපත්‍ර සඳහා ගාස්තු පැනවීම

1978 ඛනිජ තෙල් (භූමිතෙල් හා සුපර් පෙට්‍රල්) ගබඩා කිරීමේ බලපත්‍ර ලබා දීම සඳහා අමාත්‍යවරයා විසින් සාදා ඇති 1973 ඛනිජතෙල් සේවා ස්ථාන රීති මාලාවේ 0.9 රීතිය ප්‍රකාරව පහත උපලේඛනයේ දැක්වෙන පරිදි ගාස්තුවක් 2023.01.01 දින සිට පනවා අය කිරීමට 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 07 වැනි දින පවත්වන ලද මඳුරාවල ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 5.1.9 දරන සභා සම්මුතිය මගින් තීරණය කර ඇති බැව් මෙයින් නිවේදනය කරමි.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1978 ඛනිජ තෙල් (භූමි තෙල් හා සුපර් පෙට්‍රල්) ගබඩා කිරීමේ බලපත්‍ර ගාස්තු වශයෙන් අමාත්‍යවරයා විසින් සාදා ඇති 1973 ඛනිජ තෙල් සේවා ස්ථාන රීති මාලාවේ 09 වන රීතිය ප්‍රකාරව පහත දැක්වෙන පරිදි ගාස්තුවක් 2023.01.01 දින සිට පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

	එක් අවස්ථාවක දී ළඟ තබාගන්නා ප්‍රමාණය	*ගාස්තුව (රු.)*
අ.	ගැලුම් 180 නොඉක්මවන විට	5.00
ආ.	ගැලුම් 181 ඉක්මවන එහෙත් 500 නොඉක්මවන විට	10.00
ඇ.	ගැලුම් 501 ඉක්මවන එහෙත් 2,000 නොඉක්මවන විට	30.00
ඈ.	ගැලුම් 2,001 ඉක්මවන විට	
	01. ප්‍රථම ගැලුම් 2,000 සඳහා	30.00
	02. එක් එක් අතිරේක ගැලුම් 2,000 ප්‍රමාණයක් හෝ එහි කොටසකට	30.00

12 - 487/9

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් පිළිබඳ නිවේදනය

2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කරන ලද 2015.12.28 දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මඳුරාවල ප්‍රාදේශීය සභා සීමාව තුළ කිනම් ආකාරයකට හෝ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2023.01.01 වැනි දින සිට පනවා අය කිරීමට 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 07 වැනි දින පවත්වන ලද මඳුරාවල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ අංක 6.1.10 දරන සභා සම්මුතිය මගින් තීරණය කර ඇති බැව් මෙයින් නිවේදනය කරමි.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු හා එම පනතේ 126 වැනි වගන්තිය සමග කියවිය යුතු හා එම පනතේ 122(1) වගන්තියෙන් මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනත යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2015.09.22 දින බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කරන ලද 2015.12.28 දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මඳුරාවල ප්‍රාදේශීය සභා සීමාව තුළ කිනම් ආකාරයකට හෝ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2023 වර්ෂයට පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

අනු අංකය	*ප්‍රවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරණය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250	350	500
		3 ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		

අනු අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදාකරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750	850	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		

12 - 487/10

මඳුරාවල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සේවා සැපයීමේ දී අය කරනු ලබන ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මඳුරාවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව පොදු උපයෝගීතා සේවා, සුභ සාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේදී අවශ්‍ය කරන සේවා සැපයීමේ දී අය කරනු ලබන ගාස්තු පිළිබඳව 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 07 වැනි දින පවත්වන ලද මඳුරාවල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ඩී. පුෂ්පජිත් සීලවික්‍රම,
සභාපති,
මඳුරාවල ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
මඳුරාවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

6.1.11 2023.01.01 දින සිට පහත දක්වා ඇති සේවා සැපයුම් සඳහා ඉදිරියෙන් දක්වා ඇති ගාස්තු පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

මඳුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ද නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් බවට පත් කර ඇති බැවින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රය අති විශෙෂ 2235/54 - 2021.07.08 අනුව සියලුම ගාස්තු අය කරනු ලැබේ.

		රු. ශත
01. ආදහනාගාරය වෙන් කිරීමේ ගාස්තුව	ප්‍රාදේශීය සභා සීමාව තුළ	12,000.00
	ප්‍රාදේශීය සභා සීමාවෙන් පිටත	13,000.00
02. නව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත්‍ර ගාස්තු		100.00
03. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු		50.00
04. වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික අයදුම්පත් ගාස්තු		100.00
පෙරසැරි ගාස්තු		150 0
05. ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු		500 0
06. ඉඩම් අනු බෙදුම් අයදුම්පත් ගාස්තු		1,000 0

		රු. ශත
07.	තනිබ්ම් කට්ටි අයදුම්පත් ගාස්තු	500 0
08.	පාරිසරික ආරක්ෂණ පෙරසැරි ගාස්තු :	

ආයෝජන මුදල	ගාස්තුව රු. ශත
2,50,000 හෝ ඊට අඩු	3,000 0
2,50,000 - 5,00,000	3,750 0
5,00,001 - 10,00,000	5,000 0
10,00,000 ට වැඩි	10,000 0

09.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු		1,000.00
10.	අනතුරුදායක ගස් කැපීමේ ඉල්ලුම් පත්‍ර ගාස්තු		1,000.00
11.	ඔප්පු උධෘත ආකෘති පත්‍ර ගාස්තු		50.00
12.	පාරිසරික බලපත්‍ර ගාස්තු		4,500.00
13.	පුස්තකාල සාමාජික ගාස්තුව	ළමා	50.00
		වැඩිහිටි	100.00
14.	පුස්තකාල සාමාජිකත්ව අළුත් කිරීමේ ගාස්තුව	ළමා	25.00
		වැඩිහිටි	50.00
15.	බැකෝ යන්ත්‍රය මීටර් පැය 01 ක් සඳහා බැකෝ යන්ත්‍රය රැගෙන යාමේදී රු. 1,000.00 ක මුදල් තැන්පතු ලෙස තැබිය යුතුය.		5,750.00
16.	මාර්ග තලනය එක් දිනක් සඳහා (පැය 08 ක්)		10,000.00
17.	කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය එක් දිනක් සඳහා (පැය 08 ක්)		15,000.00
18.	වතුර මෝටරය (එක් ළිඳක් සඳහා)		1,000.00
19.	ට්‍රේලරය සමග ට්‍රැක්ටරය		
	මීටර් පැය 08 ක් සඳහා		8,000.00
	මීටර් පැය 04 ක් සඳහා		4,000.00
20.	ජල බවුසරය (පැය 08ක් සඳහා)		8,000.00
21.	ටිපර් රථය කියුබ් 3ට වැඩි පැය 8ක් සඳහා (වැඩිවන 1 km සඳහා රු. 210.00)		20,250 0
22.	කෘෘ කැබ් රථය (පළමු 5*km* සඳහා) (වැඩිවන 1 km සඳහා රු. 200.00)		2,500 0
23.	ශ්‍රවණාගාරය කුළියට ලබා දීම සඳහා		
	මදුරාවල ශ්‍රවනාගාරය (පැය 8ක් සඳහා)		5,000 0
	මදුරාවල ශ්‍රවනාගාරය (පැය 4ක් සඳහා)		3,000 0
	නාර්තුපාන ශ්‍රවණාගාරය (පැය 8ක් සඳහා)		3,000 0
	නාර්තුපාන ශ්‍රවණාගාරය (පැය 4ක් සඳහා)		2,000 0
24.	නෙස්කැෆේ යන්ත්‍රය සේවා ගාස්තුව (එක් අවස්ථාවක් සඳහා)		500.00
	නෙස්කැෆේ පිටි පැකට් එකක් සඳහා ගාස්තුව		2,350.00
25.	හිස් තාර බැරල් එකක් සඳහා		200 0
26.	හිස් කෝලාස් බැරල් එකක් සඳහා		500 0
27.	කොම්පෝස්ට් පොහොර 1kg සඳහා		15 0

කොළඹ මහා නගර සභාව

1979 අංක 42 සහ 1985 අංක 20 දරන මහා නගර සභා සංශෝධන පනත්වලින් සංශෝධිත මහා නගර සභා ආඥා පනතේ (252 වැනි අධිකාරය) 247 අ, 247 ආ, 247 ඇ සහ 247 ඉ යන වගන්ති යටතේ කොළඹ මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා පනවා ඇති බලපත්‍ර ගාස්තු සහ බදු අය කිරීම.

2022 දෙසැම්බර් මස 06 වැනි දින පවත්වන ලද කොළඹ මහා නගර සභාවේ අංක 3392 දරන සභා සම්මුතිය ප්‍රකාරව 2023 වර්ෂය සඳහා කොළඹ මහා නගර සභාව විසින් පනවා අය කිරීමට ඇති වෙළෙඳ බලපත්‍ර ගාස්තු කර්මාන්ත විෂයෙහි සහ/හෝ වෙළෙඳ ව්‍යාපාර විෂයෙහි බදු සහ ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අය කිරීම පිළිබඳව ගාස්තු චක්‍රයක් පහත දැක්වෙන උපලේඛනයෙහි (1), (2), (3), (4) අනුපිළිවෙලින් සියලු දෙනාගේ ම දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම ගාස්තු 2023.12.31 දක්වා බල පැවැත්වේ.

2023 වර්ෂය සඳහා ගෙවිය යුතු මෙම බලපත්‍ර ගාස්තු සහ බදු මුදල් 2023 මාර්තු මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බව මෙයින් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

රෝසි සේනානායක,
නගරාධිපතිනි,
කොළඹ මහා නගර සභාව.

2022 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹ මහා නගර සභාව,
පුරහල,
කොළඹ 07.

උපලේඛන අංක 01

247 "අ" වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තුව

(අ) බලපත්‍ර ගාස්තු චක්‍රය :

ස්ථානයේ වාර්ෂික වටිනාකම *රු.*	*බලපත්‍ර ගාස්තුව* *රු.*
1,500 0 නොඉක්මවන විට	2,000 0
1,501 0 ඉක්මවන නමුත් 2,500 0 නොඉක්මවන විට	3,000 0
2,501 0 ඉක්මවන විට	5,000 0

(ආ) ස්ථානය භාවිතා කරනු ලබන බලපත්‍රය ලබාගත යුතු කාර්යයන් සම්බන්ධ ලැයිස්තුව :

1. මිනිරන් සකස් කිරීම හා ශ්‍රේණි කිරීම.
2. මිනිරන් ගබඩා කිරීම.
3. පොහොර නිෂ්පාදනය
4. පොහොර ගබඩා කිරීම
5. හම් ගබඩා කිරීම/නිෂ්පාදනය කිරීම.
6. කිලෝග්‍රෑම් 250 ට වඩා උම්බලකඩ ගබඩා කිරීම.
7. කුකුළන් ඇති කිරීම.
8. කළුගල් හෝ කබොක් ගල් හැරීම.
9. බොරළු හැරීම.
10. හරකුන් හෝ අශ්වයන් සඳහා මඩුවක් හෝ ඉස්තාලයක් පැවැත්වීම.
11. සත්ත්ව රෝහලක් පැවැත්වීම.
12. රබර් සකස් කිරීම.
13. මයිකා ශුද්ධ කිරීම.

14. බැටළුවන් සහ/ හෝ එළුවන් 10 ක් හෝ වැඩි ගණනක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම.
15. උළු, කොන්ක්‍රීට්, පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
16. කරඳමුංගු/කෙඳි/කුරුඳු/ගෙන්දගම් දුම යොදා සකස් කිරීම.
17. සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1,250 ට වඩා ගබඩා කිරීම.
18. ඔට්ටපාලු ඇඹරීම හා වේලීම.
19. ට්‍රන්ක පෙට්ටි හෝ/සහ සූට්කේස් නිෂ්පාදනය කිරීම.
20. ඉන්ජෙක්ටර් පොම්ප සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. විෂබීජනාශක නිෂ්පාදනය කිරීම.
22. ටයර් නැවත පිරවීමේ හෝ කට්ටා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
23. කුරුඳු කිලෝ ග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම.
24. කොකෝවා කිලෝ ග්‍රෑම් 500 ට වඩා ගබඩා කිරීම.
25. ලී බඩු නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
26. මැණික් කැපීම සහ/හෝ දියමන්ති ඔප දැමීම. (මැණික් ව්‍යාපාරිකයන් විසින්)
27. බලයලත් වෙළෙඳුන් විසින් රබර් ගබඩා කිරීම.
28. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කිරීම.
29. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය සහ/හෝ ගබඩා කිරීම.
30. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන රෙදි මෝලක් පවත්වාගෙන යාම.
31. පිටි හෝ කුළුබඩු වර්ග ඇඹරීම.
32. වාණිජමය කටයුතු සඳහා සත්ත්ව ආහාර පිණිස කිලෝග්‍රෑම් 1000 කට වඩා ධාන්‍ය ගබඩා කිරීම (සමූපකාර ගබඩාවන් හැර)
33. රබර් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
34. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කිරීම.
35. යන්ත්‍ර මගින් ඇටකටු ඇඹරීම.
36. පොලිතින්, සැලෝලයිට් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
37. ලීටර් 25 ට වඩා සහ/හෝ කිලෝ ග්‍රෑම් 20 ට වඩා අම්ල වර්ග (ඇසිඩ්) සහ/හෝ රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම.
38. පාවහන්/පාවහන් කොටස් සහ/හෝ බූට්ස් නිෂ්පාදනය කිරීම.
39. ඉටිපන්දම් නිෂ්පාදනය කිරීම.
40. වාෂ්ප බලයෙන්, ජල බලයෙන්, විදුලි බලයෙන් හෝ යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.
41. සිසිල් බීම/ පළතුරු බීම/ සෝස් වර්ග නිෂ්පාදනය කිරීම.
42. කොප්පරා ගබඩාවක් තබා ගැනීම.
43. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය කිරීම.
44. යන්ත්‍රානුසාරයෙන් තලතෙල් නිෂ්පාදනය කිරීම.
45. තෙල් සිඳීම පිණිස සෙක්කුවක් හෝ අතින් ක්‍රියා කරවන මෝලක් පැවැත්වීම.
46. රෙදි වර්ග නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.
47. ගිනිපෙට්ටි නිෂ්පාදනය කිරීම.
48. පුළුන් ගබඩා කිරීම.
49. ලීටර් 225 කට වඩා පොල්තෙල් ගබඩා කිරීම.
50. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කිරීම.
51. ඇසිටිලින් සහ/හෝ ඔක්සිජන් නිෂ්පාදනය කිරීම.
52. උළු 500 ට වඩා ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
53. ගඩොල් 250 ට වඩා ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
54. කබොක් ගල් 250 ට වඩා ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
55. සිගරට් නිෂ්පාදනය කිරීම.
56. බීඩි සහ/හෝ සුරුට්ටු නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
57. කිලෝග්‍රෑම් 250 ට වඩා ලී පෙට්ටි ගබඩා කිරීම.
58. කොහු නිෂ්පාදනය.
59. රස කැවිලි නිෂ්පාදනය.
60. අඟුරු සහ/හෝ පොල්කටු අඟුරු කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම.
61. බෝට්ටු හෝ බත්තල් නිෂ්පාදනය කිරීම.
62. ලී පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

63. මෝටර් රථවාහන අලුත්වැඩියා කිරීම කරන ගරාජයක් හැර යකඩ සහ/හෝ වානේ වැඩපොලක් පවත්වාගෙන යාම.
64. මෝටර් රථවාහන අලුත්වැඩියා කිරීම/ කරන ගරාජයක් හැර ඔක්සිජන් වෑල්ඩිං සහ විදුලි වෑල්ඩිං පොලක් පවත්වාගෙන යාම.
65. මෝටර් රථවාහන අලුත්වැඩියා කරන ගරාජයක් පවත්වාගෙන යාම.
66. මෝටර් රථවාහන සේවා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
67. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම. (සේවකයින් 25 හෝ ඊට වැඩි)
68. පොල්තෙල් හැර වෙනත් ඕනෑම වර්ගයක තෙල් ලීටර් 50 ට වඩා ගබඩා කිරීම.
69. ගෙන්දගම් සහ/හෝ ගෙන්දගම් කුඩු කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම.
70. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය කිරීම.
71. පතරොම් 100 ට වඩා ගබඩා කිරීම.
72. කොහු/මෙට්ට/කොට්ට/කුෂන් වැනි දෑ නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.
73. අලුත් ටයර් හෝ ටියුබ් 50 කට වඩා ගබඩා කිරීම.
74. විසිරි පින්තාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
75. විදුලි බලයෙන් හැර යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
76. යන්ත්‍රානුසාරයෙන් ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
77. කමිස කරපටි සහ කමිස අත් සකස් කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
78. ගරාජයක් හැර යන්ත්‍රානුසාරයෙන් විද්‍යුත් ලෝහාලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
79. ගෑස්/ගල් අඟුරු ගෑස් නිපදවීම, ගබඩා කිරීම හෝ වෙළෙඳාම් කිරීම.
80. අම්ලකර වායු බල කම්හලක් පවත්වාගෙන යාම.
81. යපස් උණු කිරීම.
82. රතිඤ්ඤා ගබඩා කිරීම.
83. කිලෝග්‍රෑම් දෙකකට වඩා වෙඩි බෙහෙත් ගබඩා කිරීම.
84. මේද, ඉටි වර්ග, මැලියම් වර්ග ගබඩා කිරීම.
85. ගෙබිම පොලිෂ් නිෂ්පාදනය කිරීම.
86. තාර පිරිපහදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
87. ශීතකරණ සහ වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම, නැවත සකස් කිරීම, සහ පරීක්ෂා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
88. මෝටර් කාර් රථ එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
89. මෝටර් බයිසිකල් හෝ ස්කූටර් හෝ ත්‍රිරෝද රථ එකලස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
90. අතුනුබහන් හා සත්ත්ව තෙල් උණු කිරීම.
91. සබන් නිෂ්පාදනය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
92. තෙල් උණු කිරීමේ ස්ථානයක් පවත්වගෙන යාම.
93. රෙදි ඩයි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
94. සම් පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
95. දේශීය බෙහෙත් ද්‍රව්‍ය යොදා බීම වර්ග නිෂ්පාදනය කිරීම හා විකිණීම.
96. සව් නිෂ්පාදනය කිරීම.
97. වෙඩි බෙහෙත් නිෂ්පාදනය කිරීම.
98. ගිණිකෙළි නිෂ්පාදනය කිරීම.
99. පිදුරු ගබඩාවක් පවත්වාගෙන යාම.
100. ඇටකටු ගබඩාවක් පවත්වාගෙන යාම.
101. ගිනි ගන්නා සුළු තෙල් ගබඩා කිරීම පිණිස ගබඩාවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම.
102. පපඩම් නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.
103. හෝටලයක් පවත්වාගෙන යාම.
104. ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාම.
105. කිරි පට්ටියක් පවත්වාගෙන යාම.
106. ධාන්‍ය වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
107. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය කිරීම සහ/හෝ ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීම.
108. පුන්නක්කු කිලෝග්‍රෑම් 1000 ට වඩා ගබඩා කිරීම.
109. පුන්නක්කු හැර වෙනත් සත්ත්ව ආහාර කිලෝග්‍රෑම් 1000 ට වඩා ගබඩා කිරීම.

110. අතින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
111. පොහොර, මිනිරන්, අළුහුණු බහාලීම සඳහා පාවිච්චි කරන ලද ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
112. පුවක් ශුද්ධ කර දීම.
113. පොල්කටු අඟුරු කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම හෝ ඒ හා ආශ්‍රිත කර්මාන්තයක් පවත්වාගෙන යාම.
114. පරණ යකඩ ගබඩා කිරීම.
115. ග්ලූ හා ගම් වර්ග නිෂ්පාදනය සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
116. බැටරි නැවත පිරවීම හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
117. හිස් බෝතල් 100 ට වඩා ගබඩා කිරීම.
118. මිනී පෙට්ටි නිෂ්පාදනය සහ/හෝ ගබඩා කිරීම.
119. කපුරු නිෂ්පාදනය කිරීම.
120. පොහොර, හුණු, මිනිරන් බහාලීම සඳහා පාවිච්චි නොකරන ලද ගෝනි 100 ට වඩා ගබඩා කිරීම.
121. පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ් 100 ට වඩා ගබඩා කිරීම.
122. පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කිරීම.
123. අලුත් සහ/හෝ පරණ කඩදාසි කිලෝග්‍රෑම් 250 ට වඩා ගබඩා කිරීම.
124. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරනු නොලබන විද්‍යුත් අලේපනය, ක්‍රෝමියම් ආලේපනය, රන් ආලේපනය, රිදී ආලේපනය හෝ තඹ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
125. දර මඩුවක් පවත්වාගෙන යාම.
126. හකුරු නිෂ්පාදනය සහ/හෝ ගබඩා කිරීම.
127. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම. (සේවක සංඛ්‍යාව 25 ට අඩු)
128. බොම්බයි එෑණු කිලෝග්‍රෑම් 250 ට වඩා ගබඩා කිරීම.
129. අර්තාපල් කිලෝග්‍රෑම් 250 ට වඩා ගබඩා කිරීම.
130. කරවල කිලෝග්‍රෑම් 500 ට වඩා ගබඩා කිරීම.
131. ජාඩි කිලෝග්‍රෑම් 500 ට වඩා ගබඩා කිරීම.
132. ඇඳුම් ඩ්‍රයි ක්ලීන් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
133. කෝපි හෝ තේ පැන් ශාලාවක් පවත්වාගෙන යාම.
134. කෑම විකුණන ස්ථානයක් හා/හෝ බත් කඩයක් පවත්වාගෙන යාම. (හුදෙක්ම සාමාජිකයින් සඳහා පමණක්ම සුභ සාධක සංගම් මඟින් පවත්වන ආපන ශාලා බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් ය.)
135. නේවාසිකාගාරයක් පවත්වාගෙන යාම.
136. භෝජනාගාරයක් හා/හෝ ආපන ශාලාවක් පවත්වාගෙන යාම.
137. බේකරියක් පවත්වාගෙන යාම.
138. බාබර් සැප්පුවක් සහ/හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම. (සම්භාහන මධ්‍යස්ථාන හැර)
139. ලොන්ඩරියක් පවත්වාගෙන යාම.
140. හුණු ගබඩා කිරීම.
141. ටයර්, ටියුබ්, වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
142. බන්දිත ගුදම් පවත්වාගෙන යාම.
143. සීනි ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
144. තිරිඟු පිටි ගබඩා කිරීම සහ/ හෝ වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
145. ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
146. යන්ත්‍රානුසාරයෙන්, විදුලි බලයෙන් හෝ වාෂ්ප බලයෙන් ක්‍රියා කරන කුමන අන්දමක හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම සඳහා කාර්මික ආයතනයක් පවත්වාගෙන යාම.
147. මනුෂ්‍ය පරිභෝජනය සඳහා ගන්නා සියලුම ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හා ගබඩා කිරීම.
148. දේශීය හෝ බටහිර ඖෂධ නිෂ්පාදනය කිරීම.
149. අවමංගල ශාලාවක් පවත්වාගෙන යාම
150. මෘත ශරීර කල් තබා ගැනීමේ/සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (එම්බාම් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම)

(ඇ) (1) ලංකා සංචාරක මණ්ඩලයේ (වර්තමාන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ) ලියාපදිංචි කර ඇත්තා වූ හෝ එම මණ්ඩලය මගින් අනුමත කර ඇත්තා වූ හෝ හෝටල්වලින්, නවාතැන්පලවල්වලින් හෝ ආපනශාලාවලින් අදාළ හෝටලයේ, නවාතැන්පොළේ හෝ ආපනශාලාවේ පසුගිය වර්ෂයේ මුළු ලැබීම් වලින් සියයට දශම පහ (0.5%) බලපත්‍ර ගාස්තුවක් 2023 ජනවාරි මස 01 වැනි දින සිට පනවා අය කිරීමට.

උපලේඛන අංක 02

247 "(ආ)" වගන්තිය යටතෙහි ව්‍යාපාර හෝ කර්මාන්ත විෂයෙහි බදු

ස්ථානයේ වාර්ෂික වටිනාකම *රු.*	*වෙළඳ බදු ගාස්තුව* *රු.*
1,501 0 නොඉක්මවන විට	2,000 0
1,501 0 ඉක්මවන නමුත් 2,500 0 නොඉක්මවන විට	3,000 0
2,501 0 ඉක්මවන විට	5,000 0

(ආ) කර්මාන්ත ලැයිස්තුව :

1. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
2. කාර්යාල බඩු බාහිරාදිය ගබඩා කිරීම සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වගෙන යාම.
3. පාවිච්චි කළ සහ/හෝ අලුත් මෝටර් රථ ගෙන්වීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
4. අලුත් හෝ පාවිච්චි කරන ලද මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
5. ශීතකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
6. වීදුරු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
7. රූපවාහිනී යන්ත්‍ර ගෙන්වීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
8. බටහිර ඖෂධ වර්ග වෙළෙඳාම් කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
9. බලයලත් මත්පැන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
10. බිස්කට් සහ/හෝ ටින් කෑම වර්ග විකුණනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම.
11. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
12. රෙදිපිළි වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම.
13. භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14. බයිසිකල් විකිණීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
15. මෝටර් සයිකල් සහ/හෝ ස්කූටර් හා/හෝ ත්‍රීරෝද රථ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
16. චිනචිවට්ටි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
17. පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
18. වායු සමීකරණ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
19. මාළු අල්ලන දැල් නිෂ්පාදනය කිරීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
20. සබන් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. විවිධ භාණ්ඩ නැවිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
22. රෙදිපිළි මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
23. මැණික් සහ/හෝ දියමන්ති කැපීමේ හා පුහුණු කිරීමේ පාසලක් පවත්වාගෙන යාම.
24. ඉවතලන නූල් හෝ ජූට් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
25. ආහාර ද්‍රව්‍ය හෝ වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය අපනයනයට සහ/හෝ ආනයනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
26. ආරක්ෂක සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
27. කැසට් පටිගත කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
28. මහන මැෂින් ගෙන්වීම සහ/හෝ විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
29. පරිගණක යන්ත්‍ර ගෙන්වීම සහ/හෝ විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
30. චංචල හෝ නිශ්චල දේපළ විකිණීමේ ස්ථානයක්/ආයතනයක් පවත්වාගෙන යාම.
31. ඇස් කණ්නාඩි නිෂ්පාදනය සහ/හෝ ස්ථානයක්/විකිණීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
32. ලාම්පු ආවරණ නිෂ්පාදනය සහ/හෝ ස්ථානයක්/විකිණීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
33. යකඩ බඩු විකිණීමේ ස්ථානයක් /ආයතනයක් පවත්වාගෙන යාම.
34. මැණික් හා දියමන්ති වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

35. තොග වශයෙන් කොහු ලණු ගබඩා කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
36. ඉටිපන්දම් ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
37. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ සහ /හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
38. විදුලිබල උත්පාදන යන්ත්‍ර කුලියට දීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
39. අලුත් ටයර්, ටියුබ් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
40. ප්‍රචාරක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම.
41. සිගරැට් හෝ බීඩි වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
42. මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
43. වාණිජමය කාර්යයන් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
44. ඔරලෝසු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
45. බීජ වර්ග සහ/ හෝ පැළ වර්ග වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
46. ගුවන් සේවා කාර්යාලයක් පවත්වාගෙන යාම.
47. සංචාරක සේවා ආයතනයක් පවත්වාගෙන යාම.
48. විදේශ රැකියා සැපයීමේ ඒජන්සියක් පවත්වාගෙන යාම.
49. කන්ටේනර් නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීමේ හෝ ගබඩා කිරීමේ අංගනයක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම.
50. රූපවාහිනී යන්ත්‍ර හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
51. සුරතලය සඳහා ඇති කරන මසුන් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
52. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙනයාම.
53. නියෝජිත (ඒජන්සි) තැපැල් හලක් පවත්වාගෙන යාම.
54. අභ්‍යන්තර පණිවුඩ හුවමාරු කිරීමේ උපකරණ වෙළෙඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
55. ආයුර්වේද ඖෂධ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
56. මුළුතැන්ගෙයි උපකරණ ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
57. ඡායාරූප දල සේයාපට සේදීමේ සහ මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
58. සනීපාරක්ෂක උපකරණ සහ/හෝ පිඟන් ගඩොල් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
59. බේකරිවලට අවශ්‍ය ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
60. ලිපිද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
61. ජල පොම්ප හා උපාංග වෙළෙඳාම් කිරීම.
62. අකුරු කෙටීමේ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම.
63. සිසිල් බීම වෙළෙඳාම් කිරීම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
64. විකිණීම සඳහා වෙළඳ ද්‍රව්‍ය ගබඩා කිරීම සහ/හෝ අංගනයක් පවත්වාගෙන යාම.
65. යකඩ තහඩු හා ඇලුමිනියම් තහඩු ආශ්‍රිත වැඩපලක් පවත්වාගෙන යාම.
66. බුමුතුරුණු සහ ෆෝමිකා ෂීට්ස් විකිණීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
67. ධීවර ආම්පන්න වෙළඳාම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
68. කේක් සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යයන් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
69. කළුගල් ආශ්‍රිතව සමරු ඵලක සහ/හෝ ෆ්ලෝ ටයිල්ස් නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
70. ගුවන් විදුලි යන්ත්‍ර අමතර කොටස් වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
71. පිඟන් බඩු වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
72. තෑගි භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
73. ආහාර ද්‍රව්‍ය සහ කුළුබඩු වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
74. වාණිජමය කටයුතු සඳහා ආයතනයක් හෝ කාර්යාලයක් පවත්වාගෙන යාම.
75. දුම්කොල ගබඩා කිරීම සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
76. දේශීය සහ/හෝ විදේශීය ආනයනික හෝ අපනයනික භාණ්ඩ ගබඩා කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
77. විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය සහ/හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
78. කිරිගරුඬ සහ/හෝ කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
79. කඩදාසි බෑග් නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

80. කෞතුක භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
81. සිල්ලර වෙළඳසලක් පවත්වාගෙන යාම (ග්‍රොසරි).
82. සාප්පු බඩු වෙළඳසැලක් පවත්වාගෙන යාම.
83. ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
84. අත් යන්ත්‍ර මගින් නිෂ්පාදිත රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
85. පොත් පත් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
86. අරුමෝසම් බඩු වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් සහ/හෝ සැරසිලි භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
87. වීඩියෝ කැසට් පට වෙළෙඳාම් කිරීම සහ/හෝ කුළියට දීම.
88. පොත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
89. තරාදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
90. සංගීත භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
91. හිස් බැරල් ගබඩා කිරීම සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
92. මංගල හෝ අවමංගල කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීම හෝ කුලියට දීම.
93. බිත්තර වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
94. සිහිවටන නිෂ්පාදනය කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
95. පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
96. සෙල්ලම් බඩු ගබඩා කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
97. මල් සාප්පුවක් පවත්වාගෙන යාම.
98. ප්‍රචාරක දැන්වීම්, අතින් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
99. ගොවි උපකරණ ආම්පන්න වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
100. දුරකථන/ටෙලෙක්ස් පණිවුඩ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
101. වෛද්‍ය උපකරණ ආනයනය කිරීම සහ/හෝ වෙළෙඳාම් කිරීම.
102. පපඩම් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
103. පොල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
104. කිරි ආහාර වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
105. කඩල වර්ග වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
106. බයිසිකල් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
107. හැලි වලං සහ/හෝ කොහු භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
108. පළතුරු වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
109. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
110. ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
111. එළවළු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
112. කුඩ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
113. කට්ටකුමංජල් ගබඩා කිරීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
114. මල් පෝච්චි සහ/හෝ විවිධ පැල වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
115. කැටයම් කැපීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
116. ගිනි නිවීමේ ආම්පන්න සහ හෝ ආශ්වාස ප්‍රාශ්වාස උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
117. කාර්යාල උපකරණ විකිණීමේ සහ/හෝ අලුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
118. පරිගණක යන්ත්‍ර පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
119. ගෘහ නිර්මාණ ශිල්පය හෝ සැලසුම් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
120. රිය පැදවීම පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
121. දන්ත කාර්මික ස්ථානයක් පවත්වාගෙන යාම.
122. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
123. උපදේශක සේවා ආයතනයක් පවත්වාගෙන යාම.
124. සංචාරක බස් සේවා ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම.
125. බඩු ප්‍රවාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම.
126. දේශීය හා විදේශීය බැංකු ආයතන පවත්වාගෙන යාම.
127. රක්ෂණ සමාගම් පවත්වාගෙන යාම.

128. යන්ත්‍රෝපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
129. කුෂන් වැනි දෑ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
130. කැඩපත් සහ/හෝ ගොඩනැගිලි වීදුරු වර්ග වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
131. සම් භාණ්ඩ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
132. ප්ලාස්ටික් භාණ්ඩ ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
133. සුවඳ විලවුන් වර්ග වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
134. පාවිච්චි කරන ලද ටයර්, ටියුබ් සහ පුරවන ලද ටයර් ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
135. රසායනාගාර උපකරණ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
136. පරිගණක මගින් මුද්‍රණ කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
137. ඇලුමිනියම් භාණ්ඩ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
138. ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
139. ඉරන ලද ලී ගබඩා කිරීම සහ/හෝ වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
140. මැටි භාණ්ඩ නිෂ්පාදනය විකිණීම සහ/හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
141. පාන් වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
142. බතික් රෙදි නිෂ්පාදනය කිරීම සහ/හෝ විකිණීම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
143. රථ වාහන රෝද සමබර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
144. කුඩ නිෂ්පාදනය කිරීම සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
145. නූල් නිෂ්පාදනය කිරීම සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
146. තේ කුඩු ගබඩා කිරීම සහ/හෝ පැකට් කිරීම සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
147. ලී බඩු වෙළඳාම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
148. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම.
149. ප්ලාස්ටික් භාණ්ඩ සහ/හෝ ෆයිබර් ග්ලාස් භාණ්ඩ නිෂ්පාදනය සහ/හෝ විකිණීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
150. පෞද්ගලික සාත්තු නිවාසයක් හෝ රෝහලක් පවත්වාගෙන යාම.
151. ලොරි බොඩි සහ අනෙකුත් වාහන සඳහා බොඩි ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
152. විනාකිරි නිෂ්පාදනය සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
153. ශීත කළ පළතුරු බීම නිෂ්පාදනය කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
154. වෛද්‍ය පරීක්ෂණාගාරයක් පවත්වාගෙන යාම.
155. ගිනි අවි වෙළඳාම් කිරීමේ සහ/හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
156. වානේ හෝ යකඩ කම්බිවලින් තැනූ විවිධ උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
157. විවිධ එසෙන්ස් වර්ග නිෂ්පාදනය කිරීමේ සහ/හෝ ගබඩා කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
158. ප්ලාස්ටික් වැනි දෑ උපයෝගී කරගෙන ක්‍රීඩා භාණ්ඩ/ විසිතුරු භාණ්ඩ හෝ වෙනත් විවිධ දෑ නිෂ්පාදනය කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
159. රසායනික ද්‍රව්‍ය සහ/හෝ රසායනාගාර උපකරණ නිෂ්පාදනය කිරීමේ ගබඩා කිරීමේ සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
160. උත්සව සඳහා කෑම වර්ග සහ/හෝ සිසිල් බීම නිෂ්පාදනය කිරීම සහ සැපයීම.
161. කපාපු පොල් වෙළඳාම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
162. බණිජ වර්ග වෙළඳාම සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
163. පූජා භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
164. වැලි සහ/හෝ කළුගල් ගබඩා කිරීමේ හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
165. දියලුණු කි.ග්‍රෑ. 1,000 ට වඩා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
166. කිරිහලක් පවත්වාගෙන යාම.
167. කාර් හූඩ් සහ ආසන සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
168. හඳුන්කුරු නිෂ්පාදනය සහ/හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
169. මී පැණි/ පොල් පැණි/ කිතුල් පැණි/ හෝ වෙනත් පැණි වර්ග සෑදීමේ/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

170. කාර්මික ආයතනයක් පවත්වාගෙන යාම.
171. අවුල්පත් (රසකැවිලි) සහ /හෝ කෙටි කෑම වර්ග වෙළඳසලක් පවත්වාගෙන යාම.
172. රබර් සීල් සහ/හෝ බ්ලොක් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (ස්වයං රැකියා හැර)
173. ලෝහ සහ/හෝ ගැල්වනයිස් යකඩ තහඩුවලින් විවිධ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
174. නූඩ්ල්ස් සෑදීමේ සහ/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
175. මයින හමක් සහ ඒ හා සමාන උපකරණයක් භාවිතා කිරීමේ ස්ථානයක් (කම්හලක්) පවත්වාගෙන යාම.
176. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම සහ/හෝ ප්‍රදර්ශනය කිරීම සහ/හෝ අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
177. රථ වාහන ගාලක් පවත්වාගෙන යාම.
178. පරිගණක සහ දුරකථන ආශ්‍රිත අන්තර්ජාල සේවා හා ඊ මේල් සේවා ඇතුළත් සයිබර් කැෆේ ආයතනයක් පවත්වාගෙන යාම.
179. බෝතල්ගත කරන ලද වතුර විකිණීමේ සහ/හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
180. උත්සවශාලා කුලියට දීම.
181. රථවාහන කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
182. වාහන බර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
183. භාණ්ඩ නිෂ්කාශණය කිරීමේ කාර්යාලයක් පවත්වාගෙන යාම.
184. අයිස්ක්‍රීම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
185. කෘත්‍රිම මල් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
186. මහා නගර සභා ආඥාපනතේ 247 අ හෝ 247 ඈ වැනි වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු හෝ වෙළෙඳ ව්‍යාපාර විෂයයෙහි බදු නොගෙවන ඉහතින් සඳහන් නොවූ වාණිජ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
187. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
188. පරිගණක අළුත්වැඩියා කිරීමේ හා උපාංග සහ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
189. ජංගම දුරකථන අළුත්වැඩියා කිරීමේ, විකිණීමේ හා අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
190. රබර් සීල් හා යකඩ මුද්‍රා නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
191. නාවික කටයුතු සඳහා කාර්යාලයක් පවත්වාගෙන යාම.
192. විදුලි බිල් අයකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
193. අලුත් යකඩ වෙළෙඳාම/ගබඩා කිරීම.
194. බෝතල්ගත කරන ලද ලිහිසි තෙල් වෙළඳාම.
195. විදේශ මුදල් හුවමාරු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.

උපලේඛන අංක 03

247 "(ඇ)" වගන්තිය යටතෙහි පනවා ඇති වෙළඳ ව්‍යාපාර විෂයෙහි බදු

(අ) බදු චක්‍රය :

	I වැනි තීරුව *ගත වූ වර්ෂයේ දී වෙළඳ ව්‍යාපාරයෙන් ලත් ලැබීම්*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
02.	රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03.	රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04.	රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05.	රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06.	රු. 1,50,001 ඉක්මවන විට	3,000 0

(ආ) බදු පනවන ලැබූ ව්‍යාපාර ලැයිස්තුව :

1. කොමිස් ඒජන්තවරු
2. ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවෝ
3. මුදල් ණයට දෙන්නන්
4. බ්‍රෝකර්වරු
5. වෙන්දේසිකරුවන්
6. මුදල් ආයෝජකයින්
7. රන් බඩු උකස් ගන්නන්
8. උපදේශකවරුන්.

උපලේඛන අංක 04

1985 අංක 20 දරන මහා නගර සභා (සංශෝධන) පනතින් සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 247 "ඉ" වැනි වගන්තිය යටතේ ඇතැම් ඉඩම් විකිණීම විෂයයෙහි බදු අය කිරීම.

කොළඹ මහා නගර සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු *නැතහොත්* අනුයෝජකයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ *නැතහොත්* වෙනත් ආකාරයකින් විකුණනු ලැබුවහොත්, ඒ විකිණීමෙන් ලැබුණ මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් කෙනෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් එසේ ඒ ඉඩම විකුණාලත් මුදලින් සභාවට ගෙවිය යුතුය.

සටහන :

2023 වසර සඳහා ඉහත සඳහන් ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු අය කිරීමේ දී පහත දැක්වෙන පදනම මත ක්‍රියාත්මක වනු ඇත.

1. එක් පුද්ගලයෙකු විසින් එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කීපයකින් යුත් ගොඩනැගිල්ලක හෝ ගොඩනැගිලි කිහිපයක එකම ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේ නම්, වාර්ෂික බදු ගණනය කිරීම සඳහා පමණක් එය එක් ස්ථානයක් වශයෙන් සලකා බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු අය කරනු ඇත.

2. එක් පුද්ගලයෙකු විසින් එක් වරිපනම් අංකයක් යටතේ එක් මහලක් හෝ මහල් කිහිපයකින් යුත් ගොඩනැගිල්ලක විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම්, එම ව්‍යාපාරය හෝ කර්මාන්තය සඳහා යොදා ගෙන ඇති බිම් ප්‍රමාණය අනුව වාර්ෂික වටිනාකම කොටස් කර බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ඇත.

3. එක් පුද්ගලයෙකු විසින් එකම වර්ගයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල වරිපනම් අංක කිහිපයකින් සමන්විත ගොඩනැගිල්ලක් වුව ද එය එකම වරිපනම් අංකයක පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් ලෙස සලකා ව්‍යාපාර බදු හෝ බලපත්‍ර ගාස්තු අය කරනු ඇත. එසේ වුව ද එම ස්ථානයේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව හෝ ව්‍යාපාරික බද්ද උපරිමය රුපියල් 5,000 ට අඩු වන්නේ නම් එවැනි අවස්ථාවක අදාළ සියලුම ගොඩනැගිලිවල වරිපනම් අංකවල වාර්ෂික වටිනාකම ඒකාබද්ධ කර ලැබෙන මුළු තක්සේරු අනුව බලපත්‍ර ගාස්තුව හෝ ව්‍යාපාරික බද්ද තීරණය කරනු ඇත.

4. එක් පුද්ගලයෙකු විසින් වරිපනම් අංක කිහිපයක, විවිධ ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවක එකී වරිපනම් අංක එකට යාව පිහිටියේ වූව ද තම එක් එක් ව්‍යාපාරය හෝ කර්මාන්තය වෙනුවෙන් වෙන වෙනම බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු අය කරනු ඇත.

5. එක් වරිපනම් අංකයක් යටතේ පුද්ගලයින් කිහිප දෙනෙකු ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම්, ඒ එක් එක් ව්‍යාපාරය සඳහා යොදා ගනු ලබන ස්ථානයේ බිම් ප්‍රමාණය අනුව එකී ගොඩනැගිල්ලේ වාර්ෂික තක්සේරුව කොටස් කර බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු වෙන වෙනම අය කරනු ලැබේ.

කැලණිය ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියෙන් කැලණිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද කැලණිය ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩී. ශාන්ති කුමුදුනි,
සභාපති,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,
කැලණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් කැලණිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ගෙපත්වල පෙර වර්ෂයේ වාර්ෂික වටිනාකම 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් 5%ක වරිපනම් බද්දක් කැලණිය ප්‍රාදේශීය සභාවේ සම්පූර්ණ බල ප්‍රදේශය සඳහා පනවා අය කළ යුතු බවත්,

තව ද, 2023 වර්ෂයේ පහත උපලේඛනයෙ හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් දෙවෙනි තීරුවේ නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද කැලණිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2023 වර්ෂයෙ හි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම්, 2023 වර්ෂයේ වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයේ එක් එක් කාර්තුවේ III වැනි තීරුවෙහි නිරූපිත දිනයට පෙර අදළ වරිපනම් බදු මුදල කැලණිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එම කාර්තුවට අදළ මුදලින් සියයට පහක (5%) වට්ටමක්ද කැලණිය ප්‍රාදේශීය සභාවෙන් ලබා දිය යුතු බවටත්,

2023 වර්ෂයට අදළ වරිපනම් බදු පහත උපලේඛනයේ දෙවන තීරුවෙහි නිරූපිත පරිදි නියමිත කාර්තුවේ අවසාන දින දී හෝ ඊට පෙර ගෙවා අවසන් නොකරන්නේ නම්, එකී කාර්තුවේ අවසන් දිනට පසු එළඹෙන දින සිට නේවාසික දේපළ සඳහා සියයට පහලොවක (15%) අධි ගාස්තුවක් ද, නේවාසික නොවන දේපළ සඳහා සියයට විස්සක (20%) අධි ගාස්තුවක් ද වරිපනම් බද්දට එකතු කර අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව *කාර්තුව*	*II වැනි තීරුව* *ගෙවිය යුතු දිනය*	*III වැනි තීරුව* *5% ක වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2023 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා	2023.01.31
දෙවන කාර්තුව	2023 අප්‍රේල් 01 සිට ජුනි 30 දක්වා	2023.04.30
තුන්වන කාර්තුව	2023 ජූලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා	2023.07.31
හතරවන කාර්තුව	2023 ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා	2023.10.31

කැලණිය ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය යටතේ කැලණිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද කැලණිය ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩී. ශාන්ති කුමුදුනි,
සභාපති,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,
කැලණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වගන්තිය යටතේ කැලණිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ එකී පනතේ ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනවල I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

2015.12.28 අංක 1947/6 දරන *ගැසට් පත්‍රය,* 2016.07.20 අංක 1976/21, 2016.08.03 අංක 1978/22 හා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුකූලව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර සඳහා පැනවෙන බලපත්‍ර ගාස්තු :

පළමුවැනි උපලේඛනය

I කොටස

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි රු. ශත*
01.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	භෝජන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	ලැඟුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	කිරි හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ආහාර විකිණීම	500 0	750 0	1,000 0
12.	පිටිවලින් සාදන ආහාර විකිණීම	500 0	750 0	1,000 0
13.	රසකැවිලි විකිණීම	500 0	750 0	1,000 0
14.	සරුවත් පැණිබීම විකිණීම	500 0	750 0	1,000 0
15.	පළතුරු විකිණීම හෝ කල් තබා ගැනීම	500 0	750 0	1,000 0

අනු. අංකය	බලය දෙනු ලබන කාර්යය	*I වැනි තීරුව* වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත	*II වැනි තීරුව* වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත	*II වැනි තීරුව* වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි රු. ශත
16.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
17.	මස් විකිණීම	500 0	750 0	1,000 0
18.	අයිස් නිෂ්පාදනය, විකිණීම	500 0	750 0	1,000 0
19.	සිසිල් බීම විකිණීම, නිෂ්පාදනය	500 0	750 0	1,000 0
20.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	කොණ්ඩා සැකසීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
22.	කොණ්ඩා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	මී කිරි අලෙවිය	500 0	750 0	1,000 0
24.	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

* 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා යම් හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන්පොළක් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති අවස්ථාවක එම හෝටලයේ, ආපන ශාලාවේ, නවාතැන්පොළේ පෙර වර්ෂයේ ආදායමින් 1% ක මුදලක් බලපත්‍ර ගාස්තුව ලෙස අය කරනු ලැබේ.

ඒ හෝටලය, ආපනශාලාව, නවාතැන්පොළ ක්‍රියාත්මක වන පළමු අවුරුද්ද වන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව තීරණය වේ.

1952 අංක 6 දරන පළාත්පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුකූලව සකසන ලද අංක 1947/6 හා 2015.12.28 සහ 1976/21 හා 2016.07.20 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයට* අනුව සකසන ලද පීඩාකාරී වෙළඳුම් සඳහා :

පැනවෙන බලපත්‍ර ගාස්තු

II කොටස

01.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
02.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
03.	සම් විකිණීම	500 0	750 0	1,000 0
04.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
05.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
06.	පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
07.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
08.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
09.	පොල් කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	බලය දෙනු ලබන කාර්යය	I වැනි තීරුව	II වැනි තීරුව	
		වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි රු. ශ
13.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
15.	අලුත් හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
19.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
21.	රස කැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
22.	පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
23.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
24.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
25.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
26.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
27.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දූව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
28.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
29.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
30.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
31.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
32.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශ භෝග, කුළු බඩු හෝ කිරිපිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
33.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
34.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
35.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
36.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
37.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
38.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
39.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
40.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
41.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
42.	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
43.	සිමෙන්ති කිලෝග්‍රෑම් 1,000 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
44.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
45.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
46.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
47.	පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
48.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
49.	ධාන්‍ය හෝ මාංශ භෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුකූලව සකසන ලද අංක 1947/6 හා 2015.12.28 සහ 1976/21 හා 2016.07.20 හා 1978/22 - 2016.08.03 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයට* අනුව සකසන ලද අන්තරාදායක වෙළඳාම් සඳහා පැනවෙන බලපත්‍ර ගාස්තු

III කොටස

අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා* රු. ශත	*වාර්ෂික රු. 1,501 ට වැඩි* රු. ශත
01.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝ ග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
02.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
03.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
04.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
05.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
06.	ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
07.	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
08.	කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
09.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
10.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
12.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
17.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	500 0	750 0	1,000 0
18.	හිස්ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	පා පැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
22.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0
23.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
24.	ශීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
25.	දූව ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුකූලව සකසන ලද අංක 1947/6 හා 2015.12.28 සහ 1976/21 හා 2016.07.20 හා 1978/22 - 2016.08.03 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයට* අනුව සකසන ලද අන්තරාදායක වෙළඳාම් සඳහා පැනවෙන බලපත්‍ර ගාස්තු

IV කොටස

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි රු. ශත*
1.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම	500 0	750 0	1,000 0
2.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
3.	රෙදි මුද්‍රණය හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
4.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
6.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
9.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
13.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
15.	කිලෝග්‍රෑම් 150 ට වැඩියෙන් තේ කුඩු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	ලියවන පට්ටලයක් භාවිත කරමින් වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
18.	පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජතෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
20.	වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
21.	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

කැලණිය ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කැලණිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද කැලණිය ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩී. ශාන්ති කුමුදුනි,
සභාපති,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,
කැලණිය ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) (2) වගන්ති යටතේ ඇතැම් කර්මාන්ත සම්බන්ධ බදු

උපලේඛනය

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
අනු. අංකය	*කර්මාන්තයේ/වෙළෙඳාමේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත*
01.	වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	කපු නූල් නිපදවීමේ කර්මාන්තයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
03.	අත් වැසුම්, මුහුණු ආවරණ නිෂ්පාදනය හා අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
04.	බෝට්ටු නිෂ්පාදනය කිරීම හා අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
05.	සයිලන්සර් නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
06.	මෝටර් රථ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
07.	කේබල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
08.	කම්බි ඇණ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09.	අභ්‍යාස පොත් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	පැන්සල්, පෑන්, පැන්සල් කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	රබර් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
12.	කාඩ්බෝඩ් පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13.	මදුරු දැල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
14.	මැටි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
15.	බිම්මල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
16.	දන්වීම් පුවරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
17.	පපඩම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18.	චොකලට් වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
19.	කිරිපිටි වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
20.	සුදු යකඩ භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තයේ/වෙළෙඳාමේ ස්වභාවය	I වැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත	II වැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත
21.	හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
22.	කටු කම්බි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
23.	ඉන්ජෙක්ටර් මෝල්ඩ් සෑදීමේ කර්මාන්තය	500 0	750 0	1,000 0
24.	සෙලෝටේප් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
25.	පාවහන් නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
26.	කුෂන් වැඩපළ	500 0	750 0	1,000 0
27.	දියමන්ති මැණික් ඔප දැමීමේ කර්මාන්තය	500 0	750 0	1,000 0
28.	නූඩ්ල්ස් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
29.	සංගීත භාණ්ඩ නිෂ්පාදනය හෝ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
30.	පානීය ජලය බෝතල්ගත කිරීමේ කර්මාන්තය	500 0	750 0	1,000 0
31.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානය	500 0	750 0	1,000 0
32.	ලියුම් කවර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
33.	විසිතුරු භාණ්ඩ හෝ සෙල්ලම් බඩු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
34.	ජුකී මැෂින් අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
35.	ජංගම දුරකතන අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
36.	ඇලුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
37.	මස් වර්ග ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
38.	අමානෝ තහඩු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
39.	ක්‍රීඩා භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
40.	ස්ටිකර් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
41.	පොලිතීන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0

12 - 504/3

කැලණිය ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කැලණිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද කැලණිය ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩී. ශාන්ති කුමුදුනි,
සභාපති,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,
කැලණිය ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ කැලණිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයේ පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරය 2023 වර්ෂයේ ලද වාර්ෂික ආදායම මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාව ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

	I වැනි තීරුව *2022 වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *රු. ශත*
1.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
2.	රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
3.	රු. 12,001 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
4.	රු. 18,751 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
5.	රු. 75,001 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
6.	රු. 1,50,001 ඉක්මවන අවස්ථාවක	3,000 0

12 - 504/4

කැලණිය ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන ගාස්තු පැනවීම

1987 අංක 15 දරන කැලණිය ප්‍රාදේශීය සභා පනතට අනුව කැලණිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද කැලණිය ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩී. ශාන්ති කුමුදුනි,
සභාපති,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,,
කැලණිය ප්‍රාදේශීය සභාව.

යෝජනාව

කැලණිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතට අනුකූලව සකසන ලද 2015 දෙසැම්බර් මස 28 දිනැති අංක 1947/6, 1976/21 හා 2016.07.20 සහ 1978/22 හා 2016.08.03 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට හා අංක 1976/2 හා 2016.07.20 දිනැති අංක, 1978/22 හා 2016.08.03 අනුව අයකළ යුතු ගාස්තු පහත 01 වන උපලේඛනයේ සඳහන් වේ. මෙම ගාස්තු 2023 වර්ෂය සඳහා ද පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

01 උපලේඛනය

අනු. අංකය	*ප්‍රචාරුවේ ස්වභාවය*	*වර්ග මීටර ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 100 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250	350	500
		3 ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 100 බැගින්		

අනු. අංකය	පුවරුවේ ස්වභාවය	වර්ග මීටර ප්‍රමාණය	ගාස්තුව රුපියල්		
			මාස 03 ට අඩු	මාස 03 හෝ 06 අතර	වසරක්
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 100 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 100 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 100 බැගින්		
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 100 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750	850	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		

12 - 504/5

කැලණිය ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) (අ) උපවගන්තිය යටතේ කැලණිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද කැලණිය ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩී. ශාන්ති කුමුදුනි,
සභාපති,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,,
කැලණිය ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තියේ (1) (අ) උපවගන්තිය යටතේ කැලණිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයේදී පහත උපලේඛනයේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම එහි II වැනි තීරුවේ නිරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව* *රු. ශත*
01. (i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25.00
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහාම	
	(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18.00
	(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4.00
(iii)	සෑම කරත්තයක් සඳහාම	20.00
(iv)	සෑම අත් කරත්තයක් සඳහා	10.00
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7.50
(vi)	සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටලුවකු සඳහා	15.00
(vii)	සෑම ඇතෙකු සඳහා	50.00

* විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙම ගෙවීම්වලින් නිදහස් කෙරේ.

12 - 504/6

කැලණිය ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට සංචාරක වෙළෙඳාම සඳහා ගාස්තු පැනවීම

කැලණිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයේදී ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද කැලණිය ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩී. ශාන්ති කුමුදුනි,
සභාපති,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,,
කැලණිය ප්‍රාදේශීය සභාව.

යෝජනාව

කැලණිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතට අනුකූලව සකසන ලද 2015 දෙසැම්බර් මස 28 දිනැති අංක 1947/6 සහ 1976/21 -2016.07.20 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සංචාරක වෙළෙඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව අයකළ යුතු ගාස්තු පහත 01 වැනි උපලේඛනයේ සඳහන් වේ. මෙම ගාස්තු 2023 වර්ෂය සඳහා ද පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

01 උපලේඛනය

බලපත්‍රයේ ස්වභාවය	*වාර්ෂික බලපත්‍ර ගාස්තුව* *රු. ශත*
සංචාරක වෙළෙඳාම පවත්වාගෙන යාම	1,000 0

12 - 504/7

කැලණිය ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කැලණිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයේ දී ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද කැලණිය ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩී. ශාන්ති කුමුදුනි,
සභාපති,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,,
කැලණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ කැලණිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයක සීමාවක ඇතුළත වූ යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය සඳහා හෝ නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමේ කාර්යය සඳහා යෝග්‍ය වන හෝ ප්‍රාදේශීය සභාවේ මතය අනුව සාධාරණ යැයි සැළකෙන වියදමකින් එවැනි යම් කාර්යයක් සඳහා එම ඉඩම සංවර්ධනය කළ හැකි වන අවස්ථාවක සහ ඒ ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති වූ, සැබැවින්ම ගොඩනැගිලිවලින් ආවරණය වූ ඒ ඉඩමෙහි බිම් ප්‍රමාණය, එම ඉඩමේ මුළු බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට අඩු සමානුපාතිකයක් හෝ ඒ ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැත්තා වූ අවස්ථාවක ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 1% ක වාර්ෂික බද්දක් කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඒ ඉඩමෙ හි අයිතිකරුගෙන් 2023 වර්ෂයේ සිට අයකිරීම සුදුසු බව යෝජනා කරමි.

12 - 504/8

කැලණිය ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට මෘත ශරීර ආදහනය කිරීම සඳහා ගාස්තු පැනවීම

කැලණිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයේදී ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද කැලණිය ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩී. ශාන්ති කුමුදුනි,
සභාපති,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,,
කැලණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

කැලණිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතට අනුකූලව සකසන ලද 2015 දෙසැම්බර් මස 28 දිනැති අංක 1947/6 සහ 1976/21 හා 2016.07.20 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* හා අංක 1976/21 ා 2016.07.20 ආදහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව අයකළ යුතු ගාස්තු පහත 01 වන උපලේඛනයේ සඳහන් වේ. මෙම ගාස්තු 2023 වර්ෂය සඳහා ද පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

01 උපලේඛනය

මෘත ශරීර ආදහනය කිරීම සඳහා ගාස්තු වක්‍රය

	ගාස්තුව රු. ශත
බල ප්‍රදේශය තුළ	5,000 0
බල ප්‍රදේශයෙන් පිටත	8,000 0

12 - 504/9

කැලණිය ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීම සඳහා ගාස්තු පැනවීම

(අ)	වෙළෙඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18.00
(ආ)	වෙළෙඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	4.00
(III) -	සෑම කරත්තයක් සඳහා	20.00
(IV) -	සෑම අත් කරත්තයක් සඳහා	10.00
(V) -	සෑම ජින් රික්ෂෝවක් සඳහා	7.50
(VI) -	සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15.00
(VII) -	සෑම ඇතකු සඳහා	50.00

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12 - 456/5

රජ්ගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (ඉ.).viii.(vi.) යටතේ පහත උපලේඛනයේ දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. නිමල්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 20 වැනි දින,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(i) හා 126(vii) එවැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව, 1988.08.23 දින අංක 520/7 දරන පළාත් පාලන අතුරු ව්‍යවස්ථා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv(ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව, රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථා වල 30 වන ඡේදය යටතේ රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවල 30 වන ඡේදය යටතේ රජ්ගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුලුව) ඉදි කිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2023 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බවට රජ්ගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01. යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවිකොට ඇති හෝ මහජනතාවට දැන ගැනීමට හැකි වන පරිදි යම් තැනක සවිකර තිබෙන ප්‍රචාරක බැනරයක් සඳහා මසකට එක් වර්ග අඩියකට රු. 20.00 බැගින්ද

02. ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා කිසියම් ස්ථානයක සවි කිරීම සඳහා ප්‍රදර්ශන ගාස්තු වර්ග අඩියකට රු. 150.00.

03. ගොඩනැගිල්ලක, බිත්තියක, හෝ තාප්පයක් පින්තාරු තීන්තෙන් ප්‍රචාරක දැන්වීමක් ඇඳ තැබීම සඳහා එක් වර්ග අඩියකට රු. 40.00 බැගින්

04. වර්ග අඩි 50ට අඩු ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ග අඩියකට රු. 100.00.

05. ප්‍රචාරක දැන්වීම් පුවරුවක් මාස 06 හෝ ඊට අඩු මාසයකට ප්‍රදර්ශන ගාස්තු වර්ග අඩියකට රු. 100.00.

12 - 456/6

රජ්ගම ප්‍රාදේශීය සභාව

2023 ප්‍රසිද්ධ රඟ දැක්වීම්

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (ඉ.).viii.(viii.) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. නිමල්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 20 වැනි දින,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

යෝජනාව

(176 වන අධිකාරය) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පැවැත්වීමට ඉඩ ඇති පහත උපලේඛනයේ දැක්වෙන සංදර්ශනය වෙනුවෙන් සඳහන් දර්ශන වෙනුවෙන් සඳහන් ගාස්තු 2023 වර්ෂය සඳහා පනවා අයකිරීමට රජ්ගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

		රු. ශත
01	තාවකාලික චිත්‍රපට දර්ශන, මැජික් දර්ශන, සර්කස් දර්ශන නාට්‍ය සංදර්ශන හෝ වෙනයම් සංදර්ශනයක් සඳහා එක් දිනකට	100 0
	බලපත්‍ර ගාස්තුව වැඩිවන සෑම දිනකටම	50 0
02	සංගීත සංදර්ශනයක් සඳහා එක් දිනකට	200 0

12 - 456/7

රජ්ගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය වෙන්දේසිකරුවකු/බ්‍රෝකරුවරයකු ලෙස ක්‍රියා කිරීම

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (ඉ.).viii.(ix.) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. නිමල්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 20 වැනි දින,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

		රු. ශත
1.	රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙන්දේසියක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ගාස්තුව	2,000 0

12 - 456/8

රජ්ගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය ක්‍රීඩාංගනය කුළියට දීම

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (ඉ.).viii.(x.) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. නිමල්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 20 වැනි දින,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

ක්‍රීඩා පිටිය වෙන් කිරීමේ දී එක් දිනක් සඳහා පහත සඳහන් ගාස්තු අය කරන බව මෙයින් ප්‍රකාශ කරමි.

1.	රජ්ගම බල ප්‍රදේශයේ පාසල් සඳහා	රු.2000.00
2.	රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිට පාසල් සඳහා	රු.6000.00
3.	ආයතන සහ ක්‍රීඩා සමාජ සඳහා	රු.7000.00

රගර් ක්‍රීඩාව :

පාසල්, ආයතන හා ක්‍රීඩා සමාජ සඳහා ගාස්තුව	රු.5000.00 කි
ඇප තැන්පතු මුදල	රු.5000.00 කි

අංක 01, 02, 03 වෙන් කිරීම් වෙනුවෙන් රු. 5000.00 ක ඇප තැන්පතු මුදලක් අය කරනු ලබයි.

12 - 456/9

රජ්ගම ප්‍රාදේශීය සභාව

පාරිසරික ආරක්ෂණ බලපත්‍රය

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (ඉ.).viii.(xi.) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. නිමල්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 20 වැනි දින,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

යෝජනාව

2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ වූ නියමය.

පළාත් පාලන ආයතන වෙත බලය පැවරීම

වර්ෂ 2000 අංක 53 සහ වර්ෂ 1988 අංක 56 දරන පනත් මගින් සංශෝධිත වර්ෂ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වන වගන්තිය යටතේ මධ්‍යම පරිසර අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය වර්ෂ 2022 පෙබරවාරි මස 24 වැනි දින සිට මෙහි පළමුවෙනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් බලතල කාර්යන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා රජ්ගම ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත මෙයින් බලය පැවරේ.

මධ්‍යම පරිසර අධිකාරියේ නියෝගයන්ට, අධීක්ෂණයට හා පාලනයට යටත්ව එකී ජාතික පාරිසරික පනත යටතේ මෙහි පළමුවැනි උපලේඛනයේ සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධව සහ එකී ක්‍රියාකාරකම් සම්බන්ධව නඩු පැවරීමට ඇති බලතල ද ඇතුලුව එවැනි බලතල, කාර්යය හා කර්තව්‍යය වලට අනුෂාංගිකව හා සම්බන්ධ වන සියලු ක්‍රියාවන් දෙවන උපලේඛනයේ දක්වා ඇති ක්‍රියා පටිපාටියට අනුව සභාපති වෙත කර ඇති බලය පැවරුම අනුව එවැනි බලතල, කාර්යය හා කර්තව්‍යය එකී සභාපති විසින් ඉටුකළ යුතුවේ.

උපලේඛනය 1

2000 ක් වූ අංක 53 හා 1988 අංක 56 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පවත්වන ලද රෙගුලාසි වලට අනුකූලව අංක 2264/18 දරන වර්ෂ 2022 ක් වූ ජනවාරි 27 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ "ඈ" කොටසේ නියමිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත පනත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මෙහි දෙවන උපලේඛනයේ සඳහන් ක්‍රියාපටිපාටියට අනුව පාරිසරික ආරක්ෂණක බලපත්‍ර නිකුත් කිරීම අලුත් කිරීම, අවලංගු කිරීම ප්‍රතික්ෂේප කිරීම සහ අත්හිටුවීම.

"ඈ" කොටස

1. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4. රෙදි වියන යන්ත්‍ර මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එබ්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර් 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
6. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
7. දිනකට ලීටර් 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත
8. දිනකට කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලී සහිත වී මෝල්
9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාක් සහිත ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සිහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්"
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්
20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24. සේවක සංඛ්‍යාව 5කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින "ප්ලාස්ටර් ඔෆ් පැරිස්" අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

28. කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීමේ කටයුතු
30. දිනකට ඝන මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවයක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත
33. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම් හල්
35. විසිරි පින්තාරු කිරීමේ හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ
36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත
37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
38. මෘත ශරීර කල්තබා ගැනීමට සකස් කිරීම සහිත මල්ශාලා
39. මෙම උපලේඛනයේ ඈ කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/කර්මාන්තයක්

12 - 456/10

රජ්ගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අයදුම්පත් / සහතික ගාස්තු පැනවීම

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (ඉ).viii.(xii.) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. නිමල්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 20 වැනි දින,
රජ්ගම,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

උපලේඛනය

ජේ. සී. බී. යන්ත්‍රය කුළියට දීම

01. පැය 01 ක් සඳහා රු. 5450.00 (අවම පැය 02ක සේවාව ලබා ගත යුතු අතර නැවත එම මුදල් ගෙවනු නොලැබේ.)
02. මීටරය ගණන් බැලීම ප්‍රධාන කාර්යාලයේ අසල සිට අය කරනු ලැබේ.
03. වැඩිවන සෑම පැයක් සඳහාම රු. 5450.00 ක මුදලක් අය කරනු ලැබේ. (මුල් පැය 02 ට අමතරව)

12 - 456/11

රජ්ගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ජලනල එලීම සඳහා මාර්ග පළුදු කිරීම

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (ඉ).xv.(xiii.) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. නිමල්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 20 වැනි දින,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

උපලේඛනය

ජලනල එලීම සඳහා මාර්ග පළුදු කිරීම සඳහා ගාස්තු අය කිරීම

	රු. ශ.
පහත සඳහන් ගාස්තු 2022.01.01 දින සිට අය කරනු ලැබේ.	
කොන්ක්‍රීට් පාර හරහා කැඩීම (එක් වර්ග මීටරයකට)	4200 0
කොන්ක්‍රීට් පාර අයිනේ වලක් කැඩීම (m^2)	800 0
මැටි පාර අයිනේ වලක් කැඩීම (m^2)	600 0
තාර පාර හරහා කැඩීම (එක් වර්ග මීටරයකට)	4000 0
තාර පාර අයිනේ වලක් කැඩීම (m^2)	800 0
කාපට් පාර හරහා කැඩීම (එක් වර්ග මීටරයකට)	7000 0
කාපට් පාර අයිනේ වලක් කැඩීම (m^2)	1,000 0
පොදු ජලනල එලීම මැටි පාර අයින දිගේ (එක් දිග මීටරයකට)	100 0

12-456/12

රජ්ගම ප්‍රාදේශීය සභාව

ගලි බවුසරය කුළියට දීම සඳහා සීමාව තුළ ලීටර් 1800ක බවුසර් ලෝඩ් එකකට අයකිරීම

	ස්ථානය	*2023 වර්ෂයට ගාස්තුව රු. ශත*
01.	ආගමික ස්ථාන හා පාසල් සඳහා	1,000 0
02.	නේවාසික ස්ථාන සඳහා	1,500 0
03.	රජයේ ආයතන සඳහා	2,500 0
04.	වෙළෙඳ ආයතන සඳහා	3,000 0
05.	කර්මාන්ත සඳහා	3,500 0
06.	සංචාරක හෝටල් සඳහා	4,000 0

(ප්‍රවාහනය සඳහා 1Km කට රු. 500 0 බැගින් අය කෙරේ. ආගමික ස්ථාන හා පාසල් සඳහා ප්‍රවාහන ගාස්තු අය නොකරයි)

සභා සීමාවෙන් පිට - ලීටර් 1800ක බවුසර් ලෝඩ් එකකට අයකිරීම

	ස්ථානය	*2023 වර්ෂයට ගාස්තුව රු. ශත*
01.	ආගමික ස්ථාන හා පාසල් සඳහා	1,200 0
02.	නේවාසික ස්ථාන සඳහා	1,800 0
03.	රජයේ ආයතන සඳහා	2,500 0
04.	වෙළෙඳ ආයතන සඳහා	3,500 0
05.	කර්මාන්ත සඳහා	4,000 0
06.	සංචාරක හෝටල් සඳහා	4,500 0

(ප්‍රවාහනය සඳහා 1Km කට රු. 500 .00 බැගින් අය කෙරේ.)
(නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර වැරදි තොරතුරු සැපයීමේදී ගාස්තු ආසු ගෙවනු නොලැබේ).

ජල බවුසරය කුලියට දීම සහා සීමාව තුල ලෝඩ් එකකට අය කිරීම

	ස්ථානය	*2023 වර්ෂයට ගාස්තුව රු. ශත 6000L*	*2023 වර්ෂයට ගාස්තුව රු. ශත 1500L*
01.	ආගමික ස්ථාන හා පාසල් සඳහා	3,000 0	1,000 0
02.	නේවාසික ස්ථාන සඳහා	3,500 0	1,200 0
03.	රජයේ ආයතන සඳහා	3,500 0	1,200 0
04.	වෙළෙඳ ආයතන සඳහා	4,000 0	1,500 0
05.	කර්මාන්ත සඳහා	4,200 0	1,800 0
06.	සංචාරක හෝටල් සඳහා	4,500 0	2,000 0

(ප්‍රවාහනය සඳහා 1Km කට රු. 500 0 බැගින් අය කෙරේ. ආගමික ස්ථාන හා පාසල් සඳහා ප්‍රවාහන ගාස්තු අය නොකරයි)

සභා සීමාවෙන් පිට - ජල බවුසර් ලෝඩ් එකකට අය කිරීම

	ස්ථානය	*2022 වර්ෂයට ගාස්තුව රු. ශත 6000L*	*2022 වර්ෂයට ගාස්තුව රු. ශත 1500L*
01.	ආගමික ස්ථාන හා පාසල් සඳහා	3,200 0	1.200 0
02.	නේවාසික ස්ථාන සඳහා	3,700 0	1,400 0
03.	රජයේ ආයතන සඳහා	3,700 0	1,400 0
04.	වෙළෙඳ ආයතන සඳහා	4,200 0	1,700 0
05.	කර්මාන්ත සඳහා	4,400 0	2,000 0
06.	සංචාරක හෝටල් සඳහා	4,700 0	2,200 0

(ප්‍රවාහනය සඳහා 1Km කට රු. 500 .00 බැගින් අය කෙරේ.)

(නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර වැරදි තොරතුරු සැපයීමේදී ගාස්තු ආපසු ගෙවනු නොලැබේ).

2023 වර්ෂයට අයදුම්පත / සහතික ගාස්තු

	අයදුම්පත් වර්ග	*2023 වර්ෂයට ගාස්තුව රු. ශත*
01.	ගොඩනැගිලි අයදුම්පත්	750 0
02.	වීථි රේඛා සහතික ගාස්තු	500 0
03.	වරිපනම් නොගෙවන බවට සහතික ගාස්තුව	500 0
04.	වරිපනම් ලේඛණයේ නම සංශෝධනය, අංක ලබා ගැනීම හා ඇතුළත් කිරීම අයදුම්පත් ගාස්තුව	750 0
05.	ජල බවුසරය සඳහා ප්‍රවාහන ගාස්තු (1km සඳහා)	500 0
06.	සුසාන භූමි ආදාහන කටයුතු වෙනුවෙන් ආදාහනාගාරයේ ආදාහනයක් සිදුකරීම වෙනුවෙන්	200 0
	(බල ප්‍රදේශයේ පදිංචිකරුවන් සඳහා)	9,000 0
	බල ප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවන් සඳහා)	12,000 0
07.	ක්‍රීඩාපිටි වෙන් කිරීම	7,000 0
08.	අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා අයදුම්පත් ගාස්තු	500 0

ග්‍රාම නගර නිර්මාණ පනත ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොඩනැගිලි සඳහා පෙරසැරි ගාස්තු

2023 වර්ෂයට ගාස්තුව

ගෙබිම ප්‍රමාණය	*නේවාසික රු. ශත*	*වාණිජ හෝ වෙනත් රු. ශත*
0 - 500	500 0	2,000 0
500 - 1000	1,500 0	3,000 0
1000 - 2000	2,500 0	4,000 0
2000 -3000	3,500 0	5,000 0
3000 - 5000	4,500 0	7,000 0
5000 - 7250	5,500 0	9,000 0
7250 - 9500	6,500 0	11,000 0
9500 - 13000	7,500 0	13,000 0
13000 ට වැඩි	වර්ග අඩි 13000 ඉක්මවීමෙන් පසු සෑම වර්ග අඩි 1000 ක් සඳහාම රු.1000 බැගින් අය කෙරේ.	වර්ග අඩි 13000 ඉක්මවීමෙන් පසු සෑම වර්ග අඩි 1000 ක් සඳහාම රු.1250 බැගින් අය කෙරේ.

ග්‍රාම හා නගර නිර්මාණ පනත ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොඩනැගිලි ඉඩම් අනු කොටස්වලට බෙදීම හා සංවර්ධනය සඳහා අනුමැතිය ලබා ගැනීම.

2023 වර්ෂය

බිම් කට්ටියක ප්‍රමාණය පර්චස්	*නේවාසික කටයුතු සඳහා* *රු. ශත*	*වානිජ හා වෙනත් කටයුතු සඳහා* *රු. ශත*
0 - 6	600 0	1,500 0
6 - 12	500 0	1,300 0
12 - 24	400 0	1,000 0
24 -36	300 0	800 0
36 ට වැඩි	200 0	700 0

ග්‍රාම හා නගර නිර්මාණ පනත ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම -

2023 වර්ෂය

මායිම් තාප්ප/ආරක්ෂක බැමි	*නේවාසික දික් මීටර් 1ක් සඳහා ගාස්තුව* *රු. ශත*	*වාණිජ හා වෙනත් දික් මීටර් 1ක් සඳහා ගාස්තුව* *රු. ශත*
01. ගොඩනැගිලි සීමාවෙන් පිටත	300 0	400 0
02. ගොඩනැගිලි සීමාව තුල	500 0	600 0

ග්‍රාම හා නගර නිර්මාණ පනත ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන කර්යයන් සඳහා අනුකූලතා සහතික ගාස්තුව -

සංවර්ධන කාර්යයේ ස්වභාවය		*2023 වර්ෂය*
01.	ඉඩම් අනුබෙදුම්	පළමු බිම් කොටසට රු. 1,000/- ක් සහ ඊට වැඩි වන සෑම බිම් කට්ටියකටම රු. 500/- බැගින්
02.	නේවාසික ඉදිකිරීම්	වර්ග මීටර් 300/- ට අඩු රු. 3,000/- ක් සහ ඊට වැඩිවන සෑම වර්ග මීටරයකටම රු. 10/ බැගින්
03.	වාණිජ හා වෙනත් ඉදිකිරීම්	වර්ග මීටර් 100/- ට අඩු රු. 3,000/- ක් සහ ඊට වැඩිවන සෑම වර්ග මීටරයකටම රු. 20/ බැගින්
04.	මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම	පළමු දික් මීටර් 100/- සඳහා රු. 1,000/- ක් සහ ඊට වැඩිවන සෑම වර්ග මීටරයකටම රු. 10/ බැගින්
05.	දුරකථන / විදුලි සංදේශ කුළුණු	උස මීටර් 5 සිට 20 දක්වා රු. 5,000/- ක් සහ ඊට වැඩි වන සෑම මීටරයකටම රු. 500/-බැගින්

ග්‍රාම හා නගර නිර්මාණ පනත ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/ කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම් සඳහා ආවරණ අනුමැතිය සඳහා ගාස්තු -

2023 වර්ෂය

ඉදිකිරීම් අදියර		*නේවාසික වර්ග මීටර් 1ක් සඳහා රු. ශත*	*වාණිජ හා වෙනත් වර්ග මීටර් 1 ක් සඳහා රු. ශත*
01.	අත්තිවාරම් වැඩ පමණක් (කයිරු මට්ටම) සම්පූර්ණ කොට ඇති විට	200 0	500 0
02.	වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇති විට	300 0	1000 0
03.	වහලය ඇතුළුව ඇති විට	400 0	1500 0
04.	සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	500 0	2000 0
05.	මායිම් තාප්ප/ආරක්ෂක මායිම ඉදිකිරීම	400 0	800 0
06	දුරකථන/ විදුලි සංදේශ කුළුණු සඳහා	-	උස සෑම මීටර 05 කටම රු. 10,000 බැගින්

කාලය දීර්ඝ කිරීමේ ගාස්තු එක් අවුරුද්දක කාල සීමාවක් සඳහා රුපියල් 250/- බැගින් අයකළ යුතු වේ.

පරීක්ෂා කිරීමේ ගාස්තු

කර්මාන්තයක් හෝ නියමිත කටයුත්තක් සඳහා වන පරීක්ෂා කිරීමේ ගාස්තුව එහි මූලික ප්‍රාග්ධන ආයෝජනය පදනම් කර නිශ්චය කරනු ලැබේ. පහත සටහනේ ලෙස දක්වා ඇති උපරිමයන්ට යටත්ව පරීක්ෂා කිරීමේ ගාස්තුව අයකර ගැනීම නිර්දේශ කරන අතර එවකට අදාල රජයේ බදු මුදල් අයකර ගත යුතු වේ.

ආයෝජනය (රු.)		පරීක්ෂා කිරීමේ ගාස්තුව (උපරිම) රු. ශත
01.	250,000 හෝ ඊට අඩු	3000 0
02.	250,001 - 500,000	3750 0
03.	500,001 - 1,000,000	5000 0
04.	1,000,000 ට වැඩි	10,000 0

2023 වර්ෂයේ දී අයදුම්පත් / පරීක්ෂණ සහතික පත් ගාස්තු

අනතුරුදායක ගස්		2022 වර්ෂයට ගාස්තුව රු. ශත
01.	අයදුම්පත් පෝරම ගාස්තුව	500 0
02. (A)	පරීක්ෂණ ගාස්තුව I වන පන්තියේ දැව එක් ගසකට (කොස්, තේක්ක, බුරුත, නැදුන්)	750 0
(B)	අනෙකුත් දැව සඳහා එක් ගසකට	350 0

2023 විශේෂ ගාස්තු
(පැරණි ගොඩනැගිලි ඉල්ලුම් පත්‍ර පිටපත් නැවත නිකුත් කිරීම සඳහා ගාස්තු)

නිකුත් කිරීමේ ගාස්තුව රු. 400 0 ට අමතරව නැවත නිකුත් කිරීමට ඉල්ලන වසරේ සිට ඉල්ලුම්පත්‍රයේ සඳහන් වර්ෂය දක්වා ඇති කාලයට වර්ෂයකට රුපියල් 100 බැගින් අය කෙරේ. රු. 400.00

ටී. නිමල්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 20 වැනි දින,
රජ්ගම,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

12 - 456/13

කෑගල්ල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

කෑගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2022 සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී අංක 22/09/ඉ/-2 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් කෑගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත දියුණු ගම් ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ තුළ පිහිටි සියලුම නිවාසවල ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2014 වර්ෂයේදී සිදු කරන ලද තක්සේරුව සහ ඊට පසු සිදු කරන ලද නව ඉදිකිරීම් සඳහා වරින්වර ලබාදෙන ලද තක්සේරු අගයන් 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එක් එක් තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) හා (2) උපවගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් 7.5%ක වරිපනම් බද්දක් පනවා අයකිරීමටත්,

එම වරිපනම් බද්ද, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතරකින් අයකර ගැනීමටත්, එකී කාර්තුව අවසන් වීමට පෙර ගෙවිය යුතු බවටත්, තවද

(අ) 2023 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර මුළු වර්ෂයටම ගෙවිය යුතු වරිපනම් බද්ද ගෙවනු ලැබුවහොත් එම මුදලින් 10%ක වට්ටමක් ද,

(ආ) වරිපනම් බදු මුදල කොටස් වශයෙන් ගෙවන විට වරිපනම් බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමුවන මාසය තුළ ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් 5%ක වට්ටමක් ද, බදු ගෙවන්නන්ට දෙනු ලබන අතර, නියමිත කාලසීමාව ඉක්මවා වරිපනම් බදු ගෙවනු ලබන අයගෙන් 10%ක අධි ගාස්තුවක් ද අය කිරීමටත් කෑගල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

බද්දට යටත් වන ප්‍රදේශ :

1. පරගම්මන පාර වම - හෙට්ටිමුල්ල
2. පරගම්මන පාර දකුණ - හෙට්ටිමුල්ල
3. කෑගල්ල පාර වම - පරගම්මන
4. කෑගල්ල පාර දකුණ - පරගම්මන
5. රඹුක්කන පාර වම - කරඬුපන
6. රඹුක්කන පාර දකුණ - කරඬුපන
7. නුවර පාර වම - කරඬුපන
8. නුවර පාර දකුණ - කරඬුපන
9. කෑගල්ල පාර වම - කරඬුපන
10. කෑගල්ල පාර දකුණ - කරඬුපන

11. ගෑවිලිපිටිය පාර වම - හෙට්ටිමුල්ල
12. ගැවිලිපිටිය පාර දකුණ - හෙට්ටිමුල්ල
13. බුලත්කොහුපිටිය පාර දකුණ - හෙට්ටිමුල්ල
14. බුලත්කොහුපිටිය පාර වම - හෙට්ටිමුල්ල
15. මිනුවන්ගමුව පාර වම - හෙට්ටිමුල්ල
16. මිනුවන්ගමුව පාර දකුණ - හෙට්ටිමුල්ල
17. දීවෙල පාර වම - හෙට්ටිමුල්ල
18. දීවෙල පාර දකුණ - හෙට්ටිමුල්ල
19. බුලත්කොහුපිටිය පාර වම - උඳුගොඩ
20. බුලත්කොහුපිටිය පාර දකුණ - උඳුගොඩ
21. යටිදෑරිය පාර දකුණ - යටිදෑරිය
22. යටිදෑරිය පාර වම - යටිදෑරිය
23. හෙට්ටිමුල්ල පාර වම - මොරොන්තොට
24. හෙට්ටිමුල්ල පාර දකුණ - මොරොන්තොට
25. අරන්දර පාර දකුණ - මොරොන්තොට
26. අරන්දර පාර වම - මොරොන්තොට
27. බුලත්කොහුපිටිය පාර දකුණ - මොරොන්තොට
28. බුලත්කොහුපිටිය පාර වම - මොරොන්තොට
29. මාවනැල්ල පාර දකුණ - දීවෙල
30. මාවනැල්ල පාර වම - දීවෙල
31. කෑගල්ල පාර දකුණ - දීවෙල
32. කෑගල්ල පාර වම - දීවෙල
33. ගැවිලිපිටිය පාර වම - වතුර
34. ගැවිලිපිටිය පාර දකුණ - වතුර
35. ගැවිලිපිටිය පාර දකුණ - අලපලාවල
36. ගැවිලිපිටිය පාර වම - අලපලාවල

12 - 488/1

කෑගල්ල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වන උපවගන්තියෙන් කෑගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද කෑගල්ල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 22/09/ඉ/-03 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

තව ද, එකී බද්ද 2023 වර්ෂයට පනවා මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන කාර්තු හතරකින් අය කර ගැනීමට තීරණය කර ඇති බවත්, එකී කාර්තුව අවසන්වීමට පෙර එම බද්ද ගෙවිය යුතු බවටත් දැනුම් දෙමි.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වන උපවගන්තියෙන් කෑගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ස්ථිර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වූ ද, එක් එක් හෙක්ටයාරය මත පහත දක්වා ඇති අනුප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරමි.

ඉඩම් ප්‍රමාණය	*බදු ප්‍රමාණය* *රු. ශත*
ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක	50 0
ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩිවන අවස්ථාවක	10 0

තවද එකී පනතේ 134 (7) වැනි වගන්තිය ප්‍රකාර එකී අක්කර බදු මුදල.

(අ) 2023 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර මුළු වර්ෂයටම ගෙවිය යුතු අක්කර බද්ද ගෙවිවහොත් එම මුදලින් 10%ක වට්ටමක්ද,

(ආ) බදු මුදල වාරික වශයෙන් ගෙවන විට අක්කර බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමුවන මාසය තුළ ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් 5%ක වට්ටමක් ද, බදු ගෙවන්නන්ට දෙනු ලැබේ.

12 - 488/2

කෑගල්ල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තියෙන් කෑගල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද කෑගල්ල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 22/09/ඉ-04 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය යටතේ කෑගල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් කෑගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් මෙහි ඉදිරිපත් කරන උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පැනවීමටත්, එම ගාස්තු 2023 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
	ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	භෝජනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	බාබර් සාප්පුවක්/රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (සභාවෙන් වෙළඳ අයිතිය බදු දෙන ලද)	500 0	750 0	1,000 0
11.	ගව මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (සභාවෙන් වෙළඳ අයිතිය බදු දෙන ලද)	500 0	750 0	1,000 0
12.	කුකුල් මස් හා බිත්තර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	උත්සව සඳහා ආහාර සැපයීම (කේටරින් සර්විස්)	500 0	750 0	1,000 0
14.	ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	අයිස්ක්‍රීම්, යෝගට් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	රසකැවිලි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ශීත කළ කුකුල් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (පිළිගත් ආයතනයක ඇසුරුම්)	500 0	750 0	1,000 0
18.	කිරිපට්ටියක් පවත්වාගෙන යාම			
	I. දෙනුන් 5-10	500 0	750 0	1,000 0
	II. දෙනුන් 10-25	500 0	750 0	1,000 0
	III. දෙනුන් 25ට වැඩි	500 0	750 0	1,000 0
19.	කැඳ හෝ සුප් වර්ග, ආයුර්වේද කෑම වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	සිසිල් බීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	සංචාරක මාළු වෙළඳාම	500 0	750 0	1,000 0
22.	ටින් කළ හා කිරි ආහාර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
23.	පපඩම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	තේ කුඩු/බයිට්/කුළු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	බීඩි හෝ සුරුට්ටු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	සංචාරක වෙළඳාම (රට කජු/කඩල/ස්වීට් කෑම/කෙටි කෑම/තේ කුඩු පැකට්/කුළුබඩු පැකට්/නිල් පැකට්) විකිණීම	500 0	750 0	1,000 0
27.	කිරි පිටි වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	චොකලට් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	මාළු වෙළඳාම	500 0	750 0	1,000 0
30.	කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

කෑගල්ල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ කෑගල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 14 දින පවත්වන ලද කෑගල්ල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 22/09/ඉ-05 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා, එම බද්ද 2023 වර්ෂයේ මාර්තු මාසයේ 31 වැනි දින හෝ ඊට පෙර පහත සඳහන් ආකාරයට ගෙවිය යුතු බව යෝජනා කරමි.

(අ) 2022 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් යටෝක්ත බද්ද මාර්තු මස 31 දිනට පෙර එම බද්දට යටත් තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ය.

(ආ) 2023 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යටෝක්ත බද්ද කර්මාන්තය ආරම්භ කොට මසක් ඇතුළත එම කර්මාන්තය පවත්වාගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ය.

අංක 01 උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
	ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 751 ට වැඩි රු. 1,500ට අඩු*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	කබොක්, බොරළු හෝ කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	සිසිල් බීම වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හා ගබඩා කිරීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ගැළුම් 50ට වැඩි පොල්තෙල් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	පොල්කටු ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	විසිතුරු පින්තාරු කිරීමේ (ස්ප්‍රේ/පේන්ටින්) ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	පාවිච්චි කරන ලද පත්‍ර, කඩදාසි ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	විදුලි බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 751 ට වැඩි රු. 1,500ට අඩු*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
11.	අත්යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	අතින් ලී ඉරන ඉරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	යාන්ත්‍රික ලී මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ගෘහ භාණ්ඩ නිපදවීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	යාන්ත්‍රික රෙදි විවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	සේද රෙදි විවීම හා විසිතුරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ලොරි බොඩි ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	පවිත්‍රතා සඳහා සේවකයින් සැපයීම	500 0	750 0	1,000 0

අංක 02 උපලේඛනය

අප්‍රසන්න ව්‍යාපාර

01.	මිනිරන් ශුද්ධ කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	පොහොර, රසායනික පොහොර නිෂ්පාදනය කිරීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	හම් පදම් කිරීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	කුකුළන් 100කට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	කුකුල්, තාරා ආදී සජීවී සතුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	රබර් නිෂ්පාදනය කිරීමේ හා ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	යන්ත්‍රෝපකරණ භාවිතා කරන කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	යන්ත්‍රෝපකරණ භාවිතා නොකරන කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	මෝටර් බයිසිකල් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ටයර්, ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	සත්ත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	අලුත් හෝ පරණ ලෝහ, ලෝහමය සුන්බුන් ගබඩාකර තබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	සිරප්/පලතුරු බීම වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	පොල් ලෙලි හෝ දැව පල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	ඇසිඩ් වර්ග නිපදවීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	විනාකිරි නිපදවීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	පැණි/හකුරු නිපදවීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 751 ට වැඩි රු. 1,500ට අඩු*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
21.	පින්තාරු, තීන්ත, වාර්නිෂ් තීන්ත හෝ ඩිස්ටැම්පර් සායම් නිපදවීමේ හෝ හො. 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ලෑලි පදම් කිරීම හෝ සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	පළතුරු, මාලු හෝ වෙනත් කෑම වර්ග ටින් බෝතල්වල ඇසිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	ලියන තීන්ත, අච්චු තීන්ත, ස්ටෙන්සිල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	කපාපු පොල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	සමාජ ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	පශු වෛද්‍ය ගිලන්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	ගඩොල් හෝ උළු නිෂ්පාදනය හා ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	ආයුර්වේද බෙහෙත් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ආයුර්වේද බෙහෙත් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	පෞද්ගලික ගලි බවුසර් සේවාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

උපලේඛනය අංක 03

අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර

01.	ඩ්‍රයික්ලීන් කිරීම/රෙදි මුද්‍රණය හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ගිණිකෙළි භාණ්ඩ රතිඤ්ඤා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	හොණ්ඩර 03කට වැඩියෙන් තේ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	වෑල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	වඩුමඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	ලියවන පට්ටල් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	මෝටර් රථ ආම්චර් එතීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගල් ස්මාරක නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	පෙට්‍රල්, ඩීසල් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	මෝටර් රථ අමතර කොටස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	පොලිෂ් හෝ ඉටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	පොලිතීන් බෑග් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
16.	වැලි ගොඩ දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 751 ට වැඩි රු. 1,500ට අඩු*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
17.	විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	ලී බඩු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	රබර් මුදවන ස්ථානයක් රෝලක් දුම් කාමරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	රබර් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	රබර් ඔට්ටපාලු මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	රබර් මිශ්‍ර මෙට්ට රෙදි වර්ග හා වෙනත් උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	යකඩ තහඩු ගැල්වනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	ප්ලාස්ටික් බඩු, සෙල්ලම් බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	බාල්දි හා වෙනත් තහඩු උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	යන්ත්‍ර උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	පරණ යකඩ බඩු ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	කොහු හෝ වෙනත් කෙඳිවලින් උපකරණ හෝ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප කණු සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	සම් භාණ්ඩ නිපදවීමේ කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	ටයර් කට්ට කැපීම හෝ පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	යන්ත්‍රානුසාරයෙන් පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	මැණික් ගල් කැපීම හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	ඉටිපන්දම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	වී මෝලක් පවත්වාගෙන යාම			
	අශ්ව බල 10-5 දක්වා	500 0	750 0	1,000 0
	අශ්ව බල 21-11			
38.	මිරිස් කුඩු වර්ග ඇඹරීමේ ධාන්‍ය, කුළුබඩු ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	පොල්තෙල් සිදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	කොහු මෝලක් හෝ කොහු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	පොල් ලී මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	රථවාහන ආසන වැඩපළක් (කුෂන්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	අපනයනය කරන දැව වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	ඩිස්පෙන්සරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	ආයුර්වේද සම්බාහන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

කෑගල්ල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සංචාරක හෝටල් ආපනශාලා නවාතැන්පළවල් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද කෑගල්ල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 22/09/ඉ-06 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියෙන්, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, අනුමත කර හෝ පිළිගන්නාවූද බල ප්‍රදේශයේ ඇති සංචාරක හෝටල්, ආපනශාලා හෝ නවාතැන්පළවල් සඳහා පසුගිය වර්ෂයේ පිරිවැටුම පදනම් කරගෙන එනම් 01%ක ගාස්තුවක් අය කිරීමටත් අලුතෙන් ආරම්භ කළ පළමු අවුරුද්දේ එම ස්ථානයේ වාර්ෂික වටිනාකම මත 2023 වර්ෂයේ සිට බලපත්‍ර ගාස්තු අයකිරීමටත් එම බලපත්‍ර ගාස්තු 2023 මාර්තු 31 දිනට ප්‍රථම ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

12 - 488/5

කෑගල්ල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු හා වෘත්තීය බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි හා (11) වැනි උපවගන්ති යටතේ කෑගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 14 දින පවත්වන ලද කෑගල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක 22/09/ඉ-07 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (I) වැනි හා (II) වැනි උපවගන්ති යටතේ කෑගල්ල ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ උපලේඛනයේ සඳහන් ව්‍යාපාරයක් කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2022 වර්ෂයේ ආදායම මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනේ අනුප්‍රමාණය අනුව බද්දක් 2023 වර්ෂය සඳහා පැනවීමටත් එම බද්ද සෑම වර්ෂයකම මාර්තු මාසයේ 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

I වැනි උපලේඛනය

I වැනි තීරුව *2022 වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම*		*II වැනි තීරුව* *රු. ශත*
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
02.	රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03.	රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
04.	රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
05.	රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
06.	රු. 1,50,001 ඉක්මවන අවස්ථාවක	3,000 0

2 වැනි උපලේඛනය - ව්‍යාපාර බදු

01. සුළු අපනයන බෝග මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
02. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
03. රෙදි පිළි සාප්පුවක් පවත්වාගෙන යාම
04. සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
05. ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
06. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ (හාඩ්වෙයාර්) ස්ථානයක් පවත්වාගෙන යාම
07. ඇලුමිනියම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
08. ඔරලෝසු අලෙවිය හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
09. ලී බඩු වෙළඳසැලක් පවත්වාගෙන යාම
10. පාවහන් බෑග් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
11. සංචාරකයන් සඳහා කුළු බඩු උයනක් පවත්වාගෙන යාම
12. ගෑස් සිලින්ඩර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
13. ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14. මෝටර් රථ, මෝටර් බයිසිකල් අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15. අවමංගල්‍ය භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16. මංගල භාණ්ඩ කුළීයට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
17. මහන මැෂින් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18. වාහන වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19. ලිපි ද්‍රව්‍ය, පොත්, සඟරා, පුවත් පත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
20. මැටි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
21. විදුලි උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
22. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
23. කාපට්, කාපට් පටි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
25. ක්ෂණික ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
26. දේශීය, විදේශීය දුරකථන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
27. පටිගත කිරීමේ වීඩියෝ පටි කැසට් පටි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28. ඉදල් කොහු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29. පින්තූර රාමු කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
30. විදුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
31. ලොතරැයි ටිකට් පත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32. ගම් වර්ග ගබඩාකර විකිණීම හෝ සංචාරක වෙළඳාම
33. තුනී ලෑලි වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34. ඩිජිටල් ප්‍රින්ටින් ස්ටිකර් මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35. කෘතිම මල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36. පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37. පොලිතින් බෑග් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

38. විසිතුරු මල්පැල විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39. විසිතුරු භාණ්ඩ, ආභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
40. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
41. ගෘහ භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
42. ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
43. සෙල්ලම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
44. සිල්ලර බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45. ග්‍රොසරියක් පවත්වාගෙන යාම
46. කුළු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. වේවැල් භාණ්ඩ සෑදීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. බුලත්, දුම්කොළ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. මත්පැන් (රටබීම) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. බුරුසු වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. දැව/දර ගබඩාවක් පවත්වාගෙන යාම
52. ඇස් කණ්ණාඩි අලෙවිය හා අළුත්වැඩියා ස්ථානයක් පවත්වාගෙන යාම
53. රේස් ඔට්ටු භාර ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
54. සෙරමික් භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
55. ගෘහස්ථ ක්‍රීඩාංගනයක් පවත්වාගෙන යාම
56. ජංගම වෙළඳාම (බේකරි නිෂ්පාදන/තොග බඩු අලෙවිය)
57. දුරකථන කුළුණු ඉදිකිරීම
58. නිවාස ඉදි කිරීම් භාණ්ඩ අලෙවිය
59. නුල් රෙදි කැබලි අලෙවිය
60. ව්‍යාපාර බද්දට අයත් ගබඩාවක් හෝ කාර්යාලයක් පවත්යාගෙන යාම
61. පෞද්ගලික රථ ගාලක් පවත්වාගෙන යාම

3 වැනි උපලේඛනය - වෘත්තීය බදු

01. වෙන්දේසිකරුවෙකු ලෙස වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
02. බ්‍රෝකර්වරයෙක් ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
03. මුදල් ණයට දෙන්නෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
04. කොන්ත්‍රාත්කරුවෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
05. උකස් කරුවෙකු ලෙස වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
06. ගණන් පරීක්ෂකවරයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
07. ගෘහ නිර්මාණකරුවෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
08. සැපයුම්කරුවෙකු ලෙස වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
09. රක්ෂණ නියෝජිතයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
10. ලොතරැයි නියෝජිතයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
11. ප්‍රවාහන නියෝජිතයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
12. පෞද්ගලික අධ්‍යාපන පංති පවත්වන්නෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
13. මිනින්දෝරුවෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
14. නොතාරිස්වරයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
15. කුලී රථ ධාවකයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
16. රියදුරු පුහුණු කරවන්නෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
17. ඉන්ධන පිරවුම්හල් නියෝජිතයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
18. මැණික් හා මිනිරන් කැනීමේ හෝ අලෙවි කිරීමේ නියෝජිතයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
19. බැංකු හා මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම
20. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
21. රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
22. නීතිඥවරයෙකු ලෙස ආයතනයක් පවත්වාගෙන යාම
23. පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
24. සිගරට් හෝ බීඩි වෙළඳ නියෝජිත ආයතනයක් ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
25. තේ හෝ රබර් කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම
26. ඇඟලුම් කර්මාන්තශාලාවක් පවත්වා ගෙන යාම

27. රියදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම
28. කුලී රථ සේවා පවත්වා ගෙන යාම
29. බලවේග මගින් රෙදි වීවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
30. සමූපකාර ප්‍රාදේශීක පවත්වාගෙන යාම
31. රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
32. පතල් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
33. යෝගට් කර්මාන්තශාලා පවත්වාගෙන යාම
34. විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වා ගෙන යාම
35. ජල විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම
36. ප්‍රජා ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම
37. ගොඩනැගිලි හා නිවාස සැලසුම් කාර්යාලයක් පවත්වාගෙන යාම

12 - 488/6

කෑගල්ල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) හා (2) වැනි උපවගන්තියෙන් කෑගල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 14 දින පවත්වන ලද කෑගල්ල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 22/09/ඉ-08 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) හා (2) උප වගන්තිවල විධිවිධාන ප්‍රකාරව, කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධනය නොකළ ඉඩම් වෙනුවෙන් අදාළ ඉඩමෙහි ප්‍රාග්ධන බිම් අගයෙන් 2%ක බදු මුදලක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

12 - 488/7

කෑගල්ල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳව බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ කෑගල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද කෑගල්ල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක 22/09/ඉ-09 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ කෑගල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තකුගෙන්ම එහි 11 වැනි තීරුවේ නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළයුතු යැයි යෝජනා කරමි.

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා	25 0
(අ) වෙළෙඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

12 - 488/8

කෑගල්ල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීම මත බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) හා (2) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 14 දින පවත්වන ලද කෑගල්ල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 22/09/ඉ-10 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) හා (2) උපවගන්තිවල විධිවිධාන ප්‍රකාරව කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1%කට සමාන බද්දක් පනවා විකුණුම්කරු හෝ ඒ වෙන්දේසිකරු හෝ තරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා වෙතින් අය කළ යුතු යැයි යෝජනා කරමි.

12 - 488/9

කෑගල්ල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා දැන්වීම් පුවරු ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 හා 122, 126 වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 04 (ආ) කොටසේ පළාත් පාලන නිවාස හා ඉදි කිරීම් කටයුතු ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කරන ලදුව කෑගල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 39 කොටසේ ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 14 දින පවත්වන ලද කෑගල්ල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 22/09/ඉ-11 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 හා 122, 126 වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ*iv (ආ) කොටසේ පළාත් පාලන නිවාස හා ඉදි කිරීම් කටයුතු ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කරන ලදුව කෑගල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 39 කොටසේ ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර කෑගල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ යම් තැනැත්තෙකු විසින් යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2023 වර්ෂයට පනවා අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

අනු. අංකය	*විස්තරය*	*ලින් වර්ෂයකට ගාස්තුව (රු.)*	*මසකට ගාස්තුව (රු.)*
01.	තාවකාලික බැනරයක්/පුවරුවක් (රෙදි/කඩදාසි) වෙනුවෙන් වර්ග අඩියකට	-	60 0
	ගලවා ඉවත් කිරීමේ ගාස්තු	-	50 0
02.	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් වර්ග අඩියකට	200 0	-
03.	ස්ථිර දැන්වීම් පුවරුවක් වෙනුවෙන් වර්ග අඩියකට	400 0	-
04.	ප්‍රතිදීප්ත (ඩිජිටල්) දැන්වීම් පුවරුවක් වර්ග අඩියකට	600 0	

කැගල්ල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම

2023 වර්ෂය සඳහා කැගල්ල ප්‍රාදේශීය සභාවෙන් සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු අයකිරීම

කැගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයෙහි සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 22/09/ඉ-12 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කැගල්ල ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කැගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

කැගල්ල ප්‍රාදේශීය සභාවෙන් සපයනු ලබන සේවාවන් සඳහා 2023 වර්ෂයට අදාළව පහත සඳහන් ගාස්තු පනවා අය කිරීමට සුදුසු බව යෝජනා කරමි.

01. යන්ත්‍රෝපකරණ කුළියට සැපයීම සඳහා ගාස්තු අය කිරීම

	රු. ශත
• **ජල බවුසරය :**	
එක් වරක් ජලය රැගෙන යාම සඳහා	5,000 0
සේවා ගාස්තු (දෛනික)	1,500 0
දුර අනුව කි. මී. 1 සඳහා (යාම සහ ඒමට) දුර අනුව කි.මී. 1ක් යාමට	100 0
• **ගලි බවුසරය :**	
එක් වරක් යාම සඳහා	7,500 0
සේවා ගාස්තු (දෛනික)	1,500 0
දුර අනුව කි. මී. 1 සඳහා (යාම සහ ඒමට)	100 0
• **ට්‍රැක්ටර් රථය :**	
එක් වාරයක් සඳහා (වාහනයට ඩීසල් සැපයීම සභාවෙන්) සභාවේ රියැදුරකුගේ සහය ලබාගත යුතුයි. දුර අනුව කි.මී. 20 යාමට සහ ඒමට වැඩිවන කි.මී. 1ක් සඳහා රු. 100.00 බැගින්	5,000
• **JCB යන්ත්‍රය :**	
බල ප්‍රදේශය තුළ සේවයේ යෙදවීම - පැය 04ක අවම කාලය සඳහා (6500*3)	19,500 0
වැඩි වන සෑම මීටර් පැයක් සඳහා ම	6,500 0
බල ප්‍රදේශයෙන් පිටත සේවයේ යෙදවීම - පැය 4ක අවම කාලය සඳහා (7500*4)	30,000 0
වැඩිවන සෑම මීටර් පැයක් සඳහා ම	7,500 0
• **විදුලි ජනක යන්ත්‍රය (වොට් 10 3p) :**	
දින එකක් සඳහා	7,500 0
විදුලි ජනක යන්ත්‍රය රැගෙන යන ට්‍රැක්ටර් රථයට අය කිරීම දුර අනුව කි. මී. 1 සඳහා (යාම සහ ඒමට)	100 0
විදුලි ජනක යන්ත්‍රය කුළියට ලබා ගන්නා විසින් ඩීසල් සපයා ගත යුතු ය.	

• **මාර්ග තලනය :**

එක් කාර්යයක් සඳහා දිනකට ගාස්තුව (පෙ.ව. 08.00 - ප. ව. - 5.00 දක්වා)	7,000 0
සේවා ගාස්තු	500 0

(මාර්ග තලනය ගෙනයාම, ගෙන ඒම සඳහා වාහනයක් අදාළ සේවාලාභියා විසින්ම සපයා ගත යුතු ය.)

• **ටිපර් රථය**

දිනකට අය කිරීම (වැඩිවන ඩීසල් මිල පදනම් කරගෙන ගාස්තු තීරණය කෙරේ.)	සේවා ගාස්තුව 7,000.00 කි.මී. 1ක් යාමට 140.00 (එදිනට පවතින ඉන්ධන මිල වෙනස් වීමේදී එයට යටත්ව කි.මී 1කට අය කරන මිල තීරණය වේ).

• කොඩි කණු 01ක් සඳහා 20 0

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යේජනා අංක 05-34 යටතේ සභා සම්මත කරන ලද යෝජනාව අනුව 2023 වර්ෂයට අදාලව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුලත වූ ප්‍රදේශයන්හි පවත්වන ලද විනෝද කටයුත්තකට ඇතුළුවීම සඳහා කරන ලද ගෙවීම්වලින් 10%ක බද්දක් අය කිරීම පහත සඳහන් ආකාරයට වියයුතු බවට මෙයින් දක්වමි.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ නොවැම්බර් මස 13 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(267 වන අධිකාරයවන) විනෝද බදු ආඥා පනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වන ලද (තත් ආඥා පනතේ විස්තර කර ඇති) විනෝද කටයුත්තකට ඇතුළු වීම සඳහා කරන ලද ගෙවීම්වලින් 10% (සියයට දහය) ක බද්දක්, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළකරන ලද දින සිට පනවා අයකළ යුතු යැයි පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරයි.

12-499/12

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

බල ප්‍රදේශය තුළ භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 20 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 05-35 යටතේ සභා සම්මත කරන ලද යෝජනාව අනුව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ භෞතික සැළසුම්කරණයේ මාර්ග, ගොඩනැගිලි, මිහිදන් උයන්, ළිං, වීදි ලාම්පු ප්‍රතිපත්තිය මහජනතාවට දැන ගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

උපලේඛනය

භෞතික සැළසුම් කරණ ප්‍රතිපත්තිය

අරමුණු

සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් ම නියෝජනය වන පරිදි සංවර්ධන කාර්යයන් ව්‍යාප්ත කිරීමට ජනතා සහභාගීත්වය ලබා ගැනීම තුළින් භෞතික සැළසුම්කරණය සඳහා ප්‍රමිතියානුකූල නිමාවක් ඇති කිරීම.

නිර්ණායකයන් :

* ජන ඝනත්වය
* දුෂ්කරතාවයන්
* ජනතා ඉල්ලීම්
* ජනතා සහභාගීත්වය
* කාර්යය අවශ්‍යතාවයන්ගේ වැදගත්කම

ක්‍රමවේදය :

01. මාර්ග

I. සියලුම මාර්ගවල වර්ෂයකට වතාවක් හෝ කාණු කැපීම, කාණු ගොඩ දැමීම, කාණු උරහිස පිරිසිදු කිරීම.
II. පළුදු සහිත මාර්ග වලින් 40% ක් පළුදු මැකීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අයවැය ලේඛනය මගින් ලබා දීම.
III. මාර්ගවල පාලම්, බෝක්කු, අත්වැල් වර්ෂයකට වර්ණ ගැන්වීම.
IV. ජනතා සහභාගීත්වයෙන් නව මාර්ග කැපීම, මාර්ග කැපීම, මාර්ග පුළුල් කිරීම, ඒවා ගැසට් පත්‍රයට ඇතුළත් කිරීම.
V. සෑම මාර්ගයක්ම නියෝජනය වන ආකාරයට ගොඩනැගිලි සීමා, වීථි සීමා ගැසට් කිරීම, මායිම් සළකුණු කිරීම.
VI. මාර්ගවලට හානිකරන අයට අවශ්‍ය දඬුවම් ලබා දීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.
VII. මාර්ග සීමාවලට මුහුණලා ඇති ගොඩනැගිලිවල පිරිසිදුභාවය පිළිබඳව ප්‍රාදේශීය සභා පනතේ නිසි ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කිරීම.
VIII. මාර්ග අලුතින් කොන්ක්‍රීට් කිරීම, තාර දැමීම, කාණු සෑදීම, ජල බස්නා ඇති කිරීම.
IX. නාගරික කොටස්වල පදික වේදිකාව ඉදි කිරීම.
X. සභාව සතු මාර්ගවල හඳුනාගැනීමේ පුවරු සවි කිරීම.
XI. අඩි පාරවල් වාහන ගමන් කළ හැකි මාර්ග බවට පත් කිරීම හා එම තත්ත්වයට ගෙන ඒමට සැළසුම් කිරීම.
XII. වීදි ආලෝකකරණය.

02. මිහිදන් උයන් :

I. සියලුම සුසාන භූමිවල අයිතිය ප්‍රාදේශීය සභාවට ලබා ගැනීම.
II. මායිම් නිරවුල් කර වැටවල් ඉදිකිරීම.
III. ජනතා සහභාගීත්වයෙන් සුසාන භූමියේ දේහ මිහිදන් කරන ප්‍රදේශ හඳුනාගැනීම.
IV. විශාලත්වය සහ මහජන කැමැත්ත මත සුසාන භූමිවල කොටසක් වාණිජ කටයුතු සඳහා ශාඛා වගා කිරීම.
V. මරණාධාර සංගම්වල සහභාගීත්වයෙන් සුසාන භූමිවල මිහිදන් කරන දේහ පිළිබඳ තොරතුරු දින වකවානු සහිතව ලබාගෙන පුද්ගලයින්ගේ පුද්ගලික විස්තර සහිත ලේඛනයක් පවත්වාගෙන යාම.
VI. සිහිවටන, ස්මාරක ඉදිකරන අය සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා දුන් අංකය එම සිහිවටන හා ස්මාරකවල සටහන් කිරීම.
VII. සුසාන භූමිය භාවිතා කරන්නන්ගේ සහභාගීත්වයෙන් වැටවල් සඳහා ශාඛා සිටුවීමට සැළැස්වීම.
VIII. සුසාන භූමි නඩත්තු කාර්යයන්, මරණාධාර හා සුභ සාධක සමිතිවලට පැවරීම.

03. ළිං සහ පිහිලි :

I. අලුතින් ඉදිකරන පිහිලි සහ ළිං වල පිහිටීමේ අයිතිය පවරා ගැනීම.
II. ළිං හා පිහිලි ඉදිකිරීමේ දී ඒ සඳහා මහජන සහභාගිත්වය ලබා ගැනීම.
III. ඉදිකර ඇති ළිං, පිහිළි සඳහා වාර්ෂිකව නඩත්තු වැඩසටහනක් සකස් කිරීම.
IV. අභාවයට යන ළිං හඳුනාගෙන ඒවා මහජන අවශ්‍යතාවයන් මත පුනර්ජීවනය කිරීම.
V. බෝවන රෝග පවතින කාලවලදී ජලයේ ගුණාත්මකභාවය රැක ගැනීමට අවශ්‍ය ප්‍රතිකර්ම සැළසීම.
VI. අනාරක්ෂිත ගැඹුරු ළිං ආරක්ෂිත තත්ත්වයට පත් කිරීම.
VII. ළිං, පිහිලිවල ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සහ නඩත්තුව.
VIII. නව ජල යෝජනා ක්‍රම ඇතිවීම හේතු කොට ගෙන භාවිතයට නොගන්නා ළිං වසා දැමීම.

04. වීදි ලාම්පු ප්‍රතිපත්තිය :

I. ට්‍රාන්ස්පෝමරයේ ධාරිතාවයෙන් 3% ක් පුරවැසියාගේ පොදු අවශ්‍යතාවය, නගර අලංකරණය සඳහා වැඩිදියුණු කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
II. දියුණු ප්‍රදේශ ලෙස නම් කර ඇති ප්‍රදේශ සඳහා ප්‍රධාන මාර්ග, අතුරු මාර්ග, මංසන්ධි සඳහා වීදි ලාම්පු සවි කිරීම.
III. අනෙකුත් තදාසන්න ප්‍රදේශවල මහජනයාගේ ඉල්ලීම මත වීදි ලාම්පු සවි කිරීම.
IV. ප්‍රාදේශීය සභාවේ හඳුනාගත් ප්‍රදේශ සඳහා මංසන්ධි, ආගමික ස්ථාන, රාජ්‍ය ගොඩනැගිලි පිහිටි ස්ථානවල වීදි ලාම්පු සවි කිරීම.
V. වීදි ලාම්පු දැල්වීම සහ නිවීම සඳහා මහජන දායකත්වය ලබා ගත හැකි ස්ථාන සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
VI. මහජන ඉල්ලීම පරිදි සවි කරන වීදි ලාම්පුවල දිගුකාලීන පැවැත්ම, ආරක්ෂාකාරීත්වය සම්බන්ධ ගැටලු ඇති නොවුනොත්, වෙනත් වීදි ලාම්පුවල ආරක්ෂාව තහවුරු කිරීම හා නඩත්තු කිරීම සඳහා නිලධාරියෙකු පත් කිරීම.
VII. වීදි ලාම්පු ලේඛනයක් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
VIII. ක්‍රියා විරහිත වීදි ලාම්පු නඩත්තු කිරීම.
IX. දියුණු ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල වීදි ලාම්පු සවිකළ පසු දියුණුකළ ප්‍රදේශ ලෙස ගැසට් කිරීම.
X. ඉඩම් කට්ටි කිරීමේ දී එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන හරහා ම අවශ්‍ය වීදි ලාම්පු සවි කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
XI. ඉඩම් කට්ටි කිරීමේ දී එම ඉඩම් කට්ටි ප්‍රමාණය අනුව ඒ සඳහා අවශ්‍ය උපරිම ධාරිතාවයක ට්‍රාන්ස්පෝමර් සවි කිරීමට උපදෙස් දීම, එම ට්‍රාන්ස්පෝමර් ධාරිතාවය හරහා උචිත ප්‍රමාණයට වීදි ලාම්පු සවි කිරීම.
XII. වීදි ලාම්පුවලට හානිකරන්නන් සඳහා දඬුවම් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
XIII. වීදි ලාම්පු සවි කිරීමට සමගාමීව ප්‍රාදේශීය සභා ඒකක බල ගැන්වීම.

12-499/13

———————————————————

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන උපදේශක සභාව පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වගන්තියෙන් සාදන ලද 2013.09.30 වැනි දින මහා සභාවේ අනුමත කරන ලද සංවර්ධන උපදේශක කාරක සභා පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථාව, 2022 ඔක්තෝබර් මස 20 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 05-36 යටතේ සභා සම්මත විය. ඒ අනුව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන උපදේශක කාරක සභා පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථා නිවේදනය මෙයින් පළ කරමි. එම නිවේදනය ගැසට් පත්‍රයේ පළ කර දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට බලපාන බව මෙයින් දැනුම් දෙමි.

ඕ. ජී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ නොවැම්බර් මස 13 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

උපලේඛනය

01. මෙම කොටසේ අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන හා මහජන සුභ සාධන සේවා විධිමත් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට සහාය දක්වන සංවර්ධන උපදේශක කාරක සභා අතුරු ව්‍යවස්ථාව යැයි හඳුන්වනු ලැබේ.

02. මහා සභා තීරණයක් මත පත්කරනු ලබන මෙම උපදේශක කමිටුවේ සාමාජිකයින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් විය යුතු අතර, සිවිල් අයිතිවාසිකම්වල අනර්ථයක් සිදු නොකරන ලද පුද්ගලයන් විය යුතු ය.

03. මෙම අතුරු ව්‍යවස්ථාව මඟින් පත්කරනු ලැබූ සාමාජිකයින්ගේ ධුර කාලය වර්ෂයක් දක්වා බල පැවැත්වේ.

04. සංවර්ධන උපදේශක කාරක සභාවේ සාමාජිකයින් පත් කිරීමේ දී ඔවුන්ගේ කුමන හෝ කාර්යයක් සම්බන්ධයෙන් වුව ද විශේෂ හැකියාවක් ඇත්නම් වඩාත් සුදුසු ය.

05. සුවිශේෂ හැකියාවන් ඇති පුද්ගලයන් සොයා ගැනීමට අපහසු අවස්ථාවල විවිධ කාර්යයන් සඳහා නිපුණත්වයක් දක්වන්නේ නම් මේ සඳහා පත් කළ හැකි ය.

06. එසේ නොවන අවස්ථාවක දී සමාජ සත්කාර සේවයේ නියැලී සිටින පුද්ගලයින් ඒ සඳහා පත් කළ හැකි ය.

07. මෙම සාමාජිකත්වය ස්වේච්ඡාවෙන් සිදු කරනු ලබන උපදේශන සේවාවකි.

    සංවර්ධන උපදේශක කාරක සභාවේ කාර්යයන් :

    * සිවි අවුරුදු සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම
    * වාර්ෂික අයවැය ඇස්තමේන්තුව කෙටුම්පත් කිරීම
    * ඉටු කළ යුතු සංවර්ධන කාර්යයන් ප්‍රමුඛතාගත කිරීම
    * හදිසි ආපදා සහන සැලසීම හා ආපදා වළක්වා ගැනීම
    * ආදයම් උත්පාදන මාර්ග හා විශේෂ ව්‍යාපෘති හඳුනා ගැනීම.

08. වර්ෂයක් සඳහා ක්‍රියාත්මක වන සංවර්ධන උපදේශක කාරක සභාවේ නිල කාලය වසරකි.

09. කිසියම් සාමාජිකයෙකු උපදේශක කාරක සභාවෙන් ඉවත් වන්නේ නම් දැනුම් දීමක් ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාට මාසයකට කලින් දැනුම් දිය යුතු ය.

10. උපදේශක කාරක සභා රැස්වීම්වල දී ගණපූර්ණය පවත්වාගෙන යාම පිළිබඳව කමිටු සභාපතිවරයා විසින් සැහීමකට පත්විය යුතු ය.

අර්ථ කථනය:-

උපදේශක කාරක සභාව :

සංවර්ධන කාර්යයන් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලතල ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රදේශයේ සුවිශේෂ හැකියාවන් සහිත තැනැත්තන්ගෙන් සමන්විත කමිටුව.

ධුරවල කාලය :-

කමිටු සාමාජිකයින්ගේ රාජකාරීමය කාලය මෙයින් අදහස් වේ.

සුවිශේෂී හැකියාවන් :-

සමාජගත කාර්යයන්වල දී ඒවා හොඳින් කිරීමේ හැකියාව ඇති පුද්ගලයින් මෙයින් අදහස් වේ.

නිපුණතාව :-

යම්කිසි කාර්යයක් මනාව කිරීමේ හැකියාව.

සිවිල් අයිතිවාසිකම් සඳහා අන්තර්ගතය

ජීවත් වීමේ දී වටපිටාව සමඟ සුහදශීලීව ජීවත්වන, කිසිම සමාජ විරෝධී ක්‍රියාවකට සම්බන්ධ නොවූවන් මින් අදහස් වේ.

නාඋල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට වරිපනම් බදු පැනවීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 03 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 01(xiii)a යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තවදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ජී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 05 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද, බල ප්‍රදේශය තුළ පිහිටි නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා පෙර වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරුව 2023 වර්ෂයටත් පිළිගනු ලැබේ.

(ආ) එම තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට පහ (5%) ක වරිපනම් බද්දක් පනවා අයකිරීමට ; සහ

(ඇ) එම බද්ද 134 වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර 2023 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනි දිනවලින් අවසන්වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් නාඋල ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු බවටත් නාඋල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

වර්ෂයට අදාළ වරිපනම් බදු මුදල් ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ගෙවන්නේ නම් සියයට දහය (10%) ක වට්ටමක් ද කාර්තු ලෙස ගෙවන්නේ නම් කාර්තුවේ මුල් මාසය තුළ හෝ ඊට පෙර මුදල් ගෙවන විට සියයට පහ (5%) ක වට්ටමක් ද හිමි වනු ඇත.

නියමිත දිනට බදු නොගෙවන විට මුඩු ඉඩම් හා වාසස්ථාන වෙනුවෙන් අයවිය යුතු වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහළොව (15%) ක් ද, ව්‍යාපාර සඳහා සියයට විස්ස (20%) ක් ද ආදී ලෙස වරෙන්තු ගාස්තු අය කරනු ලැබේ.

12-492/1

නාඋල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 03 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 01(xiii)b යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ බලපත්‍ර ගාස්තු ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තවදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ජී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 05 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 (1) ඇ ඡේදයෙන් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි (1) වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ (2) වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නී ය.

I වන උපලේඛනය

බලපත්‍ර ගාස්තු

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 දක්වා*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	බත් කඩ, ආපන ශාලා පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	තේ සහ කෝපි කඩ පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	කිරිපට්ටි සහ කිරි වෙළෙඳාම සිදු කිරීම	500 0	750 0	1,000 0
06.	අයිස් කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	කෘතිම පොහොර සෑදීම සඳහා හුණු, ගම් ඇට ආදිය ගෝනියකට වඩා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
08.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
10.	ගවගාල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	සිල්ලර කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	තොග කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	බාබර් සැලුන් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	මස් පිණිස කුකුළන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	බිත්තර පිණිස කුකුළන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බැටළුවන්, ඌරන් හෝ එළුවන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මෝටර් වාහන බෝඩි සාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	යතුරු පැදි හෝ ත්‍රීරෝද රථ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	මෝටර් රථ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 දක්වා*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
21.	මිරිදිය හෝ කරදිය මාළු සිල්ලර වෙළඳාම	500 0	750 0	1,000 0
22.	මිරිදිය හෝ කරදිය මාළු තොග වෙළඳාම	500 0	750 0	1,000 0
23.	පුද්ගලික ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	යාන්ත්‍රික වඩු වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	යාන්ත්‍රික නොවන වඩු වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	යකඩ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	යන්ත්‍ර භාවිතා කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	ලෑලි පදම් කිරීමේ හෝ සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	දර මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	බෙලෙක් වැඩපළක් හෝ වාස්තු වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	ශීතකරණ, අධි ශීතකරණ හෝ වායු සමනය කිරීමේ යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	බලවේග යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දමන යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	සත්ත්ව ආහාර වර්ග ගබඩා කිරීම හෝ වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	වී කෙටීමේ හෝ ධාන්‍ය ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	පෝස්ටර් හෝ දැන්වීම් මුද්‍රණය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	තොග වශයෙන් විකිණීම සඳහා ආහාර වර්ග ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	ගවමස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	එළු මස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	තේ කුඩු ගබඩා කිරීම, නැවත සකස් කිරීම හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	පුද්ගලික සිංහල බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	ලේත් මැෂින් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීම හෝ සිල්ලර අලෙවිය	500 0	750 0	1,000 0
47.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 දක්වා*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
48.	අයිස් පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	යෝගට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	නූඩ්ල්ස් හෝ බිස්කට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	පැරණි යකඩ බඩු මිලට ගෙන අලෙවි කිරීම	500 0	750 0	1,000 0
52.	ගෘහ වීදුරු වර්ග අලෙවි කිරීම	500 0	750 0	1,000 0
53.	බුලත්, පුවක් තොග හෝ සිල්ලරට අලෙවි කිරීම	500 0	750 0	1,000 0
54.	සීනි, පිටි, හාල් තොග අලෙවි කිරීම	500 0	750 0	1,000 0
55.	ඇස් කණ්නාඩි, දෘෂ්ටි උපකරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	පාපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	ස්වර්ණාභරන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	විසිතුරු මසුන් ඇති කිරීම, විකිණීම, අපනයනය	500 0	750 0	1,000 0
59.	රූපලාවන්‍ය කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	චතුර බෝතල් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
61.	ගෑස් භාවිතා කරන උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	ධාන්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	එළ හරක් මස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	මී මැසි පාලනය හෝ මී පැණි අලෙවිය	500 0	750 0	1,000 0
65.	කුළු බඩු නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
66.	ටයිල් වර්ග අලෙවිය	500 0	750 0	1,000 0
67.	තේ කුඩු පැකට් කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
68.	බීජ ඇට පැකට් කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
69.	බයිට් වර්ග	500 0	750 0	1,000 0
70.	සිසිල් බීම අලෙවිය	500 0	750 0	1,000 0
71.	පශු වෛද්‍ය ඖෂධ හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72.	පිඟන් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
74.	ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
75.	සිංහල බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
76.	සිමෙන්ති හෝ ඇස්බැස්ටස් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 දක්වා*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
77.	ශබ්දවාහිනී යන්ත්‍ර කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	මනි බඩු හෝ සුවඳ විලවුන් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	පොහොර වර්ග ගබඩා කිරීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
80.	පදික වේදිකාවල වෙළඳාම	500 0	750 0	1,000 0
81.	මී කිරි අලෙවිය හෝ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
82.	රස කැවිලි අලෙවිය හෝ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	ශීත කළ මස්,මාළු අලෙවිය	500 0	750 0	1,000 0
84.	තෙල් හිදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85.	මිරිස් ඇඹරීම හෝ මිරිස් කුඩු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
86.	යකඩ බඩු අලෙවිය	500 0	750 0	1,000 0
87.	මැටි භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
88.	කෘෂි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
89.	ලී බඩු අලෙවිය	500 0	750 0	1,000 0
90.	මස්,මාළු සිල්ලර අලෙවිය	500 0	750 0	1,000 0
91.	විදුලි උපකරණ අලෙවිය හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
92.	ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීම	500 0	750 0	1,000 0
93.	භූමිතෙල් අලෙවි කිරීම	500 0	750 0	1,000 0
94.	ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම හෝ වෙළඳාම	500 0	750 0	1,000 0
95.	ලේ, මුත්‍රා හෝ වෙනත් රෝග පිළිබඳ පරීක්ෂා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
96.	ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
97.	බටහිර වෛද්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98.	මිනිරන් එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99.	පොහොර වර්ග ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
100.	පුවක් වේළීම	500 0	750 0	1,000 0
101.	කොහු සායම් කිරීම	500 0	750 0	1,000 0
102.	උම්බලකඩ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
103.	ලුණු හෝ කරවල වෙළඳාම	500 0	750 0	1,000 0
104.	හුණු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
105.	කබොක් ගල් ගබඩා කිරීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
106.	අයිස් ක්‍රීම් සෑදීම හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0
107.	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 දක්වා*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
108.	මෝටර් රථ වාහන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
109.	ලියවන පට්ටල ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
110.	ටයර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
111.	ඇසිටික් ඇසිඩ් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
112.	සත්ත්ව ආහාර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
113.	කෘමි නාශක අලෙවිය	500 0	750 0	1,000 0
114.	මිනිරන් ඇසිරීම්, කැනීම් කටයුතු	500 0	750 0	1,000 0
115.	කරවල කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
116.	කිරි ආහාර ද්‍රව්‍ය වෙළඳාම් කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
117.	අලෙවිය සඳහා මැටි ගඩොල් කපන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

සැ. යු. - 1986 අංක 14 දරන සංවර්ධන පනතේ කාර්යය සඳහා ලියාපදිංචි කර ඇත්තා වූ ද, හෝටලයක්, ආපනශාලාවක් හෝ නවාතැන්පළක් වන විට අය කළ යුතු බලපත්‍ර ගාස්තුව, අය කළ යුතු වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් (1%)ක් විය යුතු ය.

12-492/2

නාඋල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට ව්‍යාපාර/වෘත්තීය බදු පැනවීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 03 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 01(xiii) c යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර හා වෘත්තිය බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තව දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 05 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ I වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2022 ආදායම මෙහි පහත උපලේඛනයේ 1 වන අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් පනවා අය කිරීමට ද,

(ආ) (3) 2022 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද 2023 අප්‍රේල් මස 01 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු යැයි විධානය කිරීමට, සහ

(ඇ) 2022 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධ වූ විට යථෝක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස 03ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට ද, නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නී ය.

ව්‍යාපාර/වෘත්තීය බදු

1 වන උපලේඛනය

01. උකස් බඩු ගැනුම්කරුවන්
02. ඒජන්තවරුන් මාර්ගයෙන් බඩු විකිණීම
03. කොමිස් ඒජන්තවරුන්
04. අවමංගල්‍ය කටයුතු භාරගන්නන්
05. ආහාරපාන සපයන්නන්
06. අල, එෑනු, කරවල තොග වෙළඳාම
07. කොන්ත්‍රාත්කරුවන්
08. කුළී රථ හිමියන්
09. පෙට්ට්‍රල්, ඩීසල්, බනිජ තෙල් ගබඩා කිරීම හා විකිණීම
10. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
11. කළු ගල්, බොරළු, කබොක් ආදී කැනීම්
12. ගෘහ නිර්මාණ ශිල්පීන්
13. ගණන් පරීක්ෂකවරුන් හා ගණකාධිකාරීවරුන්
14. තොග ගෑස් වෙළඳාම
15. යන්ත්‍රානුසාරයෙන් ගඩොල්, උළු නිෂ්පාදනය
16. නොතාරිස් හා නීතීඥවරුන්
17. නවාතැන්පොළවල්, ආපනශාලා
18. තොග එළවළු වෙළඳාම
19. විදුලි සංදේශ කුළුණු
20. යතුරු පැදි, ත්‍රීරෝද රථ අලෙවි කිරීම
21. දෘෂ්ටි පරීක්ෂකවරුන්
22. ධාන්‍ය තොග මිලදී ගැනීම
23. ප්‍රවාහන නියෝජිතයින්
24. ප්‍රවාහන අයිතිකරුවන් (පුද්ගලික)
25. පෞද්ගලික අධ්‍යාපන පන්ති පැවැත්වීම
26. බ්‍රෝකර්වරුන්
27. රට බීම හලක්, සැර බීම සාප්පුවක් පවත්වාගෙන යාම
28. බීජ නිෂ්පාදන (වී, එළවළු) ආයතන පවත්වාගෙන යාම
29. මුදල් ආයෝජකයින්
30. මැණික් වෙළඳ ව්‍යාපාරිකයින්
31. මූල්‍ය ආයතන තැන්පතු
32. පෞද්ගලික මිනින්දෝරුවන්
33. මුදල් සපයන්නන් හා මුදල් ණයට දෙන්නන්

34. යන්ත්‍ර උපකරණ, බර වාහන කුළියට දීම
35. රියදුරු පුහුණු ආයතන පවත්වාගෙන යාම
36. රක්ෂණ නියෝජිතයින්
37. රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
38. රේස් ඔට්ටු භාරගන්නන්
39. මෝටර් රථ වෙළඳාම
40. ලොතරැයි නියෝජිතයින්
41. වෙන්දේසිකරුවන්
42. යන්ත්‍රානුසාරයෙන් සහල් සැකසීම
43. පුද්ගලික වන වගා ව්‍යාපාරය
44. සැලසුම්කරුවන්
45. පුද්ගලික සායන හා සාත්තු කරුවන්
46. ඇඟළුම් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම
47. බෝට්ටු සේවයක් පවත්වාගෙන යාම
48. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීම
49. උත්සව ශාලා පවත්වාගෙන යාම
50. පුද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
51. ගල් මෝල්ක් පවත්වාගෙන යාම
52. දේපළ වෙළඳ සමාගමක් පවත්වාගෙන යාම
53. ශරීර සුවතා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
54. ගල් වැඩපළක් පවත්වාගෙන යාම
55. ගෑස් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56. තොග වශයෙන් සිගරැට් අලෙවි කිරීම
57. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
58. උපදේශන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
(පරිසර, ආර්ථික, කෘෂි, වෙනත්)
59. වැලි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. වැලි ගොඩ දැමීමේ තොටුපලක් පවත්වාගෙන යාම

2 වන උපලේඛනය

I තීරුව 2022 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*II* තීරුව රු. ශත
01. රු. 6,000 නොඉක්ම වූ අවස්ථාවක	කිසිවක් නැත
02. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90.00
03. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180.00
04. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360.00
05. රු. 75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන අවස්ථාවක	1,200.00
06. රු. 150,000 ඉක්මවන අවස්ථාවක	3,000.00

නාඋල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 03 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 01(xiii) d යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තව දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ජී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 05 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (I) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වා ගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I තීරුවෙහි නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත යම් කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බව ද,

(ආ) එකී පනතේ 150 (3) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, 2022 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යටෝක්ත බද්ද 2023 අප්‍රේල් මස 01 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු යැයි විධානය කිරීමට ; සහ

(ඇ) 2023 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධ වූ විට යටෝක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස 03ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නී ය.

කර්මාන්ත බදු

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්ත*	*රු. 750.00 දක්වා*	*රු. 751.00 එහෙත් රු. 1,500.00 නොඉක්මවවූ*	*රු. 1,501.00 වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ගඩොල් හෝ උළු ගබඩා කිරීම හෝ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	කළුගල් ඇඹරීම, විසිතුරු කිරීම හෝ ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	ගල් ස්මාරක නිපදවීම හෝ ගල් උපකරණ නෙලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			ස්ථානයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*කර්මාන්ත*	*රු. 750.00 දක්වා*	*රු. 751.00 එහෙත් රු. 1,500.00 නොඉක්මවූ*	*රු. 1,501.00 වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
05.	ලෝහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	කොන්ක්‍රීට් හෝ මැටි නිෂ්පාදන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	ජ්‍යෝතිෂ්‍ය කාර්යාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	සම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	කොහු හෝ වෙනත් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	යකඩ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	යන්ත්‍ර භාවිතා කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ට්‍රක්ස් හෝ සූට්කේස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ගිනි පෙට්ටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	වීදුරු භාණ්ඩ නිපදවීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	සායම් වර්ග නිපදවීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	සෙල්ලම් බඩු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	සුවඳ විලවුන් හෝ හඳුන්කුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ස්වර්ණාභරණ නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	විදුලි උපකරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ඇළුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	විවිධ යන්ත්‍ර උපකරණ නිපදවීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	සිමෙන්ති ගල් නිෂ්පාදනය කිරීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	පළතුරු බීම වර්ග හෝ සිසිල් බීම වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	සත්ත්ව ආහාර වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	පොල් තෙල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	පපඩම් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			ස්ථානයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*කර්මාන්ත*	*රු. 750.00 දක්වා*	*රු. 751.00 එහෙත් රු. 1,500.00 නොඉක්මවවූ*	*රු. 1,501.00 වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
30.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	බීරළු ලියවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	ආහාර සඳහා බිම්මල් නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	මෙට්ට නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	පැළ තවානක් පවත්වාගෙන යාම, අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	විවිධ යන්ත්‍ර උපකරණ නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	වාහන ෂීට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ලී කැටයම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	ලියුම් කවර සකස් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	සබන්, ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	පැන්ට්‍රි කබඩ්, කාඩ්බෝඩ් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	බීඩි හෝ සුරුට්ටු එතීමේ, ගබඩා කිරීමේ ස්ථානයක් හෝ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
43.	මැණික් ඔප දැමීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
44.	පාවහන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	පිඟන් බඩු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	ඡායාරූප පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	කැසට් පටි හෝ වීඩියෝ පටි කුළියට දීම, පටිගත කිරීම හෝ වෙළෙඳාම	500 0	750 0	1,000 0
48.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	උත්සව භාණ්ඩ කුළියට දීම	500 0	750 0	1,000 0
50.	සුරතල් සතුන් විකිණීම	500 0	750 0	1,000 0
51.	පිත්තල බඩු නිෂ්පාදනය කිරීම හෝ වෙළෙඳාම් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ වෙළෙඳාම	500 0	750 0	1,000 0
53.	පරණ පුවත්පත් හෝ ලිපි ද්‍රව්‍ය ගබඩා කිරීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
54.	හිස් බෝතල් හෝ ෂොපින්, යකඩ සුන්බුන් එකතු කිරීම හෝ ගබඩා කිරීම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	දුරකථන සේවා හෝ ෆැක්ස් සේවා සැපයීම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			ස්ථානයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*කර්මාන්ත*	*රු. 750.00 දක්වා*	*රු. 751.00 එහෙත් රු. 1,500.00 නොඉක්මවූ*	*රු. 1,501.00 වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
56.	ව්‍යාපාරයක් වශයෙන් සිමෙන්ති ගල් නිපදවීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
57.	මැණික් හෝ වෙනත් වටිනා ඛනිජ ද්‍රව්‍ය වෙළෙඳාම	500 0	750 0	1,000 0
58.	පොල් පරාල වෙළෙඳාම	500 0	750 0	1,000 0
59.	පිංතූර රාමු කිරීම	500 0	750 0	1,000 0
60.	ටයර් වෙළෙඳාම	500 0	750 0	1,000 0
61.	මෙට්ට වෙළෙඳාම	500 0	750 0	1,000 0
62.	කොප්පරා නිෂ්පාදනය, සකස් කිරීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
63.	තීන්ත වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	ලොතරැයි අලෙවි හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	නිමි ඇඳුම් වෙළෙඳාම	500 0	750 0	1,000 0
66.	යතුරු පැදි හෝ පාපැදි අමතර කොටස් වෙළෙඳාම	500 0	750 0	1,000 0
67.	මෝටර් රථ වාහන අමතර කොටස් වෙළෙඳාම	500 0	750 0	1,000 0
68.	ටයර් කට්ට කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
70.	පරිගණක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	අනුමැතිය ලත් ලී ගබඩා කිරීම	500 0	750 0	1,000 0
72.	පරිගණක උපාංග වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	අටපිරිකර භාණ්ඩ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
74.	පොල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම හෝ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
75.	හඳුන් කුරු නිෂ්පාදනය හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
76.	දුම් කොළ පාම් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	ගොඩනැගිලි ද්‍රව්‍ය කුළියට දීම	500 0	750 0	1,000 0
78.	කොහු ඇඹරුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	පොල් ලෙලි වළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	සම් භාණ්ඩ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
82.	ටෙන්ට් රෙදි මැසීමේ, සවි කිරීමේ හෝ කුෂන් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
84.	වාර්නිෂ් ගබඩා කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
85.	විදුලි බලයෙන් රන්, රිදී, ක්‍රෝමියම් ආලේප කිරීම	500 0	750 0	1,000 0
86.	බැටරි චාජ් කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			ස්ථානයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*කර්මාන්ත*	*රු. 750.00 දක්වා*	*රු. 751.00 එහෙත් රු. 1,500.00 නොඉක්මවූ*	*රු. 1,501.00 වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
87.	රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
88.	නූල් කටින ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
89.	ලැමිනේටින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
90.	ජූකී මැෂින් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	රබර් නිළ මුද්‍රා සෑදීම හෝ ප්ලාස්ටික් නාම පුවරු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92.	වාහන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
93.	කිරුම් මිනුම් භාණ්ඩ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
94.	අඟුරු ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
95.	සුළු අපනයන බෝග ගබඩා කිරීම, මිලදී ගැනීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
96.	බතික් ප්‍රදර්ශනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
97.	රෙදි සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98.	සාප්පු බඩු කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99.	මසා නිම කළ ඇඳුම් වෙළඳාම	500 0	750 0	1,000 0
100.	ඇස් කණ්ණාඩි වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
101.	ඔරලෝසු අලුත්වැඩියාව හෝ වෙළඳාම	500 0	750 0	1,000 0
102.	ශීතකරණ හෝ වායු සමීකරණ වෙළඳාම	500 0	750 0	1,000 0
103.	මෝටර් සයිකල් හෝ පාපැදි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
104.	බ්‍රේක් ලයිනර් විකිණීම	500 0	750 0	1,000 0
105.	වෛද්‍ය උපදේශන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
106.	සයිලන්සර් නිපදවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
107.	ජංගම දුරකථන අලෙවි කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
108.	කොප්පරා නිෂ්පාදනය කිරීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
109.	ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ නිපදවීම හෝ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
110.	පරිගණක අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
111.	කට් පීස් අලෙවි කිරීම	500 0	750 0	1,000 0
112.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
113.	පස් සහ බොරලු කැණීම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

නාඋල ප්‍රාදේශීය සභාව

විනෝද බදු ආඥාපනත යටතේ විනෝද බදු පැනවීම - 2023

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 03 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 01(xiii) e යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ජී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 05 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(267 අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ පළමුවන උපවගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ආඥාපනතේ විස්තර කර ඇති විනෝද කටයුත්තකට ඇතුළත්වන ගෙවීම්වලින් බද්දක් පනවා අය කරනු ලැබේ. මෙහි විධිවිධාන යටතේ 2023 වර්ෂය සඳහා විනෝද බද්දක් 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පැවැත්වෙන විනෝද කටයුත්තක් සඳහා මුද්‍රණගත ටිකට් පත්වල වටිනාකමින් 10%ක මුදලක් අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-492/5

නාඋල ප්‍රාදේශීය සභාව

ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 03 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 01(xiii) f යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තවදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ජී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව,
නාඋල.

2022 නොවැම්බර් මස 05 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා 2016.02.23 දිනැති 1955/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ගරු පළාත් පාලන ඇමතිතුමා විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව දෙවන කොටසේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් හෝ බැනර් ඉදිකිරීමක් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සඳහා පහත දෙවන උපලේඛනයේ පරිදි ගාස්තු 2023.01.01 දින සිට අයකරන බවට නාඋල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

01 උපලේඛනය

ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධ ඉල්ලුම්පත්‍රය

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..... .
02. ස්ථිර ලිපිනය : ..... .
03. අයදුම්කරුගේ දුරකථන අංකය : ..... . විද්‍යුත් තැපෑල : ..... .
04. දැන්වීම් ප්‍රචාරය කිරීමට අදහස් කරන වෙළෙඳ ව්‍යාපාරය, උත්සවය, ප්‍රදර්ශනය, සැණකෙළිය, රැස්වීම හෝ වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය : ..... .
05. දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තු වන ස්ථානය/ස්ථාන : ..... .
06. අදාළ ආකෘතිය අමුණා තිබේ ද? : ..... .
07. ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දැන්වීම් වර්ගය (බැනර්, පුවරු, කටවුට්, බිත්ති, තාප්ප හෝ ස්ථාවර) : ..... .
08. යම් අයුරකින් තම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසුව ද දැන්වීම් දුර්වර්ණ වීම, ඇලවීම, ගැලවීම, බිමට කඩා වැටීමක් සිදුවුවහොත් යථා පරිදි සකස් කිරීමට එකඟ වන්නේ ද? යන්න : ..... .

ප්‍රාදේශීය සභාවේ පිළිගත් නියමයන්ට එකඟව දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට එකඟ වන අතර, ඒ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හෝ එහි යම් වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබීය හැකි වරදක් බව ද, හොඳාකාරවම මම දනිමි.

දිනය : ....,
(අයදුම්කරුගේ අත්සන)

02 උපලේඛනය

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග ප්‍රමාණය (මීටර්)*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250	350	500
		3 ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග ප්‍රමාණය (මීටර්)*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදාකරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750	850	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		

12-492/6

නාඋල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට වෙනත් ගාස්තු පැනවීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 03 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 01(xiii) g යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ජී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 05 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 2016.02.23 දිනැති 1955/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ ගරු පළාත් පාලන ඇමතිතුමා විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛනයේ පරිදි වෙනත් ගාස්තු පනවා අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*පෝරම ගාස්තු හා වෙනත් ගාස්තු*	*මුදල රු. ශත*
01	වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික සඳහා ගාස්තුව (පරීක්ෂා කිරීමේ ගාස්තුව රු. 350.00 අවමයකට යටත්ව (ඔප්පුවේ වටිනාකම සඳහන් නොවන අවස්ථාවලදී) ඔප්පුවේ සඳහන් වටිනාකම රු. 1,000,000.00 දක්වා රු. 2,000.00 (දෙදහසක්) සහ එය ඉක්මවන වටිනාකමින් සෑම රුපියල් 1,00,000.00 කටම 0.5% බැගින් වූ පරීක්ෂා කිරීමේ ගාස්තුවක් අය කෙරේ. වලංගු කාල සීමාව මාස 06 කි. දීර්ඝ කිරීමේ ගාස්තු රු. 400.00 කි. (වලංගු කාල සීමාව ඉකුත් වීමට දින 07කට පෙර දීර්ඝ කිරීමේ ඉල්ලුම්පත ඉදිරිපත් කළ යුතුය.)	500.00

අනු. අංකය	පෝරම ගාස්තු හා වෙනත් ගාස්තු	මුදල රු. ශත
02	වරිපනම් බදු ලේඛනයේ පිටපතක් සඳහා ඒ.ටී.ඩී. පෝරම ගාස්තු	250.00
03	වරිපනම් බදු තක්සේරු ලේඛනයේ පිටපතක් ලබාගැනීම සඳහා පළමු වසරට (ඊළඟ වර්ෂයේ සිට වසරකට රු. 10.00 බැගින්)	100.00
04	පරිසර බලපත්‍ර, අයදුම් පත්‍ර ගාස්තු	250.00
05	පරිසර බලපත්‍ර අලුත් කිරීම සඳහා අයදුම්පත් ගාස්තු	50.00
06	මස් ප්‍රවාහනය සඳහා ගාස්තු මසකට	1,000.00
07	සතිපොළ ගාස්තු අය කිරීම :	
	ස්වභාවය, ධාරිතාව, එකතුකළ වටිනාකම හා හානි පූරණය මත	අවමය 50 සිට උපරිමය 500 දක්වා
08	ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගාස්තු :	
	* ක්‍රිකට් තරග සඳහා	
	පුරවැසියන්, පෞද්ගලික ආයතන, රාජ්‍ය ආයතන සඳහා	6,000 0
	නාඋල කලාපයේ පාසල් සඳහා	500 0
	පිට පාසල් සඳහා	3,000 0
	නාඋල බල ප්‍රදේශයේ ක්‍රීඩා සමාජ සඳහා	4,000 0
	* අත්පන්දු තරග සඳහා	
	සංවිධානය කරන ලද අත්පන්දු තරගාවලියක් සඳහා එක් දිනකට	6,000 0
	රාත්‍රී කාලයේ අත්පන්දු පුහුණුව සඳහා (එක් රාත්‍රියක් සඳහා)	300 0
	* විවිධ අවස්ථාවන් සඳහා	අවමය
	සංගීත සංදර්ශන, අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්, ජාතික උත්සව, විවිධ උත්සව,	2,000 සිට
	කානිවල් ඇතුලු විවිධ වැඩසටහන් සඳහා (ස්වභාවය, ධාරිතාවය, එකතු කළ	උපරිමය
	වටිනාකම හා හානි පූරණය සලකා බැලීම මත)	30,000 දක්වා
09	පුස්තකාල සඳහා ගාස්තු :	
	I. ඉල්ලුම්පත්‍ර ගාස්තු	20.00
	II. ඇතුළත්වීමේ ගාස්තු	100.00
	III. අලුත් කිරීම සඳහා ගාස්තු	50.00
	(දඩ ගාස්තු දවස් 14ක් ඉක්මවන විට එක් පොතක් සඳහා ගාස්තු දවසකට රුපියල්)	1.00

අනු. අංකය	*පෝරම ගාස්තු හා වෙනත් ගාස්තු*	*මුදල රු. ශත*
10	ත්‍රීරෝද රථ ගාස්තු හා සමිති ලියාපදිංචි කිරීමේ ගාස්තු :	
	I. එක් ත්‍රීරෝද රථයක් සඳහා මාසික ගාස්තු	75.00
	II. ත්‍රීරෝද රථ සමිති ලියාපදිංචි කිරීමේ ගාස්තු	2,000.00
	III. ත්‍රීරෝද රථ නැවතුම්පළක් සඳහා ත්‍රී රෝද රථයක් ඇතුළත් කිරීමේ ගාස්තු	5,000.00
11	අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම : (ස්වභාවය, ධාරිතාවය, එකතු කළ වටිනාකම, හානිපූරණය සලකා බැලීම මත)	අවමය 1,000 සිට උපරිමය 5,000 දක්වා
12	නාඋල ජන උදනගම සිඟිති ළමා උයන සඳහා ගාස්තු	
	01. ළමා	20.00
	02. වැඩිහිටි	30.0

12-492/7

නාඋල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට ගොඩනැගිලි ඉදිකිරීම් මත ගාස්තු හා මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ ගාස්තු අයකිරීම

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 03 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 01(xiii) h යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ජී. සී. සනත් දසනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
නාඋල.

2022 නොවැම්බර් මස 05 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21.49.78 වගන්තිවලින් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2016.02.23 දිනැති අංක 1955/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව නිවාස සහ නගර ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව, 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් පරිදි අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

I වන උපලේඛනය

ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තු	රු. 500.00
ඉඩම් අනුබෙදුම් අයදුම්පත් ගාස්තු	රු. 200.00

සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණය අනුමැතිය දීම සඳහා ගාස්තු සහ සේවා ගාස්තු

<table>
<tr><th>සංවර්ධන කාර්යයේ ස්වභාවය</th><th>භාවිතා කල යුතු ආකෘති පත්‍රය</th><th colspan="5">අයකළ යුතු ගාස්තු</th></tr>
<tr><td rowspan="5">I. ඉඩම් අනුකොටස්වල බෙදීම සඳහා සංවර්ධන බලපත්‍රය</td><td rowspan="5"></td><td colspan="3">පෙරසැරි ගාස්තු බිම් කට්ටියක ප්‍රමාණය</td><td colspan="2">එක් බිම් කට්ටියකට අය කළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම්කොටස් හැර) (කැබලි 1 ක් සඳහා)</td></tr>
<tr><td colspan="3">ව. මී. 150 - ව. මී 300</td><td colspan="2">රු. 1,000</td></tr>
<tr><td colspan="3">ව. මී. 301 - ව. මී 600</td><td colspan="2">රු. 800</td></tr>
<tr><td colspan="3">ව. මී. 601 - ව. මී 900</td><td colspan="2">රු. 600</td></tr>
<tr><td colspan="3">ව. මී. 900ට වැඩි</td><td colspan="2">රු. 500</td></tr>
<tr><td>I.ii. මායිම් තාප්ප/රැඳවුම් බැම්ම ඉදිකිරීම</td><td>දික් මීටර් 1ක් සඳහා</td><td colspan="5">රු. 1000</td></tr>
<tr><td>I.iii. සන්නිවේදන කුළුණු/ඇන්ටනා කුළුණු/සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම</td><td>රු. 40,000</td><td colspan="5"></td></tr>
<tr><td rowspan="5">I.iv. නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි</td><td rowspan="5"></td><td rowspan="2">ගෙබිම් ප්‍රමාණය (ව. මී)</td><td>නේවාසික (ව. මීටර් 1කට)</td><td>(ව. මීටර් 1 කට)</td><td rowspan="2">නේවාසික නොවන (ව. මීටර් 1කට)</td></tr>
<tr><td>තනි පුද්ගල</td><td>මහල් නිවාස</td></tr>
<tr><td>ව මී. 400 දක්වා</td><td>රු. 20</td><td>රු. 25</td><td>රු. 25</td></tr>
<tr><td>ව. මී, 401-1000</td><td>රු. 22</td><td>රු. 27</td><td>රු. 27</td></tr>
<tr><td>ව. මී. 1001 - 1500</td><td>රු. 25</td><td>රු. 30</td><td>රු. 30</td></tr>
<tr><td></td><td></td><td>ව. මී. 1501 - 2000</td><td>රු. 25</td><td>රු. 32</td><td>රු. 32</td></tr>
<tr><td></td><td></td><td>ව. මී 2000ට වැඩි</td><td>වැඩිවන සෑම ව. මී. 90ක් සඳහාම රු. 2,000 බැගින්</td><td>වැඩිවන සෑම ව. මී. 90ක් සඳහාම රු. 2,000 බැගින්</td><td>වැඩිවන සෑම ව. මී 90ක් සඳහාම රු. 2000 බැගින්</td></tr>
<tr><td>i. අනුමත සැලසුමට අමතරව ගෙබිම් ප්‍රමාණය වැඩිවන සේ සිදු කරන වෙනස් කිරීම් හා එකතු කිරීම්</td><td colspan="6">මුළු පෙරසැරි ගාස්තුවෙන් 25% + වැඩිවන අමතර වර්ග ප්‍රමාණය සඳහා පෙරසැරි ගාස්තුව</td></tr>
</table>

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*භාවිතා කල යුතු ආකෘති පත්‍රය*	*අයකළ යුතු ගාස්තු*
ii. ගෙබිම් ප්‍රමාණය වෙනස් කිරීමක් නොමැතිව අනුමත සැලැස්ම තුළ සිදු කරනු ලබන වෙනස් කිරීම්.	මුල් අනුමැතියේදී ගෙවන ලද පෙරසැරි ගාස්තුවෙන් 25%	
iii. සංවර්ධන බලපත්‍රයේ වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම	රු. 25,000	
iv. සංවර්ධන බලපත්‍රයේ වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම	i. ව. මී. 1000 දක්වා	රු. 5,000
	ii. ව. මී. 1000 ට වැඩි	රු. 10,000

නීත්‍යානුකූල කිරීමේදී දඩ මුදල් අය කිරීම

සංවර්ධන කාර්යයේ ස්වාභාවය	*භාවිතා කළ යුතු ආකෘති පත්‍රය*	*අයකල යුතු ගාස්තු*	
1. අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සිදුකරන ලද ඉඩම් බෙදීමක් සඳහා		ඉඩම් කැබලි 1ක් සඳහා රු. 3,000 බැගින්	
2. අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම්/එකතු කිරීම්/නැවත ඉදිකිරීම.		නේවාසික (ව. මීටර් 1කට)	නේවාසික නොවන (ව. මීටර් 1කට)
i. අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම දක්වා)		රු. 200 0	රු. 500 0
ii. වහල මට්ටම දක්වා ඉදි කිරීම් ටැම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට (වහලය හැර)		රු. 300 0	රු. 1,000 0
iii. වහලය සහිත බිත්ති ඉදිකිරීම		රු. 400 0	රු. 1,500 0
iv. පදිංචිවීම සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කිරීම		රු. 500 0	රු. 2,000 0
v.. මායිම් තාප්ප/රැදවුම් බිත්ති ඉදිකිරීම		රු. 200 0 (දික් මීටරයක් සඳහා)	රු. 500 0 (දික් මීටරයක් සඳහා)
vi. ඉඩම්/ කුඹුරු ගොඩකිරීම සඳහා		සෑම වර්ග මීටර් 150කට රු. 5,000 0 බැගින්	
vii. විදුලි සංදේශ, සම්ප්‍රේෂණ සහ ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම		බිම්පාදම ඉදිකිරීම රු. 1,50,000 0 වහල මුදුන ඉදිකිරීම රු. 1,00,000 0	
viii. විශේෂ සංවර්ධන ව්‍යාපෘති		සෑම මිලියන 05 කටම රු. 10,000 බැගින්	
3. අනුකූලතා සහතිකය (COC) ලබා නොගෙන පදිංචි වීම		දිනකට රු. 100 0	

4. අනුකූලතා සහතිකය නිකුත් කිරීම සඳහා ගාස්තු :

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු (බදු රහිත)*			
1. ඉඩම් අනු බෙදුම් කිරීම	එක් කැබැල්ලකට රු. 1,000 0			
2. ගොඩනැගිලි ඉදිකිරීම	ගෙබිම් ප්‍රමාණය (ව. මී.)	නේවාසික		නේවාසික නොවන
		තනි පුද්ගල	මහල් නිවාස	
	ව. මී. 400 දක්වා	රු. 4,000 0	රු. 5,000 0	රු. 5,000 0
	ව. මී. 400 ට වැඩි	රු. 4,000/- + ව. මී. 400 ට වැඩිවන සෑම ව. මී. 1ට හෝ ඉන් කොටසක් සඳහා රු. 15 බැගින්	රු. 5,000/- + ව. මී. 400 ට වැඩිවන සෑම ව. මී. 1ට හෝ ඉන් කොටසක් සඳහා රු. 20 බැගින්	රු. 5,000/- + ව. මී. 400 ට වැඩිවන සෑම ව. මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 25 බැගින්
3. සංනිවේදන කුළුණු ඇන්ටනා කුළුණු සම්ප්‍රේෂණ කුළුණු සඳහා	රු. 5,000 0			
4. මායිම් තාප්ප හා රැඳවුම් බැම්	දික් මීටර් 1 කට රු. 25 0 බැගින්			
5. පොදු ගොඩනැගිලි සඳහා වන අනුකූලතා සහතිකය අළුත් කිරීම	රු. 10,000 0			

12-492/8

නාඋල ප්‍රාදේශීය සභාව

ජල ගාස්තු 2023 වර්ෂය

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 03 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 01(xiii) i යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 05 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, සභාව විසින් නඩත්තු කර පවත්වාගෙන යනු ලබන 2022.09.08 කෝන්ගහවෙල රජාවෙල ජල යෝජනා ක්‍රම මඟින් ලබා දෙන ජලය සඳහා 2021 ඔක්තෝබර්

මස 01 වැනි දින සහා තීරණ අංක 1 (VII) J අනුවද, අයථා ලෙස ජල සම්බන්ධතාවය ලබා ගැනීම මත විසන්ධි කරන ලද ජල සම්බන්ධතාවය නැවත සන්ධි කිරීම සඳහා 2022.09.08 දින මහසභා තීරණ අංක 01(v)h අනුවද පහත උපලේඛනයේ සඳහන් පරිදි නොවෙනස්ව ගාස්තු අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

කෝන්ගහවෙල - රජාවෙල ජල යෝජනා ක්‍රමය

ගෘහස්ථ

ඒකක	*මිල*
0-5	රු. 20.00 බැගින්
6-10	රු. 27.00 බැගින්
11-15	රු. 34.00 බැගින්
16-20	රු. 68.00 බැගින්
21-25	රු. 99.00 බැගින්
26-30	රු. 150.00 බැගින්
31-40	රු. 179.00 බැගින්
41-50	රු. 204.00 බැගින්
51-75	රු. 221.00 බැගින්
76 සිට	රු. 238.00 බැගින්
ස්ථාවර ගාස්තු	රු. 200.00 බැගින්

- නව ජල සම්බන්ධතා ලබා දීම සඳහා :

ඉල්ලුම් පත්‍ර ගාස්තුව	රු. 150 0
ජල සම්බන්ධතා ගාස්තුව	රු. 15,800 0
තැන්පතු මුදල	රු. 5,000 0

- විසන්ධි කරන ලද ජල සම්බන්ධතාවය නැවත සන්ධි කිරීමේ ගාස්තුව
  රු. 1,500 + හිඟ මුදල
- ප්‍රාදේශීය සභාව සතු ජල ව්‍යාපෘතියෙන් අයථා ලෙස ජල සම්බන්ධතාවය ලබා ගැනීම මත විසන්ධි කරන ලද ජල සම්බන්ධතාවය නැවත සන්ධි කිරීමේ ගාස්තුව

ගෙවීමට ඇති හිඟ මුදල පසුගිය	=	xxx
මාස 03 ක ජල බිල්පත් හි වටිනාකමේ		
සාමාන්‍ය අගය		
(සේවා ගාස්තුව සමඟ) x 12	=	xxx
නැවත සම්බන්ධතාවය ලබා දීමේ ගාස්තුව	=	5,000.00
කම්කරු, ජල උපාංග හා පරිපාලන වියදම්	=	3,000.00
	=	xxx

මාර්ග හරහා කැනීම් සිදු කිරීම සඳහා වූ ගාස්තු

මාර්ග හරහා කැනීම් කර ජල සම්බන්ධතා හා වෙනත් පහසුකම් සපයා ගන්නා විට ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිළධාරීගේ අධීක්ෂණය හා උපදෙස් පරිදි සිදුකර එම මාර්ග කොටස යථා පරිදි නිළධාරීන් සෑහීමකට පත්වන පරිදි සැකසිය යුතු ය.

ආපසු ගෙවන මුදල (තැම්පත් මුදල) ස්ථානීය පරීක්ෂාවකින් අනතුරුව මාර්ග පෘෂ්ඨයේ නිමාව හා මාර්ගයේ පළල සලකා තාක්ෂණ නිළධාරී විසින් සකස් කරනු ලබන ඇස්තමේන්තු මුදලට අනුව විය යුතුය. ආපසු ගෙවනු ලබන මුදල නිදහස් කිරීම සඳහා තැම්පත් මුදල් නිදහස් කරන ලෙස ලැබෙන ලිඛිත ඉල්ලීම ලැබී මාසයකට පසුව පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ. මාර්ගය සැකසීම පැහැර හැරියහොත් එම තැම්පත් මුදල් ආපසු ගෙවනු නොලැබේ. සේවා ගාස්තු වශයෙන් රු. 1500.00 (එක්දහස් පන්සියයක්) ආපසු නොගෙවන මුදලක් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය.

12-492/10

නාඋල ප්‍රාදේශීය සභාව

දුරකතන කුළුණු ගාස්තු - 2023 වර්ෂය

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 03 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 01(xiii) j යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ දුරකතන කුළුණු ගාස්තු ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් තවදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 05 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, වෙනත් ව්‍යාපාර මත බදු අය කිරීම යටතේ බලපත්‍ර සඳහා වන උපරිම ගාස්තුවට යටත්ව රු. 3,000.00 ක ගාස්තුවක් දුරකතන කුළුණු සඳහා අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නී ය.

12-492/9

නාඋල ප්‍රාදේශීය සභාව

යන්ත්‍රෝපකරණ කුළියට දීමේ ගාස්තු 2023 වර්ෂය

නාඋල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 03 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 01(xiii) k යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සී. සනත් දසනායක,
සභාපති,
නාඋල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 05 වැනි දින,
නාඋල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් නාඋල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, නාඋල ප්‍රාදේශීය සභාවට අයත් යන්ත්‍රෝපකරණ කුළියට දීමේදී පහත සඳහන් මිල ගණන් අනුව අය කිරීමට නාඋල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නීය.

යන්ත්‍ර වර්ගය	*අය කරන ගාස්තුව*
01. J.C.B. යන්ත්‍රය (බැකෝ ලෝඩරය)	6000.00 (මීටර් පැයක් සඳහා)
02. මෝටර් ග්‍රේඩරය	6000.00 (මීටර් පැයක් සඳහා)
03. මාර්ග තලනය	5000.00 (මීටර් පැයක් සඳහා)
04. ජල බවුසරය	5000.00 (ජල බවුසර් 1ක් සඳහා) 1000.00 (එක් දිනක් රඳවා තබා ගැනීමේ ගාස්තුව)
05. ටිපර් රථය	1 km ක් සඳහා රු. 250.00
06. ට්‍රැක්ටර් රථය සඳහා සවිකරන වල් කපන යන්ත්‍රය	3100.00 (මීටර් පැයක් සඳහා)

12-492/11

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 10 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මහා නගර සභා වෙත කරන ලද නියමය ප්‍රකාර හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත හම්බන්තොට නැගෙනහිර හා බටහිර යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පවතින සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙපත්වල වාර්ෂික තක්සේරු වටිනාකම් වශයෙන් නව ප්‍රතිශෝදන තක්සේරු වටිනාකම් 2023 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම්, වශයෙන් පිළිගැනීමටත්,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමෙන් සියයට අට (8%) ක වරිපනම් මුදලක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මහා නගර සභා වෙත කරන ලද නියම ප්‍රකාර හම්බන්තොට මහා නගර සභා නව බල ප්‍රදේශය ඇතුළත හම්බන්තොට සිරිබෝපුර, කොහොලංකල, කෑලියපුර, මිරිජ්ජවිල හා සාමෝදාගම යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පවතික සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙපත්වල වාර්ෂික තක්සේරු වටිනාකම් වශයෙන් 2022 වර්ෂයේ පිළිගෙන තිබූ වටිනාකම්, 2023 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම් වශයෙන් පිළිගැනීමටත්,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමෙන්,

වාණිජ දේපළ සඳහා	- සියයට හත (7%)
රජයේ දේපළ සඳහා	- සියයට හත (7%)
නේවාසික දේපළ සඳහා	- සියයට පහ (5%)

අනුව වරිපනම් මුදලක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් මුදල 2023 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර හම්බන්තොට මහා නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් මුදල් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් හම්බන්තොට මහා නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් ප්‍රමාණයෙන් සියයට පහ (5%) ක වට්ටමක් ද, ලබාදීමටත්, සහ

ඒ වරිපනම් මුදල්, එකී මහා නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනි දිනවලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් හම්බන්තොට මහා නගර සභාවට ගෙවීමට විධාන කිරීමටත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නීය.

12-455/1

හම්බන්තොට මහා නගර සභාව

හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමේ ස්ථානයක් සඳහා මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 1811 දරන 2013 මැයි මස 17 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල V, VI, VII, VIII, IX, X, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXI යන අතුරු ව්‍යවස්ථා ද අංක 541/17 දරන 1989 ජනවාරි 20 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල XIV, XXVII, XXVIII යන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව මෙහි පහත උපලේඛනයේ I වන කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් 2023 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා හම්බන්තොට මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා ගෙන් බලපත්‍රයක් ලබාගත යුතු බවත් එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන් ම, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම පහත සඳහන් උපලේඛනයේ 2 වන කොටසේ 1 වන තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වන තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 (අ) වන වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, 2023 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

1 වැනි කොටස

1. මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
2. මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
3. සිසිල් බීම කර්මාන්ත ශාලා ස්ථානයක් පවත්වාගෙන යාම
4. කොණ්ඩා සැකසීම, බාබර් සාප්පු, සැලුන් හා රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
5. බේකරියක් පවත්වාගෙන යාම
6. කිරිපට්ටියක් පවත්වාගෙන යාම
7. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
8. බත් කඩ, ආපන ශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම
9. හෝටලයක් පවත්වාගෙන යාම
10. නවාතැන් පොලක් පවත්වාගෙන යාම
11. ලොන්ඩරියක් පවත්වාගෙන යාම
12. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
13. අවමංගල්‍ය සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14. ඌරන් ආදී සතුන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්ය සඳහා පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. මිනිරන් වර්ග කිරීම හා සකස් කිරීම.
2. මිනිරන් ගබඩාකර තැබීම.
3. පොහොර නිෂ්පාදනය.
4. පොහොර ගබඩාකර තබා ගැනීම
5. හම් ගබඩා කර තැබීම.
6. උම්බලකඩ හොන්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම
7. කුකුළු වෙළෙඳපොළක් පවත්වාගෙන යාම.
8. කළුගල් කැඩීම සහ කබොක් කැපීම.
9. බොරලු හැරීම.
10. අශ්වයන් හෝ ගවයන් සඳහා ඉස්තාලයක්, වෙළෙඳපොළක්, ගාලක් හෝ ලැයිමක් තබා ගැනීම.
11. පශු ගිලන් හලක් පවත්වාගෙන යාම.
12. රබර් සකස් කිරීම
13. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම, අලුත්වැඩියා කිරීම හෝ ඒවායේ දූලි ඉවත් කිරීම
14. පුවක් සකස් කිරීම.
15. තලාතු මිනිරන් සකස් කිරීම.
16. බැටළුවන් හෝ එළුවන් හෝ දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල්කොට තැබීම සඳහා වූ මඩුවක් හෝ ගාලක් තබා ගැනීම
17. උළු කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
18. හුණු ගබඩා කොට තැබීම.
19. බොම්බයි ලූණු හොණ්ඩර 05කට වඩා ගබඩා කොට තැබීම
20. අර්තාපල් හොණ්ඩර 05කට වඩා ගබඩාකොට තැබීම.
21. පොල්කටු අඟුරු හොණ්ඩරයකට වඩා ගබඩා කොට තැබීම.
22. කුරුඳු, කරදමුංගු හෝ කෙඳි, ගෙන්දගම් දුම් ගස්සා සකස් කිරීම.
23. පරණ ලෝහ ගබඩා කර තැබීම.
24. සිමෙන්ති හොණ්ඩර 25කට වඩා ගබඩාකර තැබීම.
25. කරවල හොණ්ඩර 10කට වඩා ගබඩාකර තැබීම.
26. ලුණු දැමූ මාළු හොණ්ඩර 10කට වඩා ගබඩාකර තැබීම.
27. රබර් ඔට්ටපාලු සුන්බුන් ඇඹරීම හෝ වේලීම.
28. ට්‍රංක් පෙට්ටි නිෂ්පාදනය.
29. මරා සකස් කරන ලද කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම.

30. ගම් වර්ග නිෂ්පාදනය.
31. විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය.
32. බැටරි පුරවනු ලබන්නාවූ හෝ බැටරි ගබඩා කොට තබනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම.
33. ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නා වූ හෝ කට්ට කැපීම කරන්නාවූ ආයතනයක් පවත්වාගෙන යාම.
34. ටයර් හෝ ට්‍යුබ් වෝල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
35. හිස් බෝතල් 100 කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
36. කුරුඳු පොතු හොඬරයකට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
37. කොකෝවා හොඬර 10කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
38. මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කොට තැබීම
39. ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කොට තැබීම
40. මැණික් වෙළෙන්දන් විසින් මැණික් කැපීම හා ඔපදැමීම.
41. බලපත්‍ර ලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කොට තැබීම.
42. වේවැල් බඩු සෑදීම හෝ ගබඩා කොට තැබීම
43. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කොට තැබීම.
44. යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
45. පිටි හෝ කුළු බඩු ඇඹරීම.
46. පුන්නක්කු හැර සත්ව ආහාර හොඬර 20කට වඩා ගබඩාකර තැබීම.
47. සත්ව ආහාර හැර වෙනත් කාර්යයන් සඳහා ධාන්‍ය ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම, එහෙත් සමුපකාර සමිතියක් විසින් ගබඩා කොට තබා ගන්නා එවැනි ධාන්‍ය මෙම නියමයට යටත් නොවේ.
48. රබර් භාණ්ඩ නිෂ්පාදනය.
49. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කොට තැබීම.
50. යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹරීම.
51. පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
52. පොලිතින් සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය සහ ගබඩා කර තැබීම.
53. ඇසිඩ් ගැළුම් 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
54. කපුරු නිෂ්පාදනය.
55. බූට් සපත්තු සහ පාවහන් නිෂ්පාදනය.
56. ඉටිපන්දම් නිෂ්පාදනය.

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය) මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්යය සඳහා අන්තරාදායක කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. වාෂ්ප, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දුව හෝ ලී ඉරීම.
2. සිසිල් බීම නිෂ්පාදනය.
3. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම.
4. යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිෂ්පාදනය.
5. යන්ත්‍රානුසාරයෙන් තල තෙල් නිෂ්පාදනය.
6. තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත් මෝල්ක් තබා ගැනීම.
7. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කොට තැබීම
8. ගිනි පෙට්ටි නිෂ්පාදනය.
9. ඉඹුල් පුළුන් ගබඩා කොට තැබීම.
10. පොල් තෙල් ගැලුම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
11. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කොට තැබීම.
12. ඇසිටලීන් නිෂ්පාදනය.
13. උළු 500කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
14. ගඩොල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
15. කබොක් ගල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
16. සිගරට් නිෂ්පාදනය.
17. බීඩි නිෂ්පාදනය.
18. තීන්ත හෝ වාර්නිෂ් හොන්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
19. ලී පෙට්ටි හොඬර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
20. කොහු නිෂ්පාදනය.
21. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි හැර වෙනත් ගෝනි 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.

22. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
23. රසකැවිලි නිෂ්පාදනය.
24. පොල් කටු අඟුරු හැර වෙනත් අඟුරු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
25. බෝට්ටු හෝ බත්තල් සෑදීම.
26. ලී පෙට්ටි සෑදීම.
27. ඔක්සිජන් හා වෑල්ඩිං වැඩ කරනු ලබන්නා වූ ද මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
28. මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
29. මෝටර් වාහන අලුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම.
30. මෝටර් වාහන සර්විස් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
31. යාන්ත්‍රික බලය යොදා ගනු ලබන්නා වූ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
32. අතින් හෝ පා පොලුවලින් ක්‍රියා කරවන යන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
33. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තැබීම.
34. පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
35. ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු කිලෝග්‍රෑම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
36. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය.
37. 100කට අධික ප්‍රමාණයක් පතොරම් ගබඩාකර තැබීම.
38. කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය සහ/හෝ ගබඩාකර තැබීම.
39. අලුත් ටයර් හෝ ටියුබ් 150කට අධික ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
40. පාවිච්චි කළ කඩදාසි කිලෝග්‍රෑම් 250කට අධික ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
41. ස්ප්‍රේ පේන්ටිං වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
42. යාන්ත්‍රික ශීතකරණය සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
43. යාන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන්නා වූ ඇඳුම් මැසීම කරනු ලබන්නා වූ ද ආයතනයක් පවත්වාගෙන යාම.
44. කමීස කොලර් සහ කමීස අත් රැළි දමන ආයතනයක් පවත්වාගෙන යාම.

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය) මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්ය සඳහා අන්තරාදායක සහ පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. ඩ්‍රයික්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම.
2. යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ, ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම හෝ තඹ ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම.
3. යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නා වූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද ආයතනයක් පවත්වාගෙන යාම.
4. ගල් අඟුරු ගෑස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම.
5. කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය.
6. අශුද්ධ ලෝහ උණු කිරීම.
7. ගිණිකෙළි භාණ්ඩ ගබඩා කිරීම.
8. කිලෝග්‍රෑම් 2කට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම.
9. ගම්, ඉටි හෝ දුම්මල (රෙසින්) ගබඩා කිරීම.
10. බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය.
11. තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
12. ශීතකරණ අලුත්වැඩියා කිරීම, ඊකන්ඩිෂන් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
13. මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
14. ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
15. පුපුරන ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
16. ගල් කොරියක් පවත්වාගෙන යාම.
17. ගල් මෝලක් පවත්වාගෙන යාම.

18. ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම.

උපලේඛනය

2 වැනි කොටස

	I වැනි තීරුව *වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *බලපත්‍ර ගාස්තුව* *රු. ශත*
1.	රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	2,000 0
2.	රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට	3,000 0
3.	රු. 2,500 ඉක්මවන විට	5,000 0

ඉහත 1 වන කොටසේ සඳහන් කර්මාන්ත අතරින් කිසියම් හෝටලයක් ආපන ශාලාවක් නවාතැන් පොළක් 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද වන අවස්ථාවක, ඉහත 2 වැනි කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පොළෙහි 2022 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතු ය.

12-455/2

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 ආ වන වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නා වූ මෙහි පහත උපලේඛනයේ 1 වන කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ 2 වන කොටසේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක එහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙක්ම, එකී කර්මාන්ත බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''.

උපලේඛනය

1 වන කොටස

1. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
2. පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

3. වාස්තු වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
4. ලී කැටයම් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
5. වානේ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය හා අළුත්වැඩියාව.
6. කොසු, ඉදල්, බුරුසු ආදී නිෂ්පාදනය.
7. පැන්ට්‍රි කබඩ් හා ඇලුමිනියම් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
8. වීදුරු ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
9. විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
10. ජංගම දුරකථන අළුත්වැඩියාව කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
11. පරිගණක යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
12. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
13. ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14. මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
15. රෙදි විවීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
16. රූපවාහිනී යන්ත්‍ර හා ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
17. පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
18. රෙදි පින්තාරු කිරීමේ හෝ බතික් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
19. බ්‍රේක් ලයිනර් ඇලවීමේ හා සවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
20. ඡායාරූප, දළ සේයාපට සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. විකිණීම සඳහා බිම්මල් වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
22. විදුලි කර්මාන්ත වැඩපලක් පවත්වාගෙන යාම.
23. සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
24. කුෂන් කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම.
25. බ්ලොක් ගල් නිෂ්පාදනය සහ විකිණීම
26. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම.
27. කොන්ක්‍රීට් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම
28. වාහන සඳහා ටින්කරින් ටින්ටඩ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

උපලේඛනය

2 වැනි කොටස

	I වැනි තීරුව *වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද*
		රු. ශත
1.	රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	2,000 0
2.	රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට	3,000 0
3.	රු. 2,500 ඉක්මවන විට	5,000 0

12-455/3

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,

හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 (ඇ) වන වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී අඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී ආඥාපනතේ 247 (අ) වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ ද හා වෘත්තියක් නොවන්නා වූ ද මෙහි පහත උපලේඛනයේ 1 වැනි කොටසේ සඳහන් කිසියම් ව්‍යාපාරයක් හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 2 වැනි කොටසේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වැනි තීරයේ අනුරූප සටහනෙ හි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක් ම, එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

උපලේඛනය

1 වැනි කොටස

1. කිරි පිටි, බිස්කට් වර්ග, රස කැවිලි හා ආහාරයට ගන්නා ද්‍රව්‍ය ගබඩාකර තැබීම, විකිණීම, බෙදාහැරීම හා අලෙවි නියෝජිත කටයුතු සිදු කරනු ලබන ආයතන.
2. සබන් හා එදිනෙදා භාවිතයට ගන්නා සනීපාරක්ෂක ද්‍රව්‍ය ගබඩා කර තැබීම, විකිණීම, බෙදහැරීම හා අලෙවි නියෝජිත කටයුතු සිදු කරන ආයතන.
3. කෘෂි රසායන හා කෘෂිකාර්මික උපකරණ ගබඩාකර තැබීම, විකිණීම, බෙදහැරීම හා අලෙවි නියෝජිත කටයුතු සිදු කරන ආයතන.
4. වෙළෙඳ ප්‍රචාරණ හා පුවත්පත් දැන්වීම් පළ කිරීම සිදුකරන ආයතනයක් පවත්වාගෙන යාම.
5. මෝටර් රථ කුළියට ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
6. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
7. දුරකථන ඇමතුම් ලබාදීම, දුරකථන කාඩ්පත් අලෙවිය, ජංගම දුරකතන අලෙවිය හා සන්නිවේදන සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
8. දුරකථන සමාගම්වල ශාඛා හා නියෝජිත ආයතන පවත්වාගෙන යාම.
9. කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
10. රියැදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම.
11. උත්සව භාණ්ඩ බදුදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
12. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
13. උපස්ථායක සේවා ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
15. ක්‍රීඩා උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
16. උත්සව ශාලා බදු දීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
17. පෞද්ගලික ආරක්ෂණ සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
18. ගණකාධිකාරී සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
19. විදේශ මුදල් හුවමාරු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
20. බැංකු සේවා හා උකස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
21. ලීසිං හා ෆිනෑන්ස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම, කොටස් වෙළෙඳපොළ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
22. ඉඩම් හා ගොඩනැගිලි විකිණීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
23. විදේශ ගුවන් ප්‍රවේශපත් අලෙවි කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
24. නිවාස සැළසුම් හා ගොඩනැගිලි ඉදිකිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
25. ගුවන් හෝ නැව් භාණ්ඩ නිෂ්කාශන සේවා සපයනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම.
26. රථවාහන තත්ත්ව සහතික ලබාදීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
27. ලුණු පැකට් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
28. ස්වර්ණාභරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
29. ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
30. විදුලි උපකරණ හා ඉලෙක්ට්‍රොනික උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
31. නිමි ඇඳුම් හා රෙදිපිළි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
32. සිල්ලර හා තොග වෙළෙඳාම සිදුකරන ස්ථානයක් පවත්වාගෙන යාම.

33. ෆාමසියක් පවත්වාගෙන යාම.
34. තෑගි භාණ්ඩ, විසිතුරු භාණ්ඩ, ළදරු භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
35. ගොඩනැගිලි ඉදිකිරීමේ අමුද්‍රව්‍ය හා උපකරණ ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
36. පුවත්පත් හා සඟරා අලෙවි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
37. පොත් පත් හා ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
38. පාවහන් හා සම්භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
39. ලියාපදිංචි කළ හා නොකළ වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
40. කෘෂිකාර්මික උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
41. ලිහිසි තෙල් හා ග්‍රීස් ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
42. ගෑස් ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
43. කෘෂි රසායන ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
44. දේශීය බෙහෙත් බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
45. යකඩ, ඇළුමිනියම්, පීවීසී, තීන්ත යනාදිය ගඩබා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
46. දේශීය හා විදේශීය මත් පැන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හා නීතීඥවරයෙකු වශයෙන් කටයුතු කිරීම
48. මුදල් අය කරන පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
49. පෞද්ගලික බටහිර වෛද්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම
50. පෞදගලික ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
51. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
52. දුරකථන හා රූපවාහිනී සේවා සම්ප්‍රේෂණාගාර කුළුණු පවත්වාගෙන යාම
53. සාප්පු බඩු වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. ස්වර්ණාභරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. ආයුර්වේද බෙහෙත් බඩු වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
56. ලිපිද්‍රව්‍ය, පොත්පත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. ඇස් කණ්ණාඩි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. ඔරලෝසු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. තුරඟ තරග ක්‍රීඩා පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. ධීවර ආම්පන්න අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63. ෆ්ලෝටයිල්, වෝල් ටයිල් හා විවිධ සෙරමික් භාණ්ඩ අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. සුරතල් මසුන් ඇති කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. පරිගණක යන්ත්‍ර හා අමතර කොටස් අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
67. විවිධ භාණ්ඩ බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (කුරියර් සර්විස්)
68. යතුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70. මිනිස් ශ්‍රමය සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම
71. පානය සඳහා ජලය පිරිසිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

උපලේඛනය

2 වැනි කොටස

	I වැනි තීරුව *බද්ද අදළ වන වර්ෂයට පෙර වර්ෂයේ දී ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
(1)	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
(2)	රු. 6,001 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
(3)	රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
(4)	රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
(5)	රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1200 0
(6)	රු. 1,50,001 ඉක්මවන විට	3,000 0

12-455/4

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අයකිරීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අයකිරීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"252 වන අධිකාරය වන මහා නගර සභා අඥා පනතේ 267 (27) වන වගන්තිය ප්‍රකාරව, මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, හම්බන්තොට මහා නගර සභාව විසින් වැළඳගෙන ඇති අංක 541/17 හා 1989 ජනවාරි 20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ ''ප්‍රචාරක දැන්වීම්'' අතුරු ව්‍යවස්ථාව යටතේ හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ යම් වීථියකට, පාරකට, මාවතකට, ඇළකට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර දැන්වීම් පුවරු, බැනර්, කටවුට් හා බිත්තිවල පින්තාරු කර ඇති දැන්වීම් වෙනුවෙන් පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් වර්ගයේ ප්‍රදර්ශනයන් වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක ගාස්තු පනවා අයකිරීමටත්, හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නී ය.".

I තීරුව	*II තීරුව*		
දැන්වීම් වර්ගය	*වර්ග අඩියක් සඳහා අයකිරීම*		
	සතියක්	*මාසයක්*	*වර්ෂයක්*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
බැනර් (රාමු නොකරන ලද රෙදි දැන්වීම් ලද)	40 0	50 0	100 0
කටවුට් (රාමු කරන ලද රෙදි දැන්වීම් ලද)	40 0	50 0	100 0
ස්ථිර දැන්වීම් පුවරු		50 0	200 0
බිත්ති පින්තාරු		50 0	200 0
ආලෝක විමෝචක දියෝඩ නාම පුවරු			1,600 0

නගර සභාව මගින් ඉවත් කරනු ලබන දැන්වීම් පුවරුවක් නැවත ලබා දීම සඳහා පහත ගාස්තු අය කරනු ලැබේ :

	රු. ශත
එක් බැනරයක් හෝ කටවුටයක් සඳහා	100 0
එක් ස්ථාවර දැන්වීම් පුවරුවක් සඳහා	6,000 0

12-455/5

හම්බන්තොට මහා නගර සභාව

ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟ දැක්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟ දැක්වීම් පිළිබඳ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,

හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 541/17 දරන 1989 ජනවාරි 20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ XXXI වන කොටසේ "ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග සහ රඟ දැක්වීම්" පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3 වැනි වගන්තිය යටතේ හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, පහත උපලේඛනයේ නිරූපිත ප්‍රමාණයක ගාස්තු පනවා අයකිරීමටත්, හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නී ය".

	බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂිත ස්ථානයේ වර්ග ප්‍රමාණය	එක් එක් දිනයක් සඳහා රු. ශත
(අ)	වර්ග මීටර් 93 ක් නොඉක්මවන්නේ නම්	1,500 0
(ආ)	වර්ග මීටර් 93 ක් ඉක්මවන එහෙත් වර්ග මීටර් 186 ක් නොඉක්මවන විට	1,750 0
(ඇ)	වර්ග මීටර් 186 ක් ඉක්මවන එහෙත් වර්ග මීටර් 279 ක් නොඉක්මවන විට	2,000 0
(ඈ)	වර්ග මීටර් 279 ක් ඉක්මවන එහෙත් වර්ග මීටර් 465 ක් නොඉක්මවන විට	2,250 0
(ඉ)	වර්ග මීටර් 465 ක් ඉක්මවන විට	3,000 0

12-455/6

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2023 වර්ෂයේ ඔක්තෝම්බර් මස 10 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"267 වන අධිකාරය වන විනේද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, හම්බන්තොට මහා නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට (චිත්‍රපට සංදර්ශනයක්, සර්කස් සංදර්ශනයක්, මැජික් සංදර්ශනයක්, ගායනයක්, සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක් හෝ මුදල් අයකරමින් පවත්වාගෙන යන සක්‍රිය කටයුත්තක්) වෙනුවෙන්, ඒ වෙනුවෙන් නිකුත් කරනු ලබන ටිකට් පත්වල වටිනාකමෙන් 5% ක විනෝද බද්දක් පනවා අය කළයුතු යැයි ද, මෙම යෝජනාව 2023 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද යෝජනා කරන්නී ය. එසේම ඉහත පවරන ලද විනෝද බද්ද එකී විනෝද කාර්ය පැවැත්වීමට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරුන් විසින් නිසි ලෙස හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් හම්බන්තොට මහා නගර සභාව වැඩිදුරටත් යෝජනා කරන්නී ය.".

උපලේඛනය

මීට අමතරව චිත්‍රපට සංදර්ශනයක් (චිත්‍රපට ශාලා අයත් නොවේ) සර්කස් සංදර්ශනයක්, මැජික් සංදර්ශනයක්, ගායනයක්, සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක්, වේදිකා නාට්‍යයක් හෝ මුදල් අයකරමින් පවත්වාගෙන යන ක්‍රීඩා කටයුත්තක් වෙනුවෙන් පහත පරිදි සංදර්ශන බලපත්‍ර ගාස්තු අයවිය යුතු අතර, වැඩිවන සෑම දිනක් සඳහාම රු. 100 ක අමතර ගාස්තුවක් අයකරනු ලැබේ.

		ගාස්තුව රු. ශත
01.	චිත්‍රපට සංදර්ශනයක් (චිත්‍රපට ශාලා අයත් නොවේ), සර්කස් සංදර්ශනයක්, මැජික් සංදර්ශනයක්, වේදිකා නාට්‍ය කටයුත්තක්	2,000 0
02.	සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක්, මුදල් අයකරමින් පවත්වාගෙන යන ක්‍රීඩා කටයුත්තක්.	2,500 0

12-455/7

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා හම්බන්තොට මහා නගර සභාව සතු බිම් තාවකාලික වෙළෙඳ කටයුත්තක් සඳහා බදු දීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා මහා නගර සභාව සතු බිම් තාවකාලිකව වෙළෙඳ කටයුතු වෙනුවෙන් බදු දීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 අධිකාරය දරන මහා නගර සභා ආඥාපනතෙන් මහා නගර සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ පහත උපලේඛනයේ ඇති පරිදි මහා නගර සභාව සතු භූමි තාවකාලිකව බදු දීමේ ගාස්තු පනවා අයකිරීමටත්, හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නී ය''.

උපලේඛනය

	රු. ශත
වර්ග අඩි 01ක්	20 0
වෙළඳ ප්‍රවර්ධන ප්‍රචාරක කුඩා ලොරි රථයක් සඳහා	2,000 0
වෙළඳ ප්‍රවර්ධන ප්‍රචාරක මධ්‍යම ප්‍රමාණයේ ලොරි රථයක් සඳහා	2,500 0
වෙළඳ ප්‍රවර්ධන ප්‍රචාරක විශාල ප්‍රමාණයේ ලොරි රථයක් සඳහා	3,000 0

12 - 455/8

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,

හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 අධිකාරය වන මහා නගර සභා පනතේ 247 ඉ (1) හා (2) වගන්තිවලින් මහා නගර සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ යම් ඉඩමක් හිමිකරු විසින්, තැරැව්කරුවෙකු විසින්, වෙන්දේසිකරුවෙකු විසින්, ඔවුන්ගේ නියෝජිතයෙකු හෝ සේවකයෙකු විසින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකුණනු ලබන මුදලින් 1% ක මුදලක් ඉඩම විකුණනු ලබන පාර්ශ්වය විසින් හම්බන්තොට මහා නගර සභාව වෙත ගෙවිය යුතු බව හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නී ය.''

12 - 455/9

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 247ඈ වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි කිසියම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැනහොන් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක, එවැනි යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක ; හෝ

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම පහක (0.5%) ක වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු යයි විධාන කිරීමටත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

12-455/10

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා පුස්තකාල ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා පුස්තකාල ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2019 ඔක්තෝබර් මස 10 වැනි දින,

හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 541/17 දරන 1989 ජනවාරි 20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 'පුස්තකාල' පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 7 වන සහ 12 වන වගන්තිවලට අනුව හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී 7 වන අතුරු ව්‍යවස්ථාවේ (1) (ඇ) වන ඡේදයේ සඳහන් තැන්පත් මුදල.

පුස්තකාල ගාස්තු :

	රු. ශත
සාමාජික අයදුම්පත් ගාස්තු	50 0
වැඩිහිටි සාමාජික ගාස්තු	150 0
වැඩිහිටි අලුත් කිරීම්	100 0
වැඩිහිටි අනුපිටපත් සාමාජික ගාස්තු	100 0
ළමා සාමාජික ගාස්තු	100 0
ළමා අලුත් කිරීම්	50 0
ළමා අනුපිටපත් සාමාජික ගාස්තු	50 0
එක් දිනක් වෙනුවෙන් දඩ මුදල (එක් පොතකට)	3 0
අන්තර්ජාල ගාස්තු	
1. පළමු පැයට	50 0
2. විනාඩි 30න් සඳහා	40 0
ඡායා පිටපත් ගාස්තු	
1. එක් පැත්තක් සඳහා	8 0
2. දෙපැත්ත සඳහා	15 0

විය යුතුය යන්න සහ මෙම තීරණය 2023 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

12 - 455/11

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරන පහත සඳහන් සේවා සහ වෙනත් අනුෂංගික කාර්යයන් ඉටු කිරීමේ දී මහා නගර සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය

යුතු බවත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

උපලේඛනය

අනු. අංකය	*සේවාව*	*ගාස්තුව රු. ශත*
01	ඔප්පු සාරංශ අයදුම්පත්	400 0
02	ඔප්පු සාරාංශයක් ලියාපදිංචි කිරීම	300 0
03	අතිරේක තක්සේරු දැන්වීමක් නිකුත් කිරීම	450 0
04	වරිපනම් සහතිකයක් නිකුත් කිරීම	750 0
05	මෘත දේහයක් භූමදනය සඳහා	150 0
06	භෂ්මාවශේෂ තැන්පත් කිරීම	100 0
07	රජයේ ශල්‍යාගාරවලින් ඉවත් කරන මෘතදේහ කොටස් මිහිදන් කිරීම	750 0
08	ආදාහනාගාරයක් රහිත සුසාන භූමියක සිහිවටන ඵලකයක් සඳහා	3,600 0
09	නගරය තුළ හා පොදු ස්ථානවල ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය (දිනකට)	800 0
10	ගුවන් යානයක් මහා නගර සභාව සතු ක්‍රීඩා භූමියකට ගොඩබැස්වීම සඳහා	7,500 0
11	මහජන පුස්තකාලයේ ඉහළ මහලේ ශාලාව බදු දීම (දිනකට)	4,500 0
12	පරිපාලන සංකීර්ණය අසල පුස්තකාල ගොඩනැගිල්ලෙහි රැස්වීම් ශාලාව බදු දීම දිනකට ගාස්තු වායු සමීකරණ පහසුකම් සහිතව	15,000 0
	පැයක් සඳහා	5,000 0
13	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තු	750 0
14	කොම්පෝස්ට් පොහොර (කි.ග්‍රෑ.1)	20 0

12 - 455/12

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා සේවා ගාස්තු හා වෙනත් ආදායම් ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා සේවා ගාස්තු හා වෙනත් ආදායම් ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

" හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරන පහත සඳහන් සේවා සහ වෙනත් අනුෂංගික කාර්යයන් ඉටු කිරීමේ දී මහා නගර සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය. "

සේවා සඳහා අය කරන ගාස්තු හා වෙනත් ආදායම් :

	වාහනය	*විස්තරය*	*ගාස්තුව රු. ශත*
01	බස් රථය	දිනකට කි.මී. 300 දක්වා (සභාවෙන් ඉන්ධන සපයා)	65,530 0
		වැඩිවන කි.මී. 01 ක් සඳහා	288 0
		කි.මී. 300 දක්වා (ඉල්ලුම්කරු ඉන්ධන සපයා)	29,000 0
		වැඩිවන කි.මී. 01 ක් සඳහා	97 0
		කි.මී. 100 සඳහා කෙටිදුර ධාවනය	22,000 0
		කි.මී. 50 සඳහා කෙටිදුර ධාවනය	11,000 0
		වැඩිවන කි.මී. 01 ක් සඳහා	288 0
02	ගලි රථය	ලීටර් 1800	8,970 0
		අමතර බවුසර් 1 ක් සඳහා	4,256 0
		ධාවන දුර කි.මී. 01	200 0
		ලීටර් 4000	11,172 0
		අමතර බවුසර් 1ක් සඳහා	7,400 0
		ධාවන දුර මීටර් පැය 01ක් සඳහා	2,290 0
		ගලි රථය සේවා ස්ථානය වෙත පැමිණීමෙන් පසු සේවා ලාභියාගේ පාර්ශවයේ ගැටළු හේතුවෙන් සේවය ලබා දීමට නොහැකි වූ අවස්ථාවක දී නැවත මුදල් නිකුත් කිරීමේ දී සේවා ගාස්තු ලෙස රු.1000.00 ක් සහ එම ස්ථානය වෙත යාමට සහ ඒමට දුර සඳහා වැය වන මුදල් අය කර ඉතිරි මුදල් ගෙවීමට කටයුතු කරනු ලැබේ.	
03	බැක්හෝ යන්ත්‍රය	මීටර් පැය 01 ක් සඳහා (යාමට හා ඒමට මීටර් පැය ගණනය කරනු ලැබේ)	6,850 0
04	මෝටර් ග්‍රේඩරය	මීටර් පැය 01 ක් සඳහා (යාමට හා ඒමට මීටර් පැය ගණනය කරනු ලැබේ)	8,800 0
05	ටිපර් රථය	අවම ගාස්තු (උපරිම දුර කි.මී. 10)	7,320 0
		වැඩිවන කි.මී. 01 ක් සඳහා	288 0
06	චතුර බවුසරය	ලීටර් 6000 බවුසරය එක් ගමන් වාරයක් සඳහා කි.මී. 30 ක උපරිම ධාවන දුරක් සඳහා (රඳවාගැනීමේ කාලය පැය 08 කි)	16,450 0
		ලීටර් 6000 බවුසරය එක් ගමන් වාරයක් සඳහා කි.මී. 10 ක උපරිම ධාවන දුරක් සඳහා (රඳවාගැනීමේ කාලය පැය 03 කි)	6,240 0
		වැඩිවන සෑම කි.මී. 01කටම	288 0
		ලීටර් 4000 බවුසරය (එක් ගමන් වාරයක් සඳහා මීටර් පැය 03 උපරිම ධාවන දුරක් සඳහා) (රඳවාගැනීමේ කාලය පැය 08කි)	13,000 0
		ලීටර් 4000 බවුසරය (එක් ගමන් වාරයක් සඳහා මීටර් පැය 01 උපරිම ධාවන දුරක් සඳහා) (රඳවාගැනීමේ කාලය පැය 03කි)	5,000 0
		වැඩිවන සෑම මී.පැ 01 ක් සඳහා	2,290 0
07	ට්‍රැක්ටර් රථ	කම්කරුවන් රහිතව ගමන් වාර 01 කට (උපරිම මීටර් පැය 01ක් වාහනය රඳවාගත හැකි උපරිම කාලය පැය 02 කි.)	3,465 0
		වැඩි වන සෑම මීටර් පැය 01 ක් සඳහා	2,290 0
08	කම්පැක්ටර් රථය	ගමන් වාරයක් සඳහා (උපරිම දුර කි.මී. 10 කි) (කම්කරුවන් දෙදෙනෙකු සමඟ, කසළ ගාස්තුව රහිතව)	8,670 0
		වැඩිවන කි.මී. 01 ක් සඳහා	288 0

(ඉහත සඳහන් ගාස්තුවලට අමතරව එකතු කළ අගය මත බදු හා ජා.ගොා. බදු එකතු විය යුතු ය)

	විස්තරය	*ගාස්තුව (රු.ශ.)*
01	අනතුරුදායක ගස් විමර්ෂණ අයදුම්පත්‍ර ගාස්තු	1,000 0
02	ගොඩනැගිලි සැලසුම් අයදුම්පත්‍ර ගාස්තු	1,000 0
03	ඉඩම් අනුබෙදුම් අයදුම්පත්‍ර ගාස්තුව	600 0
04	විටී රේඛා සහ නොපවරා ගැනීමේ සහතිකපත්‍ර ගාස්තු	1,000 0
	- පරීක්ෂණ ගාස්තු (කි.මී. 1ට)	60 0
05	දීර්ඝකාලීන බදු සඳහා පරීක්ෂණ ගාස්තු	1,000 0
06	ජලනල එළීම සඳහා මාර්ග පළුදු කිරීම පරීක්ෂණ ගාස්තු (කි.මී. 1ට)	60 0
	- තැන්පත් මුදල	3,000 0
07	මාර්ග පළුදු කිරීම සඳහා අය කරන මුදල, ඊට අදාළ ඇස්තමේන්තුව හා මිල ගණන් අනුව තීරණය වේ.	-

පෙරසැරි ගාස්තු :

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*පෙරසැරි ගාස්තුව*	
ඉඩම් අනුබෙදුම් කිරීම	ඉඩමේ ප්‍රමාණය	ගාස්තුව
	ච.මී. 150 - 300	කැබලි 1 ක් සඳහා රු.1000.00
	ච.මී. 301 - 600	කැබලි 1 ක් සඳහා රු. 800.00
	ච.මී. 601 - 900	කැබලි 1 ක් සඳහා රු.600.00
	ච.මී. 900 වැඩි	කැබලි 1 ක් සඳහා රු. 500.00
මායිම් තාප්ප/ රැඳවුම් බැම් ඉදිකිරීම (ගොඩනැගිලි සීමාවෙන් පිටත)	දික් මීටර් 1 ක් සඳහා	රු. 100.00
(ගොඩනැගිලි සීමාව තුළ)		
සංනිවේදන කුළුණු/ ඇන්ටනා කුළුණු/ සම්ප්‍රේෂණ කුළුණු සඳහා	රු. 40,000.00	

ගොඩනැගිලි ඉදිකිරීම/ පවත්නා ගොඩනැගිලිවලට අළුතින් කොටසක් එකතු කිරීම/ නැවත ඉදිකිරීම

පෙරසැරි ගාස්තුව			
ගෙබිමේ විශාලත්වය (ව.මී.)	*නේවාසික (ව.මී. 01කට)*		*නේවාසික නොවන (ව.මී. 1 කට)*
	තනි පුද්ගල	*මහල් නිවාස*	
400 දක්වා	රු. 20.00	රු. 25.00	රු. 25.00
401-1000	රු. 22.00	රු. 27.00	රු. 27.00
1001-1500	රු. 25.00	රු. 30.00	රු. 30.00
1501-2000	රු. 25.00	රු. 32.00	රු. 32.00
2000 ට වැඩි	වැඩිවන සෑම ච.මී. 90 ක් සඳහාම රු. 2000.00 බැගින්	වැඩිවන සෑම ච.මී. 90 ක් සඳහාම රු. 2000.00 බැගින්	වැඩිවන සෑම ච.මී. 90 ක් සඳහාම රු. 2000.00 බැගින්

ආවරණ අනුමැතිය ලබා දීම :

සංවර්ධන කාර්යයේ ස්වාභාවය	*නව පෙරසැරි ගාස්තුව*	
01. නිසි බලපත්‍රයක් නොමැතිව ඉඩම් අනුබෙදුම් කිරීම	ඉඩම් කැබලි 01 ක් සඳහා රු. 3000.00	
02. අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදි කිරීම/ එකතු කිරීම/ නැවත ඉදි කිරීම	නේවාසික (ව.මී. 01කට)	නේවාසික නොවන (ව.මී. 01 කට)
i. අත්තිවාරම වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම සඳහා)	රු. 200 0	රු. 500 0
ii. වහල මට්ටම දක්වා (වහල හැර) ඉදිකොට ඇති විට	රු. 300 0	රු. 1,000 0
iii. වහළ ඇතුළුව ඉදිකොට ඇති විට	රු. 400 0	රු. 1,500 0
සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	රු. 500 0	රු. 2,000 0
iv. මායිම් තාප්ප/ ආරක්ෂක බැමි ඉදිකොට ඇති විට	රු. 200 0 (දික් මීටර් 01 ක් සඳහා)	රු. 500 0 (දික් මීටර් 01 ක් සඳහා)
දුරකථන/ විදුලි සංදේශ කුළුණු	බිම් පාදම ඉදි කිරීම රු. 150,000.00 වහළ මුදුන ඉදි කිරීම රු. 100,000.00	
v. අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම/ භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම	එක් දිනකට රු. 100.00 බැගින්	

සංවර්ධන කාර්යයේ ස්වාභාවය	*නව පෙරසැරි ගාස්තුව*		
01. ඉඩම් අනුබෙදුම් කිරීම	එක් කැබැල්ලකට රු. 1000.00		
02. නේවාසික ගොඩනැගිලි ඉදිකිරීම්	*ගෙබිමේ ප්‍රමාණය (ව.මී.)*	*තනි පුද්ගල*	*මහල් නිවාස*
	ව.මී. 400 දක්වා	රු. 4,000.00	රු. 5,000.00
	ව.මී. 400 ට වැඩි	රු. 4,000.00 + ව.මී. 400 ට වැඩි වන සෑම ව.මී. 01 කට හෝ කොටසකට රු. 15.00 බැගින්	රු. 5,000.00 + ව.මී. 400ට වැඩිවන සෑම ව.මී. 01 කට හෝ කොටසකට රු. 20.00 බැගින්
03. නේවාසික නොවන ගොඩනැගිලි ඉදිකිරීම්	ව.මී. 400 දක්වා	රු. 5,000.00	
	ව.මී. 400ට වැඩි	රු. 5,000 + ව.මී. 400ට වැඩි වන සෑම ව.මී. 01 කට හෝ කොටසකට රු. 25.00 බැගින්	
04. මායිම් තාප්ප හා රැඳවුම් බැමි	දික් මීටර් 01 කට රු. 25.00 බැගින්		
05. දුරකථන/ විදුලි සංදේශ කුළුණු	රු. 5,000.00		
ස්ථානීය පරීක්ෂාව සඳහා ප්‍රවාහන ගාස්තු			පෙරසැරි ගාස්තුව
			කි. මී. 01 ක් සඳහා රු. 50.00

12-455/13

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා ක්‍රීඩාපිටි සහ ක්‍රීඩා මණ්ඩපය වෙන් කිරීමේ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩා මණ්ඩපය වෙන් කිරීමේ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2023 වර්ෂයේ ඔක්තෝම්බර් මස 10 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී හම්බන්තොට මහා නගර සභාව සතු ක්‍රීඩාපිටි හා ක්‍රීඩාංගණ වෙන් කිරීමේ ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම වෙන්කිරීමේ ගාස්තු අයකිරීම 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

උපලේඛනය

ක්‍රීඩාංගණ ගාස්තු අය කිරීම :

අංකය	*විස්තරය*	*ආරක්ෂිත ඇප* *රු.*	*ගාස්තු* *රු.*	*වැඩිවන එක් දිනක් සඳහා අයකිරීම* *රු.*
01	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාංගනය මුදල් අයකරනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	20,000	9,000	3,000
02	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාංගනය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	6,000	1,000	300
03	ක්‍රීඩාගාරය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයක් වෙළඳ ප්‍රචාරණය සඳහා යොදගනු ලබන්නේ නම් එක් දිනකට	6,000	3,000	1,500
04	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශය පෞද්ගලික ආයතනයක් හෝ රාජ්‍ය නොවන ආයතනයක් මගින් ක්‍රීඩා තරග/ තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	6,000	2,000	1,500
05	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශයේ ක්‍රීඩා සමාජයක් ක්‍රීඩා තරගයක්/තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට		500	
06	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය මෙම බල ප්‍රදේශයෙන් බැහැර ක්‍රීඩා සමාජයක් ක්‍රීඩා තරගයක් /තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	6,000	5,000	1,500

අංකය	*විස්තරය*	*ආරක්ෂිත ඇප* රු.	*ගාස්තු* රු.	*වැඩිවන එක් දිනක් සඳහා අයකිරීම* රු.
07	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය සැණකෙළියක් (කානිවල්) හෝ මුදල් අය කරනු ලබන වෙනත් කාර්යයක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් මුල් දින 05 සඳහා	30,000	15,000	3,000
08	ඉහත ගාස්තුවලට අමතරව විදුලි හා ජල ගාස්තු ගෙවීම		1,500	

12-455/14

හම්බන්තොට මහා නගර සභාව

2023 වර්ෂය සඳහා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා කසළ බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ජී. ගාමිණී ශ්‍රී ආනන්ද,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''හම්බන්තොට මහා නගර සභාව විසින් වැළඳගෙන ඇති 1989 ජනවාරි මස 20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ XI වැනි අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය අනුව හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හම්බන්තොට මහා නගර සභා සීමා තුළ ඉවත් කරනු ලබන කසළ වෙනුවෙන් පහත ගාස්තු උපලේඛනයේ සඳහන් ආකාරයට අයවිය යුතු බවත්, මෙම ගාස්තු අයකිරීම 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.

කසළ වර්ගය :

දිරන කසළ	රු. 3.00 (කිලෝග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)
නොදිරන කසළ	රු 9.00 (කිලෝග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)
කර්මාන්ත ශාලා අපද්‍රව්‍ය	රු. 20.00 (කිලෝග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)
කඩා ඉවත් කරන ලද ගොඩනැගිලි සුන්බුන් (උළු කැබලි, ගඩොල් කැබලි, බදාම කැබලි)	රු. 750.00 (කියුබ් 1 ක් සඳහා)
වෙනත් අපද්‍රව්‍ය	රු. 30.00 (කිලෝග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)

* වෙනත් අපද්‍රව්‍ය - මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරන පරිදි වේ.

තව ද මහා නගර සභා බල ප්‍රදේශය තුළ දෛනිකව කසළ බැහැර කරනු ලබන ව්‍යාපාරික ආයතනවලින් කසළ ගාස්තු අය කිරීමේ දී මසකට ලබා දෙනු ලබන කසළ ප්‍රමාණය කිලෝග්‍රෑම් 50ට අඩු නම් මාසික ගාස්තුව ලෙස රු. 100.00 ක මුදලක් ද, කසළ ප්‍රමාණය කිලෝග්‍රෑම් 50-200 අතර නම් මාසික ගාස්තුව ලෙස රු. 200.00 ක මුදලක් ද, කසළ ප්‍රමාණය කිලෝග්‍රෑම් 200ට වැඩි නම් ඉහත වගුවේ සඳහන් පරිදි කිලෝග්‍රෑම් ප්‍රමාණය අනුව ගාස්තු අය කරනු ලැබේ.

12-455/15

කඩුගන්නාව නගර සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන වෙළෙඳ බලපත්‍ර මත ගාස්තු පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 164 (1) වගන්තිය සමග කියවිය යුතු 162 වැනි වගන්තිය යටතේ කඩුගන්නාව නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2022 ඔක්තෝබර් මස 25 වැනි දින පවත්වන ලද කඩුගන්නාව නගර සභාවේ මහා සභා රැස්වීමේ තීරණ අංක එ, 2, i 2 යටතේ 2023 වර්ෂය සඳහා පහත දැක්වෙන යෝජනාව සභාවේ ස්ථිර කර සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2023 වර්ෂයේදී කඩුගන්නාව නගර සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මතම ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

අමිල රංග වේරගොඩ,
සභාපති,
කඩුගන්නාව නගර සභාව.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
කඩුගන්නාව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

නගර සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ කඩුගන්නාව නගර සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ කඩුගන්නාව නගර සභාව විසින් 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1979 අංක 42 දරන මහ නගර සභා හා 1939 අංක 61 දරන නගර සභා (සංශෝධිත) පනතේ වැඩිදුරටත් සංශෝධිත 1985 අංක 20 දරන මහ නගර සභා (සංශෝධිත) පනතේ වැඩිදුරටත් සංශෝධිත නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 164 හා 165 වැනි වගන්තිවලට යටත්ව කඩුගන්නාව නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක් 2023 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II තීරුවේ නිරූපිත යම් සීමාවක් ඇතුළත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් අයකළ යුතුයැයි ද ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන්පොළක් වන විට, එකී හෝටලයෙන්, ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එකක (1%) ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි ද කඩුගන්නාව නගර සභාවේ මාසික සභාව වෙත යෝජනා කරමි.

වෙළෙඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර :			
01. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. බත් කඩයක්, තේ කඩයක්, කෝපි කඩයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
03. භෝජනාගාරයක් පැවැත්වීම*	500 0	750 0	1,000 0
04. හෝටලයක් පවත්වාගෙන යාම*	500 0	750 0	1,000 0

	වෙළෙඳාමේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 දක්වා	වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා	වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
05.	ලැගුම්හලක් (නවාතැන්පලක්) පවත්වාගෙන යාම*	500 0	750 0	1,000 0
06.	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	කිරි පට්ටි හා කිරි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	කරණවැමි මැදිරි හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	සැලූන් හෝ රූපලාවන්‍යාගාර පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	හරක් ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	පළතුරු වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	එළවළු වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	අවමංගල සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	පෞද්ගලික ඉගැනුම් ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

* 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ ද අවස්ථාවක බලපත්‍ර ගාස්තුව පෙර වර්ෂය සඳහා එම හෝටලයේ, ආපනශාලාවේ හෝ නවාතැන්පොළේ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතු ය.

පීඩාකාරී ව්‍යාපාර :

1.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
2.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
3.	සම් විකිණීම	500 0	750 0	1,000 0
4.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
5.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
8.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබාගැනීම	500 0	750 0	1,000 0
9.	පොල්කඩු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0

	වෙළෙඳාමේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 දක්වා	වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා	වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
12.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
15.	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
16.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
19.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
21.	රස කැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
22.	පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
23.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
24.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
25.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
26.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
27.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දූව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
28.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයෙන් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
29.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
30.	සම්භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
31.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
32.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂභෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
33.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
34.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
35.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
36.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
37.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
38.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
39.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
40.	ආහාර වර්ග පැකට් කිරීම	500 0	750 0	1,000 0
41.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
42.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
43.	ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
44.	සිමෙන්ති කිලෝග්‍රෑම් 1,000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0

	වෙළෙඳාමේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 දක්වා	වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා	වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
45.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
46.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
47.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
48.	පොහොර, හුනු පිටි වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදුකර විකිණීම	500 0	750 0	1,000 0
49.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
50.	ධාන්‍ය හෝ මාෂභෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0

අන්තරාදායක ව්‍යාපාර :

1.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
2.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
3.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළුගාලක් හෝ කුකුළු කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6.	ගඩොල් හෝ උළු ගඩබාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
7.	දර ගබඩාවක් පැවැත්වීම			
8.	කළුගල් කැනීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
9.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල්බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
10.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය			
11.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
12.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	කොහු හෝ වෙනත් කෙඳිවර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
16.	රිදී භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
17.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
18.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
19.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තැබීම	500 0	750 0	1,000 0
20.	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
21.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
22.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
23.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0

තලාව ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ දෙසැම්බර් මස 09 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 01/v යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඉන්දික උදයකුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වැනි වගන්ති යටතේ තලාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මෙම බද්දට යටතේ වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකු විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම පහත උපලේඛනයන්හි දක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදළව නියම කර අය කිරීම සුදුසු බව යෝජනා කරන්නීය.

උපලේඛනය

		රු. ශත
01.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
02.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
	(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
	සෑම කරත්තයක් සඳහා	20 0
	සෑම අත් කරත්තයක් සඳහා	10 0
	සෑම රික්ෂෝවක් සඳහා	7 50
	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
	සෑම ඇතෙකු සඳහා	50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

මෙම උපලේඛනයේ "වෙළෙඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-521/5

තලාව ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රකාරව 176 වැනි අධිකාරය ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වන වගන්තිය ප්‍රකාර තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදළව සංදර්ශන පැවැත්වීම වෙනුවෙන් අයකිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තලාව ප්‍රාදේශීය සභාව විසින් 2022 දෙසැම්බර් මස 09 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 01/II යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව යෝජනා කරන්නීය.

ටී. එම්. ඉන්දික උදයකුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

පැවරී ඇති බලතල ප්‍රකාරව 176 වන අධිකාරය ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වන වගන්තිය ප්‍රකාර වූ තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංදර්ශන පැවැත්වීම වෙනුවෙන් 2023 වර්ෂයේ එක් දිනකට රු. 3,000 බැගින් අය කිරීම සුදුසු බවට යෝජනා කරන්නීය.

12-521/6

තලාව ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට සංචාරක හෝටල්/ආපන ශාලා/නවාතැන් පොළවල් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149(ඈ) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, අනුමත කර හෝ පිළිගත්තා වූ ද, සංචාරක හෝටල් හෝ ආපනශාලා හෝ නවාතැන් පොළවල් සඳහා බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තලාව ප්‍රාදේශීය සභාව විසින් 2022 දෙසැම්බර් මස 09 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 01/vii යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ටී. එම්. ඉන්දික උදයකුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, අනුමත කර හෝ පිළිගත්තා වූ ද, සංචාරක හෝටල් හෝ ආපනශාලා හෝ නවාතැන් පොළවල් සඳහා 2022 වර්ෂයේ පිරිවැටුම් පදනම් කරගෙන එම ආදායමෙන් 1% ක් නොඉක්මවන ගාස්තුවක් අය කිරීමටත්, අලුතින් ආරම්භකර පළමු අවුරුද්ද වන අවස්ථාවක ඒ ගාස්තුව එම ස්ථානයේ වාර්ෂික වටිනාකම මත 2023 වර්ෂයට අදළව නියමකර අය කිරීමට යෝජනා කරන්නීය.

12-521/7

තලාව ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය පිළිබඳව අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු - 2023

තලාව ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ දෙසැම්බර් මස 09 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 01/viii යටතේ ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසරය පිළිබඳව අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසරපත්‍ර ලබා ගැනීමට ගාස්තු අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ටී. එම්. ඉන්දික උදයකුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වන හා 126 (xxx) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර සාදන ලද 2016.03.30 වැනි දින අංක 1960/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උතුරු මැද පළාතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා අනුමත කර ප්‍රකාශයට පත්කර ඇති ප්‍රචාරක දැන්වීම් පිළිබඳව අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර තලාව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට/ පාරකට/ ඇළකට/ හෝ අහසට පෙනෙන පරිදි වර්ග අඩියකට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2023.01.01 වැනි දින සිට අයකිරීම සුදුසු බව ද, එම මුදල් 2023 මැයි 31 වැනි දිනට පෙර අය කිරීමට ද, එසේම උපලේඛනයේ 1 සිට 3 දක්වා දැන්වීම් දෙපැත්තම ප්‍රදර්ශනය වන්නේ නම් මෙම ගාස්තුව දෙගුණයක් ලෙස අය කිරීම සුදුසු බවට ද දැන්වීම් ප්‍රචාරක පුවරුවේ නියමිත වාර්ෂික ගාස්තුවෙන් සියයට 25%ක ප්‍රමාණයක් තලාව ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතු බව යෝජනා කරන්නී ය.

උපලේඛනය

අනු. අංකය	*විස්තරය*	*එක් වර්ෂයක ගාස්තුව රු. ශත*
01.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට ප්‍රදර්ශන ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම දැන්වීමක් සඳහා වර්ග අඩියකට	150 0
02.	බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරවා ඇති දිස්න ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම	200 0
03.	සෑම වර්ගයකම ප්‍රචාරක බැනරයක් සඳහා වර්ග අඩියකට	50 0

12-521/8

තලාව ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

තලාව ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ දෙසැම්බර් මස 09 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 01/ix යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බද්දක් 2023 වර්ෂයට අදාළව නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ටී. එම්. ඉන්දික උදයකුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව තලාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව තලාව ප්‍රාදේශීය සභා සීමා තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2%ක් වන බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) (ඇ) ඡේදය යටතේ වන ''සමානුපාතය'' වශයෙන් මෙම ඉඩමේ ගොඩනැගිලි වලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 3:2ක් විය යුතු බවටත්, පර්චස් 20 ක් දක්වා වූ සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අය නොකරන බවටත් තීරණය කිරීම සුදුසු බවත් යෝජනා කරන්නීය.

12-521/9

තලාව ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට විනෝද බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හා විනෝද බදු ආඥාපනතේ 11 වැනි වගන්තියේ 1 වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා විනෝද බද්දක් 2023 වර්ෂයට අදාළව නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තලාව ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ දෙසැම්බර් මස 09 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 01/x පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ටී. එම්. ඉන්දික උදය කුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත හා විනෝද බදු ආඥාපනතේ 11 වැනි වගන්තියේ 1 වන උපවගන්තිය ප්‍රකාරව මුදල් උපයන විනෝද කටයුතු වශයෙන් ගැනෙන ආධාර, චිත්‍රපට දර්ශනයන්, සර්කස් සංදර්ශනයන් හා සෑම සංගීත ප්‍රසංගයක් සඳහාම නිකුත් කරනු ලබන ප්‍රවේශපත්‍රවල වටිනාකමින් 20%ක විනෝද බද්දක් ද, සිනමාශාලාවල ප්‍රදර්ශනය කරනු ලබන චිත්‍රපට සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශපත්‍රවල වටිනාකමින් 20%ක විනෝද බද්දක් ද 2023 වර්ෂයට පනවා අය කිරීම සුදුසු බවට යෝජනා කරන්නීය.

12-521/10

තලාව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට ජල ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (xiii) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ජල ගාස්තුවක් 2023 වර්ෂයට අදාළව නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තලාව ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ දෙසැම්බර් මස 09 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 01/xi යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ටී. එම්. ඉන්දික උදයකුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (xiii) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තලාව ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක ජල ව්‍යාපෘති සඳහා ජල ගාස්තුවක් 2023 වර්ෂයට පහත සඳහන් පරිදි පනවා අය කිරීම සුදුසු බවට යෝජනා කරන්නීය.

ඒකක	*මුදල*	*එකතුව*	*ඒකක*	*මුදල*	*එකතුව*	*ඒකක*	*මුදල*	*එකතුව*
	රු.	*රු.*		*රු.*	*රු.*		*රු.*	*රු.*
1	10	10	11	145	145	21	400	400
2	20	20	12	165	165	22	450	450
3	30	30	13	185	185	23	500	500
4	40	40	14	205	205	24	550	550
5	50	50	15	225	225	25	600	600
6	65	65	16	250	250	26	670	670
7	80	80	17	275	275	27	740	740
8	95	95	18	300	300	28	810	810
9	110	110	19	325	325	29	880	880
10	125	125	20	350	350	30	950	950

ඒකක	*මුදල*	*එකතුව*	*ඒකක*	*මුදල*	*එකතුව*
	රු.	*රු.*		*රු.*	*රු.*
31	965	1030	41	2055	2070
32	1050	1110	42	2180	2190
33	1135	1190	43	2305	2310
34	1220	1270	44	2430	2430
35	1305	1350	45	2555	2550
36	1430	1470	46	2680	2670
37	1555	1590	47	2805	2790
38	1680	1710	48	2930	2910
39	1805	1830	49	3055	3030
40	1930	1950	50	3180	3150

රාජ්‍ය ආයතන

ඒකක	*මුදල රු.*	*ස්ථාවර රු.*
1	80	150

පුද්ගලික ආයතන

ඒකක	*මුදල*	*ස්ථාවර*
1-30	80	150
30ට වැඩි	240	100

ආගමික සිද්ධස්ථාන

ඒකක	*මුදල*	*ස්ථාවර*
1-10	5	80
10ට වැඩි	10	50

12-521/11

තලාව ප්‍රාදේශීය සභාව

පළාත් පාලන සම්මත අතුරු ව්‍යාවස්ථා

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වගන්තිය යටතේ, පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබූ 1988/08/23 දින 520/7 දරන ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පලකරන ලද්දා වූ, පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව හා උතුරු මැද පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් සම්මත කරන ලද උතුරු මැද පළාත් සභාව මගින් වර්ෂ 2016/03/30 වැනි දින අංක 1960/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පලකරන ලද්දා වූ, පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 10 ත් ඇතුළුව එම අතුරු ව්‍යාවස්ථා සියල්ල තලාව ප්‍රාදේශීය සභාව තුල බදු හා ගාස්තු අයකිරීම සඳහා පිළිගැනීමටත්, තලාව ප්‍රාදේශීය සභාවේ 2022.12.09 වන දින විශේෂ මහ සභා රැස්වීමේ තීරණ අංක 01/xii යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1. බත්කඩ, ආපනශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම, විධිමත් කිරීම, අධික්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
2. හෝටල් පවත්වාගෙන යාම, අධික්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
3. පොදු ක්‍රීඩාභූමි විධිමත් කිරීම, අධික්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ ව්‍යවස්ථාව.
4. නවාතැන් පොලවල් පවත්වාගෙන යාම පිළිබඳ විධිමත් කිරීම අධික්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ ව්‍යවස්ථාව
5. බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
6. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
7. වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
8. සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
9. මාළු විකිණීම විධිමත් කිරීම, අධික්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
10. මස් විකිණීම විධිමත් කිරීම, අධික්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

ටී. එම්. ඉන්දික උදය කුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-521/12

තලාව ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට වෙනත් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියෙන් හෝ එම පනතේ විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව කළ යෝජනාව වෙනත් ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2022 දෙසැම්බර් මස 09 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 01/xiii යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ටී. එම්. ඉන්දික උදයකුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළ වෙනත් ගාස්තු හා සේවා සඳහා පහත සඳහන් ආකාරයට විය යුතු බවට යෝජනා කරන්නීය.

අනු. අංකය	*විස්තරය*	*රු. ශත*
01.	වීථිරේඛා නොපවරා ගැනීමේ සහතිකයක් ලබා දීම සඳහා (පෙරසැරි ගාස්තු ඇත)	1,377 0
02.	පාරිසරික බලපත්‍ර අයදුම්පතක් සඳහා	200 0
03.	වාහන හා සත්ත්ව බදු වෙනුවෙන් ගාස්තු	6 0
04.	පාරිසරික බලපත්‍ර ගාස්තු (2000 අංක 53 දරන ජාතික පාරිසරික නව සංශෝධිත පනත අනුව අංක 152/16 දරන *ගැසට් පත්‍රයේ* පිටුවේ කාර්යයයන්ට අදාළව)	4,500 0
05.	බලපත්‍ර සහිතව ඝාතනය කරනු ලබන එළුවකු සඳහා	25 0
06.	පාරිසරික බලපත්‍රය අළුත් කිරීමේ අයදුම්පතක් සඳහා ගාස්තුව	100 0
07.	ගිවිසුම්පත් ගාස්තුව (කර්මාන්ත)	500 0
08.	වරිපනම් නාමය වෙනස් කිරීමේ ගාස්තුව	1,000 0
09.	අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා එක් දිනකට ගාස්තුව	2,000 0
10	දීර්ඝ කාලීන බලපත්‍ර එකඟතා ලිපියක් නිකුත් කිරීම සඳහා	500 0
11.	සැලසුමේ කාලය දීර්ඝ කිරීම වසරකට - නේවාසික	100 0
	- වාණිජ	100 0
12.	ව්‍යාපාර නාම ලියාපදිංචි නිර්දේශ ලිපියකට	300 0
13.	ගොඩනැගිලි අයදුම්පත් - නේවාසික	200 0
	- ව්‍යාපාරික	200 0
14.	අනුබෙදුම් අයදුම් පත්‍රයකට	200 0
15.	අනුකූලතා සහතික පෝරමයකට	200 0
16.	නාමය වෙනස් කිරීමේ පෝරමයකට	100 0
17.	තක්සේරු දැන්වීම් පිටපතක් සඳහා	10 0
18.	ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර පැවරීමේ ගාස්තුව	5,000 0
19.	පුස්තකාල සාමාජික ගාස්තු	100 0

			රු. ශත
20.	වාහන නැවතුම්පල ගාස්තු	- ත්‍රීවීලරය (වසරකට)	500 0
		- අත්ට්‍රැක්ටරය	400 0
		- රෝද හතරේ ට්‍රැක්ටරය	750 0
		- වෑන් රථය	750 0
		- ටිපර්/ ලොරි බර වාහන/ බස්රථ	1,000 0
		- වාහන නැවතුම්පල ලියාපදිංචි ගාස්තුව	1,000 0
21.	සුසාන භූමියක මෘත දේහයක් තැන්පත් කිරීම සඳහා වර්ග අඩියකට		50 0
22.	භූමදනය කිරීම සඳහා		250 0
23.	පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අයදුම් පත්‍රයක් සඳහා		200 0
24.	පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ අයදුම් පත්‍රයක් සඳහා		100.00
25.	පාරිසරික බලපත්‍ර පරීක්ෂා කිරීමේ පෙරසැරි ගාස්තු	රු.3,000.00 සිට රු. 10,000.00 දක්වා	
26.	පාරිසරික බලපත්‍ර ගාස්තු (2000 අංක 53 දරන ජාතික පාරිසරික නව සංශෝධන පනත අනුව හා අංක 152/16 දරන ජාතික පාරිසරික නව සංශෝධන පනත අනුව)		4,000.00
27.	ජල නල එලීමේ නිර්දේශ ලබාදීම සඳහා (බොරළු මාර්ගයක් සඳහා)		2,000.00
28.	බොරළු ප්‍රවාහනය කිරීම සඳහා (කිලෝ මීටර් 01 ක් සඳහා රු. 20,000.00 ක තැන්පත් මුදලක් ලබා ගැනීම)		
29.	තලාව ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍ර සූත්‍ර කුළියට ලබා දීමේ දී අයකරනු ලබන ගාස්තු :		

(i)	මෝටර්ග්‍රේඩරය (කොමාට්සු) පැය 01 ක් සඳහා	රු. 9692.00		
(ii)	මෝටර්ග්‍රේඩරය (SANY) පැය 01ක් සඳහා	රු. 7910.00		
(iii)	බැකෝ ලෝඩරය (මිට්සු) පැය 01ක් සඳහා	රු. 7057.50		
(iv)	බැකෝ ලෝඩරය (ෆෝටර්න්) පැය 01ක් සඳහා	රු. 7269.00		
(v)	ටිපර් රථය (ලේලන්ඩ්) කි. යු. 2.5 දිනකට	රු. 18493.50	දින 1/2 සඳහා	රු. 9,246.25
(vi)	ටිපර් රථය (ෆෝටර්න්) කි. යු. 3 දිනකට	රු. 22200.00	දින 1/2 සඳහා	රු. 11,100.00
(vii)	ජල බවුසරය සඳහා	රු. 6,000.00		
(viii)	ගලි රථය	- පළමු ටැංකිය සඳහා - රු. 6423.00		
		දුර කි. මී. 5ට වැඩිවන විට වැඩිවන කි. මී. 1 ක් සඳහා -රු. 300.00 බැගින් අය කිරීම		
(ix)	ට්‍රැක්ටර් ජල බවුසරයක් සඳහා	- රු. 4923.00		
	දුර කි. මී. 5ට වැඩිවන විට වැඩිවන කි. මී. 1ක් සඳහා	- රු. 150.00 බැගින් අය කිරීම		
(x)	ගල්රෝල පැය 06 ක් සඳහා	- රු. 31128 + වාහන වියදම්		
	(ප්‍රවාහන වියදම පළමු කි. මී. 12 ඇතුලත රු. 5000 හා වැඩිවන සෑම කි.මී. 1 සඳහා රු. 250.00 බැගින් එකතුවේ)			

30.	දිග අඩි 9 පළල අඩි 8 ක් වූ කඩ කාමරයක් ව්‍යාපාර කටයුතු සඳහා භාවිතා කරන එක් දිනක් වෙනුවෙන්	රු. 250 0
31.	සතිපොළ පදික ස්ථානවල ව්‍යාපාර කටයුතුවල යෙදෙන සෑම ව්‍යාපාරිකයෙක්ම වර්ග අඩි 1 ක් වූ භූමි ප්‍රමාණයක් සඳහා	රු. 10 0
32.	සතිපොළ සංචාරක වෙළඳාමේ යෙදෙන සියලුම ව්‍යාපාරිකයන් එක් දිනක් වෙනුවෙන්	රු. 50 0
33.	සංදර්ශන විනෝද කටයුතු/ආගමික හා ජාතික උත්සව පැවැත්වීමට ක්‍රීඩා පිටි වෙන් කිරීම සඳහා දිනකට ගාස්තුව	රු.15,000 0
34.	තඹුත්තේගම ශ්‍රවණාගාරය ලබාදීම වෙනුවෙන් දිනකට ගාස්තුව රු. 15,000 0 හා දින භාගයක් සඳහා ගාස්තුව	රු. 7,500 0
35.	එප්පාවල ආදාහනාගාරයේ එක් මළ සිරුරක් ආදාහනය සඳහා අයකිරීම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල රු. 20,000 0 වන අතර, බල ප්‍රදේශයෙන් පිටත	රු.22,500 0

තලාව ප්‍රාදේශීය සභාව

සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීම සඳහා පෙරසැරි ගාස්තු ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු සහ සේවා ගාස්තු අයකිරීම - 2023

තලාව ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ දෙසැම්බර් මස 09 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 01/xiv යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ටී. එම්. ඉන්දික උදයකුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

සමාජවාදී ජනරජයේ 2009 අප්‍රේල් මස 17 වැනි දින අංක 1597/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතට අනුව නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යවරයා විසින් පල කරන ලද රජයේ නිවේදන යටතේ වූ සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු සහ සේවා ගාස්තු අය කිරීම ඉහත *ගැසට්* නිවේදනය ප්‍රකාරව සිදු කිරීමට තීරණය කිරීම සුදුසු බවට යෝජනා කරන්නීය.

12-521/14

තලාව ප්‍රාදේශීය සභාව

ඇතැම් ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2023

තලාව ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ දෙසැම්බර් මස 09 වැනි දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ දී තීරණ අංක 01/xv යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ටී. එම්. ඉන්දික උදයකුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි වගන්තියෙන් තලාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, බල සීමාව ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ සේවකයා හෝ අනුයෝජකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ ඒ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් මෙම බද්ද 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන බව ද යෝජනා කරන්නීය.

12-521/15

තංගල්ල නගර සභාව

වරිපනම් බදු පැනවීම - 2023 වර්ෂය

තංගල්ල නගර සභාවේ 2022.09.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් 2023 වර්ෂයට වරිපනම් හා බදු පැනවීමට කරන ලද නිර්දේශය 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 04/V(i) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආරියදාස වර්ණකුලසූරිය,
සභාපති,
තංගල්ල නගර සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

නගර සභා ආඥාපනතේ (255 අධිකාරිය) 160 (1) වගන්තියෙන් තංගල්ල නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර තංගල්ල නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිශ්චල දේපල සඳහා වරිපනම් බද්දක් පනවා අය කළ හැකිය. එකී පනතේ 166 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වැනි අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර තංගල්ල නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2013 වර්ෂයේ වාර්ෂික වටිනාකමින් 2023 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්, එකී වාර්ෂික වටිනාකමින්,

* නේවාසික ස්ථාන සඳහා සියයට දහයක (10%) ප්‍රතිශතයක් වන වරිපනම් බද්දක් ද,
* වෙළෙඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන සඳහා සියයට පහළොවක (15%) ප්‍රතිශතයක් වන වරිපනම් බද්දක් ද,

2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් එම වරිපනම් බදු නගර සභා ආඥාපනතේ 170 වැනි වගන්තිය සමග කියවිය යුතු මහනගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත්,

2023 වර්ෂය සඳහා අවශ්‍ය මුළු වරිපනම් බද්ද වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ගෙවනු ලැබුවහොත් සියයට දහයක (10%) වට්ටමක් ද, කාර්තුවක් තුළ පළමු මාසයේ අවසන් දිනට පෙර ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද, ගෙවනු ලබන බවටත්, නගර සභා ආඥාපනතේ (255 අධිකාරිය) 170 වැනි වගන්තිය සමග කියවිය යුතු මහ නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරියේ) 255 (අ) වැනි වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලබන බලපත්‍රයක් යටතේ, ඉහත වරිපනම් බද්ද නියමිත කාර්තුව තුළ ගෙවනු නොලැබුවහොත් එම ගෙවනු ලැබිය යුතු කාර්තුවට අදාළ වරිපනම් බදු මුදලෙන් මුඩු ඉඩම් හා වාසස්ථාන වෙනුවෙන් සියයට පහළොවක් (15%) සහ මුඩු ඉඩම් හා වාසස්ථාන නොවන දේපළ වෙනුවෙන් සියයට විස්සක (20%) ගාස්තුවක් අය කිරීමටත් තංගල්ල නගර සභාව යෝජනා කරන්නී ය.

12-596/1

තංගල්ල නගර සභාව

ව්‍යාපාර බදු පැනවීම - 2023 වර්ෂය

තංගල්ල නගර සභාවේ 2022.09.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් 2023 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීමට කරන ලද නිර්දේශය 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 04/V(ii) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආරියදාස වර්ණකුලසූරිය,
සභාපති,
තංගල්ල නගර සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ විධිවිධාන යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන හා/හෝ නගර සභා ආඥාපනතේ 165 ආ වගන්ති ප්‍රකාරව තංගල්ල නගර සභාව විසින් කිසිම බද්දකට යටත් කර ප්‍රකාශයට පත් කර නොමැති පහත I වැනි උපලේඛනයේ 1 කොටසේ සඳහන් වෙළඳ ව්‍යාපාර ඇතුළු වෙළඳ ව්‍යාපාරයක් තංගල්ල නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී පවත්වා ගෙනු යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ''ලැබීම්'' (පිරිවැටුම්) වලින් පහත I උපලේඛනයේ 2 වැනි කොටසේ සඳහන් පරිදි I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක එහි II වැනි තීරයේ අනුරූප සටහනෙ හි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර තංගල්ල නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට තංගල්ල නගර සභාව යෝජනා කරන්නීය.

I උපලේඛනය

1 කොටස

01.	පෞද්ගලික බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම (ඩිස්පැන්සරියක්)
02.	පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් (රජයේ ආධාර නොලබන) පවත්වාගෙන යාම (ළදරු පාසල් හැර)
03.	ගණකාධිකරණ විගණන ආයතනයක් පවත්වාගෙන යාම
04.	ගෘහ නිර්මාණ ශිල්ප ආයතනයක් පවත්වාගෙන යාම
05.	රේස් වැඩපළක් පවත්වාගෙන යාම
06.	ඒජන්සි වැඩපළක් පවත්වාගෙන යාම
07.	පුවත්පත් නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
08.	උත්සව සඳහා පුටු, වෙනත් භාණ්ඩ කුළියට දෙන ස්ථානයක්
09.	සිනමා ශාලාවක් පැවැත්වීම
10.	දුරකතන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
11.	රූපවාහිනී විස්තර ප්‍රකාශ සහිත රේස් ඔට්ටු තබන ස්ථානයක් පැවැත්වීම
12.	ලොතරැයි අලෙවි නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
13.	විදේශ රැකියා ඒජන්සිකරුවකු ලෙස ස්ථානයක් පවත්වාගෙන යාම
14.	රියැදුරු පුහුණු පාසලක් පැවැත්වීම
15.	උත්සව කටයුතු වීඩියෝ කිරීම හා ඡායාරූපගත කිරීමේ සේවය
16.	කොමිස් නියෝජිතයන් විසින් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම

17. වෙන්දේසිකරුවන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
18. බ්‍රෝකර්වරුන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
19. කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
20. උකස් බඩු ගන්නවුන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
21. ගණකාධිකරුවන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
22. ප්‍රවාහන නියෝජිත ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
23. ආනයන හා අපනයන ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
24. ඉංජිනේරුවරුන් (පෞද්ගලික) ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
25. මිනින්දෝරුවන් (පෞද්ගලික) ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
26. රක්ෂණ නියෝජිතයන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
27. මුදල් සපයන්නන්/මුදල් ණයට දෙන්නන් ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
28. බැංකු රක්ෂණ හා මූල්‍ය ආයතන
29. 1988 අංක 30 දරන පනත යටතේ බැංකු සේවාවක් පවත්වාගෙන යාම
30. 1942 අංක 13 දරන උකස් ගන්නන් පිළිබඳ ආඥාපනත යටතේ උකස් තැබීම
31. 2006 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත යටතේ කල්බදු ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
32. 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ මුදල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
33. විද්‍යුත් මූල්‍ය ගණුදෙනු පවත්වාගෙන යාම (Teller Machine)
34. විදේශ රැකියා නියෝජිත ආයතන
35. චන්ද්‍රිකා තාක්ෂණය මගින් රේස් ඔට්ටු පොළක් පැවැත්වීම
36. වෙළෙඳ ද්‍රව්‍ය අපනයනය සඳහා ස්ථාන පවත්වාගෙන යාම
37. දුරකතන කුටි පවත්වාගෙන යාම
38. දුරකතන විකිණීම හා සේවා සැපයීමේ ස්ථාන
39. නියෝජිත තැපැල් හලක් (පුද්ගලික)
40. (මුද්‍රණාලයක් නොවන) නවීන තාක්ෂණික හා උපකරණ මගින් මුද්‍රණ කටයුතු සිදුකරන ස්ථානයක්
41. අන්තර්ජාල පහසුකම් භාවිතා කිරීමේ ස්ථානයක්
42. පුවත්පත් හෝ පොත් පත් විකිණීමේ ස්ථානයක්
43. මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක්
44. අරක්කු, බියර්, රටබීම ආදිය ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45. රාජ්‍ය නොවන සංවිධානයක් පවත්වාගෙන යාම
46. මෝටර් රථ වාහන විකිණීමේ ස්ථානයක්
47. වීදුරු විකිණීමේ ස්ථානයක්
48. ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක්
49. පූජා භාණ්ඩ විකිණීමේ ස්ථානයක්
50. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක්
51. පිඟන්, පිඟන් ගඩොල් හෝ නාන කාමර උපකරණ විකිණීමේ ස්ථානයක්
52. සිල්ලර වෙළෙඳ ස්ථාන
53. සාප්පු බඩු සහිත සිල්ලර වෙළෙඳ ස්ථාන
54. යකඩ බඩු, තීන්ත වර්ග ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම හෝ විකිණීම
55. තේ. කි. ග්‍රෑ. 250 ට වඩා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56. ඉංග්‍රීසි බෙහෙත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ෆාමසි)
57. සිංහල බෙහෙත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. මෝටර් සයිකල් ගබඩා කිරීම හා විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
59. ක්ෂණික ඡායා පිටපත් ලබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. සිසිල් බීම ග්‍රෝස් පහකට වඩා ගබඩා කරන හෝ විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
61. ගීත පටිගත කරන ස්ථානයක් පවත්වාගෙන යාම

62. සිරජ්, හකුරු, හෝ බීම වර්ග විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
63. ටයර් විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
64. ෆයිබර් ග්ලාස් ද්‍රව්‍ය වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
65. ග්‍රොසරියක් පවත්වාගෙන යාම
66. කෘෂි රසායන ද්‍රව්‍ය වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
67. ටයර්, ටියුබ් බැටරි විකිණීම
68. තොග හා සිල්ලර සහල් විකිණීම
69. ජංගම දුරකතන අලුත්වැඩියා කිරීමේ හා අමතර කොටස් විකිණීමේ ස්ථානයක්
70. පරිගණක යන්ත්‍ර උපාංග (අමතර කොටස්)
71. පරිගණක යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ හා අමතර කොටස් විකිණීමේ ස්ථානයක්
72. සෙවිලි තහඩු සේවා සහ අමතර කොටස් විකිණීම
73. කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
74. සාප්පු බඩු, රෙදිපිළි, මැසූ ඇඳුම් විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
75. සාප්පු බඩු, සුවඳ විලවුන් හා මණිබඩු විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
76. සාප්පු බඩු, සුවඳ විලවුන් හා මණිබඩු සහිත දුම්කොළ, සුරුට්ටු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77. ඩීවර ආම්පන්න විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
78. පොත්පත්, සඟරා, ලිපි ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79. රෙදිපිළි, මැසූ ඇඳුම් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
80. විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
81. බෝට්ටු එන්ජින් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. සිගරට් තොග ගබඩා කිරීමේ හා/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. මහන මැෂින් වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
84. පිඟන් භාණ්ඩ හා වීදුරු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
85. ගොඩනැගිලි ද්‍රව්‍ය සහ සිමෙන්තියෙන් සාදන ලද ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
86. පාවහන් වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
87. ඉංග්‍රීසි බෙහෙත් වර්ග සහ ග්‍රොසරියක් පවත්වාගෙන යාම
88. වෙළෙඳ සමාගමකට අයත් බඩු බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89. ඇස් කණ්නාඩි වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
90. පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
91. ජංගම දුරකතන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
92. රෙදි කැබලි වශයෙන් හා කිරා තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
93. ඉටිරෙදි, පොලිතීන් වර්ග, බෑග් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
94. මෝටර් රථ හෝ ත්‍රිරෝද රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
95. පරණ යකඩ, පිත්තල, බෝතල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
96. බහාලුම් ප්‍රවාහන ස්ථානයක් පවත්වාගෙන යාම
97. ස්වර්ණාභරණ වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
98. විදුලි සැපයුම් කාර්යාලයක් පවත්වාගෙන යාම
99. ජල සැපයුම් කාර්යාලයක් පවත්වාගෙන යාම
100. දුරකතන සැපයුම් කාර්යාලයක් පවත්වාගෙන යාම
101. පෙර පාසලක් පවත්වාගෙන යාම
102. මංගල උත්සව භාණ්ඩ බදුදීමට හා සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
103. විදුලි සංදේශ (දුරකතන) සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යාම

I වැනි තීරය		*II* වැනි තීරය	
බද්ද අදාළවන වර්ෂයට පෙර වර්ෂයේ දී ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය		*ගෙවිය යුතු බද්ද* *රු. ශත*	
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත	
02.	රු. 6,001 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0	(අනූවයි)
03.	රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0	(එකසිය අසූවයි)
04.	රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0	(තුන්සිය හැටයි)
05.	රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0	(එක්දහස් දෙසීයයි)
06.	රු. 1,50,001 ඉක්මවන විට	3,000 0	(තුන් දහසයි)

12-596/2

තංගල්ල නගර සභාව

ව්‍යාපාර/කර්මාන්ත/බලපත්‍ර නිකුත් කිරීම හා බලපත්‍ර ගාස්තු පනවා අය කිරීම - 2023 වර්ෂය

තංගල්ල නගර සභාවේ 2022.09.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් 2023 වර්ෂයට වරිපනම් හා බදු පැනවීමට කරන ලද නිර්දේශය 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 04/V(iii) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආරියදාස වර්ණකුලසූරිය,
සභාපති,
තංගල්ල නගර සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරිය වන නගර සභා ආඥාපනත ප්‍රකාරව තංගල්ල නගර සභාව විසින් සම්පාදනය කර ප්‍රසිද්ධ කරන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හා/හෝ 1952 අංක 06 දරන පළාත් පාලන මණ්ඩල (ආදර්ශ උපනීති පිළිබඳ) පනත ප්‍රකාරව සම්පාදනය කර ප්‍රකාශයට පත් කරන ලද උපනීති යටතේ තංගල්ල නගර සභාව විසින් 2023 වර්ෂය තුළ නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 162 වැනි වගන්තිය සමග කියවිය යුතු 164 වැනි වගන්තියෙන් නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර මෙහි පහත I වැනි උපලේඛනයේ 1 වැනි කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් 2023 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක එකී කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා තංගල්ල නගර සභාවේ බලපත්‍රයක් ලබා ගත යුතු බවත්, එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන් ම එකී කර්මාන්තය හෝ ව්‍යාපාරයක් කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම I උපලේඛනයේ 3 වැනි කොටසේ I වැනි තීරුවේ ඇතුළත් වාර්ෂික වටිනාකම් ප්‍රමාණයන් අතර, පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 164 (අ) වැනි වගන්තියේ බලතල ප්‍රකාරව පනවා අය කිරීමට සුදුසු බවටත්, එම කර්මාන්තය හෝ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගත යුතු බවට අණ පනත්වලින් කර ඇති නියමයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත්, පහත

දැක්වෙන I වැනි උපලේඛනයේ 2 වැනි කොටසේ සඳහන් සියලුම ව්‍යාපාර සහ කර්මාන්ත සඳහා බලපත්‍ර නිකුත් කිරීමට 1952 හය (06) වැනි අංකය දරන පළාත් පාලන මණ්ඩල උප නීති පනත පිළිගැනීමටත් එකී උප නීති පනතේ VIII වැනි කාණ්ඩයේ උප නීති යටතේ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර අප්‍රිය වූ ද, අන්තරාදායක වූද, කර්මාන්ත ලෙස ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවටත්, එකී බලපත්‍ර ලබා ගැනීමට යටත් සෑම තැනැත්තෙකුම එකී බලපත්‍ර ගාස්තුව 2023 වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර තංගල්ල නගර සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරන්නීය.

I **උපලේඛනය**

1 වැනි කොටස

බලපත්‍ර ගාස්තුවක් ගෙවා බලපත්‍රයක් ලබා ගත යුතු කර්මාන්ත හෝ ව්‍යාපාර (නගර සභා සම්මත පොදු අතුරු ව්‍යවස්ථාව වන 1952 අංක 06 දරන පළාත් පාලන මණ්ඩල උපනීති පනත මගින් නම්කර ඇති කර්මාන්ත හෝ ව්‍යාපාර)

1. බේකරියක් පවත්වාගෙන යාම
2. බත්කඩ, තේ, කෝපි කඩ
3. හෝටල්
4. ආපන ශාලා
5. නවාතැන්පොළ
6. සිසිල්බීම කර්මාන්ත ශාලා
7. අයිස් කර්මාන්ත ශාලා
8. කිරි පට්ටි හා කිරි විකිණීම
9. කරණවැම් මැදිරි හා බාබර් සාප්පු
10. මාළු විකිණීම
11. මස් විකිණීම
12. හරක් ගාල්
13. පොදු මාර්කට්
14. පුද්ගලික මාර්කට් හා බලයලත් වෙනත් ස්ථාන

2 වැනි කොටස

බලපත්‍ර ගාස්තුවක් ගෙවා බලපත්‍රයක් ලබා ගත යුතු කර්මාන්ත හෝ ව්‍යාපාර (නගර සභා සම්මත පොදු අතුරු ව්‍යවස්ථාව වන 1952 අංක 06 දරන පළාත් පාලන මණ්ඩල උප නීති පනතේ VIII වැනි කාණ්ඩයේ උපනීති හා විධි විධාන අනුව නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර තංගල්ල නගර සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද අප්‍රිය වූද අන්තරාදායක වූද කර්මාන්ත හෝ ව්‍යාපාර,

01. ගැලුම් 50 ට වැඩියෙන් පොල්තෙල් ගබඩා කිරීම
02. සුරුට්ටු නිපදවීම
03. තලතෙල් නිපදවීම
04. ගිනිකුරු නිපදවීම
05. ගෝනි ගබඩා කිරීම
06. විදුලිය වැඩපලක් පවත්වාගෙන යාම
07. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
08. එළවළු පළතුරු ව්‍යාපාර බදුවලට විකුණන කඩයක් පවත්වාගෙන යාම
09. සුන්බුන් ලෝහ ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා/හෝ සැකසීමේ මධ්‍යස්ථානයක්
10. ස්වර්ණාභරණ නිපදවීමේ වැඩපළක්
11. යකඩ වැඩපොළක් පවත්වාගෙන යාම

12. ලුණු දැමූ මාළු සකස් කිරීමේ හා/හෝ ගබඩා කිරීමේ ස්ථානයක්
13. කරවල සකස් කිරීමේ හා/හෝ ගබඩා කිරීමේ ස්ථානයක්
14. යන්ත්‍රානුසාරයෙන් මිරිස් කුඩු කිරීම
15. බුරුසු සැකසීම
16. අඟුරු සඳහා දර හෝ පොල්කටු පිළිස්සීම
17. දහ දෙනෙකුට වැඩි එළු පට්ටියක් පවත්වා ගෙන යාම හා/හෝ විකිණීම
18. රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19. පශු වෛද්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම
20. බීඩි නිපදවීම
21. සිගරට් නිපදවීම
22. අඟුරු ගබඩා කිරීම
23. ගිනියම් කර පෑස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24. ටයර් හා ට්‍යුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25. මෝටර් රථ වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
26. දර සකස් කර විකිණීම හා/හෝ ගබඩා කිරීම
27. දැව සකස් කර විකිණීම හා/හෝ ගබඩා කිරීම
28. ඇසිටික් ඇසිඩ් ගබඩා කිරීම
29. ගල්, උළු, ගඩොල් හෝ කබුක් ගබඩා කිරීම
30. බෝර ගසා ගල් කැඩීම
31. ඉලෙක්ට්‍රෝප්ලේට් කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම
32. බෝට්ටු සාදන ස්ථානයක් පවත්වාගෙන යාම
33. කෘත්‍රිම පොහොර වර්ග ඇසුරුම් කර ගබඩා කර තබාගැනීම
34. කෘත්‍රිම පොහොර වර්ග නිපදවීම
35. හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
36. පුවක් වියළීම
37. සබන් නිපදවීම
38. කෙඳිවර්ග නිපදවීම
39. කෙඳිවර්ග ගබඩා කිරීම
40. කෙඳිවර්ග සායම් කිරීම
41. නුණු, හම් හෝ ඇටකටු හෝ කෘත්‍රිම පොහොර සෑදීම පිණිස පාවිච්චි කරනු ලබන 500 ගෝනි එකකට වඩා ගබඩා කිරීම
42. කොප්පරා වේළීම
43. පොල්තෙල් නිපදවීම
44. කපාපු පොල් නිපදවීම
45. නුණු පෝරණුවක් පවත්වාගෙන යාම
46. ලී ඉරීම
47. සිසිල් බීම නිපදවීම
48. අයිස් නිපදවීමේ කර්මාන්ත ශාලාවක්
49. අයිස් හා සිසිල් බීම නිපදවීම
50. පැඟිරිතෙල් නිපදවීම හා ගබඩා කිරීම
51. පුළුන් හෝ පිදුරු ගබඩා කිරීම
52. සිමෙන්ති ගබඩා කිරීම
53. කොප්පරා ගබඩා කිරීම
54. අයිස්ක්‍රීම් සෑදීම
55. රසකැවිලි හෝ පිසූ ආහාර නිෂ්පාදනය කරන ස්ථානයක්

56. රස කැවිලි හෝ දොදොල් නිපදවීමේ හා/හෝ විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
57. මැණික් ගල් මිලදී ගැනීම, නිපදවීම හා /හෝ කැණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
59. කම්මල් ලිපක් හා/හෝ වෑල්ඩිං යන්ත්‍ර සහිත වැඩපළක් පවත්වාගෙන යාම
60. ලියවන පට්ටලයක් හා/හෝ වෑල්ඩිං යන්ත්‍ර සහිත වැඩ පළක් පවත්වාගෙන යාම
61. බලවේග යන්ත්‍රානුසාරයෙන් රෙදි වියන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
62. අත් යන්ත්‍රානුසාරයෙන් (මැෂින් 01 ක් හෝ ඊට වැඩි) රෙදි විවීම හා සායම් දැමීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
63. සම් භාණ්ඩ නිෂ්පාදනය, අළුත් වැඩියාව හා/හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
65. ගෘහ භාණ්ඩ සෑදීම හා/හෝ විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
66. පොකිරිස්සන්, ඉස්සන් තැම්බීම හා/හෝ ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
67. කුෂන් වැඩපොළක් පවත්වාගෙන යාම
68. මෝර වරල් සකස් කිරීම හා/හෝ ගබඩා කර තබා ගැනීම
69. කුකුලන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70. මිරිස්, තුනපහ, ධාන්‍ය පැකට් කිරීම හා/හෝ විකිණීම කරන ස්ථානයක්
71. පානීය ජලය බෝතල් කර බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
72. ඇඳුම් නිෂ්පාදනය කිරීමේ මැෂින් 03 කට වැඩි ස්ථානයක් පවත්වාගෙන යාම
73. මිනී පෙට්ටි සෑදීම හා/හෝ අවමංගල්‍ය භාණ්ඩ සෑදීම හා/හෝ ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
74. රසායනාගාර සේවය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
75. මනාලියන් හැඩගැන්වීමේ උපකරණ සැකසීමේ හා/හෝ හැඩ ගැන්වීම කරන ආයතනයක් පවත්වාගෙන යාම
76. දත් බැඳීම හා/හෝ පිරිසිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77. පෞද්ගලික ආරෝග්‍ය ශාලාවක් පවත්වාගෙන යාම
78 පලතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79. කොන්ක්‍රීට් (පෙර නිමි ද්‍රව්‍ය) වැඩපලක් පවත්වාගෙන යාම
80. ගෑස් විකිණීමේ නියෝජිත ආයතනයක්
81. බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. බුලත්, පුවක් සැපයීම හා ගබඩා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. ස්නැක්බාර් එකක් පවත්වාගෙන යාම
84. තේ කුඩු වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
85. පොල් තෙල් ගබඩා කිරීමේ හෝ වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
86. ලිහිසි තෙල් බෙදාහැරීමේ හෝ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක්
87. ඉස්සන් මිළදීගෙන සකස් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. දේශීය හා විදේශීය මත්පැන් අලෙවිසැලක් පවත්වාගෙන යාම (නියෝජිත අලෙවිසැල්)
89. පාපැදි අළුත්වැඩියා කරන ස්ථානයක්
90. යතුරුපැදි අලුත්වැඩියා කරන ස්ථානයක්
91. ඩීසල් වාහනවල ඉන්ජෙක්ටර් පොම්ප අළුත්වැඩියා කිරීම
92. බණිජ තෙල් සේවා කිරීමේ ස්ථාන පවත්වාගෙන යාම

93.	ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම
94.	සත්ත්ව සායන පවත්වාගෙන යාම
95.	හෙද විදුහලක් පවත්වාගෙන යාම
96.	ටයර් නැවත පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
97.	පැණි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
98.	ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
99.	සම් නිෂ්පාදන ආයතනයක් මගින් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය, උපකරණ හෝ බඩු විකිණීම සඳහා නියෝජිත ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම (අලෙවි නියෝජිත)
100.	මස් හා මාළු සකස් කිරීම හෝ වේළීම
101.	රබර් වියලා සකස් කිරීම
102.	දහ දෙනෙකුට වැඩි එළු පට්ටියක් පවත්වාගෙන යාම
103.	වී කොටන මෝලක් මගින් සහල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
104.	විසිතුරු භාණ්ඩ හෝ සෙල්ලම් බඩු නිපදවන හා/හෝ විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
105.	ඡායාරූප ශාලාවක් හා/හෝ පිංතූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
106.	කාර්මික යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ හා විකිණීමේ ස්ථානයක්
107.	ප්‍රචාරක කටයුතු සඳහා බැනර් කටවුට් ඇඳීම හා/හෝ පාවිච්චි කිරීම
108.	අවමංගල සේවා කටයුතු පවත්වාගෙන යන ස්ථානයක් පවත්වාගෙන යාම
109.	උම්බලකඩ හොන්ඩර් 05 ට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කර ගබඩා කිරීම
110.	සමාජශාලාවක් පවත්වාගෙන යාම (නිෂ්පාදනය හා විකිණීම සහිත)
111.	පෞද්ගලික වෛද්‍ය සායන පවත්වන ස්ථානයක්
112.	වෙළෙඳ ද්‍රව්‍ය පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
113.	උපස්ථායක ස්ථානයක් පවත්වාගෙන යාම
114.	ජලය පිරිපහදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

3 වැනි කොටස

1 වැනි තීරුව *වාර්ෂික වටිනාකම*		*11 වැනි තීරුව* *බලපත්‍ර ගාස්තුව* *රු. ශත*	
1.	රු. 750 නොඉක්මවන අවස්ථාවක	500 0	(පන්සියයක්)
2.	රු. 751 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට	750 0	(හත්සිය පනහක්)
3.	රු. 1,501 ඉක්මවන විට	1,000 0	(දහසක්)

ඉහත උපලේඛනයේ 1 වැනි කොටසේ සඳහන් කර්මාන්ත අතරින් අංක 3 යටතේ සඳහන් කිසියම් හෝටලයක් හෝ අංක 4 යටතේ සඳහන් කිසියම් ආපන ශාලාවක් හෝ අංක 5 යටතේ සඳහන් කිසියම් නවාතැන් පොළක් හෝ ඒ හෝටලය ආපන ශාලාව හෝ නවාතැන් පොළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද වන අවස්ථාවක ඉහත උපලේඛනයේ 3 වැනි කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වා ගෙන යනු ලබන ස්ථානය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළෙහි හෝ 2022 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතුය.

තංගල්ල නගර සභාව

කර්මාන්ත බදු පැනවීම - 2023 වර්ෂය

තංගල්ල නගර සභාවේ 2022.09.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් 2023 වර්ෂයට වරිපනම් හා බදු පැනවීමට කරන ලද නිර්දේශය 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 04/V(iv) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආරියදාස වර්ණකුලසූරිය,
සභාපති,
තංගල්ල නගර සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 අ (1) වැනි වගන්තියෙන් තංගල්ල නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධානයට හෝ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නා වූ මෙහි පහත උපලේඛනයේ I වැනි කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් තංගල්ල නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ 2 වැනි කොටසේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාක II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත මුදල් ප්‍රමාණය අනුව කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී කර්මාන්ත බද්ද 2023 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර, තංගල්ල නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට තංගල්ල නගර සභාවට යෝජනා කරන්නීය.

1 උපලේඛනය

1 වැනි කොටස

1. ඇඳුම් මැසීමේ ස්ථානයක් (ටේලර් සාප්පුවක්) මැෂින් 03කට නොවැඩි ස්ථානයක් පවත්වාගෙන යාම
2. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
3. ශීතකරණ අලුත්වැඩියා කිරීම
4. විදුලි උපකරණ අළුත්වැඩියාව
5. මල් පැල තවාන් කිරීම හා විකිණීම
6. සුරතල් මසුන් ඇති කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

2 වැනි කොටස

	I *වැනි තීරුව* *වාර්ෂික වටිනාකම*	*II* *වැනි තීරුව* *බලපත්‍ර ගාස්තුව* *රු. ශත*
1.	රු. 750 නොඉක්මවන අවස්ථා	500 0 (පන්සියයයි)
2.	රු. 751 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට	750 0 (හත්සිය පනහයි)
3.	රු. 1,501 ඉක්මවන විට	1,000 0 (දහසයි)

තංගල්ල නගර සභාව

ජනතා පොළ වෙළඳුන්ගෙන් බදු අය කිරීම - 2023 වර්ෂය

තංගල්ල නගර සභාවේ 2022.09.22 වැනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් 2023 වර්ෂයට වරිපනම් හා බදු පැනවීමට කරන ලද නිර්දේශය 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 04/V(V) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආරියදාස වර්ණකුලසූරිය,
සභාපති,
තංගල්ල නගර සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරය වන නගර සභා ආඥාපනත යටතේ සහ 1952 අංක 06 දරන පළාත් පාලන මණ්ඩල උපනීති පනත මගින් තංගල්ල නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂය ඇතුළත තංගල්ල ජනතා පොළ තුළ වෙළඳාම් කරනු ලබන වෙළඳුන්ගෙන් භාණ්ඩ විකුණුම් මිලෙන් සියයට තුනක (3%) ක ගාස්තුවක් සහ අමතර බදු වශයෙන් සංචාරක හා තාවකාලික ලෙස පොදු වෙළෙඳපොල වෙළඳාම් කරනු ලබන වෙළඳුන්ගෙන් භාණ්ඩ විකුණුම් මිලෙන් සියයට තුනක (3%) ක මුදලක් පනවා අය කිරීමටත් තංගල්ල නගර සභාව මගින් යෝජනා කරන්නීය.

මෙහි ජනතා පොළ (සති පොළ) පැවැත්වෙන භූමිය යනු තංගල්ල නගර සභාව විසින් භුක්ති විඳින සහ පරිපාලන කටයුතු කරගෙන යනු ලබන තංගල්ල ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති ජයසිංහවත්ත නමැති ඉඩමේ පිහිටි ප්‍රදේශය මහජන පොළ ගොඩනැගිල්ල හා ඒ අවට ඇති එහි හිස් භූමි කොටස්වන අතර මීට ප්‍රවේශ මාර්ගයන් අයත් නොවේ.

මෙහි පොදු වෙළඳපොළ ලෙස තංගල්ල නගර සභාව විසින් අවසර ලබා දී ඇති තංගල්ල නගර සභා බල ප්‍රදේශයේ ඕනෑම මාර්ගයක හා/හෝ ඕනෑම පොදු ඉඩමක හා/හෝ නගර සභාවට අයත් පොදු වෙළඳ පොළ (මාර්කට් එක) ඇතුළත නගර සභාව මගින් බදු දී නැති තංගල්ල නගර සභාවේ අවසරය ලබා ගත් වෙළෙඳාම් කරන ස්ථාන අමතර බදු එකතු කරන ප්‍රදේශයක් බවට තීරණය කරනු ලැබේ.

12-596/5

තංගල්ල නගර සභාව

ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අය කිරීම - 2023 වර්ෂය

තංගල්ල නගර සභාවේ 2022.09.22 වැනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් 2023 වර්ෂයට වරිපනම් හා බදු පැනවීමට කරන ලද නිර්දේශය 2022 වර්ෂයේ ඔක්තෝම්බර් මස 18 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 04/V(vi) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආරියදාස වර්ණකුලසූරිය,
සභාපති,
තංගල්ල නගර සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරය වන නගර සභා ආඥාපනතෙහි 153 සහ 157 වැනි වගන්තිවලින් නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර තංගල්ල නගර සභාව විසින් සාදන ලද, ඉහත කී පනතේ 154 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් 1967.08.19 වැනි දින අනුමත කළ 1967.09.22 දිනැති අංක 14767 දරන ගැසට් පත්‍රයේ පළකර ප්‍රසිද්ධ කරන ලද අතුරු ව්‍යවස්ථාව යටතේ හා/හෝ නගර සභා ආඥාපනත යටතේ හා/හෝ තංගල්ල නගර සභාව විසින් පිළිගෙන ඇති සම්මත පොදු අතුරු ව්‍යවස්ථාවන් යටතේ යම් අයෙකු විසින් තංගල්ල නගර සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, මාවතකට, ඇළකට, ඉඩමක ගොඩනැගිල්ලකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර දැන්වීම් පුවරු, තාවකාලික දැන්වීම් පුවරු, බැනර්, කටවුට් ඩිජිටල් (ඉලෙක්ට්‍රොනික දැන්වීම් පුවරු හා බිත්තිවල පින්තාරු කර ඇති දැන්වීම් වෙනුවෙන් පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් බැනර් වර්ගයෙහි ප්‍රදර්ශනයන් වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහන්හි නිරූපිත ප්‍රමාණයට ගාස්තු පනවා අය කිරීමටත් තංගල්ල නගර සභාව විසින් යෝජනා කරන්නීය.

I වැනි තීරුව	*II* වැනි තීරුව	
දැන්වීම් වර්ගය	*වර්ග අඩියක් සඳහා අය කිරීම*	
	මාසයක් සඳහා	*වර්ෂයක් සඳහා*
	රු. ශත	*රු. ශත*
01. බැනර් හා කටවුට්	25 0	-
02. ස්ථාවර දැන්වීම් පුවරු (බල ප්‍රදේශයේ පමණක් ස්ථාපිත ආයතන)	-	75 0
	(උපරිම ගාස්තුව 1,000 0)	
03. ස්ථාවර දැන්වීම් පුවරු - වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු (දීප ව්‍යාප්ත හෝ අන්තර්ජාතික සමාගම් හෝ ආයතන)	-	1,000 0
04. එම ගාස්තුවට අමතරව සේවා ගාස්තු (වර්ග අඩියක් සඳහා)	-	500 0

12-596/6

තංගල්ල නගර සභාව

රථ වාහන හා සත්ත්ව බද්ද පැනවීම - 2023 වර්ෂය

තංගල්ල නගර සභාවේ 2022.09.22 වැනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් 2023 වර්ෂයට වරිපනම් හා බදු පැනවීමට කරන ලද නිර්දේශය 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 04/V(vii) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආරියදාස වර්ණකුලසූරිය,
සභාපති,
තංගල්ල නගර සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 162 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 163 වන වගන්තියේ සඳහන් විධිවිධානවලින් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර තංගල්ල නගර සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂය තුළ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහන හෝ සතුන් තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II වැනි තීරුවේ නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් එකී වාහන හෝ සතුන් තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2023 වර්ෂය සඳහා මෙම බද්ද පනවා අය කිරීමටත්, තංගල්ල නගර සභාව විසින් යෝජනා කරන්නීය.

උපලේඛනය

1 වැනි තීරුව			*11 වැනි තීරුව* *රු. ශත*
01.	මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත්කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම		25 0
02.	(i)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් සඳහා,	
		(අ) එය වෙළෙඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම්	10 0
		(ආ) එය වෙළෙඳ කටයුතු නොවන කාර්යය සඳහා පාවිච්චි කරන්නේ නම්	5 0
	(ii)	සෑම කරත්තයක් සඳහා	20 0
	(iii)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
	(iv)	සෑම රික්ෂෝවක්ම සඳහා	7 50
	(v)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටලුවෙකු සඳහා	20 0
	(vi)	සෑම අලියෙකු සඳහා	50 0

12-596/7

තංගල්ල නගර සභාව

පරෙයිවැල්ල වෙරළ උද්‍යානයේ ගාස්තු අය කිරීම - 2023 වර්ෂය

තංගල්ල නගර සභාවේ 2022.09.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් 2023 වර්ෂයට වරිපනම් හා බදු පැනවීමට කරන ලද නිර්දේශය 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 04/V(viii) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආරියදාස වර්ණකුලසූරිය,
සභාපති,
තංගල්ල නගර සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරිය වන නගර සභා ආඥා පනත මගින් හා 1952 අංක 6 දරන පළාත් පාලන මණ්ඩල පනතේ (උප නීති) මගින් ද දකුණු පළාත් පාලන අමාත්‍යතුමා මගින් තංගල්ල නගර සභාවට ඇති විශේෂ බලතල ප්‍රකාරව ද පරෙයිවැල්ල වෙරළ උද්‍යානය අසල තංගල්ල නගර සභාව විසින් ඉදිකර පවත්වාගෙන යන රථවාහන අංගනයට ඇතුල් කරන බස් රථ හැර අනෙකුත් සෑම වාහනයක්ම නතර කර තබන පළමු පැයට රු. 100 ක් සහ මුල් පැය ඉකුත් වූ පසු එක් පැයකට රු. 50 බැගින් වූ එකතු වූ ගාස්තුවක් පනවා අය කිරීමටත් බස්රථවලින් පළමු පැයට අයකරන මුදල රු. 150 ක් ලෙස අයකිරීමටත් මුල් පැය ඉකුත් වූ පසු පැයකට රු. 50 බැගින් අය කිරීමටත් ඊට අමතරව පරෙයිවැල්ල උද්‍යාන රථ ගාල ආශ්‍රිත භූමියේ වෙළඳාම් කරනු ලබන ජංගම රථ සඳහා වාර්ෂික ලියාපදිංචි ගාස්තුව රු. 1,500 ක් ද, දෛනිකව රු. 200 ක ගාස්තුවක් ද පනවා අයකිරීමටත්, තවද පරෙයිවැල්ල වෙරළ උද්‍යානයට පැමිණෙන සංචාරකයන්ට දියනෑම සඳහා නාන කාමර කලාපයට ඇතුලුවීම වෙනුවෙන් නිකුත් කරන පහත සඳහන් ටිකට් පත් ගාස්තු අයකිරීමටත් පරෙයිවැල්ල වෙරළ උද්‍යාන භූමියේ නගර සභාවේ ලියාපදිංචි වී ඇති වෙළඳුන්ට වෙන් කර දී ඇති භූමිය අතහැර ඉතිරි භූමි කොටස්වල වෙළඳ ප්‍රවර්ධන කටයුතු සඳහා ලබාදීමේ දී දිනකට රුපියල් 30,000.00 අයකිරීමටත්, සංචාරක ප්‍රවර්ධන සැනකෙළි සඳහා දිනකට රුපියල් 100,000.00ක් අයකිරීමටත් තංගල්ල නගර සභාව විසින් යෝජනා කරන්නීය.

01. ළමයින් සඳහා නිකුත් කරන ප්‍රවේශ පත්‍ර ගාස්තුව	රු. 20 0 (විස්සයි)
02. වැඩිහිටියන් සඳහා නිකුත් කරන ප්‍රවේශ පත්‍ර ගාස්තුව	රු. 50 0 (පනහයි)

12-596/8

තංගල්ල නගර සභාව

පුස්තකාල ගාස්තු පැනවීම - 2023 වර්ෂය

තංගල්ල නගර සභාවේ 2022.09.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් 2023 වර්ෂයට වරිපනම් හා බදු පැනවීමට කරන ලද නිර්දේශය 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 04/V(ix) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආරියදාස වර්ණකුලසූරිය,
සභාපති,
තංගල්ල නගර සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනත මගින් හා 1952 අංක 06 දරන පළාත් පාලන මණ්ඩල උපනීති මගින් තංගල්ල නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව අතුරු ව්‍යවස්ථාවේ xvii වැනි කාණ්ඩයේ පුස්තකාලය පිළිබඳ උපනීති මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව මුල්වරට සාමාජිකත්වය ලබා ගන්නා තැනැත්තෙකු වන විට පහත සඳහන් ගාස්තු ගෙවා සාමාජිකත්වය ලබා ගත යුතු බවත්, තංගල්ල නගර සභාව විසින් යෝජනා කරන්නීය.

අනු. අංකය	*විස්තරය*	*ගාස්තුව*
01.	ඇප තැන්පත් මුදල	රු. 300 0
02.	පරිගණක කාඩ්පත සඳහා	රු. 300 0
03.	කුඩා ළමුන් සඳහා ගාස්තුව (අවු. 18ට අඩු)	රු. 50 0

ප්‍රමාදවන දිනකට අය කරනු ලබන ප්‍රමාද ගාස්තුව දින 01 ක් සඳහා රු. 5 00කි.

12-596/9

තංගල්ල නගර සභාව

විවිධ ගාස්තු පැනවීම - 2023 වර්ෂය

තංගල්ල නගර සභාවේ 2022.09.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් 2023 වර්ෂයට වරිපනම් හා බදු පැනවීමට කරන ලද නිර්දේශය 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 04/V(X) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආරියදාස වර්ණකුලසූරිය,
සභාපති,
තංගල්ල නගර සභාව.

2022 වර්ෂයේ ඔක්තෝබර් මස 18 වැනි දින,
තංගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වැනි අධිකාරිය වන නගර සභා ආඥාපනත මගින් තංගල්ල නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයට පහත සඳහන් සේවා සහ වෙනත් අනුෂාංගික කාර්යයන් ඉටු කිරීමේ දී තංගල්ල නගර සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි පහත උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, 2023 වර්ෂය සඳහා විවිධ ගාස්තු පනවා අය කිරීමටත් යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*සේවාව*	*ගාස්තුව රු. ශත*
01.	ජලය ලබාදීමේ ලිපියක්	300 0
02.	නොපවරා ගැනීමේ සහතිකයක්	500 0
03.	වීථි රේඛා සහතිකයක්	500 0
04.	අයිතිය පිළිබඳ සහතිකයක්	500 0

අනු. අංකය	සේවාව	ගාස්තුව රු. ශත
05.	සභාව විසින් නිකුත් කරනු ලබන වෙනත් සහතිකයක්	500 0
06.	ඔප්පු සාරාංශ නිකුත් කිරීමේ අයදුම්පත සඳහා	100 0
07.	ඉඩම් අනුබෙදුම් අයදුම්පත්	500 0
08.	ගොඩනැගිලි අයදුම්පත්	1,000 0
09.	නිවාස වලින් බැහැර කරන ද්‍රව්‍ය ඉවත් කිරීම 01. ට්‍රැක්ටර් ලෝඩ් 1 (එකක්) සඳහා	2,500 0
10.	මළ අපද්‍රව්‍ය ඉවත් කිරීම :	
	01. ගලි බවුසරයක් සඳහා බල ප්‍රදේශය තුළ	7,000 0
	02. ගලි බවුසරයක් සඳහා බල ප්‍රදේශයෙන් පිටත	9,000 0
	03. ධාවනය වන කි. මී. 1 සඳහා (බල ප්‍රදේශයෙන් පිටත පමණක්)	75 0
11.	ගිණි නිවීමේ රථයක් එක් සේවා වාරයක දී/එක් දිනයක දී-	
	01. බල ප්‍රදේශයෙන් පිටත සේවයේ යෙදීම සඳහා	15,000 0
	02. ධාවනය වන කි.මී. 01 (එකක්) සඳහා	200 0
	03. යන්ත්‍ර ක්‍රියාකාරී ධාවන පැය 01 (කි. මී. එකක්) සඳහා	1,000 0
	04. ගිනි නිවීමේ සිලින්ඩර 01 (එකක්) සඳහා	
12.	ගිනි හා ආපදා කළමණාකරණ පුහුණුව ලබා දීම සඳහා සේවාලාභියා වෙතින් අයකරනු ලබන ගාස්තුව	
	01. විශේෂ පුහුණුව එක් දිනක් සඳහා (දිනය පුරාම)	25,000 0
	02. සාමාන්‍ය පුහුණුව එක් දිනක් සඳහා (පැය 03ක්)	15,000 0
	03. පුහුණු සම්පත් දායක දීමනාව (එක් සම්පත් දායකයෙක් සඳහා පැයකට)	300 0
	ගිනි හා ආපදා අනුකූලතා සහතිකය ලබා දීම	10,000 0
13.	ගිනි ආරක්ෂණ සහතිකය ලබා දීම	
	01. පළාත් පාලන ආයතන ගිනි ආරක්ෂණය සඳහා ලියාපදිංචි ගාස්තුව (වාර්ෂික)	50,000 0
	02. පළාත් පාලන ආයතන ලියාපදිංචි වර්ෂය සඳහා අදාළ සේවා ලබා නොගැනීම මත ඊළඟ වර්ෂයේ සිට ලියාපදිංචි ගාස්තුව	25,000 0
14.	03. ආයතන ස්වභාවය මත වෙනත් ආයතන ගිනි ආරක්ෂණය සඳහා ලියාපදිංචි ගාස්තු (වාර්ෂික)	
	i. ඉන්ධන පිරවුම්හල්	50,000 0
	ii. වෙඩි බෙහෙත් ආශ්‍රිත කර්මාන්ත ශාලා	50,000 0
	iii. ඇඟලුම් කර්මාන්ත ශාලා	50,000 0
	iv. ලී ආශ්‍රිත කර්මාන්තශාලා	25,000 0
	v. බෝට්ටු නිපදවීමේ ආයතන	25,000 0
	vi. විශේෂිත අවදානම සහිත කර්මාන්ත	25,000 0
	vii. ප්‍රධාන පෙලේ වෙළඳ ආයතන	10,000 0
	viii. වෙළඳ ආයතන/හෝටල් (සාමාන්‍ය)	10,000 0

අනු. අංකය	සේවාව	ගාස්තුව රු. ශත
ix.	ප්‍රධාන පෙලේ හෝටල්	50,000 0
x.	ප්‍රභූ නිවාස	5,000 0
xi.	සිනමා ශාලා	25,000 0
xii.	අනෙකුත් කර්මාන්ත ශාලා	25,000 0
xiii.	ගෑස් ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථාන	50,000 0
xiv.	රසායන ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථාන	25,000 0
xv.	ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථාන	25,000 0
xvi.	ශේෂිත ගිණි හා ආපදා අවදානම් සහිත ව්‍යාපාර	15,000 0
xvii.	පොත් පත්, පත්තර ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථාන	25,000 0
xviii.	තීන්ත ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථාන	25,000 0
xix.	රෙදි ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථාන	25,000 0
xx.	කඩදාසි හා පොලිතීන් ගබඩා කර/විකිණීමේ ස්ථාන	25,000 0
15.	වාණිජ ගොඩනැගිලි සැලසුම්වල ගිනි ආරක්ෂණ සැලසුම අනුමත කිරීම සඳහා ගාස්තුව -	
i.	ගොඩනැගිලි වර්ගඵලය වර්ග මීටර් 300 දක්වා	3,000 0
ii.	ගොඩනැගිලි වර්ගඵලය වර්ග මීටර් 301 සිට ව. මී. 500 දක්වා	4,500 0
iii.	ගොඩනැගිලි වර්ගඵලය වර්ග මීටර් 501 සිට ව. මී. 750 දක්වා	6,000 0
iv.	ගොඩනැගිලි වර්ගඵලය වර්ග මීටර් 751 සිට ව. මී. 1000 දක්වා	8,000 0
v.	ගොඩනැගිලි වර්ගඵලය වර්ග මීටර් 1001 සිට ව. මී. 1300 දක්වා	10,000 0
vi.	ගොඩනැගිලි වර්ගඵලය වර්ග මීටර් 1300ට වැඩි වන සෑම ව. මී. 300ක් සඳහා	3,000 0 බැගින්
16.	නගර ශාලාව වෙන් කිරීමේ ගාස්තු	
i.	ප්‍රදර්ශන භූමිය සමග (රාජ්‍ය ආයතන ඇතුළුව)	25,000 0
ii.	මුදල් අයකර සිදුකරනු ලබන වැඩසටහන් සඳහා	20,000 0
iii.	භාණ්ඩ ප්‍රදර්ශනය හා විකිණීම	20,000 0
iv.	ප්‍රදර්ශන ශාලාව පමණක් (රාජ්‍ය ආයතන ඇතුළුව)	15,000 0
v.	ලාභ පිණිස හෝ ආධාර පිණිස පවත්වන සම්ප්‍රේෂණ/සාකච්ඡා/සංදර්ශන/දේශන	20,000 0
vi.	නගර ශාලාව අවට භූමිය පමණක් වෙන් කිරීමේ ගාස්තු	5,000 0
vii.	මංගල උත්සව	10,000 0
viii.	සාකච්ඡාවක් හෝ රැස්වීමක් හෝ තෑගි බෙදදීමක්	
ix.	සහතික පත්‍ර ප්‍රදානය කිරීමක්	
x.	නාට්‍ය රඟ දැක්වීම හා පුහුණු කිරීම	
xi.	විශ්‍රාමිකයන් හෝ සමිතියක සාමාජිකයන්ගේ උත්සව	
xii.	ගෘහස්ත ක්‍රීඩා ඉසව් පැවැත්වීම	
xiii.	නැටුම්/ගැයුම්/වැයුම් ක්‍රීඩා ඇතුළු ළමුන්ගේ ප්‍රසංග	
xiv.	පාසල් ළමුන් සඳහා පැවැත්වෙන වැඩමුළු/සම්මන්ත්‍රණ/අධ්‍යාපන වැඩසටහන්	10,000 0
xv.	සම්මන්ත්‍රණයක් සඳහා රාජ්‍ය ආයතනයකට	
මෝටර් රථයක්, මෝටර් කාරයක්, ලොරියක්, මෝටර් බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා හෝ සෑම බයිසිකලයක්, ට්‍රයිසිකලයක් හෝ කරත්තයක් සඳහා -	18 0
(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
(ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	20 0
සෑම කරත්තයක් සඳහා	10 0
සෑම අත් කරත්තයක් සඳහා	7 50
සෑම රික්ෂෝවක් සඳහා	15 0
සෑම අශ්වයෙකු, පෝනියෙකු, හෝ කොටළුවෙකු සඳහා	50 0
සෑම අලියෙකු, ඇතෙකු සඳහා	20 0

12 - 458/4

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා දැන්වීම් ප්‍රදර්ශනය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2022.10.25 දින පවත්වන ලද හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05-(i)-01-(v) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ආර්. උඩවත්ත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
හිඟුරක්ගොඩ.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය 1 වැනි උපවගන්තිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) කොටසේ පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම වෙනුවෙන් 2023 වර්ෂයට පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

	රු. ශත
ස්ථිර ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ෂයකට බලපත්‍ර ගාස්තුව	1,000 0

12 - 458/5

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2022.10.25 දින පවත්වන ලද හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05-(i)-01-(vi) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ආර්. උඩවත්ත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
හිඟුරක්ගොඩ.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය (1) උපවගන්තිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වූ යම් ඉඩමක්, වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන බද්දක් විකුණුම්කරු හෝ එම වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත 2023 වර්ෂයේ දී ගෙවිය යුතු බවට යෝජනා කරමි.

12 - 458/6

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 උප වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022.10.25 දින පැවති හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05-(i)-01-(vii) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ආර්. උඩවත්ත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
හිඟුරක්ගොඩ.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත දියුණු ගම් ප්‍රදේශ ලෙස හඳුනාගත් ප්‍රදේශවල පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් 2021 වාර්ෂික වටිනාකම සඳහා 2017 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරුව 2023 වර්ෂය සඳහා සම්මත කිරීමටත්, ඒ එක් එක් තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී

වාර්ෂික වටිනාකමින් 7% ක වරිපනම් බද්දක් නියම විය යුතු බවටත් තවද, 2023 වර්ෂයෙ හි පහත උප ලේඛනයෙ හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ප්‍රාදේශීය සභා අරමුදල වෙත ගෙවිය යුතු බවටත් එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2023 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයට 10% ක වට්ටමක් ද එකී උප ලේඛනයෙ හි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවක අදළ මුදලින් 5% ක වට්ටමක් ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව *කාර්තුව*	*II වැනි තීරුව* *ගෙවිය යුතු දිනය*	*III වැනි තීරුව* *5%ක වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2023.03.31	2023.01.31
දෙවන කාර්තුව	2023.06.30	2023.04.30
තුන්වන කාර්තුව	2023.09.30	2023.07.31
හතරවන කාර්තුව	2023.12.31	2023.10.31

12 - 458/7

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව

සභාව සතු දේපළ කුළියට දීම සඳහා ගාස්තු - 2023

2023 වර්ෂයේ දී හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් පහත උපලේඛනයන් හි සඳහන්ව ඇති ස්ථාන කුළියට ලබාදීමේ දී ඊට අදළව සඳහන් කර ඇති ගාස්තු අය කිරීමට 2022.10.25 දින පැවති හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05-(i)-01-(viii) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ආර්. උඩවත්ත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
හිඟුරක්ගොඩ.

යෝජනාව

2023 වර්ෂයේ දී හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් පහත උපලේඛනයෙ හි සඳහන්ව ඇති ස්ථාන කුළියට ලබාදීමේ දී ඊට අදාළව සඳහන් කර ඇති ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

විෂය	*අයකරන ගාස්තුව*	*ඇප තැන්පත්*	
		දිනකට	*මුදල*
		රු. ශ.	*රු. ශ.*
01.	ඩඩ්ලි සේනානායක ක්‍රීඩාංගනය	10,000.00	15,000.00
02.	සභාවට අයත් අනෙකුත් සියලුම ක්‍රීඩාංගන	5,000.00	10,000.00
03.	තාරකා මණ්ඩප ශාලාව	10,000.00	10,000.00
04.	හිඟුරක්ගොඩ පුරනැගුම ගොඩනැගිල්ලේ ඉහල මහලේ රැස්වීම් ශාලාව	7,000 00	

උපලේඛනය

විෂය		*අයකරන ගාස්තුව*
01.	දැන්වීම් පුවරු/තාවකාලික බැනර්	වර්ග අඩියකට රු. 25 0
02.	දැන්වීම් පුවරු ස්ථිර	වර්ග අඩියකට රු. 100 0

12-458/8

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව

ආදහනාගාර සහ සුසාන භූමි පනත - 2023

2023 වර්ෂයේ දී හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් ආදහනාගාරයේ ගාස්තු සහ සුසානභූමි ගාස්තු පහත උපලේඛනයේ සඳහන් පරිදි අය කිරීමට 2022.10.25 දින පැවති හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05-(i)-01-(ix) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ආර්. උඩවත්ත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
හිඟුරක්ගොඩ.

යෝජනාව

2023 වර්ෂයේ දී හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් ආදහනාගාරයේ ගාස්තු සහ සුසානභූමි ගාස්තු පහත උපලේඛනයේ සඳහන් පරිදි අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

විෂය		*අයකරන ගාස්තුව* *රු. ශ.*
01.	ආදහනයක් සිදු කිරීම (හිඟුරක්ගොඩ බල ප්‍රදේශය ඇතුළත)	18,000 0
02.	ආදහනයක් සිදු කිරීම (හිඟුරක්ගොඩ බල ප්‍රදේශයෙන් පිටත)	19,000 0
03.	තැම්පත් කිරීමක් සඳහා	1,000 0
04.	භූමදනයක් සිදු කිරීම සඳහා	500 0

12-458/9

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව

සති පොළ ගාස්තු - 2023

2023 වර්ෂයේ දී හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් හිඟුරක්ගොඩ සතිපොළෙ හි සතිපොළ පැවැත්වෙන දිනක ගාස්තුව පහත සඳහන් පරිදි අය කිරීමට 2022.10.25 දින පැවති හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05-(i)-01-(x) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ආර්. උඩවත්ත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
හිඟුරක්ගොඩ.

යෝජනාව

2023 වර්ෂයේ දී හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් හිඟුරක්ගොඩ සතිපොළෙ හි සතිපොළ පැවැත්වෙන දිනක ගාස්තුව පහත සඳහන් පරිදි අය කිරීමට යෝජනා කරමි.

මැන වෙන් කර ඇති ලොකු කොටුවක් සඳහා - රු. 200.00
පොඩි කොටුවක් සඳහා රු. 100.00
සතිපොළ පරිශ්‍රයෙන් පිටත (එළියේ) වෙළඳම් කරන මීටර් අඩි 3 x 3 ප්‍රමාණයේ ස්ථානයක් සඳහා රු. 1,000.00

12-458/10

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව

සභාව සතු යන්ත්‍ර උපකරණ කුළියට දීමේ ගාස්තු - 2023

2023 වර්ෂයේ දී හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් යන්ත්‍ර, වාහන කුළියට ලබා දීමේ දී පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට 2022.10.25 දින පැවති හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05-(i)-01-(xi) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ආර්. උඩවත්ත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
හිඟුරක්ගොඩ.

යෝජනාව

2023 වර්ෂයේ දී හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් යන්ත්‍ර, වාහන කුළියට ලබා දීමේ දී පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

* මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යන්ත්‍ර පැයක් සඳහා රුපියල් 8,100.00
* JCB යන්ත්‍රය සඳහා යන්ත්‍ර පැයක් සඳහා රුපියල් 6,400.00
* චතුර බවුසරය සඳහා බවුසරයක් රුපියල් 2,500.00
  (ප්‍රවාහනය 1 කි. මී.) රුපියල් 200.00
* ටිපර් රථය සඳහා පැයකට රුපියල් 2200.00
* ට්‍රැක්ටර් ජල බවුසරය දවසකට රුපියල් 1,500.00
  (රඳවා තබා ගැනීමකට දවසකට) රුපියල් 1,000.00
* තණකොළ කපන යන්ත්‍රය කපන පැයක් සඳහා රුපියල් 2,300.00
* ට්‍රැක්ටර් රථ සඳහා මැෂින් පැය 01කට රුපියල් 1700.00
* ගලී බවුසරයේ ලෝඩ් 01ක් සඳහා රුපියල් 4,000.00
  (ප්‍රවාහනය 1 කි. මී.) රුපියල් 100.00

12-458/11

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ව්‍යාපාරික බදු

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) වැනි ඡේදය සමග කියැවෙන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උතුරු පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් පිළියෙල කරනු ලැබ අංක 2011/25 හා 2017.03.24 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද්ද, වූ සම්මත අතුරු ව්‍යවස්ථාවල වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව විසින් අංක 04 හා 2017.05.02 දිනැති පරිපාලන නියෝගය මගින් පිළිගත් බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123(2) වැනි වගන්තිය යටතේ අංක 2025 හා 2017.06.23 දිනැති ගැසට් පත්‍රය මගින් පළ කරනු ලැබීමට අනුව, උතුරු පළාත් සභාවේ සම්මත අතුරු ව්‍යවස්ථාවලට අනුව හා ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පහත දැක්වෙන ව්‍යාපාර හා කර්මාන්ත පවත්වාගෙන යාම, විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම යනාදිය සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුකූලව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍යය ආරක්ෂා වන අරමුණින්, එකී පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු 126 (ix) හා 126(xxiii) යන වගන්තිවල උපවගන්ති යටතේ සහ 147, 148, 149, 150, 152(1) හා 154 යන වගන්ති යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ අංක 02 හා 17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව පහත උපලේඛනයෙහි දැක්වෙන ව්‍යාපාරික හා කර්මාන්ත ආයතනවලින් 2023 වර්ෂයට බලපත්‍ර ගාස්තු හා බදු 2023 වසරේ ජනවාරි මස පළමු වැනිද සිට මාස තුනක කාලය ඇතුළත වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ හෝ මල්ලාකම්, තෙල්ලිප මයිලිට්ඩි හා කංකසන්තුරයි යන උප කාර්යාලවලට හෝ ගෙවීම් කිරීමට හැකි වන අතර සෑම වසරකම මාර්තු මස 31 වැනිදාට පෙර ගෙවිය යුතු වේ.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි).

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි).

1. ව්‍යාපාරික බලපත්‍ර ගාස්තු/බදු

අනු. අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*අයකිරීම රු. ශත*
1	තේ කඩයක් පවත්වාගෙන යාම සඳහා	500 0
2	තේ කඩයක් හා භෝජනාගාරයක් පවත්වාගෙන යාම සඳහා	1,000 0
3	නේවාසික පහසුකම් සමගින් නවාතැන් නිවසක් පවත්වාගෙන යාම සඳහා	1,000 0
4	සාමාන්‍ය භෝජනාගාරයක් පවත්වාගෙන යාම සඳහා	1,000 0
5	බේකරියක් පවත්වාගෙන යාම - නිෂ්පාදන	1,000 0
6	බේකරියක් පවත්වාගෙන යාම - අළෙවිය	1,000 0
7	විවේකාගාරයක් පවත්වාගෙන යාම	1,000 0
8	කොණ්ඩා කපන ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
9	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	1,000 0
10	''බීඩි'' සුරුට්ටු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	750 0
11	එළු මස් කඩයක් පවත්වාගෙන යාම	1,000 0

අනු. අංකය	ව්‍යාපාරයේ ස්වභාවය	අයකිරීම රු. ශත
12	වෙනත් මාංශ වර්ග අළෙවිසැලක් පවත්වාගෙන යාම	1,000 0
13	මාළු අළෙවිසැලක් පවත්වාගෙන යාම	1,000 0
14	කුඩා තිර චිත්‍රපටි දර්ශන පෙන්වන ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
15	ගඩොල් හෝ උළු ගබඩා කිරීම	1,000 0
16	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ අළෙවි කිරීම	1,000 0
17	ගොඩනැගිලි ද්‍රව්‍යයන් අළෙවි කිරීම හෝ තබා ගැනීම	1,000 0
18	යකඩ භාණ්ඩ අළෙවි කිරීම හෝ තබා ගැනීම	1,000 0
19	පරණ යකඩ භාණ්ඩ අළෙවි කිරීම හෝ තබා ගැනීම	1,000 0
20	සිමෙන්ති කොට්ට 25 කට වැඩියෙන් අළෙවි කිරීම හෝ තබා ගැනීම	1,000 0
21	ලී මඩුවක් පවත්වාගෙන යාම - ලී බඩු නිෂ්පාදනය	1,000 0
22	ලී බඩු විකිණීම	1,000 0
23	තල් ලී මඩුවක් පවත්වාගෙන යාම හෝ අළෙවි කිරීම	1,000 0
24	දර මඩුවක් පවත්වාගෙන යාම	1,000 0
25	වඩු වැඩ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	1,000 0
26	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ අළෙවි කිරීම	1,000 0
27	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීමේ මෝලක් පවත්වාගෙන යාම - ලෑලි	1,000 0
28	''ලෑලි'' දැව අළෙවි කිරීම	1,000 0
29	මිනිස් ශ්‍රමයෙන් ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම	1,000 0
30	යාන්ත්‍රික යකඩ කම්හලක් පවත්වාගෙන යාම	1,000 0
31	යකඩ කම්හලක් පවත්වාගෙන යාම	750 0
32	රසැති පාන වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
33	අයිස් කැට නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
34	අයිස් කැට අළෙවි කිරීම	1,000 0
	දැව නිෂ්පාදනය :	
35	අයිස් ක්‍රීම් නිෂ්පාදනය කිරීම	1,000 0
36	අයිස් ක්‍රීම් හා සිසිල් බීම වර්ග අළෙවි කිරීම	1,000 0
37	රසකැවිලි (මිට්ටායි) නිෂ්පාදනය	1,000 0
38	පැණි ටොපි අළෙවි කිරීම	1,000 0
39	පළතුරු බීම වර්ග නිෂ්පාදනය කිරීම හා අළෙවි කිරීම	1,000 0
40	එළවළු කඩයක් පවත්වාගෙන යාම (අනුමත කළ)	500 0
41	පළතුරු විකිණීම	500 0
42	කිරිහළක් පවත්වාගෙන යාම	1,000 0
43	කිරි එකතු කිරීම හා විකිණීම	1,000 0
44	කොට්ට පොල් නිපදවීම හෝ තබා ගැනීම	1,000 0
45	ගැළුම් 50 කට වැඩියෙන් පොල්තෙල් තබා ගැනීම	1,000 0
46	පොල් එකතු කිරීම හා විකිණීම	1,000 0
47	යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිෂ්පාදනය කිරීම	1,000 0
48	පොල් කොහු නිෂ්පාදනය කිරීම හෝ එකතු කිරීම	1,000 0
49	කොසු හෝ ඉදල් නිෂ්පාදනය කිරීම	500 0
50	රන් ආභරණ නිපදවීම හා පළඳු බැලීම	1,000 0
51	රන් ආභරණ අළෙවි කිරීම	1,000 0

අනු. අංකය	ව්‍යාපාරයේ ස්වභාවය	අයකිරීම රු. ශත
52	විදුලි බලයෙන් ආලේප කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
53	තොග වෙළෙඳාම පිණිස හොණ්ඩර 10 ක් හෝ ඊට වඩා වැඩියෙන් පිටි, සීනි, පරිප්පු, හාල්, ලුණු තබා ගැනීම	1,000 0
54	පෙට්ටි කඩයක් පවත්වාගෙන යාම	500 0
55	තේ කොළ ටොන් 10 කට වැඩියෙන් තබා ගැනීම	1,000 0
56	සිල්ලර කඩයක් පවත්වාගෙන යාම	1,000 0
57	හාල් නිෂ්පාදනය කිරීම	1,000 0
58	හාල් අළෙවි කිරීම	1,000 0
59	පපඩම් නිෂ්පාදනය හා අළෙවිය	1,000 0
60	තල් හකුරු නිෂ්පාදනය හා අළෙවිය	1,000 0
61	කඩල අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0
62	පළතුරු හෝ වෙනත් ආහාර වර්ග හා ටින්වල අසුරන ලද ද්‍රව්‍යයන් තබා ගැනීම	1,000 0
63	සත්ත්ව ආහාර කඩයක් පවත්වාගෙන යාම	1,000 0
64	කුකුළන් සඳහා වන ආහාර නිෂ්පාදනය කිරීම හෝ අළෙවි කිරීම	1,000 0
65	කුකුළන් හා සතුන් සඳහා වන ආහාර නිෂ්පාදනය කිරීම	1,000 0
66	රා එකතු කිරීමේ හෝ අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
67	පිදුරු කඩයක් පවත්වාගෙන යාම	500 0
68	හිස් බෝතල් හා ගෝනි එකතු කිරීම	500 0
69	පරණ පුවත්පත් එකතු කිරීම හා අළෙවි කිරීම	500 0
70	අළුත් හෝ පරණ ටයර් 25 කට වැඩියෙන් තබා ගැනීම	500 0
71	පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0
72	යතුරු පැදි, පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
73	මෝටර් රථ වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
74	වෑල්ඩිං ගරාජයක් පවත්වාගෙන යාම	1,000 0
75	ටිංකරිං වැඩපොළක් පවත්වාගෙන යාම	1,000 0
76	ලියවන පට්ටල යන්ත්‍ර වැඩපොළක් පවත්වාගෙන යාම	1,000 0
77	විසිරි තීන්ත ආලේපන ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
78	බැටරි නැවත ආරෝපණය කිරීමේ හෝ පළුදු බැලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
79	මෝටර් රථ වාහනවලට බොඩි සවි කිරීමේ වැඩපොළක් පවත්වාගෙන යාම	1,000 0
80	මෙට්ට සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
81	ටයර් හා ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0
82	ටයර් නැවත පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
83	මෝටර් රථ වාහන සඳහා ටයර් හා ටියුබ් අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
84	මෝටර් රථ වාහනවල අමතර කොටස් අළෙවි කිරීම	1,000 0
85	පාපැදි අමතර කොටස් අළෙවි කිරීම	1,000 0
86	වායු සමීකරණ නිපදවීම, අලුත්වැඩියා කිරීම හා එක්කාසු කිරීම	1,000 0
87	ශීතකරණ හා අධිශීතකරණ නිෂ්පාදනය කිරීම හා අලුත්වැඩියා කිරීම	1,000 0
88	විදුලි උපකරණ, විදුලි පංකා, මෝටර් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
89	රූපවාහිනී යන්ත්‍ර හා ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
90	යතුරුලියන හා ද්විගුණ වේග යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
91	රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍රවල අමතර කොටස් අළෙවි කිරීම	1,000 0

අනු. අංකය	ව්‍යාපාරයේ ස්වභාවය	අයකිරීම රු. ශත
92	රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍ර අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
93	විදුලි උපකරණ අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
94	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
95	අළුත් පාපැදි අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
96	පෙට්‍රල් ඩීසල් හා පොළොවෙන් ලබාගන්නා වෙනත් තෙල් වර්ග තබා ගැනීම	1,000 0
97	පෙට්‍රල්, ඩීසල් අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
98	පුවත්පත් කඩයක් පවත්වාගෙන යාම හෝ බෙදා හැරීම	1,000 0
99	මිනිස් ශ්‍රමයෙන් ක්‍රියාන්විත මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	1,000 0
100	විදුලිබල ශක්තියෙන් ක්‍රියාන්විත මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	1,000 0
101	පොදු ප්‍රචාරක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
102	වෛද්‍ය විශේෂඥ උපදෙස් සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
103	පුද්ගලික සත්ත්ව රෝහලක් පවත්වාගෙන යාම	1,000 0
104	පෞද්ගලික ආයුර්වේද රෝහලක් පවත්වාගෙන යාම	1,000 0
105	පෞද්ගලික බටහිර රෝහලක් පවත්වාගෙන යාම	1,000 0
106	බටහිර පන්නයේ (ඉංග්‍රීසි) බෙහෙත් වර්ග තබා ගැනීම හා අළෙවි කිරීම	1,000 0
107	ආයුර්වේද බෙහෙත් වර්ග තබා ගැනීම හා අළෙවි කිරීම	1,000 0
108	රෙදි වියන අත්යන්ත්‍ර පවත්වාගෙන යාම	1,000 0
109	ඇඳුම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
110	රෙදිවලට සායම් දැමීමේ හෝ මුද්‍රණ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
111	මහන කඩයක් පවත්වාගෙන යාම	1,000 0
112	මැසූ නිමි ඇඳුම් අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
113	කෘෂිකර්ම රසායනික ද්‍රව්‍යයන් නිෂ්පාදනය කිරීම හෝ තබා ගැනීම	1,000 0
114	සම් භාණ්ඩ, සපත්තු නිපදවීම	1,000 0
115	පාවහන් අළෙවි කිරීම	1,000 0
116	විසිතුරු භාණ්ඩ අළෙවි සලක් පවත්වාගෙන යාම	1,000 0
117	සබන් නිපදවීම	1,000 0
118	ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීම	1,000 0
119	ප්ලාස්ටික් භාණ්ඩ අළෙවි කිරීම	1,000 0
120	P. V. C. නල නිෂ්පාදනය කිරීම හෝ තබා ගැනීම හෝ අළෙවි කිරීම	1,000 0
121	හුණු හා හුණු ගල් තබා ගැනීම	500 0
122	තීන්ත, ''වාර්නිෂ්'', පොලිෂ් අළෙවි කිරීම	1,000 0
123	කුකුළන් 50 කට වැඩි වූ ගොවිපළක් පවත්වාගෙන යාම	1,000 0
124	වී, හාල් පිටි ඇඹරුම් හළක් පවත්වාගෙන යාම	1,000 0
125	මිරිස්, කෝපි ඇඹරුම් හළක් පවත්වාගෙන යාම	1,000 0
126	සෙක්කුවෙන් හෝ අත් යන්ත්‍රයෙන් පොල්තෙල් නිපදවීම හා විකිණීම	1,000 0
127	වීදුරු භාණ්ඩ හෝ මැටි භාණ්ඩ නිපදවීම හෝ අළෙවි කිරීම	500 0
128	වීදුරු නිපදවීම හෝ අළෙවි කිරීම	1,000 0
129	රූප රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
130	ක්‍රීඩා භාණ්ඩ නිපදවීම හෝ අළෙවි කිරීම	1,000 0
131	ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම හෝ අළෙවි කිරීම	1,000 0
132	ඡායාරූප ගැනීමේ ස්ටූඩියෝවක් පවත්වාගෙන යාම	1,000 0
133	ඡායාරූප ගැනීමේ ස්ටූඩියෝවක් හා වීඩියෝ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0

අනු. අංකය	ව්‍යාපාරයේ ස්වභාවය	අයකිරීම රු. ශත
134	ගීත හා සංගීත හඬ තැටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
135	රූපවාහිනී චිත්‍රපට තැටි විකිණීම හා කුළියට දීම	1,000 0
136	ඡායාස්ථික පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
137	විශේෂිත උත්සව සඳහා භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
138	අවමගුල් චාරිත්‍රයට අවශ්‍ය කරන භාණ්ඩ සැකසීම හෝ අළෙවි කිරීම	1,000 0
139	කපුරු නිෂ්පාදනය කිරීම	1,000 0
140	වාත්තු ලෝහ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	1,000 0
141	පාසල් පොත් ලිපිද්‍රව්‍ය එකතු කිරීම	1,000 0
142	ඉඩම් විකිණීමේ කාර්යාලයක් පවත්වාගෙන යාම	1,000 0
143	දුම්කොළ වැනි දෑ තබා ගැනීම	1,000 0
144	ව්‍යාපාරික අරමුණින් දුරකතන හා ෆැක්ස් සේවා	1,000 0
145	සැළසුම් ශිල්ප අනුමත කිරීමේ ගාස්තුව	1,000 0
146	හාල් මෝලක්, කොට්ටා මෝලක් තබා ගැනීම	1,000 0
147	අධ්‍යාපනික මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
148	විවිධ සේවා සමුපකාර සමිති ශාඛා	1,000 0
149	පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
150	වාහන පිරිසිදු කිරීමේ (සර්විස්) ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
151	ශබ්ද විකාශන, ආලෝකකරණ කුළියට දීම	1,000 0
152	ග්‍රෝස් එකකට වැඩි වූ රසැති පාන වර්ග විකිණීම	500 0
153	ගිනි පෙට්ටි නිපදවීම	500 0
154	හාල් අළෙවි සැලක් පවත්වාගෙන යාම	1,000 0
155	ශීතකළ මාළු හා මස් තබා ගැනීම	500 0
156	මාළු හා මස් වේළීම හා විකිණීම	1,000 0
157	මෝටර් රථ වාහන නඩත්තු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
158	විදුලි උපකරණ නිෂ්පාදනය කිරීම	1,000 0
159	ජල පොම්ප නිෂ්පාදනය හා අලුත්වැඩියාව	1,000 0
160	පෙට්‍රෝලියම් වායු විකිණීම	1,000 0
161	මිනී පෙට්ටි තැනීම හා අළෙවි කිරීම	1,000 0
162	දුරකථන සන්නිවේදන උපකරණ අළෙවිය	1,000 0
163	ඇස් කණ්නාඩි අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
164	රෙදි අළෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
165	විනෝද ගමන් සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
166	විදේශික නියෝජිතායතනයක් පවත්වාගෙන යාම	1,000 0
167	කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
168	රූපලාවණ්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම, කේක් හා අයිසින් සෑදීම	1,000 0
169	ශබ්ද විකාශන කුළියට දීම	1,000 0
170	සංචාරක අයිස් ක්‍රීම් අළෙවිය හෝ අනෙකුත් සංචාරක අළෙවිය	1,000 0
171	බුලත් කඩයක්, බීඩි කඩයක් පවත්වාගෙන යාම	500 0
172	බේකරි නිෂ්පාදන අළෙවිය	1000 0
173	මහන යන්ත්‍ර අලුත්වැඩියා කරන්නන්	500 0

අනු. අංකය	ව්‍යාපාරයේ ස්වභාවය	අයකිරීම රු. ශත
174	පැළ වර්ග නිෂ්පාදනය	500 0
175	ගොවිපළ පවත්වාගෙන යාම	1,000 0
176	මික්සර් නිෂ්පාදනය	1,000 0
177	මික්සර් අළෙවිය	1,000 0
178	පොත් බැඳීම	1,000 0
179	කරවල කඩයක් පවත්වාගෙන යාම	1,000 0
180	පාපැදි හා යතුරු පැදි අළෙවිය	1,000 0
181	කෘෂිකර්ම උපකරණ අළෙවිය	1,000 0
182	බර වාහන අළුත්වැඩියා කිරීම	1,000 0
183	වාසනා ලොතරැයි සීට්ටු ඇදීමේ ගාස්තුව	1,000 0
184	අන්තර්ජාල පහසුකම් පවත්වාගෙන යාම	1,000 0
185	උත්සව සමයේ කඩවල් සඳහා	(රු. 100-1,000 දක්වා)
186	ඇඳුම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
187	ආලෝකරණ උපකරණ කුළියට දීම	1,000 0
188	වී හාල් මෝලක් පවත්වාගෙන යාම	1,000 0
189	ඇමුණුම් කුළියට දීම	1,000 0
190	හෝටල් පවත්වාගෙන යාම	1,000 0
191	ඇළුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය	1,000 0
192	හරක් මස් කඩයක් පවත්වාගෙන යාම	1,000 0
193	කුකුළු මස් කඩයක් පවත්වාගෙන යාම	1,000 0
194	බොරළු හෝ ගල් කඩන මෝලක් පවත්වාගෙන යාම	1,000 0
195	ගල් කඩන මෝලේ ගල් විකිණීම	1,000 0
196	සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය	1,000 0
197	මත්පැන් හා විදේශීය මත්පැන් අළෙවිය	1,000 0
198	භාණ්ඩ ගබඩා කිරීමේ ස්ථාන පවත්වාගෙන යාම	1,000 0
199	සැරසිලි පැල වර්ග සුරතල් සතුන් විකිණීම	1,000 0
200	කැටයම් වැඩ පොළ	1,000 0
201	විදුලි බුබුළු සැරසිලි වැඩ පොළ	1,000 0
202	රබර් මුද්‍රා තබන වැඩ පොළ	1,000 0
203	තැපැල් කන්තෝරු සහ ඇසුරුම් කිරීමේ වැඩ පොළ	1,000 0
204	කිරි මත පැන වූ නිෂ්පාදන සහ විකුණුම් ස්ථාන	1,000 0
205	මල් ශාලා පැවැත්වීම	1,000 0
206	පූජා භාණ්ඩ හා පරණ ගොඩනැගිලි භාණ්ඩ විකිණීම	1,000 0
207	වාහන දුම් පරීක්ෂා කිරීම	1,000 0
208	හතු නිෂ්පාදන හා වෙළඳ ස්ථාන	1,000 0
209	පැල්ලම් ඉවත් කරන නිෂ්පාදන ස්ථාන	1,000 0
210	කොහු භාණ්ඩ නිෂ්පාදනය කිරීම	1,000 0

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

සුවිශේෂී වෘත්තීන් සඳහා ව්‍යාපාරික බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) වැනි වගන්තියට අනුකූලව පහත දැක්වෙන කර්මාන්තවලට පහත සඳහන් පරිදි ගාස්තු අයකර ගැනීමට අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇත.

(අ) *ව්‍යාපාරික බද්දේ ලැයිස්තුව :*

වසරකට ව්‍යාපාරික ලැබීම්	*ගෙවිය යුතු වාර්ෂික බදු ගාස්තු මුදල රු. ශත*
(1) රු. 6,000 ට වැඩි රු. 12,000 ට අඩු	250 0
(2) රු. 12,000 ට වැඩි රු. 18,750 ට අඩු	500 0
(3) රු. 18,750 ට වැඩි රු. 75,000 ට අඩු	750 0
(4) රු. 75,000 ට වැඩි රු. 1,50,000 ට අඩු	1,000 0
(5) රු 1,50,000 ට වැඩි රු. 2,00,000 ට අඩු	3,000 0

(ආ) සුවිශේෂී වෘත්තීවල ලැයිස්තුව :

(1) ඉඩම් මිනින්දෝරු
(2) නීතිඥ නොතාරිස්
(3) වෙන්දේසිකරු
(4) තැරැව්කරු
(5) තැරැව් නියෝජිත
(6) මගුල් තැරැව්කරු
(7) ගොඩනැගිලි කොන්ත්‍රාත්කරු
(8) මූල්‍ය අයෝජකයින්
(9) රැකියා නියෝජිතයින්
(10) ගමන් නියෝජිත
(11) කොමිස් අනුප්‍රාප්තික
(12) මුදල් ණයට දෙන්නන්
(13) මෝටර් රථ වාහන රියදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
(14) පරිගණන පුහුණුවීම් ආයතනයක් පවත්වාගෙන යාම
(15) විගණන ආයතනයක් පවත්වාගෙන යාම

(16) චාරිකා ගමන් බස් රථ සේවයක් පවත්වාගෙන යාම
(17) පාර්සල් ආනයන අපනයන සේවයක් පවත්වාගෙන යාම
(18) ගොඩනැගිලි නිර්මාණ කලාව හෝ නිර්මාණ ශිල්ප ආයතනයක් පවත්වාගෙන යාම
(19) රක්ෂණ නියෝජිතයින්
(20) පෞද්ගලික අධ්‍යාපනික ආයතනයක් පවත්වාගෙන යාම
(21) දේශීය වාණිජමය බැංකු ආයතන
(22) දේශීය බැංකු ආයතන
(23) සමුපකාර බැංකු ආයතන
(24) විදේශීය බැංකු ආයතන
(25) අවමංගල්‍ය සේවා භාරකරු
(26) පුද්ගලික පාසල්
(27) රන් උකස් ගන්නා ස්ථානය
(28) වෛද්‍ය සේවකයින්, පුද්ගලික බෙහෙත්ශාලා, පුද්ගලික වෛද්‍ය නිවාස
(29) ආයුර්වේද රෝහල
(30) දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
(31) සමුපකාර වෙළඳ සලක් පවත්වාගෙන යාම
(32) ෆුඩ් සිටියක් පවත්වාගෙන යාම
(33) දර්ශන කාමර පවත්වාගෙන යාම
(34) දුරකථන සන්නිවේදන කුළුණු බලපත්‍ර ගාස්තු
(35) මංගල ශාලා, හෝටල්, නවාතැන්, නිවාස, ලැගුම් නිවාස
(36) සිසිල් බීම (වාතික පාන) කර්මාන්ත ශාලා
පුද්ගලික බස් නැවතුම්පළ, බස් ආසන ලියාපදිංචිය ස්ථානය බර වාහන කුලියට ගැනීම
(37) පුද්ගලික නැවතුම් පෙදෙස, කාර්යාලයේ ආසනය
(38) බර වාහන කුළියට ගැනීම (සෑම බර වාහනයක් ම අය කරනු ලැබේ)
(39) ස්වයංක්‍රීය යාන්ත්‍රික මාරු මධ්‍යස්ථානය

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි).

12-459/2

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ගෝ ඝාතකාගාර පවත්වාගෙන යාම - 2023

ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ ගෝ ඝාතකාගාර විධිමත් කිරීමට නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම යනාදිය සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුකූලව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන

මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍යය ආරක්ෂා වන අරමුණින් 201 වැනි අධිකාරය ගෝ ඝාතක ආඥාපනත සමග 3 වැනි වගන්තියට අනුව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 102 සහ 122(1) යන වගන්ති සමග කියවිය යුතු 126 (සං) (එ) යන උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව ගෝ ඝාතකාගාරයේ ඝාතනය කරනු ලබන එක් හරකෙකු සඳහා රුපියල් 200.00 ක මුදල බැගින් ගාස්තු අයකරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි).

12-459/3

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

වාහන නතර කර තැබීම නියාමනය කිරීම - 2023

ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාහන නතර කර තැබීම විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම යනාදිය සම්බන්ධයෙන් උතුරු පළාත් සභාවේ සම්මත අතුරු ව්‍යවස්ථාවලට අනුව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්ති සමග කියවිය යුතු 126 හා (vii) (ඌ) යන උපවගන්ති යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ අංක 02/17.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව වාහන නතර කර තැබීම සඳහා වන ගාස්තු පහත දැක්වෙන පරිද්දෙන් පනවා, මාසිකව අයකරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1)	ත්‍රිරෝද රථයක් නවතා තැබීමේ ගාස්තු (එක් මසකට රු. 100.00 බැගින් එක් අවුරුද්දකට)	රු. 1,200.00
(2)	කුඩා ටිපර් (රථයක් නවතා තැබීමේ ගාස්තු (එක් මසකට රු. 100.00 බැගින් එක් අවුරුද්දකට)	රු. 1,200.00
(3)	ලෑන්ඩ් මාස්ටරයක් නවතා තැබීමේ ගාස්තු (එක් මසකට රු. 100.00 බැගින් එක් අවුරුද්දකට)	රු. 1, 200.00

පහත දැක්වෙන ස්ථාන ලියාපදිංචි කළ ත්‍රිරෝද රථ නවතා තැබීමේ ස්ථාන වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත :

1. මල්ලාකම් හංදිය
2. මල්ලාකම් වෙළෙඳ පොළ
3. අධිකරණය ඉදිරිපසින් වල්ලයි සංගානයි පාර
4. දුරක්කයියම්මන් කෝවිලඩි
5. තෙල්ලිප්පලයි රෝහල ඉදිරිපස
6. මලයිවෙම්පඩි වෙළෙඳ පොළ

7. විවිධ සේවා සමුපකාර සමිතිය ඉදිරිපසින් අලවෙඩ්ඩි
8. කේනික්කරයි
9. තවලක්කිරි මුත්තුමාරියම්මන් කෝවිලඩි අලවෙටඩ්
10. වීමන්කාමම් වෙළෙඳ පොළ
11. තෙල්ලිප්පලයි හංදිය
12. වසන්තපුරම් ග්‍රාම නිලධාරි කාර්යාලය ඉදිරිපසින්
13. සිත්තිරමේලි හංදිය
14. ආලඩි ඉලවාලයි
15. කුට්ඩියප්පුලම්
16. පන්නාලයි
17. කීරිමලයි නගුලේෂ්වරම්
18. කොල්ලංකලට්ඩි (මඩත්තඩි)
19. මාවිට්ඩටපුරම් මඩත්තඩි
20. මාවිට්ඩටපුරම් කෝවිලඩි
21. ආවලෙ හංදිය
22. මයිලිඩ්ඩි හංදිය
23. කංකසන්තුරය දුම්රිය ස්ථානය

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි),
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ දී ය.

12-459/4

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ඉඩම් වෙන්දේසි බද්ද -2023

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ, බල ප්‍රදේශය තුළ පිහිටා තිබෙන යම් ඉඩමක්, වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු හෝ විසින් වෙන්දේසියෙන් හෝ වෙනත් අන්‍යාකාරයකින් හෝ විකුණනු ලබන අවස්ථාවක එවැනි විකිණීමෙන් ලත් මුදලින් ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ ගෙවිය යුතු සියයට එකකට සමාන බදු මුදල විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ විසින් ගෙවිය යුතුයි. යන්නෙන්, අංක 02/17.11.2022 වැනි දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි),
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ දී ය.

12-459/5

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ගොඩනැගිලි ඉදිකිරීම සඳහාවන අනුමැතිය හා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21 වැනි හා 78 වැනි වගන්ති යටතේ සහ අංක 520/7 හා 1988.08.23 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් පළ කරන ලද්දා වූ ද අතුරු ව්‍යවස්ථාවල 8 වැනි වගන්තියට අනුකූලව 1978 වර්ෂයේ අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1597 දරන 17.04.2009 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත ගාස්තු වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ අළුතින් ඉදි කිරීමට යෝජිත ගොඩනැගිලිවල ප්‍රාදේශීය සභාවේ අනුමැතිය පරීක්ෂණ ගාස්තුව හා (අනවසර) ගොඩනැගිලි සඳහා වන දඩ මුදල් පහත දැක්වෙන උපලේඛන අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

කංකසන්තුරයි (කොල්ලංකලටඩ්),
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛන 01

සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම

i. ගොඩනැගිලි ඉදිකිරීමක්/පවත්නා ගොඩනැගිලිවලට අළුතින් කොටසක් එකතු කිරීමක්/නැවත ඉදිකිරීමක් සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීම.	(1)	ගෙබිමේ විශාලත්වය වර්ග මීටර්වලින්	පදිංචිය සඳහා	වාණිජ හෝ වෙනත් භාවිත
			රු. ශත.	රු. ශත.
		45 ට අඩු	500.00	1,000.00
		45 - 90	1,500.00	2,000.00
		91 - 180	2,500.00	3,000.00
		181 - 270	3,500.00	4,000.00
		271 - 450	4,500.00	6,000.00
		451 - 675	5,500.00	8,000.00
		676 - 900	6,500.00	10,000.00
		901 - 1225	7,500.00	12,000.00
		1225 ට වැඩි	7,500.00	12,000.00
		වර්ග මීටර් 1226 ඉක්මවීමෙන් පසු සෑම වර්ග මීටර් 90ක් සඳහා ම රු. 1,000 බැගින්		වර්ග මීටර් 1226 ඉක්මවීමෙන් පසු සෑම වර්ග මීටර් 90ක් සඳහා ම රු. 1,250 බැගින්

ii. මායිම් තාප්පයක්/ආරක්ෂක බැමි ඉදිකිරීමක්	(ii)	නේවාසික (දික් මීටර් 1ක සඳහා)	වාණිජ හා වෙනත් වර්ග (දික් මීටර් 1ක් සඳහා)
		රු. ශත	රු. ශත
* ගොඩනැගිලි සීමාවෙන් පිටත		300.00	400.00
* ගොඩනැගිලි සීමාව තුළ		500.00	600.00

(iii) ඉඩමක් කුඹුරක් ගොඩ කිරීම	(iii) වර්ග මීටර් 150 ට අඩු රු. 1,500 ක් සහ එයට වැඩි වන සෑම ව.මී. 150ක් සඳහා ම රු. 1,000 බැගින්
(iv) දුරකථන කුළුණක් /ඇන්ටනා කුළුණක් ඉදි කිරීම	(iv) උස මීටර් 5-20 දක්වා රු. 20,000ක් සහ එයට වැඩි වන සෑම මීටර් එකකට ම රු. 100 බැගින්
(v) විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍රයක් නිකුත් කිරීම	(v) රුපියල් මිලියන 5 කට රු. 5,000 ක් සහ එයට වැඩි වන සෑම රුපියල් මිලියන එකකට ම රු. 100 බැගින්

2. නේවාසික සඳහා වූ ඒකකයක භාවිතය වෙනස් කිරීම

(1) ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්)	පෙරසැරි ගාස්තු රු. ශත.
45 ට අඩු	500.00
45 - 90	1,000.00
91 - 180	1,250.00
181 - 270	1,500.00
271 - 450	1,750.00
451 - 675	2,000.00
676 - 900	2,250.00
900 ට වැඩි	2,250.00

වර්ග මීටර් 901කට වැඩි වන සෑම එක් එක් ව. මී. 90ක් සඳහා ම රු. 500 බැගින්

3. අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක් , සංවර්ධනයක් සඳහා ම අනුකූලතා සහතිකය ලබාගත යුතු ය.)

අනුකූලතා සහතිකය ප්‍රදනය කිරීමේ ගාස්තු

1. නේවාසික ඉදිකිරීමක්	(i)	ව. මී. 300 ට අඩු රු. 3,000 ක් සහ ඊට වැඩි වන සෑම ව. මී. 1 කට ම රු. 10 බැගින්
වාණිජ හා වෙනත් ඉදිකිරීමක්		ව. මී. 100 ට අඩු රු. 3,000 ක් සහ ඊට වැඩි වන සෑම ව. මී. 1 කට ම රු. 20 බැගින්
2. මායිම් තාප්පයක්/ආරක්ෂක බැම් ඉදිකිරීමක්	(ii)	පළමු දික් මීටර් 100ක් සඳහා රු. 1,000 ක් සහ ඊට වැඩි වන සෑම මීටර් 1 කට ම රු. 10 බැගින්
3. ඉඩමක්/කුඹුරු ඉඩමක් ගොඩකිරීම	(iii)	ව. මී. 150ට අඩු රු. 3,000 ක් සහ ඊට වැඩි වන සෑම ව. මී. 1 ක ටම රු. 20 බැගින්
4. දුරකථන /විදුලි සංදේශ කුළුණක්	(iv)	උස මීටර් 5 සිට 20 දක්වා රු. 2,000ක් සහ ඊට වැඩි වන සෑම මීටර් 1 කට ම රු. 100 බැගින්
5. විශේෂ සංවර්ධන ව්‍යාපෘතියක්		*රු. ශත.*
	(v)	කුඩා පරිමාණ සඳහා 5,000.00
		මධ්‍යම පරිමාණ සඳහා 10,000.00
		මහා පරිමාණ සඳහා 20,000.00

4. නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීමක් /කොටස් එකතු කිරීමක් /නැවත ඉදිකිරීමක්

		නේවාසික ව. මී. 1ක් සඳහා ගාස්තු රු. ශත	වාණිජ හා වෙනත් ව. මී. 1ක් සඳහා ගාස්තු රු. ශත
ඉදිකිරීමේ අදියර			
*	අත්තිකාරම් වැඩ පමණක් (ලණු මට්ටම්) සම්පූර්ණ කොට ඇති විට	200.00	500.00
*	වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇති විට	300.00	1,000.00
*	වහලය ඇතුළව ඉදිකොට ඇති විට	400.00	1,500.00
*	සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	500.00	2,000.00
ii.	මායිම් තාප්පයක්/ආරක්ෂක බැමි ඉදිකිරීමක්	400.00	400.00

iii.	ඉඩමක් /කුඹුරු ඉඩමක් ගොඩ කිරීම	සෑම වර්ග මීටර් 150 කට ම රු. 5,000 බැගින්
iv.	දුරකථන/විදුලි සංදේශ කුළුණක්	උස සෑම මීටර් 5 කට ම රු. 10,000 බැගින්
v.	විශේෂ සංවර්ධන ව්‍යාපෘතියක්	සෑම මිලියන 05 කට ම රු. 10,000 බැගින්
vi.	අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම/භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම.	එක් දිනකට රු. 50 බැගින්.

12-459/6

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ජාතික පාරිසරික පනත යටතේ වන දැන්වීම - 2023

මධ්‍යම පාරිසරික අධිකාරිය 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 28 වැනි වගන්තියට අනුව හා 1988 අංක 56 දරන සංශෝධිත පනතේ විධිවිධාන ප්‍රකාරව මධ්‍යම පාරිසරික සභාපතිවරයා විසින් එකී පනත යටතේ අංක 1159/22 හා 2002.11.22 දිනැති *අති විශෙෂ* ගැසට් පත්‍රයේ IV වැනි කොටසින් පළ කරන ලද්දාවූද එකී ගාස්තුවලට හා එකී රෙගුලාසිවලට අනුව 2003 වසරේ ජනවාරි මස 01 වැනිදා සිට පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති බලතල රාජකාරී හා කර්තව්‍ය ප්‍රාදේශීය සභාවෙහි සභාපතිවරයාට පවරාදීම මත වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ මෙම පනත ක්‍රියාත්මක වන අතර පහත උපලේඛනයෙහි දැක්වෙන කර්මාන්ත සඳහා මධ්‍යම පාරිසරික අධිකාරිය විසින් නියම කර ඇති ආකාරයේ ආකෘතිපත්‍ර ගාස්තුව එකක් සඳහා පරීක්ෂණ ගාස්තු හා බලපත්‍ර ගාස්තු යනාදිය පනවා අය කළ යුතුයි යන්නෙන් අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

ප්‍රාදේශීය සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක ගාස්තුව වශයෙන් රුපියල් 4,000 ක මුදල හා බදු මුදල අයකරනු ලැබේ. එමෙන්ම පරිසර ආරක්ෂණ බලපත්‍රය එක් වරක් (වසර තුනකට වරක්) අළුත් කරන විට පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව වශයෙන් රුපියල් 4,000 ක මුදල හා බදු මුදල අයකරනු ලැබේ.

පාරිසරික පරීක්ෂණ ගාස්තු යොදවන ලද ප්‍රාග්ධනයට අනුව පහත දැක්වෙන පරිද්දෙන් අය කරනු ලැබේ :

යොදවන ලද ප්‍රාග්ධනය	පරීක්ෂණ ගාස්තුව රු. ශත.
රු. 2,50,000 ට වඩා අඩු නම්	3,000 0
රු. 2,51,000 ත් - 5,00,000 අතර නම්	3,750 0
රු. 5,01,000 ත් 10,00,000 අතර නම්	5,000 0
රු. 10,00,000 ට වඩා වැඩි නම්	10,000 0

ප්‍රාදේශීය සභා පනතේ 149, 150, 152 (1) යන වගන්ති යටතේ පනවා අයකර ගන්නා බලපත්‍ර ගාස්තුවලට කිසිදු ආකාරයකින් අගතියක් සිදු නොවේ.

උපලේඛනය

කොටස ''ඇ''

1. සියලුම වාහන ඉන්ධන පිරවුම් හල්
2. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් යොදවන තෙල් සිඳීමේ කර්මාන්ත
4. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
5. වියළි ක්‍රියාවලි සහිත වී මෝල්
6. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 1,000 කට අඩුවන ඇඹරුම්හල්
7. දුම්කොළ වේළීමේ කර්මාන්ත
8. සල්ෆර් දුම් ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
9. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
13. දිනකට මෙට්‍රික් ටොන් 20 ට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත හුණු පෝරණු
14. සේවකයින් 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
15. සියලුම බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත
16. උළු සහ ගඩොල් කර්මාන්ත
17. පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදුකරනු ලබන කැණීම් කටයුතු සඳහා එක් වරකට එක් බෝර වලක්.
18. දිනකට ඝනමීටර් 50 ට අඩු දව ඉරුම ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත
19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5 ට වැඩි 25 ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
20. නේවාසික කාමර 05 හෝ ඊට වැඩි සහ 20 ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්
21. වාහන අලුත්වැඩියා කිරීමේ /නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ්
22. ශීතකරණ හා වායුසමීකරණ උපකරණ හා පද්ධති අලුත්වැඩියා කිරීමේ නඩත්තු කිරීම සවි කිරීම නිෂ්පාදනය කිරීම යනාදිය සිදු කරන හා නඩත්තු කිරීමේ පහසුකම (ගරාජ ඇතුළුව) ජංගම වායු සමීකරණ හා ප්‍රවාහන ශීතකරණ යන්ත්‍රවල ශීතකාරක ප්‍රතිචක්‍රීකරණය හා ප්‍රතිග්‍රහණය කරන යනාදිය සිදු කරන ස්ථාන
23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලු පර්යන්ත

24. සේවකයින් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ අලුත්වැඩියා කිරීමේ ස්ථාන

25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-459/7

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු 126 වැනි වගන්තියේ (vii) (ඊ) හා (xxx) යන උපවගන්ති යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා පළාත් පාලන නිවාස ඉදිකිරීමේ, අමාත්‍යවරයා විසින් අංක 520/7 හා 1988.08.23 දිනැති *අති විශෙෂ* ගැසට් පත්‍රය මගින් (62/A, 63/A, 64/A පිටුවල) පළ කරන ලද්දා වූ ප්‍රචාරක දැන්වීම, සම්බන්ධයෙන් වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් යම් වීදියක් මත හෝ වීදියට නෙරා සිටින ආකාරයකින් වන ප්‍රචාරක දැන්වීම පුවරු හෝ වෙනත් තාවකාලික ව්‍යුහ හෝ යම් ආකාරයකින් වන කුමන හෝ අලංකාරයේ පිහිටීමක් හෝ පිහිටුවීමට කටයුතු කිරීමේ කටයුත්ත සඳහා වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව වෙතින් අනුමැතිය ලබාගත යුතුයි. මෙම කරුණ සම්බන්ධයෙන් පහත දැක්වෙන උපලේඛනයට අනුව ප්‍රචාරක දැන්වීම් පුවරුවලට ගාස්තු අයකර ගැනීමට අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි. මෙලෙසින් සිටුවන ස්ථිර ප්‍රචාරක දැන්වීම සෑම වසරක් පාසාම මාර්තු මස 31 වැනි දිනට පෙර නියමිත ගාස්තුව ගෙවා අලුත් කිරීම කළ යුතු බවත් දන්වමි.

(1)	එක් වසරකට බිත්තියක් මතින් හෝ නාම පුවරුවක් මතින් ප්‍රදර්ශන කෙරෙන ස්ථිර ප්‍රචාරක දැන්වීමකට - වර්ග අඩියක් සඳහා (දැන්වීමක් නාම පුවරුවක දෙපැත්තෙහි ම ප්‍රදර්ශනය කර ඇත්නම් දෙපැත්තට ම ගාස්තු අය කෙරේ.)	රු. 100 0
(2)	එක් වසරකට බැනරයකින් ප්‍රදර්ශනය කෙරෙන තාවකාලික දැන්වීමකට වර්ග අඩියක් සඳහා	රු. 50 0
(3)	එක් වසරකට පුවරුවක හෝ උපකාරයක සමගින් ප්‍රදර්ශනය කෙරෙන විදුලිපහන් ධාරාව සමගින් වූ දැන්වීමකට - වර්ග අඩියක් සඳහා	රු. 200 0

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-459/8

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (272 වැනි පරිච්ඡේදය) - 2023

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශය තුළ ඇති කරන සුනඛයින් සඳහා වන ලියාපදිංචිය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148(3,4) වැනි වගන්තියට අනුකූලව එක් සුනඛයෙකුට 2022 වසරට ලියාපදිංචි කිරීමේ ගාස්තුව වශයෙන් රුපියල් 50.00ක් පනවා අයකර ගැනීමට අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/9

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

පාපැදි ලියාපදිංචි කිරීමේ ගාස්තුව සඳහා වන දැන්වීම - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 (3,4) වැනි වගන්තියට අනුකූලව පාපැදියක් ලියාපදිංචි කිරීමේ ගාස්තුව වශයෙන් 2023 වසරට රුපියල් 30.00 ක් අයකර ගැනීමට අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/10

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

කසළ හා ගල් වැලි, ගොඩනැගිලි සුන්බුන් ඉවත් කරලීම සඳහා වන ගාස්තු - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය යටතේ හා 1988.08.23 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 9(4) වැනි වගන්තිය යටතේ සභාවේ බල ප්‍රදේශය තුළ ට්‍රැක්ටර් යන්ත්‍රය මගින් කසළ බැහැර කරලීම සඳහා පහත දැක්වෙන පරිද්දෙන් ගාස්තු අයකර ගැනීමට අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

(1)	කුණු කසල බැහැර කිරීම	ට්‍රැක්ටරය මගින් ලෝඩ් 1 ක් සඳහා ගාස්තුව	රු. 1,500 0
(2)	කුකුල් අපද්‍රව්‍ය බැහැර කිරීම	ට්‍රැක්ටරය මගින් ලෝඩ් 1 ක් සඳහා ගාස්තුව	රු. 2,000 0
(3)	ගල්, වැලි, ගොඩනැගිලි සුන්බුන් බැහැර කිරීම	ට්‍රැක්ටරය මගින් ලෝඩ් 1ක් සඳහා ගාස්තුව	රු. 4,000 0
(4)	කැඩුණු වීදුරු, උළු බැහැර කිරීම	පොහොර බෑගයක් සඳහා ගාස්තුව	රු. 50 0
(5)	වෙළෙඳ සැලකින් කසළ බැහැර කිරීම	පොහොර බෑගයක් සඳහා ගාස්තුව	රු. 50 0

තේ කඩවලින් සහ භෝජනාගාරවලින් එක් වර්ගයකට අනුව කසළ බැහැර කිරීම පිණිස පහත දැක්වෙන පරිද්දෙන් මාසිකව ගාස්තුව අය කරනු ලැබේ.

සාමාන්‍ය කසළ බැහැර කිරීම සඳහා මාසික ගාස්තුව - ව්‍යාපාරික ස්ථානවලින්, තේ කඩවලින් සහ භෝජනාගාරවලින් එක් වර්ගයට අනුව අනුපිළිවෙලින් රු. 200/-, රු. 500/-.

ප්ලාස්ටික්, පොලිතීන්, බනිජමය වැනි කසල බැහැර කිරීම සඳහා මාසික ගාස්තුව - ව්‍යාපාරික ස්ථානවලින්, තේ කඩවලින් සහ භෝජනාගාර වලින් එකී වර්ගයට අනුව අනුපිළිවෙලින් රු. 5,000/-, රු. 7,500/-, රු. 10,000/.

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/11

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ගල්, බොරළු, පස්, වැලි, ගොඩනැගිලි සුන්බුන් මත ගාස්තුව - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ ගල්, බොරළු, පස්, වැලි, ගොඩනැගිලි සුන්බුන් යනාදිය බර වාහනවලින් ගෙනයාම සඳහා වන ගාස්තුව ''කියුබ්'' එකකට රුපියල් 200.00 ක් බැගින් අයකර ගැනීමට අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වම්.

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/12

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ගලි බවුසර් සේවා ගාස්තු - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව මගින් ගලි බවුසරයෙන් සේවා සැපයීමට අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන පරිදි ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි :

සභාවෙහි බල සීමාව තුළ පළමුවෙනි ලෝඩ් 1ක් සඳහා	රු. 6,000 0
ඊළඟ සෑම ලෝඩ් එකක් සඳහා ම	රු. 5,000 0
සභාවෙහි බලසීමාවට පිටින් නම් පළමුවෙනි ලෝඩ් 1 ක් සඳහා	රු. 7,500 0
ඊළඟ සෑම ලෝඩ් එකක් සඳහා ම	රු. 5,000 0

සභාවේ හි බලසීමාවට පිටින් වන සේවය සඳහා ඉහත ගාස්තුව සමගින් අතිරේක සෑම කිලෝමීටරයක් සඳහා ම රුපියල් 100.00 බැගින් අයකරනු ලැබේ.

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/13

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

බවුසරය මගින් ජලය සැපයීම සඳහා සේවා ගාස්තු - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 114 වැනි හා 118 වැනි වගන්ති යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව මගින් පානීය ජලය සැපයීමේ''සේවාව සඳහා අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි :

ජල ටැංකියක් තබා පානීය ජලය සැපයීමට :

	රු. ශ.
ජල ටැංකියක් සඳහා කුළී ගාස්තුව	1,000 0
ජල බවුසර් ටැංකියක් සඳහා කුළී ගාස්තුව	1,500 0
පානීය ජලය ලීටර් එක (1) ක් සඳහා ගාස්තුව	1.0
වෙනත් කාර්යයන් සඳහා පාවිච්චි කරන ජලය ලීටර් එක (1) ක් සඳහා ගාස්තුව	2 0

එස්. සුකීර්තන්,
සභාපති,

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/14

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

රෝලර් මැෂින් යන්ත්‍රයක් සඳහා කුළිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව විසින් රෝලර් යන්ත්‍රයෙන් සේවා සැපයීම සඳහා අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන ගාස්තු අයකිරීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එක් පැයක් සඳහා රුපියල් 2,500.00 කි. පැය 2 කට වඩා අඩුවෙන් එක් දවසකට වැඩ කිරීමට හැකියි. පැය 2 කට වඩා අඩු වූ අවශ්‍යතාවයක් සඳහා ගාස්තුව රුපියල් 5,000.00 කි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/15

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

මෝටර් ග්‍රේඩර් *(Motor Grader)* යන්ත්‍රයක් සඳහා කුළිය - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය යටතේ වලිකාමම්, උතුරු ප්‍රාදේශීය සභාව විසින් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයෙන් සේවා සැපයීම සඳහා අංක 02/17.11.2022 දින සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එක් පැයක් සඳහා රුපියල් 4,750.00 කි (ගමන් ගාස්තුව ඇතුළුව)
ගමන් ගාස්තුව - පැයක කුලී ගාස්තුවෙන් 50% ක් වේ.
(දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මිළ ගණන් අනුව ගාස්තු අයකිරීම වෙනස් වේ.)

එස්. සුකීර්තන්,
සභාපති,

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/16

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

JCB (බැකෝ) යන්ත්‍රයක් සඳහා කුළිය - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව විසින් බැකෝ යන්ත්‍රයෙන් සේවා සැපයීම සඳහා අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එක් පැයක් සඳහා රුපියල් 3,000.0 කි. (ගමන් ගාස්තුව ඇතුළුව.)
ගමන් ගාස්තුව - පැයක කුළී ගාස්තුවෙන් 50% ක් වේ.
(දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මිළ ගණන් අනුව ගාස්තු අයකිරීම වෙනස් වේ.)

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/17

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

නිර්මාණ ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ නිර්මාණ ශිල්පීන් ලියාපදිංචි කිරීම සඳහා අංක 02/17.10.2022 දිනට සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි :

	රු. ශත
නිර්මාණ ශිල්පීන් ලියාපදිංචි කිරීම සඳහා බලපත්‍ර ගාස්තුව	1,000 0
නිර්මාණ ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව	5,000 0
අලුත් කිරීමේ ගාස්තුව	2,000 0

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/18

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ආකෘති පත්‍ර ගාස්තු, සහතික පත් ගාස්තු - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ආකෘති පත්‍ර ගාස්තු/සහතික පත් ගාස්තු යනාදිය පහත දැක්වෙන පරිදි අයකර ගැනීමට අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

ආකෘති පත්‍ර ගාස්තු :	*රු. ශත*
1. ගොඩනැගිලි අයදුම්පතක් සඳහා	500 0
2. දේපළ නාමය මාරු කිරීමේ අයදුම් පතක් සඳහා	500 0
3. ව්‍යාපාරික බලපත්‍ර අයදුම්පතක් සඳහා	100 0
4. පාරිසරික අයදුම්පතක් සඳහා	250 0
5. පුස්තකාල සාමාජික අයදුම්පතක් සඳහා	20 0
6. පාරිසරික අයදුම්පතක් සඳහා (අලුත් කිරීමේ)	

සහතිකපත් ගාස්තු :

1. දේපළෙ හි හිමිකම් සහතිකයක් සඳහා	1250 0
2. වීථිරේඛා සහතිකයක් සඳහා	1000 0
3. නොපවරා ගැනීමේ සහතිකයක් සඳහා	1000 0
4. ගොඩනැගිලි අයදුම්පත් කාලය දීර්ඝ කිරීමේ ගාස්තු	500 0
5. ප්‍රශ්න පත්‍ර ගාස්තු රැකියා	3000 0
6. ප්‍රශ්න පත්‍ර ගාස්තු	1,500 0

එස්. සුකීර්තන්,
සභාපති,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/19

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

නාමය මාරු කිරීම සඳහා වන පරීක්ෂණ ගාස්තුව - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ දේපළෙ හි නාමය මාරු කිරීම සඳහා පරීක්ෂණ ගාස්තුව වශයෙන් රුපියල් 300.00 ක් අයකර ගැනීමට අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/20

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

එළවළු විකිණීම තහනම් කිරීම - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 126 (ix) එ වැනි වගන්තිය යටතේ හා 1988.08.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ IV (ආ) වැනි කොටසින් පළ කරන ලද්දාවූ ද පළාත් පාලන ආයතන සඳහා වන අතුරු ව්‍යවස්ථාවල II වැනි පරිච්ඡේදයේ ප්‍රසිද්ධ වෙළඳ පොළ අතුරු ව්‍යවස්ථාවේ 33 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ආයතන වෙත පවරා දී ඇති බලතල අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව වලිකාමම්'' උතුරු ප්‍රාදේශීය සභාවේ'' බල ප්‍රදේශය ඇතුළත පොදු වෙළඳ පොළ පිහිටා ඇති ස්ථානයේ සිට කිලෝමීටර් භාගය (01) ක වටරවුම තුළ ව්‍යාපාරික ස්ථාන'' සංචාරක වෙළෙඳාම සහ පදික වෙළඳාම ආදියෙන් එළවළු විකිණීම හෝ ප්‍රදර්ශනයට තැබීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/21

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

තොටුපළ සඳහා ගාස්තු අය කිරීම - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(2) වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවේ, බල ප්‍රදේශය තුළ දකින්නට ලැබෙන මයිලිටඩ් හා කංකසන්තුරයි යන තොටුපළවලින් ආනයනය කරනු ලබන භාණ්ඩවල වටිනාකමින් 0.1% ක ගාස්තුවක් අයකර ගැනීමට අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/22

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

බනිජ තෙල් සංස්ථාවෙන් ගාස්තු අය කිරීම - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149(2) වැනි වගන්තිය යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වූ කංකසන්තුරයි ප්‍රදේශයේ පිහිටා ඇති බනිජ තෙල් සංස්ථාවේ ගබඩාවෙහි ඉතුරුම් කර ඇති බනිජ නිෂ්පාදිත වටිනාකමින් 0.05% ක් ගාස්තු වශයෙන් අයකර ගැනීමට අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/23

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

වාසනා ලොතරැයිය දිනුම් ඇදීම සඳහා වන ගාස්තුව - 2023

1987 අංක 37 දරන විනෝද බදු සංශෝධන පනත යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසනා ලොතරැයිය දිනුම් ඇදීමේ කටයුතු සිදුකරන්නන් විසින් බලපත්‍ර ගාස්තුව වශයෙන් රුපියල් 1,000.00 ක මුදලක් ගෙවිය යුතුයයි සභාව විසින් ප්‍රජා සංවර්ධන ආයතන සඳහා බදු මුදලින් නිදහස් කර ඇත්නම් බලපත්‍ර ගාස්තු වශයෙන් රුපියල් 1,000.00 ක මුදල පමණක් අයකර ගැනීමට හා බදු මුදලින් නිදහස් නොකර ඇත්නම් බලපත්‍ර ගාස්තුව සමගින් කුවිතාන්සිවල වටිනාකමින් 10% ක මුදල ගාස්තුව වශයෙන් අයකර ගැනීමට අංක 02/17.11.2021 දරන සභාවේ පරිපාලන නියෝගයට අනුව තීරණය කර ඇති බව දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/24

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

වරිපනම් බදු මුදල අයකර ගැනීම - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියට අනුකූලව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පෙර වසරේ අයකිරීම් කළ පරිද්දෙන් දේපළ මත බදු මුදල සහ දඩ මුදල අයකර ගැනීමට අංක 02/17.11.2022 දින සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-459/25

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

පාපැදි ආරක්ෂාකාරී ස්ථානයක් සඳහා වන ගාස්තුව - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පාපැදි ආරක්ෂාකාරී ස්ථානයක් නඩත්තු කරන්නන් විසින් බලපත්‍ර ගාස්තුව වශයෙන් රුපියල් 1,000.00 ක මුදලක් ගෙවිය යුතුයි. සභාව විසින් ප්‍රජා සංවර්ධන ආයතන සඳහා බදු මුදලින් නිදහස් කර ඇත්නම්'' බලපත්‍ර ගාස්තු වශයෙන් රුපියල් 1,000.00 ක මුදල පමණක් අයකර ගැනීමට හා බදු මුදලින් නිදහස් නොකර ඇත්නම් බලපත්‍ර ගාස්තුව සමගින් කුවිතාන්සිවල වටිනාකමින් 10% ක මුදල ගාස්තුව වශයෙන් අයකර ගැනීමට අංක 02/17.11.2022 දින සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-459/26

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

නළ ළිං ඉදිකිරීම සඳහා වන අනුමැතිය - 2023

යාපනය ජාතික ජල සම්පාදනය හා ජලාපවහන මණ්ඩලයේ නල ළිං ඉදි කිරීමේ ක්‍රියාපටිපාටියට අනුව හා අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ නල ළිං ඉදි කරනු ලබන්නේ නම් ප්‍රාදේශීය සභාවෙන් පූර්වාංග අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කළ යුතු යැයි මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-459/27

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

කුකුල් මස් විකිණීම සඳහා වන දැන්වීම - 2023

ගෝ ඝාතක ආඥාපනතේ 201 වැනි අධිකාරය සමග 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුකූලව ප්‍රාදේශීය සභාවේ, බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍යය ආරක්ෂා සඳහා වන අරමුණින් හා එකී පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු 126 (ix) (එ) යන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1988.08.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටසින් පළ කරන ලද්ද වූ පළාත් පාලන ආයතන සඳහා වන අතුරු ව්‍යවස්ථාවල IV වැනි පරිච්ඡේදයේ ප්‍රසිද්ධ වෙළෙඳ පොළ අතුරු ව්‍යවස්ථාවේ 33 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ආයතන වෙත පවරන ලද බලතල ප්‍රකාරව හා වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ, අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පොදු වෙළෙඳ පොළවල් පිහිටා ඇති ස්ථාන (මල්ලාකම් පොදු වෙළෙඳ පොළ, වීමන්කාම පොදු වෙළෙඳ පොළ, කුත්තන් චීමා වෙළෙඳ පොළ, පන්නාලයි, ඉරාල්මඩම් වෙළෙඳපොළ, අලවෙට්ඩි උතුරු වෙළෙඳ පොළ) වල සිට කිලෝමීටර් එකක (01) වටරවුම තුළ කුකුල් මස් විකිණීම හෝ පාරිභෝගිකයින්ට කුකුළන් පෙන්වීම වෙන් වෙන්ව විකිණීම හෝ තහනම් කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-459/28

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

කීරිමලයි සංචාරක කේන්ද්‍රස්ථානයේ අයකර ගැනීමට හැකි ගාස්තු - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති කීරිමලයි සංචාරක කේන්ද්‍රස්ථානයෙ හි පහත දක්වා ඇති පරිදි ගාස්තු අයකර ගැනීමට අංක 02/17.11.2022 දින සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

කීරිමලයි පොකුණ පිහිටා ඇති ස්ථානයේ :

වැසිකිළි කැසිකිළි පාවිච්චිය සඳහා වන ගාස්තුව (ස්ත්‍රී/පුරුෂ)	රු. 10 0
පිරිසිදු වතුරින් නෑම සඳහා වන ගාස්තුව (ස්ත්‍රී/පුරුෂ)	රු. 30 0
ආරක්ෂක භාණ්ඩ පෙට්ටියක් සඳහා වන ගාස්තු	රු. 30 0

වාහන නතර කර තැබීම සඳහා වන ගාස්තු :

පාපැදි සඳහා	රු. 10 0
යතුරු පැදියක් සඳහා	රු. 20 0

ත්‍රීරෝද රථයක්/කාර් රථයක් සඳහා	රු. 30 0
වෑන් වාහනයක් සඳහා	රු. 50 0
මිනි බස් රථයක්/බස් රථයක් සඳහා	රු. 100 0

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/29

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

කීරිමලයි සංචාරක කේන්ද්‍රස්ථානයේ පිහිටියා වූ පොකුණෙහි දිය නෑමට අයකළ හැකි ගාස්තු-2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පවිත්‍රතාවය හා සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ අරමුණින් වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ පිහිටියා වූ සංචාරක කේන්ද්‍රස්ථානය වන කීරිමලයි පොකුණෙහි දිය නෑම පිණිස පහත දක්වෙන පරිදි ගාස්තු අය කිරීමටත් පාසල් සිසුන් ප්‍රාදේශීය සභාව වෙතින් පූර්ව අනුමැතිය ලබා ගතයුතු බවත් ජූලි මස අමාවක හා සිවරාත්‍රී දිනවලට නොමිලේ දිය නෑම අනුමත කරන බවත් අංක 02/17.11.2022 දින සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

වැඩිහිටි පුද්ගලයෙකු සඳහා	රු. 20 0
බාලවයස්කාර පුද්ගලයෙකු සඳහා	රු. 10 0

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/30

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

හින්දු සුසානභූමිවල මෘතදේහ ආදාහනය කිරීමට ගාස්තු අයකිරීම - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පවිත්‍රතාවය සහ සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ අරමුණින් ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු 126 (iv)(ඇ) සහ (ix) (ඒ) වැනි වගන්ති යටතේ සුසානභූමි හා මිනීපිටි ආඥාපනත යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇත්තා වූ බලතල ප්‍රකාරව, වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ අංක 02/17.11.2022 දින සභාවේ යෝජනාව අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවට ඇතුළත් හින්දු

සුසානභූමිවල මෘතදේහ ආදාහනය කිරීමට හෝ මිහිදන් කිරීමට හෝ සතුන් වැළලීමට ගාස්තු වශයෙන් එක් මෘතදේහයකට හෝ එක් සත්වයෙකුට රුපියල් 1000.00 ක් බැගින් අයකරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-459/31

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

පොදු උත්සව/රැස්වීම් ශාලාව කුළියට දීම - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පවිත්‍රතාවය හා සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ අරමුණින් වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ කුරුම්පසිටඩි ප්‍රදේශයේ පිහිටියා වූ සභාවට අයිති පොදු උත්සව/රැස්වීම් ශාලාවෙ හි කුළී ගාස්තු පහත දැක්වෙන පරිදි අයකරනු ලබන බව අංක 02/17.11.2022 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

1.	සමාජ සේවා සංවිධානයක් සඳහා එක් දවසකට (පැය 08 ක්) පාවිච්චි කිරීමේ ගාස්තුව (විදුලි ගාස්තුව රු. 400.00 ක් ඇතුළත්ව)	රු. 2,400 0
2.	සමාජ සේවා සංවිධානයක් සඳහා අඩ දවසකට (පැය 04 ක්) පාවිච්චි කිරීමේ ගාස්තුව (විදුලි ගාස්තුව රු. 200.00 ක් ඇතුළත්ව)	රු. 1,200 0
3.	මහජන මංගල උත්සවයක් පැවැත්වීම සඳහා එක් දවසකට (පැය 08 ක්) පාවිච්චි කිරීමේ ගාස්තුව	රු. 5,000 0
4.	මහජන මංගල උත්සවයක් පැවැත්වීම සඳහා දවසකට (පැය 04 ක්) පාවිච්චි කිරීමේ ගාස්තුව	රු. 3,000 0
5.	රාජ්‍ය ආයතන හා පාසල් ගාස්තු අයකිරීමෙන් තොරව ශාලාව පාවිච්චි කළ හැකිය. විදුලි ගාස්තුව එක් දවසකට රු. 400.00, අඩ දවසකට රු. 200.00	

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-459/32

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

කංකසන්තුරේ ළමා උද්‍යානයට ඇතුලුවීමේ ගාස්තු අයකිරීම - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පවිත්‍රතාවය හා සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ අරමුණින් වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ කංකසන්තුරේ ළමා උද්‍යානය ඇතුල්වීමේ ගාස්තු අයකිරීමට අංක 02/17.11.2022 දින සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

වැඩිහිටි පුද්ගලයෙකු සඳහා	රු. 20 0
බාලවයස්කාර පුද්ගලයෙකු සඳහා	රු. 10 0

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/33

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

අතිශයෝක්තියෙන් යුතු සිදුවීම් වලට බදු අයකිරීම - 2023

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා සීමාව තුළ අතිශයෝක්තියෙන් යුතු සිදුවීම් ගාස්තු 10% අයකිරීමට අංක 02/17.11.2022 දින සභාවේ යෝජනාව අනුව දැනුම් දෙනු ලැබේ.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-459/34

කන්තලේ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල පරිදි කන්තලේ ප්‍රාදේශීය සභාව 2022 වර්ෂයෙහි නොවැම්බර් මස 24 දින යෝජනා අංක 554 දරන යෝජනාව යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. එස්. ඒකනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල අනුව කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල හා ගෙපත්වල 2022 වර්ෂයට පිළිගෙන ක්‍රියාත්මක කරනු ලැබූ 2008 වර්ෂයේ දී කරනු ලැබූ තක්සේරුව 2023 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමට ද,

(ආ) එකී තක්සේරුව මත 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ තුළ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් පහත උපලේඛනයේ දක්වා ඇති ආකාරයට 6% සහ 12% වරිපනම් බද්දක් පනවා අය කිරීමට ද,

(ඇ) 134 වන වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අනුව යථෝක්ත වරිපනම් බද්ද 2023 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වන දිනවලින් අවසන්වන කාර්තු හතර තුළ දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස, බද්දට යටත්වන සෑම පුද්ගලයෙකුටම විධාන කිරීමට ද,

යෝජනා සම්මත වූ බව නිවේදනය කරමි.

උපලේඛනය

බලප්‍රදේශය	*ප්‍රතිශතය*
නගර සභා මාවත - වම (9 - 85)	12%
නගර සභා මාවත - දකුණ (12 - 94)	12%
අබ්දුල් මජීඩ් මාවත - වම (විශේෂ) (9 - 59/2)	12%
අබ්දුල් මජීඩ් මාවත - දකුණ (280/4 - 470)	12%
රජඇළ පාර - වම (19 - 57)	12%
රජඇළ පාර - දකුණ (8 - 70)	12%
සිවන් කෝවිල් පාර - දකුණ (04 - 50)	12%
ජනතා මාවත - වම (05 - 77)	12%
ජනතා මාවත - දකුණ (04 - 78)	12%
ගැමුණු මාවත - වම (03 - 61)	12%
ගැමුණු මාවත - දකුණ (04 - 76)	12%
අග්‍රබෝධි මාවත - වම (311 - 615/1)	12%
වැව පාර - දකුණ (08 - 12)	12%
ත්‍රිකුණාමල පාර - වම	12%
ත්‍රිකුණාමල පාර දෙවන පටුමග - දකුණ	12%
ත්‍රිකුණාමල පාර - දකුණ	12%
පරාක්‍රම මාවත - වම	12%

බලප්‍රදේශය	*ප්‍රතිශතය*
නුවර පාර - වම	6%
නුවර පාර - දකුණ	6%
අබ්දුල් මජීඩ් මාවත - වම	6%
සේරුවිල පාර - වම	6%
සමගි මාවත - දකුණ	6%
සමගි මාවත - වම	6%
පේරාරු හරස් පාර - දකුණ	6%
ත්‍රිකුණාමල පාර - වම	6%
ත්‍රිකුණාමල පාර 2 වන පටුමග - වම	6%
ආරියවංශ මාවත - වම (විශේෂ)	6%
ආරියවංශ මාවත - දකුණ (විශේෂ)	6%
ආරියවංශ මාවත - වම	6%
ආරියවංශ මාවත - දකුණ	6%
ධීවරගම පාර - වම	6%
ධීවරගම පාර - දකුණ	6%
ජනතා මාවත - වම	6%
ජනතා මාවත - දකුණ	6%
සේනානායක මාවත - වම	6%
සේනානායක මාවත - දකුණ	6%
භාතියගම පාර - වම	6%
භාතියගම පාර - දකුණ	6%
දුම්රිය ස්ථානය පාර - වම	6%
අලුත් පාර - වම	6%
අලුත් පාර - දකුණ	6%
ත්‍රිකුණාමල පාර - දකුණ	6%

12-573/1

කන්තලේ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය ප්‍රකාරව කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල පරිදි කන්තලේ ප්‍රාදේශීය සභාව 2022 වර්ෂයෙහි නොවැම්බර් මස 24 දින යෝජනා අංක 554 දරන යෝජනාව යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. එස්. ඒකනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උපවගන්තියේ (1) වන වගන්තියෙන් කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2022 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකිරීමට යෝජනා කිරීම,

(ඇ) (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන සෑම තැනැත්තෙකු විසින් යටෝක්ත බද්ද 2023.04.30 වැනි දිනට ප්‍රථම කන්තලේ ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ද,

යෝජනා සම්මත වූ බව නිවේදනය කරමි.

උපලේඛනය

I වන තීරය *2022 වර්ෂයේ දී ආදායම*	*II වන තීරය* *රු. ශත.*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,001 ඉක්මවන අවස්ථාවක	3,000 0

01. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
02. පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
03. ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
04. ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
05. දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
06. ඉඩම් වෙන්දේසි කිරීමේ බලපත්‍රයක් ලබා ගැනීම
07. ගඩොල් වෙන්දේසි කිරීමේ බලපත්‍රයක් ලබා ගැනීම
08. ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම හා විකිණීම
09. පාවිච්චි කළ ඇඳුම් ගබඩාකර තබා ගැනීම හා විකිණීම
10. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම, අලුත්වැඩියා කිරීම හා විකිණීම
11. දැව ගබඩාවක් පවත්වාගෙන යාම හෝ විකිණීම
12. දර ගබඩාවක් පවත්වාගෙන යාම
13. තොග වෙළෙඳාම (ස්ථානීය නියෝජිතයෙකු ලෙස වශයෙන්)
14. හිස් බෝතල්, හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම
15. අලුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් විකිණීම
16. බයිසිකල් අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම
17. චේවැල් භාණ්ඩ නිෂ්පාදනය පවත්වාගෙන යාම
18. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම
19. අලුත් හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම හෝ විකිණීම
20. මෝටර් වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
21. වීදුරු තහඩු ගබඩා කිරීම හෝ විකිණීම
22. වීදුරු උපකරණ හා ඉලෙක්ට්‍රොනික් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
23. පාවහන් හා බෑග් වර්ග වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
24. මහන මැෂින් ගබඩා කිරීම හෝ විකිණීම
25. පරිගණක යන්ත්‍රය හා ඒ ආශ්‍රිත උපකරණ විකිණීම හා අලුත්වැඩියා කිරීම
26. ඇස් කණ්ණාඩි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27. ශබ්ද විකාශන යන්ත්‍ර විකිණීම හා කුළියට දීම
28. විසිතුරු බඩු හා සාප්පු බඩු විකිණීමේ වෙළෙඳාම
29. ලී බඩු වෙළෙඳාම
30. රෙදි පිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
31. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
33. ලියාපදිංචි කළ පොද්ගලික තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
34. ලිපිද්‍රව්‍ය පාසල් උපකරණ පුවත්පත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35. පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
36. කම්පියුටර් ප්‍රින්ටින්, ස්කැනින් ප්‍රින්ටින් සිදු කරන ස්ථානයක් පවත්වාගෙන යාම

37. පෞද්ගලික උපකාරක පන්තියක් පවත්වාගෙන යාම
38. එළවළු බීජ වර්ග විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
39. වර්ණ ඡායාරූප ගන්නා රසායනාගාරයක් පවත්වාගෙන යාම
40. ඡායාරූප ගන්නා රසායනාගාරයක් පවත්වාගෙන යාම
41. මැටි භාණ්ඩ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
42. උත්සව භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
43. බුලත්, පුවක්, දුම්කොළ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
44. තේ කුඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45. තුරඟ තරග ඔට්ටු භාර ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46. ජ්‍යොතිෂ්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම
47. මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. රියැදුරන් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. සුරතල් මසුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. විකිණීම සඳහා මල් හෝ පැළ තවානක් පවත්වාගෙන යාම
51. ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ ගබඩා කිරීම හෝ විකිණීම
52. දුරකථන සේවා, ෆැක්ස් සේවා, අන්තර්ජාල පහසුකම් හා ඡායා පිටපත් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. ආයුර්වේද දේශීය ඖෂධ නිෂ්පාදනය හෝ සංයෝජනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. කුමන හෝ වර්ගයක අලුත් වාහන විකිණීම
55. කුමන හෝ වර්ගයක අලුත්වැඩියා කරන ලද පරණ වාහන විකිණීම
56. කායවර්ධන පුහුණු පාඨමාලා ස්ථානයක් පැවැත්වීම
57. රජය පිළිගත් ලොතරැයි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
59. පා පැදි අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
60. ජංගම වෙළෙඳාම
61. ඉදිකිරීම් කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
62. උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
63. ටයර් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු සඳහා (ජංගම ප්‍රචාරක රථ මගින්)
65. තීන්ත අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
66. ජංගම දුරකථන අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
67. සංගීත භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
68. කොමිස් ඒජන්තවරුන්
69. බ්‍රෝකර්වරුන්
70. මුදල් ආයෝජකයන් හා මුදල් ණයට දෙන්නන්
71. කොන්ත්‍රාත්කරුවන්
72. උකස් බඩු ගන්නවුන්
73. සැපයුම්කරුවන්
74. රක්ෂණ නියෝජිතයන්
75. ප්‍රවාහන නියෝජිතයන්
76. කුලී රථ අයිතිකරුවන්
77. මෝටර් රථ වාහන වෙළෙඳාම් කරන්නවුන්
78. බැංකු රක්ෂණ සමාගම්
79. සිල්ලර සහ තොග වෙළෙඳසලක් පවත්වාගෙන යාම
80. රජයේ අවසරලත් රටබීමහලක් පවත්වාගෙන යාම
81. පොහොර වෙළෙඳසලක් පවත්වාගෙන යාම
82. අවමංගල්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
83. විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
84. සුපිරි වෙළෙඳසලක් පවත්වාගෙන යාම

කන්තලේ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල පරිදි කන්තලේ ප්‍රාදේශීය සභාව 2022 වර්ෂයෙහි නොවැම්බර් මස 24 දින යෝජනා අංක 554 දරන යෝජනාව යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. එස්. ඒකනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියෙන් කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2022 වර්ෂයේ ආදායම අනුව මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට,

යෝජනා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

අනු. අංකය	*වෙළෙඳ බලපත්‍රය ලබාගත යුතු ව්‍යාපාරය*	*වාර්ෂික වටිනාකම රු. 750.00 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 751.00 සිට රු 1,500.00 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
	අන්තරායදායක ව්‍යාපාර			
01.	ධාන්‍ය හෝ මාංශ භෝග හොන්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
02.	ගෑස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
04.	කෝපි, ධාන්‍ය වර්ග, මාංශ භෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම	500 0	750 0	1,000 0
05.	විද්‍යුත් ලෝහ ආලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	විදුලි කර්මාන්ත වැඩපොළක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
	අප්‍රසන්න ව්‍යාපාර			
01.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම			
	i කුකුල් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
	ii ඌරු මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
	iii ගව මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	*වෙළෙඳ බලපත්‍රය ලබාගත යුතු ව්‍යාපාරය*	*වාර්ෂික වටිනාකම රු. 750.00 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 751.00 සිට රු 1,500.00 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,501ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
04.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	කුකුලන් 100 කට වැඩි ගණනක් සඳහා, කුකුල් කොටුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ශීත කළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම හෝ එම භාණ්ඩ පමණක් විකිණීමට තබා ඇති ස්ථාන	500 0	750 0	1,000 0
වෙනත්				
1.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	තේ, කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	භෝජනාගාරයක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	රසකැවිලි වර්ග නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	සිසිල් බීම නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
10.	කිරි එකතු කිරීමේ හෝ අලෙවි කිරීමේ හා විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0 500 0	750 0 750 0	1,000 0 1,000 0
11.	කුළු බඩු පැකට් කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
12.	සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම හෝ විකිණීම	500 0	750 0	1,000 0
13.	කෑම වර්ග නිෂ්පාදනය කර පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-573/3

කන්තලේ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල පරිදි කන්තලේ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයෙහි නොවැම්බර් මස 24 වැනි දින යෝජනා අංක 554 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. එස්. ඒකනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, බද්දට යටත් වන සෑම තැනැත්තෙකු විසින් යටෝක්ත බද්ද 2023 අප්‍රේල් මස 30 වැනි දිනට ප්‍රථම කන්තලේ ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ද,

යෝජනා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

I වැනි තීරය *2021 වර්ෂයේ දී වාර්ෂික වටිනාකම*	*II වැනි තීරය* *රු. ශත.*
වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක	500 00
රු. 750 ඉක්මවන එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක	750 00
රු. 1,500 ඉක්මවන අවස්ථාවක	1,000 00

01. ලී ඉරීමේ මඩුවක් පවත්වාගෙන යාම (යාන්ත්‍රික/යාන්ත්‍රික නොවන)
02. ත්‍රීරෝද රථ, යතුරු පැදි හා පාපැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම
03. සහල් සැකසීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (විදුලිබලය/ඉන්ධන)
04. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
05. බිම්මල් වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
06. සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනය
07. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම (ගෘහ භාණ්ඩ/ලී කැටයම්)
08. පෑස්සුම් සඳහා ස්ථානයක් පැවත්වීම
09. මැටි ආශ්‍රිත නිෂ්පාදන (ගඩොල්, උළු හා මැටි භාණ්ඩ)
10. වාහන පින්තාරු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම (ස්ප්‍රේ පේන්ටින්)
11. මත්ස්‍යයන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ඉස්සන්, විසිතුරු මසුන්)
12. කබොක් ගල්, බොරළු ගල්, කළුගල් කැණීම හා ගබඩා කිරීම
13. වැලි ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14. බොරළු පස් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15. යන්ත්‍රානුසාරයෙන් කළු ගල් ඇඹරීම
16. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
17. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
18. හුණු ගල් හෝ හුණු ගබඩා කර තබාගැනීම හෝ විකිණීම
19. ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පැවැත්වීම
20. වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවීම, සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම
21. දැව නොවන ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
22. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය
23. කම්මලක් පවත්වාගෙන යාම
24. පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
25. කුෂන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

කන්තලේ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 සහ 148 වැනි වගනත්ති ප්‍රකාරව, කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල පරිදි කන්තලේ ප්‍රාදේශීය සභාව 2022 වර්ෂයෙහි නොවැම්බර් මස 24 වැනි දින යෝජනා අංක 554 දරන යෝජනාව යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. එස්. ඒකනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

යෝජනාව

(*අ*) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 සහ 148 වැනි වගන්ති ප්‍රකාරව, කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබාගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද,

(*ආ*) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, බද්දට යටත් වන සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2023 අප්‍රේල් මස 30 වැනි දිනට ප්‍රථම කන්තලේ ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි ද,

යෝජනා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
	රු. ශත.
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා-	
(*අ*) වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම්	18 0
(*ආ*) වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	07 0
සෑම අශ්වයෙකු , පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයෙහි වෙළඳ කාර්යයන්ට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

කන්තලේ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීම

යෝජනාව

1984 අංක 27 දරන විනෝද බදු (සංශෝධිත) පනතින් 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් කන්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව, කන්තලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සියලුම විනෝදාස්වාද ක්‍රියාකරකම් මගින් ලබන ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් පනවා අයකළ යුතු බවට වූ යෝජනාව කන්තලේ ප්‍රාදේශීය සභාව 2022 වර්ෂයෙහි නොවැම්බර් මස 24 වැනි දින යෝජනා අංක 554 යටතේ සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. එස්. ඒකනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

12-573/6

කන්තලේ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අතුරු ව්‍යවස්ථා බලාත්මක කිරීම

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ බලතල ප්‍රකාරව, සකස් කර, 123 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුකාරතුමියගේ අවසරය යටතේ 2020.03.12 දිනැති අංක 2166/19 දරන *ගැසට් පත්‍රයේ* පළ කළ පහත සඳහන් අතුරු ව්‍යවස්ථාවන් 2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක, 2023 වර්ෂයට බලාත්මක කිරීමට 2022 වර්ෂයෙහි නොවැම්බර් මස 24 වැනි දින යෝජනා අංක 554 යටතේ යෝජනා සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරමි.

I. ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියේ VII වැනි උප වගන්තියේ (ඊ) අනු වගන්තිය ප්‍රකාරව,
   * ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

II. ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියේ IX වැනි උප වගන්තියේ (උ) අනු වගන්තිය ප්‍රකාරව,
   * හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
   * බේකරි පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

III. ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියේ IX වැනි උපවගන්තියේ (ඔ) අනු වගන්තිය ප්‍රකාරව,
   * පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදයක ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදයක ව්‍යාපාර විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

IV. ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියේ XXIV වැනි උපවගන්තියේ ප්‍රකාරව,
   * කොණ්ඩා සකසන ස්ථාන බාබර් සාප්පු සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

ඊ. එම්. එස්. ඒකනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

12-573/7

කන්තලේ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු කන්තලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල පරිදි, කන්තලේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයෙහි නොවැම්බර් මස 24 වැනි දින යෝජනා අංක 554 යටතේ පහත සඳහන් තීරණය යෝජනා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. එස්. ඒකනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කන්තලේ.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
කන්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලය,
කන්තලේ.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා බලය ලබා දෙමින් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ගාස්තුවක් 2023 වර්ෂය සඳහා අය කළ යුතු යැයි,

යෝජනා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

	I වැනි තීරුව *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරුව* *ගාස්තුව* *රු. ශත*
01.	*පෝරම ගාස්තු හා පරිපාලන ගාස්තු :*	
I.	වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු	1,000 0
II.	සේවා ගාස්තු (ලේඛන සෙවීම/ඡායා පිටපත්)	500 0
III.	ත්‍රිරෝද රථ ගාල් කිරීම වෙනුවෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තු	1,500 0
IV.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	500 0
V.	ඉඩම් අනුබෙදුම්/මිනින්දෝරු සැලසුම අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	500 0
VI.	ළිං/වැසිකිළි වල කැපීම සඳහා අයදුම්පත්‍ර ගාස්තු	1,000 0
VII.	දුරකතන කුළුණු සඳහා සේවා ගාස්තු	20,000 0
VIII.	පා පැදි බලපත්‍ර පරිපාලන සේවා ගාස්තු	50 0
IX.	වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීම සඳහා සේවා ගාස්තු	250 0
X.	පුස්තකාලය සම්බන්ධ ගාස්තු	
	* සාමාජික ගාස්තු	250 0
	* දඩ මුදල් ගාස්තු එක් ග්‍රන්ථයකට එක් දිනකට	1 0
	* ග්‍රන්ථයක් අස්ථාන ගත වීමේ දී එම ග්‍රන්ථයේ වටිනාකම මෙන් දෙගුණය සහ තැපැල් ගාස්තු සඳහා රු. 75.00 ක් හෝ එම ග්‍රන්ථය ම නැවත ලබාගැනීම	
XI.	ටෙන්ඩර් පෝරම ගාස්තු	1,000 0
XII.	අලෙවි ප්‍රවර්ධන ගාස්තු (දිනකට)	5,000 0

		රු. ශත
XIII.	ආදාහනාගාර ගාස්තු	
	* එක් ආදාහනයක් සඳහා	20,000 0
	* ආදහනාගාර අයදුම්පත්‍ර ගාස්තු	50 0
XIV.	ක්‍රීඩාංගණ සඳහා ගාස්තු	
	* ලීලාරත්න ක්‍රීඩාංගනය දිනකට	5,000 0
	* අනෙකුත් ක්‍රීඩාංගන දිනකට	2,000 0

02. *සභාව සතු වාහන කුළියට ලබා දීම :*

	වාහනය	*විස්තරය*	
I.	ට්‍රැක්ටර් බවුසරය	දිනකට	1,000 0
II.	ට්‍රැක්ටරය සමග බවුසරය	දිනකට	5,000 0
III.	ලොකු ගල් රෝල	දිනකට	12,000 0
IV.	මෝටර් ග්‍රේඩරය	පැය 01	8,000 0
V.	ගලි බවුසරය	වාර 01	9,000 0
		(වැඩි වන කි. මී. 1 සඳහා)	200 0
VI.	ටිපර් රථය	දිනකට	5,000 0
VII.	පස් තලන යන්ත්‍රය	දිනකට	2,000 0
VIII.	කුඩා ගල් රෝල	දිනකට	3,750 0
		(වැඩිවන කි. මී. 1 සඳහා)	50 0
IX.	JCB යන්ත්‍රය	පැය 01	5,500 0

03. පොදු වෙළඳපොළ රථ ගාල් ගාස්තු :

I.	පා පැදි	10 0
II.	යතුරු පැදි	20 0
III.	ත්‍රී රෝද රථ	50 0
IV.	ලොරි රථ, බස් රථ, වෑන් රථ, වෙනත් බර වාහන	100 0

04. ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු අයකිරීම :
අංකය 518
දිනය 2022.07.19

කාලය	*ස්වභාවය*		
	ලී තහඩු ප්ලාස්ටික් ෆයිබර් වර්ග අඩියකට රු. ශත	*රෙදි, ඩිජිටල්, ඉටිරෙදි බෝඩ් හෝ වෙනත් වර්ග අඩියකට රු. ශත*	*තැන්පතු මුදල (එක් පුවරුවක් සඳහා) වර්ග අඩියකට රු. ශත*
සති 2 හෝ ඊට අඩු	75 0	45 0	75 0
මාස 1 - 6	112 0	75 0	150 0
මාස 6 - අවුරුදු - 1	150 0	112 50	225 0
අවුරුදු 1 - අවුරුදු 2	225 0	150 0	375 0

05. ප්‍රාදේශීය සභා මාර්ග හරහා ජල සැපයුම ලබා ගැනීමේ ගාස්තු අය කිරීම :

Pradeshiya Sabha Kanthale

Road Damage Rate 2023

LNO.	*Description of Work*	*Times*					
1	Easth road			*Rs. Cents*	*Rs. Cents*	*Rs. Cents*	*Rs. Cents*
	Excavation	1	7.50	0.60	0.75	3.38	
	Scand Filling		M^2	0.85	8,182.00	6,954/70	
	Gravel Filling		M^3	1.00	2,939.00	2,989.00	
	Tamp		M^3	3.40	100.00	340.00	
	Rate 4.5M^2					10,238.70	
	Rate per M^2					2,274.16	2,270.00
2	Concrete a Block Paving Road	1	3.65	0.60	0.15	0.33	
		2	0.60	0.15	0.30	0.05	0.38
	Send Filling		M^3	0.85	6.102.00	6.954.70	
	Gravel Filling		M^3	1.00	2.939.00	2,939.00	
	Tamp		M^3	3.40	100.00	340.00	
	1:2 :4 (12) Concreet		M^3	0.40	40,410.00	16,164.00	
	Rate per 4.5M^2					26,397.70	
	Rate per M^2					5.866.16	5,850.00
3	Metalling and Tarling						
	Sand Filling		M^3	0.85	8.182.00	6.954.70	
	Graval Filling		M^3	1.00	2.939.00	2,939.00	
	Tamp		M^3	3.40	100.00	340.00	
	Ripping the existing damage metalling a taring road		M^3	2.20			
	Supplying Demage grated aggregate base (ABC)		M^3	0.32	5,840.00	1,868.00	
	Prime coat with avelution (C35-1) 11.it/M^2		M^2	2.20	340.00	748.00	
	Suppling a pilling 12 mm metal at site		M^2	0.11	4,865.00	534.05	
	Supplying a pilling 12mm metal at site		M^2	0.07	5,215.00	365.00	

LNO.	*Description of Work*	*Times*		*Rs. Cents*	*Rs. Cents*	*Rs. Cents*	*Rs. Cents*
	First coat bitumens surface using 2 1 a.M^2		M^3	0.04	5,215.00	208.60	
	First coat bituments surface using 1.10/M^2		M^2	2.20	605.52	1,332.14	
	Frst coat bitumens surface using 1.1 a/M^2		M^2	2.20	299.00	657.80	
	Rate per 4.5M^2					15,948.14	
	Rate per M^2					3,544.03	3,500.00

06. නගර ශාලාව වෙන් කිරීම සම්බන්ධ ගාස්තු අය කිරීම :

තීරණ අංකය 547 (සංශෝධිත තීරණ අංක 75)
දිනය 2020 ජනවාරි 23

නගර ශාලා කොටස	*විස්තරය*	*අය කරන මුදල රු. ශත*
ඉහල මහල ප්‍රේක්ෂකාගාරය	පෙර පාසල් උත්සව සඳහා දිනකට	10,000 0
	රාජ්‍ය ආයතන පොදු කටයුතු සඳහා දිනකට	25,000 0
බිම් මහල උත්සව ශාලාව	ඕනෑම කටයුත්තක් සඳහා දිනකට	30,000 0
බිම් මහල කුඩා සම්මන්ත්‍රණ ශාලාව	ඕනෑම කටයුත්තක් සඳහා දිනකට	10,000 0
කාමර	තනි පුද්ගලයෙක් සඳහා දිනකට	1,000 0
	පුද්ගලයන් දෙදෙනෙකු සඳහා දිනකට	1,500 0
	පුද්ගලයන් තිදෙනෙකු හෝ සිව්දෙනෙකු සඳහා දිනකට	2,000 0

තීරණ අංකය 547 (සංශෝධිත තීරණ අංක 75,253)
දිනය 2020 ජනවාරි 23

නගර ශාලා කොටස	*විස්තරය*	*අය කරන මුදල රු. ශත*
ඉහළ මහල ප්‍රේක්ෂකාගාරය	පෙර පාසල්, රාජ්‍ය ආයතන නොවන කටයුතු සඳහා දිනකට	37,500 0
	පෙර පුහුණුවීම් කටයුතු - උපරිම පැය 4කට යටත්ව	5,000 0

මිනිපේ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

මිනිපේ ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස 13 වැනි දින පැවති මහ සභා රැස්වීමේ යෝජනා අංක 05-04 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. එස්. බී. අබේසිංහ,
සභාපති,
මිනිපේ ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 09 වැනි දින,
මිනිපේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් මිනිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ අනුරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ අප්‍රේල් මස 01 වැනි දිනට පෙර මිනිපේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් මිනිපේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

	ව්‍යාපාරයේ වාර්ෂික ආදායම	*ගෙවිය යුතු වාර්ෂික බදු මුදල රු. ශත*
(i)	රු. 6,000 දක්වා	නැත
(ii)	රු. 6,001 සිට රු. 12,000 දක්වා	90 0
(iii)	රු. 12,001 සිට රු. 18,750 දක්වා	180 0
(iv)	රු. 18,751 සිට රු. 75,000 දක්වා	360 0
(v)	රු. 75,001 සිට රු. 1,50,000 දක්වා	1,200 0
(vi)	රු. 1,50,000 සිට ඉහළට	3,000 0

12-493/1

මිනිපේ ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු අයකිරීම

මිනිපේ ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස 13 වැනි දින පැවති මහ සභා රැස්වීමේ යෝජනා අංක 05-05 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ මිනිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2023 වර්ෂයේ දී මිනිපේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. එස්. බී. අබේසිංහ,
සභාපති,
මිනිපේ ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 09 වැනි දින,
මිනිපේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මිනිපේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ මිනිපේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ මිනිපේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක්වන විට එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එකක (1%) ක ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත් මිනිපේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I තීරය		*II තීරය*		
	බලපත්‍ර වර්ගය	*වාර්ෂික වටිනාකම රු. 01 සිට රු. 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම 751 සිට සිට රු. 1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි වනවිට රු. ශත*
01.	බේකරි	500 0	750 0	1,000 0
02.	භෝජනශාලා හා තේ හා කෝපි කඩ	500 0	750 0	1,000 0
03.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
04.	ත්‍රි රෝද රථ අලුත්වැඩියා කිරීමේ හා සර්විස් කිරීමේ ස්ථාන	500 0	750 0	1,000 0
05.	ලෝහ ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	යෝගට් නිපදවන හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	බාබර් සාප්පු, රූපලාවන්‍ය හා මනාලියන් හැඩ ගැන්වීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
08.	ලැගුම්හලක් හෝ නවාතැන්පලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	වීදුරු භාණ්ඩ නිෂ්පාදනය වීදුරු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	සංචාරක වෙළෙඳාම සඳහා	500 0	750 0	1,000 0
11.	බටහිර ඖෂධ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
12.	පාවහන් අලෙවි කිරීමේ හෝ නිපදවීමේ ස්ථාන	500 0	750 0	1,000 0
13.	දත් බැඳීමේ ස්ථාන සඳහා	500 0	750 0	1,000 0
14.	පැණි හකුරු නිපදවීම	500 0	750 0	1,000 0
15.	පෙහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
17.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0

	I තීරය	*II තීරය*		
	බලපත්‍ර වර්ගය	*වාර්ෂික වටිනාකම රු. 01 සිට රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම 751 සිට සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි වනවිට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
18.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
19.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
20.	කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
22.	සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
23.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝ ග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
24.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
25.	අළුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
26.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
27.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
28.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
29.	වඩුකර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
30.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
31.	රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
32.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
33.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
34.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
35.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
36.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
37.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
38.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
39.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
40.	අවමංගල්‍ය සේවා කටයුතු හා මල් ශාලාවක් පවත්වාගෙනයාම	500 0	750 0	1,000 0
41.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
42.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
43.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
44.	ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
45.	සිමෙන්ති කිලෝග්‍රෑම් 1,000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
46.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
47.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
48.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
49.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
50.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම	500 0	750 0	1,000 0
51.	ධාන්‍ය හෝ මාංෂභෝග කිලෝ ග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
52.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝ ග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
53.	ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
54.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0

	I තීරය	*II තීරය*		
	බලපත්‍ර වර්ගය	*වාර්ෂික වටිනාකම රු. 01 සිට රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම 751 සිට සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි වනවිට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
56.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
57.	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
58.	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
59.	කළුගල් කැනීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
60.	සිසිල්බීම නිෂ්පාදනය හෝ සිසිල්බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
61.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
62.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
63.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
64.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
65.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
66.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
67.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
68.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
69.	පාපැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
70.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
71.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
72.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
73.	ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
74.	දැව ගබඩා කිරීම	500 0	750 0	1,000 0
75.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
76.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
77.	බැටරි විද්‍යුත් ආරෝපනය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
78.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
79.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
80.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	ගෑස් සිලින්ඩර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
84.	විදුරු භාණ්ඩ හෝ විදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
85.	කිලෝග්‍රෑම් 150 ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
86.	වෑල්ඩිං සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
87.	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
88.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
89.	වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
90.	විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

මිනිපේ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

මිනිපේ ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස 13 වැනි දින පැවති මහා සභා රැස්වීමේ යෝජනා අංක 05-06 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම 2023 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනි දිනවලින් අවසන්වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2023 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

ඒ. එම්. එස්. බී. අබේසිංහ,
සභාපති,
මිනිපේ ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 09 වැනි දින,
මිනිපේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මිනිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල පිහිටි සියලුම නිවාස ගොඩනැගිලි, ඉඩම් හා ගෙපත් සඳහා 2018 වර්ෂය සඳහා පිළිගත් නව තක්සේරු ප්‍රතිශෝධනය 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වරිපනමක් 2023 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් ;

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් එලෙස ගෙවිය යුතු සම්පූර්ණ වරිපනම් බද්ද 2023 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ලබාදිය යුතු බවටත් මිනිපේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-493/3

මිනිපේ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

මිනිපේ ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස 13 වැනි දින පැවති මහ සභා රැස්වීමේ යෝජනා අංක 05-07 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. එස්. බී. අබේසිංහ,
සභාපති,
මිනිපේ ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 09 වැනි දින,
මිනිපේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මිනිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

2022 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද 2023 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමටත්,

2023 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස 03ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට මිණිපේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

කර්මාන්ත බද්ද

	ව්‍යාපාරය	*වාර්ෂික වටිනාකම රු. 01 සිට රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම 751 සිට සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි වනවිට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	එළවළු හා පළතුරු විකිණීම	500 0	750 0	1,000 0
2.	සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	ත්‍රිරෝද රථ හා යතුරු පැදි හා අනෙකුත් වාහන අමතර කොටස් අලෙවිය	500 0	750 0	1,000 0
4.	නාමපුවරු ඇඳීම, ප්ලාස්ටික් නාමපුවරු සැකසීම, රබර් සීල් සැකසීම	500 0	750 0	1,000 0
5.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය - හාඩ්වෙයාර්	500 0	750 0	1,000 0
6.	ශබ්දවාහිනී යන්ත්‍ර කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	බුලත්, පුවක්, අලෙවි කිරීම	500 0	750 0	1,000 0
8.	සුවඳ කුරු, සුවඳ සුණු නිපදවීම	500 0	750 0	1,000 0
9.	විසිතුරු මසුන් අලෙවිය	500 0	750 0	1,000 0
10.	ඔරලෝසු අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
11.	මහන මැෂින් හා මහන මැෂින් අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	දුරකථන කාඩ්පත් හා රීලෝඩ් අලෙවිය	500 0	750 0	1,000 0
13.	පරණ යකඩ බඩු ප්ලාස්ටික්, පොලිතින් එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	පරිගණක හා ජංගම දුරකථන අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
15.	ජංගම දුරකථන අමතර කොටස් විකිණීම	500 0	750 0	1,000 0
16.	අන්තර්ජාල පහසුකම් හා සන්නිවේදන පහසුකම් සැපයීම	500 0	750 0	1,000 0
17.	ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	V. C. D. තැටි හා කැසට් පටි කුලියට දීම	500 0	750 0	1,000 0
19.	බෑග්, පාපිසි, හා කුෂන් කවර මැසීම	500 0	750 0	1,000 0
20.	ස්ටිකර් කිරීම හා පින්තූර රාමු කිරීම	500 0	750 0	1,000 0
21.	හස්ත කර්මාන්තයක් පවත්වාගෙන යාම - මැටි බඳුන් ඇතුලුව	500 0	750 0	1,000 0
22.	සාප්පු බඩු අලෙවිය (විලවුන්, ඇඳුම්, විසිතුරු භාණ්ඩ)	500 0	750 0	1,000 0
23.	ඇලුමිනියම් ප්ලාස්ටික් ඉවුම් පිහුම් උපකරණ අලෙවිය	500 0	750 0	1,000 0
24.	ලිපිද්‍රව්‍ය හා පුවත්පත් සහ සඟරා අලෙවිය	500 0	750 0	1,000 0
25.	පොත් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	ව්‍යාපාරය	*වාර්ෂික වටිනාකම රු. 01 සිට රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම 751 සිට සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි වනවිට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
26.	ජ්‍යොතිෂ්‍ය කටයුතු කිරීම	500 0	750 0	1,000 0
27.	මිනිස් බල සැපයීම	500 0	750 0	1,000 0
28.	විසිතුරු පැළ හා අනෙකුත් පැළ වර්ග තවාන් කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
29.	පූජා භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
30.	වී ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	කෘෂි උපකරණ අලෙවිය සඳහා	500 0	750 0	1,000 0
32.	උත්සව භාණ්ඩ කුලියට දීමේ ස්ථාන සඳහා	500 0	750 0	1,000 0
33.	යකඩ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	විදුලි උපකරණ හා සංගීත භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
35.	දුරකථන (ජංගම) අලෙවිසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	ඇඳුම් මැසීම	500 0	750 0	1,000 0

12-493/4

මිනිපේ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අයකිරීම

මිනිපේ ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස 13 වැනි දින පැවති මහා සභා රැස්වීමේ යෝජනා අංක 05-08 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. එස්. බී. අබේසිංහ,
සභාපති,
මිනිපේ ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 09 වැනි දින,
මිනිපේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මෙහි පහත උපලේඛනයේ සඳහන් වන ගාස්තු 2023 වර්ෂය සඳහා අයකිරීමට මිණිපේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

ගොඩනැගිලි හා දේපළ :

		රු. ශත
01.	ඉඩම් අනුබෙදුම් අනුමත කිරීමේ ගාස්තු	1,000 0
02.	ගොඩනැගිලි සීමා හා නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත්කිරීමේ දී ගාස්තු	1,000 0
03.	වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	100 0
04.	වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ දී ගාස්තු	500 0
05.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු	1,000 0
06.	ගොඩනැගිලි අයදුම්පත් සලකා බැලීමේ ගාස්තු (පෙරසැරි ගාස්තු)	
	* වර්ග අඩි 0-500	1,000 0

		රු. ශත
	* වර්ග අඩි 501-1,500 ට අඩු	2,500 0
	* වර්ග අඩි 1,500 ට වැඩිවන විට වැඩිවන වර්ග අඩි 100ට හෝ ඉන් කොටසකට	200 0
07.	ගොඩනැගිලි අයදුම්පත් අනුමත කර නොගෙන ඉදිකිරීම් ආරම්භ කර ඇති ස්ථාන සඳහා දඩ මුදල් අයකිරීම - වර්ග අඩියකට	
	1. අත්තිවාරම් මට්ටම	3 0
	2. බිත්ති ඉදිකිරීම	4 0
	3. වහලය - පළමු මහල	5 0
08.	අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තුව	1,000 0
09.	ගොඩනැගිලි අයදුම්පත්වල කාලය වසරකට දීර්ඝකර ගැනීමේ ගාස්තු	1,000 0
10.	දුරකතන සම්ප්‍රේෂණ කුළුණු සඳහා ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීමේ ගාස්තු	20,000 0
11.	ට්‍රැක්ටරය කුළියට දීම- ට්‍රේලරය/බවුසරය සමග (පැය 01කට) දිස්ත්‍රික් මිල ගණන් අනුව	
12.	මිනිපේ ප්‍රාදේශීය සභාවේ පැරණි කාර්යාලයේ රැස්වීම් ශාලාව කුළියට දීම (පැය 05) ඊට වැඩිවන සෑම පැයකටම රු. 250.00 කි	2,000 0
13.	මිනිපේ ප්‍රාදේශීය සභාවේ වේදිකාව කුළියට දීම (එක් දිනකට)	3,000 0
14.	මිනිපේ ප්‍රාදේශීය සභාවේ වේදිකාව අනුමත කාර්යයට පසුව රැයක් තබා ගන්නේනම්	1,000 0
15.	මිනිපේ ප්‍රාදේශීය සභාවේ වේදිකාව කුළියට දීමේ තැන්පත් මුදල	2,000 0
16.	පොදු ක්‍රීඩාංගණය කුළියට දීම පැය 05කට (ඊට වැඩිවන සෑම පැයකටම රු. 250.00 කි)	2,000 0
17.	පොදු ක්‍රීඩාංගණය කුළියට දීමේ දී තැන්පත් - ක්‍රීඩා තරග සඳහා	2,000 0
	- සංගීත සංදර්ශන සඳහා	15,000 0
18.	සභාවට අයත් කොඩි කණු ලබා දීම - එක් කණුවක් සඳහා දිනකට	20 0
19.	සභාවට අයත් කොඩි කණු ලබාදීමේ දී තැන්පත්	1,000 0
20.	මිනිපේ ප්‍රාදේශීය සභාවේ පෝටෝන් ලොරි රථය කුළියට දීම :	
	* මූලික ගාස්තුව	500 0
	* ධාවනය වන කිලෝමීටර් 01 ක් සඳහා	160 0
	* රැයක් තබා ගන්නේ නම්	1,000 0
21.	මිනිපේ ප්‍රාදේශීය සභාවේ මෝටර් ග්‍රේඩරය කුලියට දීම -පැයක් සඳහා	7,400 0
	ජල සේවා :	
1.	නළ ලිං අලුත්වැඩියා කිරීමේ ගාස්තු	1,000 0
2.	ජල අයදුම්පත්‍ර ගාස්තු	100 0
3.	ජල බවුසර් කුළියට දීමේ දී ගාස්තු :	
	01. ජල ලීටර් 3500ට ට්‍රැක්ටර් බවුසර් 01ක්	
	* පුණ්‍යමය කටයුතු සඳහා	500 0
	* වෙනත් කටයුතු සඳහා	1,000 0
	* කුඩා ජල බවුසරය රැයක් තබා ගන්නේනම් (මේ සඳහා අංක 11හි සඳහන් ට්‍රැක්ටරය සඳහා ගාස්තු අය කෙරේ.)	300 0
	02. ජල ලීටර් 6,000 ට්‍රක් බවුසර් 01ක්	
	* පුණ්‍යමය කටයුතු සඳහා	900 0
	* වෙනත් කටයුතු සඳහා	1,800 0
	* ට්‍රක් බවුසරය සඳහා ජලය සඳහා ගාස්තු හැර මූලික ගාස්තුව	500 0

		රු. ශත
	* ධාවනය වන කිලෝමීටර් 01 ක් සඳහා	170 0
	* රැයක් තබා ගන්නේ නම්	1,000 0
4.	ගිවිසුම් කොන්දේසි කඩ කිරීම මත විසන්ධි ජල සැපයුම් නැවත සන්ධි කිරීමේ ගාස්තු	1,000 0
5.	පාරිභෝගික ඉල්ලීම් මත විසන්ධි කළ ජල සැපයුම් නැවත සන්ධි කිරීමේ ගාස්තු	400 0
6.	අනවසර ජල සැපයුම් දඩ	2,000 0
7.	ජල පාරිභෝගික නම් වෙනස් කිරීමේ ජල ගිවිසුම් ගාස්තු	250 0
8.	නව ජල සැපයුම් ලබා ගැනීමේ දී හා නම් වෙනස් කිරීමේ දී ආරක්ෂිත ඇප තැන්පත්	
	* ගෘහස්ථ කටයුතු සඳහා	1,000 0
	* ව්‍යාපාරික ස්ථාන සඳහා	2,500 0
	පාරිසරික කටයුතු :	
1.	පරිසර බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තු	150 0
2.	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	100 0
3.	පරිසර බලපත්‍ර ගාස්තු වසර 03 කට	4,500 0
4.	පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු	1,500 0
5.	ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ නිපදවනු ලබන :	
	(i) නොහලන ලද කොම්පෝස්ට් පොහොර ට්‍රැක්ටර් ලෝඩ් 01	1,000 0
	(ii) හලන ලද කොම්පෝස්ට් පොහොර කි. ග්‍රෑම් 01	12 0
	(iii) අසුරන ලද කොම්පෝස්ට් පොහොර බෑග් කි. ග්‍රෑම් 10	120 0
	කි. ග්‍රෑම් 25	300 0
	කි. ග්‍රෑම් 50	600 0
6.	මිනිපේ ප්‍රාදේශීය සභාවට අයත් පොදු වැසිකිළිය භාවිතය සඳහා එක් අයෙකු වෙනුවෙන් ගාස්තු	20 0
	වෙනත් පොදු කටයුතු :	
1.	පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු :	
	* පාසල් ළමුන් සඳහා	20 0
	* වැඩිහිටියන් සඳහා	50 0
2.	පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමේ දී තැන්පත් මුදල	200 0
3.	පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීමේ සේවා ගාස්තු	20 0
4.	පුස්තකාල පොත් ප්‍රමාද වීමේ දඩ දිනකට	1 0
5.	පුස්තකාල පොත් නැතිවීමේ දඩ - පොතේ වර්තමාන වටිනාකම හා 25% දෙපාර්තමේන්තු ගාස්තු	
6.	පෙර පාසල් ගාස්තුව	500 0
16.	පුස්තකාල ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමේ ගාස්තු (බල ප්‍රදේශයෙන් පිට පාසල් අයදුම්කරුවන් සඳහා)	100.0
17.	පුස්තකාල ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමේ ගාස්තු (බල ප්‍රදේශයෙන් පිට වැඩිහිටි අයදුම්කරුවන් සඳහා)	250.0
18.	පුස්තකාල සාමාජික ගාස්තු අළුත් කිරීම	50.0
19.	පිඹුරු පිටපත් අනුමත කිරීමේ ගාස්තු	1,500.0
20.	පරිසර බලපත්‍ර අයදුම්පත් නිකුත් කිරීමේ ගාස්තු	500.0
21.	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත් නිකුත් කිරීමේ ගාස්තු	250.0
22.	පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු (වර්ෂ තුනකට වලංගු බලපත්‍රය)	4,000.0

23. ක්‍රියාවලිය සඳහා අයකරනු ලබන පරීක්ෂණ ගාස්තු

ආයෝජනය (රු.)	*පරීක්ෂණ ගාස්තුව (රු.)*
250,000 හෝ ඊට අඩු	3,000.0
250,001 වැඩි එහෙත් 500,000දක්වා	3750.0
500,001 ට වැඩි එහෙත් 10,00,000 දක්වා	5,000.0
10,00,000 ට වැඩි	10,000.0

24.	දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත් කිරීම සඳහා එකඟතා සහතික ලබාදීමේ ගාස්තු	1,500.0
25.	පාපැදි බලපත්‍ර නිකුත් කිරීම - ලිපි ද්‍රව්‍ය ගාස්තු	25.0
26.	කර්මාන්ත ගිවිසුම් කට්ටලයක් නිකුත් කිරීම සඳහා ගාස්තු	1,000.0
27.	අයාලේ යන ගවයින් ඇල්ලීම වෙනුවෙන් අයකරන ගාස්තු	500.0
28.	අයාලේ යන ගවයින් අල්ලා නඩත්තු කිරීම වෙනුවෙන් අයකරන ගාස්තු (දිනකට)	200.0
29.	අයාලේ යන ගවයින් අල්ලා ආරක්ෂා කිරීම වෙනුවෙන් අයකරන ගාස්තු (දිනකට)	100.0
30.	අයාලේ යන ගවයින් ඇල්ලීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම - පරිපාලන හා වෙනත් ගාස්තු	1,000.0
31.	වාණිජ කටයුතු සඳහා බණිජ වර්ග ප්‍රවාහනය කිරීමට ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් කියුබ් 01ට අය කරනු ලබන ගාස්තු	150.0
32.	වාණිජ නොවන කාර්යයන් සඳහා බණිජ වර්ග ප්‍රවාහනය කිරීමට ප්‍රාදේශීය සභා මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් කියුබ් 05ට අඩු ප්‍රවාහන කටයුතු සඳහා කියුබ් 01ට අය කරනු ලබන ගාස්තු	200.0
33.	ට්‍රැක්ටර් රථ කුලියට දීම ට්‍රේලරය සමග (දිනකට)	15,000.0
34.	ජල බවුසරයෙන් ජලය සහිතව කි.මී. 03 ක් ඇතුළත සැපයීම සඳහා ගාස්තු	5,000.0
35.	ජල බවුසර් මගින් ජලය ප්‍රවාහනය කරදීම (පෞද්ගලික මංගල - අවමංගල්‍ය සඳහා) කි.මී. 03 ඇතුළත අමතර කි.මී. 01 ක් සඳහා ගාස්තු	125.0
36.	ජල බවුසරය කුලියට දීම ට්‍රැක්ටරය සහිතව (දිනකට)	15,000.0

		රු. ශත
37.	ජල බවුසරය කුළියට දීම ට්‍රැක්ටරය රහිතව (දිනකට)	3,000.0
38.	ජල බවුසර් සැපයීම (පෞද්ගලික මංගල, අවමංගල සඳහා) දින 01ක් සඳහා ට්‍රැක්ටර රහිතව ජලය රහිතව	2,000.0
39.	ගලි බවුසරය සේවා (ටැංකි 01 ඉවත ලීම) සඳහා	10,000.0
40.	ගලි බවුසරය ප්‍රවාහන ගාස්තු කි.මී. 01 සඳහා	125.0
41.	රැස්වීම් ශාලාව කුළියට ලබා දීම (පැය 01ක කාලයක් සඳහා)	1,500.0
42.	රැස්වීම් ශාලාව කුළියට ලබා දීම (වරුවක් - පැය 06ක කාලයක් සඳහා)	7,000.0
43.	රැස්වීම් ශාලාව කුළියට ලබා දීම (දිනකට)	12,000.0
44.	(මෙම සෑම අවස්ථාවකදීම ශබ්දවාහිනී යන්ත්‍ර (Sounds) ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන්නේ නම් අමතර ගාස්තුව)	8,000.0
45.	මෝටර් ග්‍රේඩරය මීටර් පැය 01 (තලය අඩි 08)	9,000.0
46.	බැකෝ ලෝඩරය මීටර් පැය 01 ක් සඳහා	7,500.0
47.	ටිපර් රථ කියුබ් 02 (දිනකට පැය 08) (බල ප්‍රදේශය තුළ)	16,000.0
48.	කාබනික පොහොර අලෙවි කිරීමේ ගාස්තු (1kg)	20.0
49.	තාවකාලික වෙළඳාම (දෛනික)	200.0
50.	තාවකාලික වෙළඳාම (දීර්ඝ කාලීන, සතියකට)	500.0
51.	ට්‍රැක්ටරයට සවිකර ඇති තණකොළ කපන යන්ත්‍රය වැඩ කරන මීටර් පැයකට (බල ප්‍රදේශය තුළ)	7,000.0

නීල හරිත උද්‍යානය

49.	කාමර අංක 01 ක් සඳහා	කාල සීමාව	AC	Non/AC
		දිනයක් සඳහා (උදෑසන 6.00 සිට පසුදා උදෑසන 8.00 දක්වා)	රු. 3,500.0	රු. 2,500.0
	සම්පූර්ණ ගෙස්ට් එකම කුළියට ගත් විට	දිනයක් සඳහා (උදෑසන 6.00 සිට පසුදා උදෑසන 8.00 දක්වා)	රු. 20,000.0	රු. 15,000.0
	කාමර 01 සඳහා	දින 02 සිට 07 දක්වා නතර වන අයකුට	රු. 3,500.0-10%	රු. 2,500.0-10%
		දින 07කට වැඩිය නතර වන අයකුට	රු. 3,500.0-20%	රු. 2,500.0-10%

අනතුරුව විරුද්ධත්වයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.

මෙම උධෘතය 2022.10.26 වැනි දින මාසික මහ සභා වාර්තාවෙන් උපුටා ගන්නා ලදි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
හොරොව්පොතාන.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ වැඩබලන සභාපති ඩබ්ලිව්. එල්. රුවන් ලියනගේ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි. එනම්;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (I) වන උපවගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1524 හා 2007.11.16 දිනැති *ගැසට් පත්‍රය* යටතේ හා අංක 1617 හා 2009-08-28 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2022 වර්ෂය සඳහා වූ තක්සේරුව 2023 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කලයුතු බවටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට දහයක (10%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2023 වර්ෂයෙහි මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දිනයන්ට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2023 වර්ෂයෙ හි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, කාර්තු වශයෙන් අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවේ පළමුවන මාසය තුළ දී අදාළ මුදලින් 5% ක වට්ටමක් ද ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති *(වැ. බ.)*,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීමේ ගාස්තු රු. 100.00

12 - 490/1

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ වැඩබලන සභාපති ඩබ්ලිව්. එල්. රුවන් ලියනගේ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(3) වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව හා එම විධිවිධාන අනුව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සලකණු ලබන බව අංක 544(IV) ආ හා 1989-02-03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති නියමයට ඇතුළත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පිහිටියා වූද, ස්ථිර හෝ

නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු ස්ථීර හෝ නිතිපතා ගොවිතැන් යටතේ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ හෙක්ටයාර් එකක් සඳහා 2023 වර්ෂයට රුපියල් 50/- ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට ද ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 5 හෝ ඊට වැඩි වන සෑම හෙක්ටයාර් එකක් මත 2023 වර්ෂය සඳහා රු. 10/- ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට මම තීරණය කරමි.

2022 වසරේ අක්කර බදු සඳහා පදනම් කොටගත් සත්‍යාක්ෂණය 2023 වසර සඳහාද සත්‍යාක්ෂණය ලෙස පිළිගැනීමටත් තව ද, 2023 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2023 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ හතරවන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එම කාර්තුවට මුදලින් 5% ක වට්ටමක් ද ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති *(වැ. බ.)*,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*10% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	මාර්තු 31	ජනවාරි 31	ජනවාරි 31
දෙවන කාර්තුව	ජුනි 30		අප්‍රේල් 30
තුන්වන කාර්තුව	සැප්තැම්බර් 30		ජූලි 31
හතරවන කාර්තුව	දෙසැම්බර් 31		ඔක්තෝබර් 31

12 - 490/2

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ වැඩබලන සභාපති ඩබ්ලිව්. එල්. රුවන් ලියනගේ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති *(වැ. බ.)*,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

උපලේඛනය

	රු. ශත
මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25.00
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා :-	
(අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18.00
(ආ) වෙළඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	4.00
සෑම කරත්තයක් සඳහා	20.00
සෑම අත්කරත්තයක් සඳහා	10.00
සෑම රික්ෂෝවක් සඳහා	7.50
සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15.00
සෑම ඇතෙකු සඳහා	50.00

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 490/3

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ වැඩබලන සභාපති ඩබ්ලිව්. එල්. රුවන් ලියනගේ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම් ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අංක 2152/37 දරන 2019.12.05 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* නියම කර ඇති පරිදි, මහජන සෞඛ්‍යයට අදාළ වන, වාර්ෂික බලපත්‍රයක් ලබා ගත යුතු, පහත ලැයිස්තු අංක 01, ලැයිස්තු අංක 02, ලැයිස්තු අංක 03, ලැයිස්තු අංක 04 හි දක්වා ඇති යම් වෙළෙඳාමක් හෝ කර්මාන්තයක් සඳහා යොදගනු ලබන ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින්, එකී පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම මත, පහත උපලේඛන අංක 01හි නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2023 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2022 වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2023 වර්ෂය සඳහා නියම කර අය කිරීමට මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති *(වැ. බ.)*,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

උපලේඛනය 01

I වන තීරය	*II වන තීරය* *රු. ශත*
වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක	500 0
වාර්ෂික වටිනාකම රු. 750 ඉක්වන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	750 0
වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක	1,000 0

ලැයිස්තු අංක 01

අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත

1. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම.
2. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම.
3. සම් පදම් කිරීම.
4. රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම.
5. රබර් භාණ්ඩ නිෂ්පාදනය.
6. ඔට්ටපාලු ගබඩාකර තැබීම හෝ විකිණීම.
7. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම.
8. සත්ත්ව ආහාර නිපදවීම.
9. සබන් නිෂ්පාදනය කිරීම.
10. අලුත් ලෝහ හෝ පරණ ලෝහ මිලට ගැනීම හෝ ගබඩාකර තබා ගැනීම.
11. ලෝහ සුන්බුන් හා අබලි ද්‍රව්‍ය මිලට ගැනීම හෝ ගබඩාකර තබා ගැනීම.
12. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ඔපදැමීම.
13. වේවැල් භාණ්ඩ නිපදවීම.
14. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
15. පොල් ලෙලි පෙඟවීම (පල් කිරීම).
16. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර).
17. යන්ත්‍රානුසාරයෙන් දැව ඉරීම.
18. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම.
19. කෙඳි සායම් කිරීම.

20. සම් භාණ්ඩ නිපදවීම.
21. රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ නැවත ඇසිරීම.
22. ගෑස් මැන්ටල් නිපදවීම.
23. පොටි නිපදවීම.
24. ඉටිපන්දම් නිපදවීම.
25. කපුරු නිපදවීම.
26. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
27. රෙදි සෝදන නිල් නිපදවීම.
28. ලාකඩ නිපදවීම.
29. සුවඳ විලවුන් නිපදවීම.
30. පාසල් රටහුණු නිපදවීම.
31. ටයර් හෝ ටියුබ් නිපදවීම.
32. ටයර් නැවත පිරවීම.
33. කිරි පට්ටි හෝ කිරි වෙළඳාම
34. සිමෙන්ති ගබඩා කිරීම, ඇස්බැස්ටස් ගබඩා කිරීම.
35. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
36. වැලි කඩදසි නිපදවීම.
37. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීම.
38. ගඩොල් පිළිස්සීම හා විකිණීම.
39. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම.
40. උළු නිපදවීම හා විකිණීම
41. භාවිතයට ගත් ගෝනි, බැරල් හා භාජන පිරිසිදු කර විකිණීම.
42. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම.
43. කුරුඳු, කරදමුංගු වේලා සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම.
44. ගම් වර්ග නිපදවීම හෝ විකිණීම.
45. විෂබීජනාශක වර්ග නිෂ්පාදනය හෝ විකිණීම.
46. බැටරි පිරවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
47. පරණ බෝතල් එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
48. අවමංගල සේවාවක් පවත්වාගෙන යාම.
49. ගෘහ භාණ්ඩ නිපදවීම හා ගබඩාකර තබා ගැනීම.
50. මැණික් කැපීම හා ඔප දැමීම.
51. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම.
52. යාන්ත්‍රික බලයෙන් රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
53. පිටි හෝ කුළුබඩු ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
54. සත්ත්ව ආහාර ගබඩාකර තබා ගැනීම.
55. ධාන්‍ය වර්ග ගබඩාකර තබා ගැනීම.
56. පොලිතින් හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන කිරීම හෝ විකිණීම.
57. සපත්තු නිෂ්පාදනය හා විකිණීම.
58. ඉටිපන්දම් නිෂ්පාදනය හා විකිණීම.
59. වෙනත් අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත.
60. සත්ත්ව පාලනය.
61. බිම්මල් නිෂ්පාදනය.
62. කැබලි රෙදි අලෙවිය.
63. රසකැවිලි නිෂ්පාදනය.
64. පළතුරු බීම, සිරප් වර්ග නිෂ්පාදනය.
65. බේකරිය.

ලැයිස්තු අංක 02

අන්තරාදායක ව්‍යාපාර හෝ කර්මාන්ත

01. යාන්ත්‍රික බලයෙන් දැව ඉරීම.
02. කොප්පරා නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
03. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් හෝ වෙනත් යම් තෙල් වර්ගයක් සිදීම හෝ ගබඩාකර තබා ගැනීම.
04. පුළුන් ගබඩාකර තබා ගැනීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සකස් කර විකිණීම.
05. ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
06. මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය.
07. කොහු හෝ වෙනත් කෙඳිවර්ග නිෂ්පාදනය.
08. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
09. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම.
10. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම.
11. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.
12. දර විකිණීම.
13. උළු හා ගඩොල් ගබඩා කර තබා ගැනීම හා විකිණීම.
14. ටයර් ටියුබ් විකිණීමට ගබඩාකර තබා ගැනීම.
15. දැව ආශ්‍රිත ලෑලි නිෂ්පාදනය සහ දැව කුඩු ආශ්‍රිත නිෂ්පාදන
16. කාඩ්බෝඩ් හා කඩදාසි භාවිතයෙන් කරන නිෂ්පාදන ගබඩා කර තබා ගැනීම හා විකිණීම.
17. ගල් හා පතුරු ගල් ආශ්‍රයෙන් කරන කර්මාන්ත.
18. මැටි හා මැටි ආශ්‍රිත කර්මාන්ත.
19. නිමි ඇඳුම් නිෂ්පාදන ආයතන.
20. රසායන ආශ්‍රිත රෙදි නිෂ්පාදන කර්මාන්ත.
21. රෙදි සේදීම් ස්ථාන.
22. බීඩි නිෂ්පාදනය හා ගබඩාකර තබා ගැනීම.
23. වාහන අලුත්වැඩියා කර තීන්ත ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
24. වාහනවල බඳ කොටස අලුත්වැඩියා කර තීන්ත ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
25. වාහන සේවා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
26. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
27. පරණ පත්තර හෝ කඩදාසි එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
28. පා පැදි, යතුරු පැදි හා මෝටර් වාහන අලුත්වැඩියා කිරීම.
29. විසිරි පින්තාරු කිරීම.
30. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිෂ්පාදනය හා ගබඩා කිරීම.
31. ලෝහ සංස්කාර්යය කර්මාන්ත යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම.
32. වෙනත් අන්තරාදායක ව්‍යාපාර හෝ කර්මාන්ත
33. ඉන්ධන පිරවුම්හල

ලැයිස්තු අංක 03

අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත

01. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම.
02. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් කිරීම හෝ බතික් කිරීම.

03. විද්‍යුත් ලෝහ ආලේපණය කිරීම.
04. ශීතකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
05. තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම.
06. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම.
07. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම.
08. ෆයිබර් නිෂ්පාදන.
09. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම.
10. ලෝහ වර්ග පෑස්සවීම.
11. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.
12. වාත්තු වැඩපළක් පවත්වාගෙන යාම.
13. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම.
14. මෝටර් වාහන බොඩි තැනීම.
15. කෘමිනාශක, දිලීරනාශක, පැළෑටිනාශක හෝ පළිබෝධනාශක නිපදවීම හෝ නැවත පිරවීම.
16. විෂබීජනාශක නිපදවීම සහ මදුරු දඟර නිපදවීම.
17. දැව ආරක්ෂණ නිපදවීම.
18. ගල් තර හා සිමෙන්ති ආශ්‍රිත පූර්ව සැකසුම් මධ්‍යස්ථාන.
19. වීදුරු භාණ්ඩ නිපදවීම හා ගබඩා කිරීම.
20. යකඩ තහඩු ගල්වනයිස් කිරීම.
21. පාස්සන ඊයම් නිපදවීම.
22. ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.
23. කටු කම්බි නිපදවීම.
24. කම්බි ඇණ නිපදවීම.
25. කාබන් කඩදාසි හෝ යතුරු ලියන් රිබන් නිපදවීම.
26. බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබන් නිපදවීම.
27. ජී අයි සී බාල්දි නිපදවීම.
28. වායු සමන යන්ත්‍ර, ශීතකරණ, අධි ශීතකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම.
29. බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම හා අලුත්වැඩියා කිරීම.
30. යන්ත්‍රෝපකරණ නිපදවීම.
31. විදුලි භාණ්ඩ නිපදවීම
32. රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම.
33. සංචායත බැටරි නිපදවීම.
34. මෝටර් රථ වාහන එකලස් කිරීම.
35. රේඩියේටර් නිපදවීම.
36. ඉලෙක්ට්‍රොනික උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම.
37. වියළි කෝෂ බැටරි නිපදවීම.
38. විදුලි බුබුළු නිෂ්පාදනය සහ අලුත්වැඩියාව.
39. වෙනත් අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත.

ලැයිස්තු අංක 04

අතුරු ව්‍යවස්ථා පනවා ඇති ව්‍යාපාර හෝ කර්මාන්ත

01. ආහාර පිණිස සතුන් ඝාතනය කිරීම හා ඝාතනය සඳහා රඳවා තබා ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම.
02. ආහාර සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම.

03. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම.
04. එළවළු හෝ පළතුරු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම.
05. ගල්වලක් සහ ගල් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම.
06. තේ කෝපි කඩ හා කෙටි ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
07. මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
08. මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
09. රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
10. ලැගුම්හල් හා නවාතැන්පලවල් පවත්වාගෙන යාම.
11. සංචාරක වෙළෙඳාමක් පවත්වාගෙන යාම.
12. සිස්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම.
13. හෝටලයක් පවත්වාගෙන යාම.

වෘත්තීය බදු අය කිරීම	*රු.ශත*
1. නාගරික වෘත්තීය ගාස්තු	3000.00
2. අර්ධ නාගරික වෘත්තීය ගාස්තු	2000.00
3. ග්‍රාමීය වෘත්තීය ගාස්තු	1500.00

12 - 490/4

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති ඩබ්ලිව්. එල්. රුවන් ලියනගේ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම් ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා නියම කර අය කිරීමට මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති *(වැ. බ.)*,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

උපලේඛනය

අනු. අංකය	*I තීරුව* *කර්මාන්තය*	*II වන තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	*රු. 751.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501.00 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	අභ්‍යාස පොත් නිපදවීම	500.00	750.00	1,000.00
02	ඇඳ ඇතිරිලි, කොට්ට උර, තිර රෙදි නිපදවීම හා අලෙවිය	500.00	750.00	1,000.00
03	ඇඳුම් මැසීමේ ස්ථාන	500.00	750.00	1,000.00
04	කඩදසි බෑග් නිෂ්පාදනය	500.00	750.00	1,000.00
05	ජී අයි බාල්දි නිපදවා විකිණීම	500.00	750.00	1,000.00
06	පාවහන් නිෂ්පාදනය	500.00	750.00	1,000.00
07	පැණි නිපදවා විකිණීම	500.00	750.00	1,000.00
08	ප්‍රචාරක දැන්වීම් පුවරු/බැනර් සකස් කිරීම	500.00	750.00	1,000.00
09	බෙලෙක් වැඩපලවල්	500.00	750.00	1,000.00
10	මදුරු දැල් මසා අළෙවිය	500.00	750.00	1,000.00
11	මැටි භාණ්ඩ නිපදවීම/අලෙවිය	500.00	750.00	1,000.00
12	සිමෙන්ති භාණ්ඩ නිපදවීම හා අළෙවිය	500.00	750.00	1,000.00

12 - 490/5

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති ඩබ්ලිව්. එල්. රුවන් ලියනගේ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 (1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම් ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 152 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2022 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයට ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා නියම කර අය කිරීමට මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති (වැ. බ.),
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

ඉහත කී උපලේඛනය

I තීරුව *II තීරුව*

2022 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*රු. ශත*
රු. 6,000.0 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,001.0 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90.00
රු. 12,001.0 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180.00
රු. 18,751.0 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360.00
රු. 75,001.0 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200.00
රු. 1,50,001.0 ඉක්මවන විට	3,000.00

ව්‍යාපාර බදු අදාළ වන ස්ථානයන් :

1. අලෙවි නියෝජිත ව්‍යාපාර (ඇන්කර්/බිස්කට්/සිගරට්)
2. ඇඟළුම් කර්මාන්ත ශාලා
3. ඇළුමිනියම් භාණ්ඩ අළෙවිය
4. ඇස්කණ්නාඩි අළෙවිය
5. ඉංග්‍රීසි බෙහෙත් විකිණීම (ෆාමසි)
6. උකස් මධ්‍යස්ථාන
7. උත්සව ශාලා සැරසිලි කුළියට දීම
8. ඒජන්සි තැපැල් කාර්යාල
9. කාපට් විකිණීම
10. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
11. කෘතිම මල් අලෙවිය
12. ගල් ස්මාරක විකිණීම
13. ගුවන් විදුලි යන්ත්‍ර අමතර කොටස් අලෙවිය
14. ගොඩනැගිලි ද්‍රව්‍ය අළෙවිය
15. ඡායාරූප ශාලා
16. ජංගම සීට්ටු බඩු අලෙවිය
17. ජ්‍යොතිෂ කාර්යාලය
18. ටයර්, ටියුබ් විකිණීම, වොල්කනයිස් කිරීම
19. තොග ගබඩාවක් පවත්වාගෙන යාම
20. ත්‍රීවීල් රථ අමතර කොටස් අලෙවිය
21. දන්ත ශල්‍යාගාර
22. දිවා සුරුකුම් මධ්‍යස්ථාන
23. දුරකථන සම්බන්ධ කරන ව්‍යාපාර
24. දුම් පරීක්ෂා කිරීමේ ස්ථාන
25. දේශීය, විදේශීය දුරකථන ඇමතුම් හා ජංගම දුරකථන අලෙවිය
26. දේශීය රැකියා නියෝජිත
27. නානකාමර කට්ටල හා පිඟන් ගඩොල් අලෙවි ප්‍රදර්ශනාගාර
28. නිමි ඇඳුම් ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම
29. නිවාස සැලසුම් ඇඳීම
30. පරිගණක වෙළඳාම

31. පාපැදි අමතර කොටස් අලෙවිය
32. පා පැදි විකිණීම
33. පාවහන්, කුඩ අලුත්වැඩියා කරන ස්ථාන
34. පාවහන් අලෙවි කරන ස්ථාන
35. පිඟන් භාණ්ඩ අලෙවිය
36. පැල තවාන හා බීජ නිෂ්පාදනය
37. පුවත්පත්, සඟරා වෙළෙඳාම
38. පූජා භාණ්ඩ අලෙවිය
39. ප්‍රධාන නියෝජිතයින්
40. ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම (ලීබඩු/මැෂින්/මෝටර් සයිකල් වැනි වෙනත්)
41. ප්ලාස්ටික් බඩු අලෙවිය
42. පොත් සහ ලිපි ද්‍රව්‍ය වෙළෙඳාම
43. පොල් විකිණීම
44. පෞද්ගලික ආයුර්වේද මධ්‍යස්ථාන
45. පෞද්ගලික ඉංග්‍රීසි වෛද්‍ය මධ්‍යස්ථාන
46. පෞද්ගලික පන්ති
47. පෞද්ගලික උත්සව ශාලා ව්‍යාපාර
48. බල ප්‍රදේශය තුළ තේ දළු, රබර් කිරි එකතු කිරීමේ ව්‍යාපාරය (ජංගම)
49. බැංකු ව්‍යාපාර
50. බුලත්, දුම්කොළ විකිණීම
51. මල් පැල විකිණීම
52. මනි බඩු අලෙවිය
53. මහා පරිමාණයේ කර්මාන්ත ශාලා
54. මංගල ඇඳුම් කුළියට දීම
55. මිලදී ගැනීම හා අලෙවිය
56. මිරිදිය මසුන් ඇතිකිරීම හා අලෙවිය"
57. මුදල් ණයට දෙන ස්ථාන
58. මුළුතැන්ගෙයි උපකරණ අලෙවිය
59. මෝටර් රථ අමතර කොටස් අලෙවිය
60. මෝටර් සයිකල් විකිණීමේ ස්ථාන
61. යතුරු පැදි අමතර කොටස් අලෙවිය
62. යන්ත්‍ර උපකරණ කුළියට දීම
63. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
64. රසායනාගාර
65. රටබීම ශාලාවක් පවත්වාගෙන යාම
66. රක්ෂණ ව්‍යාපාර
67. රියදුරු පුහුණු ආයතන
68. රේස් ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාර
69. රෙදිපිළි විකිණීම
70. ලීසිං මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
71. ලොතරැයි අලෙවිය/අලෙවි නියෝජිත
72. ලේ සාම්පල් එකතු කිරීම
73. වාහන ස්ටිකර් කැපීම/අංක තහඩු අලෙවිය
74. වාහන අලංකරණ උපාංග අලෙවිය

75. වාහන කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
76. වාහන විකිණීමේ ස්ථාන (සේල්)
77. වැලි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
78. විදේශ රැකියා නියෝජිත
79. විසිතුරු භාණ්ඩ වෙළෙඳාම
80. විදුලි උපකරණ අලෙවිය
81. විදුලි උත්පාදන යන්ත්‍ර කුළියට දීම
82. වීඩියෝ පට කුළියට දීම, ගීත පටිගත කිරීම හා විකිණීම
83. වීදුරු භාණ්ඩ අලෙවිය
84. වෙන්දේසිකරුවන්
85. වේවැල් භාණ්ඩ අලෙවිය
86. සතොස වෙළෙඳ ආයතනයක් පවත්වාගෙන යාම
87. සංගීත භාණ්ඩ, නර්ථන භාණ්ඩ විකිණීම හා අළුත්වැඩියාව
88. සාරි වෙළෙඳාම
89. සාප්පු බඩු අලෙවිය
90. සැපයුම්කරුවන්
91. සිංහල බෙහෙත් විකිණීම
92. සිනමාශාලා
93. සීමාසහිත සමාගම්
94. සුපිරි වෙළෙඳසැල
95. ස්වාර්ණාභරණ අලෙවිය
96. සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ විකිණීම
97. වෙනත් ඕනෑම භාණ්ඩයක්/ද්‍රව්‍යයක් වෙළෙඳාම් කිරීම සඳහා
98. පශු වෛද්‍ය මධ්‍යස්ථාන
99. ආයුර්වේද ස්පා (සම්බාහන මධ්‍යස්ථාන)

12 - 490/6

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයෙහි තාවකාලික අලෙවි කුටි සඳහා ගාස්තු අය කිරීම්

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවට ඇතුළත් වූ ප්‍රදේශයෙහි ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් නම් කරනු ලබන ස්ථානයන්හි තාවකාලික අලෙවි කටයුතු සඳහා මෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති *(වැ. බ.)*,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

01	තාවකාලික සේල් පොළවල් සඳහා දිනකට ගාස්තු	රු. 1000 සිට 3000 දක්වා
02	රෙදි සහ අනෙකුත් ද්‍රව්‍ය සඳහා	රු. 250 සිට 1500 දක්වා

12 - 490/7

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

2023 වර්ෂය සඳහා සිනමාහල් නොවන මුදල් අයකර පෙන්වන දර්ශන සඳහා වන ප්‍රවේශ පත්‍රයක සඳහන් මුදලින් 15% විනෝද බදු මුදල් වශයෙන් අය කළ යුතුයැයි මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති (වැ. බ.),
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

12 - 490/8

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ලබා දීම

2000 අංක 53 දරන පාරිසරික සංශෝධන පනත යටතේ පැවරී ඇති බලතල අනුව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශය සඳහා පරිසර බලපත්‍ර පැනවීමේ දී මෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අය කළයුතු යැයි මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති (වැ. බ.),
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

ආයෝජන මුදල රු.		*ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව*
		රු. ශත
01	250,000 ට අඩු	3000.00
02	250,001 ත් 500,000 ත් අතර	3750.00
03	500,001 ත් 1,000,000 ත් අතර	5000.00
04	1,000,001 ට වැඩි	10,000.00
05	පරිසර බලපත්‍ර ගාස්තු	4500.00

12 - 490/9

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අය කිරීම්

2023 වර්ෂය සඳහා බදු මුදල් අය කිරීමට අදාළ නොවන්නා වූ වෙනත් ගාස්තු පහත සඳහන් අනු ප්‍රමාණ අනුව අය කිරීමට මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති (වැ. බ.),
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

	රු. ශත
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.	3000.00
ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.	3000.00
පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම. (වැඩිහිටි)	100.00
පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම. (ළමා)	50.00
පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම. (වැඩිහිටි)	50.00
පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම. (ළමා)	30.00
(සෑම සාමාජිකයෙකුම සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු වාර්ෂිකව සාමාජිකත්වය අළුත් කර ගත යුතුය.	
ප්‍රමාද ගාස්තු දිනකට	1.00
ප්‍රමාද ගාස්තු දින 31-90 දක්වා	40.00
ප්‍රමාද ගාස්තු දින 91-180 දක්වා	60.00
ප්‍රමාද ගාස්තු දින 181 ට වැඩි	100.00
අයදුම්පත් ගාස්තු	5.00

පොතකට අලාභයක් සිදුවුවහොත් හෝ නැතිවුවහොත් පොතේ වටිනාකම මෙන් දෙගුණයක් හා පොතේ වටිනාකමින් 25% ක් රජයේ ගාස්තු වශයෙන් ගෙවිය යුතුය.

බල ප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවන් සඳහා සාමාජිකත්වය ලබා ගැනීමේදී අවුරුදු 12 ට අඩු වූවන් සඳහා රු. 200 ක් හා අවුරුදු 12 ට වැඩි වූවන් සඳහා රු. 500 ක් බැගින් තැන්පතුවක් තැබිය යුතුය. (මීට අමතරව සාමාජික ගාස්තු ගෙවිය යුතුය.)

අනතුරුදායක කොස් ගස් එකක් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීමට ගාස්තුව (එකම ඉඩමක පිහිටි කොස් ගස් කිහිපයක් සඳහා පරීක්ෂණ ගාස්තු වෙනස් නොවේ.*)	රු. 1,000.00
කොස් නොවන ඕනෑම වෙනත් අනතුරුදායක ගස් එකක් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීමේ ගාස්තු (එකම ඉඩමක පිහිටි කොස් නොවන ඕනෑම ගස් කිහිපයක් සඳහා පරීක්ෂණ ගාස්තු වෙනස් නොවේ.*)	රු. 500.00
ප්‍රසිද්ධ රැගුම් සඳහා බලපත්‍ර ගාස්තු	රු. 500.00
පාපැදි ඉල්ලුම්පත් ගාස්තු	රු. 100.00
එක් දින වෙන්දේසි ගාස්තු	රු. 1200.00
සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු	රු. 100.00
ගවයෙකු ඝාතනය කිරීම සඳහා තාවකාලික බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු	රු. 2000.00
දිවුරුම්පිටිය ජල යෝජනා ක්‍රමයේ ජලය ලබා දීමට නව ජල සම්බන්ධතා ගාස්තුව	රු. 6,000 0
ප්‍රාදේශීය සභා මාර්ගවල දූව/පස් ප්‍රවාහනයට මාර්ග පරීක්ෂා කර අනුමැතිය ලබා දීමේදී ආපසු නොගෙවන ගාස්තුව	රු. 3,000 0
මැණික් පතල් කැපීම සඳහා ස්ථාන පරීක්ෂා කර සහා නිර්දේශය/ අනුමැතිය ලබාදීමට ආපසු නොගෙවන ගාස්තුව	රු. 5,000 0
කසල බැහැර කිරීමේ ගාස්තු - මහ පරිමාණ	රු. 15,000 0
කසල බැහැර කිරීමේ ගාස්තු - කුඩා පරිමාණ	රු. 6,000 0

කාබනික පොහොර පැකට් කරන ලද 1kg ක් සඳහා රු. 35.00
කාබනික පොහොර පැකට් නොකරන ලද 1kg ක් සඳහා රු. 30.00

සේවාලාභීන් සඳහා ලිපි ලේඛන පිටපත් ලබා දීමේ දී එක් පිටපතක් සඳහා රු. 50/- ක මුදලක් සභාවට ගෙවිය යුතු ය.

12 - 490/10

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් සඳහා සැලසුම් අනුමත කිරීම හා ඒ සම්බන්ධ වෙනත් කාර්යයන්, ඉඩම් අනුබෙදුම් හා විථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික සඳහා ගාස්තු

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ වැඩබලන සභාපති ඩබ්ලිව්. එල්. රුවන් ලියනගේ වන මම සංවර්ධන අවසර පත්‍ර ලබාදීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු හා සේවා ගාස්තු අයකිරීම, අදාළ සේවා සඳහා අයදුම්පත් ගාස්තු අයකිරීම, විථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික සඳහා ගාස්තු අයකිරීම, දඩ මුදල් අයකිරීම පහත සඳහන් අනුප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට තීරණය කරමි.

	රු. ශත
ගොඩනැගිලි අයදුම්පත් ගාස්තුව	500.00
භූමි යෝග්‍යතා සහතිකපත් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර ගාස්තු	50.00
විථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම	1000.00
පිඹුරු අනුමත කිරීමේ ගාස්තු (නාගරික නොවන එක් බිම්කඩක් සඳහා)	500.00

නාගරික සංවර්ධන අධිකාරියෙන් නාගරික ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීම, වෙනත් ඉදිකිරීම් හා ඒ සම්බන්ධ සියළු කාර්යයන්, ඉඩම් අනු බෙදුම් හා ඒ සම්බන්ධයෙන් වන සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු අය කිරීම 2009.04.17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් ගාස්තු පරිදි අය කිරීම සිදු කළ යුතුය.

උක්ත කලාපයට අයත් නොවන නාගරික ප්‍රදේශයෙන් පිටත පිහිටා ඇති ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීම, පවත්නා ගොඩනැගිලිවලට අළුතින් කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම යන සංවර්ධන කාර්යයන් සඳහා ගාස්තු අය කිරීම පහත පරිදි විය යුතුය :

පෙරසැරි ගාස්තු

	තනි මහල	*මහල් නිවාස*	*ව්‍යාපාරික*
චර්ග මීටර් 400 දක්වා	රු. 10/-	රු. 10/-	රු. 15/-
චර්ග මීටර් 401 - 1000 දක්වා	රු. 11/-	රු. 15/-	රු. 15/-
චර්ග මීටර් 1001 - 1500 දක්වා	රු. 15/-	රු. 20/-	රු. 20/-
චර්ග මීටර් 1501 - 2000 දක්වා	රු. 15/-	රු. 20/-	රු. 20/-
චර්ග මීටර් 2000ට වැඩි	වැඩිවන සෑම චර්ග මීටර් 90ක් සඳහාම රු. 1000/- බැගින්	වැඩිවන සෑම චර්ග මීටර් 90ක් සඳහාම රු. 1000/- බැගින්	වැඩිවන සෑම චර්ග මීටර් 90ක් සඳහාම රු. 1000/- බැගින්

	වර්ග ප්‍රමාණය	*ගාස්තුව රු.*
සූර්ය පැනල සඳහා වන ගාස්තු	වර්ග මීටර් 50 - 1000 දක්වා	15000/-
	වර්ග මීටර් 1000ට වැඩි	රු. 15000/- වැඩි වන සෑම වර්ග මීටර් 100ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 500/-

අනුමත සැලසුමට අමතරව ගෙබිම් ප්‍රමාණය වැඩි වන සේ සිදුකරන වෙනස් කිරීම් හා එකතු කිරීම්	*මුළු පෙර සැරි ගාස්තුවෙන් 15% ක් + වැඩිවන අමතර වර්ග ප්‍රමාණය සඳහා පෙර සැරි ගාස්තුවෙන් 1/2*
ගෙබිම් ප්‍රමාණය වෙනස් කිරීමක් නොමැතිව අනුමත සැලැස්ම තුළ සිදු කරනු ලබන වෙනස් කිරීම්	මුල් අනුමැතියේ දී ගෙවන ලද පෙර සැරි ගාස්තුවෙන් 15%

1.	ගොඩනැගිලි සැලසුම් අනුමත කාලය වසරකින් දීර්ඝ කිරීම (නාගරික)		රු. 5,000.00
2.	ගොඩනැගිලි සැලසුම් අනුමත කාලය වසරකින් දීර්ඝ කිරීම (ග්‍රාමීය)		රු. 1,000.00
3.	මායිම් තාප්ප ආරක්ෂක බැමි ඉදිකිරීම (ග්‍රාමීය)	නේවාසික දික් මීටර් 1 ක් සඳහා වාණිජ හා වෙනත් වර්ග සඳහා (දිග මීටර් 1 ක් සඳහා)	රු. 300.00 රු. 400.00
4.	කුඹුරු ඉඩම් හා පහත් බිම් ගොඩකිරීම	වර්ග මීටර් 250 දක්වා රු.2,000 ක් ද වර්ග මීටර් 250ට වඩා වැඩිවන විට රු. 2,500/-ක් බැගින්	
5.	දුරකථන කුළුණු/ ඇන්ටනා කුළුණු ඉදිකිරීම (ග්‍රාමී හා නාගරික)	රු. 40,000/-	
6.	විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම (ග්‍රාමීය)	රු. මිලියන 5 කට අඩු රු. 2,500.00 ක් සහ වැඩිවන සෑම රුපියල් මිලියන එකකට රු. 50 බැගින්	

අනුකූලතා සහතික නිකුත් කිරීම (ග්‍රාමීය)

ඉඩම් අනුබෙදුම් (ග්‍රාමීය)	i.	පළමු බිම් කොටසකට රු. 500ක් හා ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු. 250.00 බැගින්
නේවාසික ඉදිකිරීම් (ග්‍රාමීය)	ii.	වර්ග මීටර් 300ට අඩු රු. 1,500 ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1ට හෝ කොටසකට රු. 5 බැගින්
වාණිජ හා වෙනත් ඉදිකිරීම් (ග්‍රාමීය)	iii.	වර්ග මීටර් 100ට අඩු 1,500 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට හෝ කොටසකට රු. 10 බැගින්
මායිම් තාප්ප ආරක්ෂක බැමි ඉදිකිරීම (ග්‍රාමීය)	iv.	පළමු දික් මීටර් 100 සඳහා රු. 500 ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1 කට හෝ කොටසකට රු. 5.00 බැගින්
දුරකථන/විදුලි සංදේශ කුළුණු	v.	රු. 5,000 බැගින්
විශේෂ ව්‍යාපෘති (ග්‍රාමීය)	vi.	කුඩා පරිමාණ සඳහා රු. 2,500.00 මධ්‍ය පරිමාණ සඳහා රු. 5,000.00 මහා පරිමාණ රු. 100,00.00

නිසි බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/ කොටස් එකතු කිරීම/ නැවත ඉදිකිරීම (ග්‍රාමීය)

ඉදිකිරීමේ අදියර	*නේවාසික වර්ග මීටර් 01 සඳහා ගාස්තු රු. ශත*	*වාණිජ හා වෙනත් වර්ග මීටර් 01 සඳහා ගාස්තු රු. ශත*
අත්තිවාරම් වැඩ පමණක්	100.00	250.00
වහල මට්ටම දක්වා (වහලය රහිතව)	150.00	500.00
වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	200.00	750.00
සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	250.00	1,000.00
මායිම් තාප්ප ආරක්ෂිත බැමි ඉදිකිරීම	200.00	200.00

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති *(වැ. බ.)*,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

12 - 490/11

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වන වගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත යම් ඉඩමක් වෙන්දේසිකරුවකු, තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන බද්දක් විකුණුම්කරු, තැරැව්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති *(වැ. බ.)*,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

12 - 490/12

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සභාව සතු ක්‍රීඩා භූමි හා සභා ශ්‍රවණාගාරය බදු දීමේ දී ගාස්තු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා භූමි බදු දීමේ දී පහත සඳහන් අනු ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති *(වැ. බ.)*,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

ක්‍රීඩා පිටි වෙන් කිරීම එක් දිනක් සඳහා		රු.ශත
01	ප්‍රා.ස. බල ප්‍රදේශයේ පාසල් සඳහා	නොමිලේ
02	ප්‍රා.ස. බල ප්‍රදේශයේ ක්‍රීඩා සමාජ සඳහා	250.00
03	ප්‍රා.ස. බල ප්‍රදේශයෙන් පිටත ක්‍රීඩා සමාජ සඳහා	500.00
04	පෞද්ගලික ආයතන ක්‍රීඩා උත්සව හෝ වෙනත් කටයුතු සඳහා	2,500.00
05	දේශපාලන රැස්වීම් සඳහා	3,000.00
06	සංදර්ශන, කානිවෙල් සහ වෙනත් කාර්යයන් සඳහා	5000.00

ශ්‍රවණාගාරය වෙන් කිරීම එක් දිනකට (ඇහැළියගොඩ)		
01	ආදායම් උත්පාදන වැඩසටහන් සඳහා	5,000.00
02	අනෙකුත් වැඩසටහන් සඳහා	2,500.00

ශ්‍රවණාගාරය වෙන් කිරීම (දම්මුල්ල)		
01	ආදායම් උත්පාදන වැඩසටහන් සඳහා	1,000.0
02	අනෙකුත් වැඩසටහන් සඳහා	750.00

12 - 490/13

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවට ඇතුලත් වූ ප්‍රදේශයෙහි ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා පහත සඳහන් අනු ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති (වැ. බ.),
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

		වර්ග මීටරයකට හෝ ඊට අඩුවන විට රු. ශත
01	බිත්ති හා තාප්ප උපයෝගී කර ගන්නා ප්‍රචාරක දැන්වීම් සඳහා	500 0
02.	ස්ථිර දැන්වීම් පුවරු සඳහා	750 0
03.	රෙදි මගින් කෙරෙන ප්‍රචාරක දැන්වීම් සඳහා (බැනර් සහ කටවුට්)	250 0
04.	ඩිජිටල් මුද්‍රණ දැන්වීමක් සඳහා	2500 0

12 - 490/14

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ජල බදු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවට ඇතුලත් වූ ප්‍රදේශයෙහි 2023 වර්ෂය සඳහා ජල බදු අය කිරීම් පහත සඳහන් අනු ප්‍රමාණ අනුව විය යුතු යැයි මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති (වැ. බ.),
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

		රු.ශත
01	නිවෙස් සඳහා ස්ථිර බද්ද	100.00
02	ව්‍යාපාරික ස්ථාන සඳහා ස්ථිර බද්ද	300.00
03	මාසික ඒකක 10 දක්වා ඒකකයක් සඳහා (නේවාසික)	25.00
04	මාසික ඒකක 10 ට වැඩි වන විට ඒකකයක් සඳහා (නේවාසික)	35.00
05	මාසික ඒකක 05 දක්වා ඒකකයක් සඳහා (ව්‍යාපාරික)	25.00
06	මාසික ඒකක 05 ට වැඩිවන විට ඒකකයක් සඳහා (ව්‍යාපාරික)	35.00

12 - 490/15

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වාහන කුලියට දීමේ දී ගාස්තු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු වාහන කුළියට දීමේ දී පහත සඳහන් අනුප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

ඩබ්. එල්. රුවන් ලියනගේ,
සභාපති (වැ. බ.),
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

		රු. ශත	
01	ට්‍රැක්ටරය දිනකට	3,600.00	(උපරිම පැය 8 - ඉන්ධන සහිතව)
02	ට්‍රැක්ටරය සහ අඩි 75 ට්ලරය	5,200.00	(උපරිම පැය 8 - ඉන්ධන සහිතව)
03	බැකෝ ලෝඩර (පැයකට)	2,500.00	(උපරිම පැය 8 - ඉන්ධන සහිතව)
04	ජල බවුසරය (ජලය රහිත පැයකට)	1,000.00	(උපරිම පැය 8 - ඉන්ධන සහිතව)
05	ඩ්‍රම්ප්ට්‍රක් ලොරිය (දිනකට)	8,500.00	(උපරිම පැය 8 - ඉන්ධන සහිතව)
06	තණකොල කපන මැෂිම (පැයකට)	335.00	(උපරිම පැය 8 - ඉන්ධන සහිතව)

12 - 490/16

යටියන්තොට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 06 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද වාර්ෂික වරිපනම් බද්ද 2023 මාර්තු 31ට පෙර හෝ සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු මුදල 2023 වර්ෂයේ ජනවාරි 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු මුදලින් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවනු ලැබේ.

එලෙස නියමිත කාලය තුළදී අදාළ බදු මුදල නොගෙවීම මත 15% ක අධි ගාස්තුවක් අය කිරීමටත් කටයුතු කරනු ලැබේ.

කේ. ඩී. වසන්ත,
සභාපති,
යටියන්තොට ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 27 වැනි දින,
යටියන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2011 වර්ෂයේ තක්සේරු වටිනාකම් 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ -

(අ) අංක 106 යටියන්තොට ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වරිපනම් අංක 01 සිට වරිපනම් අංක 251 දක්වා හා එහි අනු අංක සහිත ව මාර්ගයේ වම ද වරිපනම් අංක 02 සිට වරිපනම් අංක 282 දක්වා හා එහි අනු අංක ද සහිතව මාර්ග යේ දකුණින් ද පිහිටි දියුණු කළ ප්‍රදේශයේ සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමෙන් සියයට දාහතරක (14%)ක වරිපනම් බද්දක් ද,

(ආ) අංක 134 කිතුල්ගල උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි දියුණු කළ ප්‍රදේශයේ සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමෙන් සියයට දහයක (10%)ක වරිපනම් බද්දක් ද,

(ඇ) අංක 106 යටියන්තොට, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වරිපනම් අංක 253 සිට 303 දක්වා හා එහි අනු අංක ද සහිතව මාර්ගයේ වම ද, වරිපනම් අංක 284 සිට 336/1 දක්වා හා එහි අනු අංක ද සහිතව මාර්ගයේ දකුණින් ද, අංක 106 ඒ පරැස්සැල්ල, අංක 15 සී පහළ ගරාගොඩ, 115 ඩී ඉහළ ගරාගොඩ හා 106 බී කබුලුමුල්ල යන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි දියුණු කළ ප්‍රදේශයේ සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමෙන් සියයට නවයක (9%)ක වරිපනම් බද්ද ;

2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ 2023 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමට ත්,

ජනවාරි 31ට පෙර අදාළ වර්ෂයේ මුදල සම්පූර්ණ ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් මුදලින් සියයට (10%)ක වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාළ වරිපනම් බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවීමටත්,

නියමිත කාර්තු තුළ දී අදාළ බදු මුදල නොගෙවීම මත 15% ක අධි ගාස්තුවක් අය කිරීමටත් යටියන්තොට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

කාර්තුව	*ගෙවිය යුතු කාලය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2023 ජනවාරි මස 01 සිට මාර්තු මස 31 දක්වා	2023 ජනවාරි මස 31
දෙවන කාර්තුව	2023 අප්‍රේල් මස 01 සිට ජුනි මස 30 දක්වා	2023 අප්‍රේල් මස 30
තුන්වන කාර්තුව	2023 ජූලි මස 01 සිට සැප්තැම්බර් මස 30 දක්වා	2023 ජූලි මස 31
හතරවන කාර්තුව	2023 ඔක්තෝබර් මස 01 සිට දෙසැම්බර් මස 31 දක්වා	2023 ඔක්තෝබර් මස 31

12 - 520/1

යටියන්තොට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 07 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද වාර්ෂික අක්කර බදු මුදල මාර්තු 31ට පෙර හෝ සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බදු මුදල 2023 වර්ෂයේ ජනවාරි 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එක් එක් කාර්තුවට අදාළ අක්කර බදු මුදල ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවනු ලැබේ. එලෙස නියමිත කාර්තු තුළදී අද ාල බදු මුදල නොගෙවීම මත 15% ක අධිගාස්තුවක් අය කිරීමටත් කටයුතු කරනු ලැබේ.

කේ. ඩී. වසන්ත,
සභාපති,
යටියන්තොට ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 27 වැනි දින,
යටියන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූද ස්ථිර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වූ, එක් එක් ඉඩම් හෙක්ටයාරය මත පහත දක්වා ඇති අනුප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක්,

(අ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙහි අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1989.03.10 දිනැති *ගැසට්* පත්‍රයේ අංක IV (ආ) වැනි කොටසේ ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2023 වර්ෂය සඳහා එක් එක් හෙක්ටයාරයක් මත රු. 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමට සහ,

(ආ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ වැඩිවන සෑම හෙක්ටයාරයක්ම මත 2023 වර්ෂය සඳහා රු. 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමටත්,

(ඈ) ජනවාරි 31ට පෙර අදාළ වර්ෂයේ මුදල සම්පූර්ණයෙන්ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු මුදලින් සියයට (10%) වට්ටමක්ද එක් එක් කාර්තුවට අදාළ අක්කර බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවීමටත්,

(ඉ) නියමිත කාර්තු තුළදී අදාළ බදු මුදල නොගෙවීම මත 15% ක අධි ගාස්තුවක් අය කිරීමටත් යටියන්තොට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

කාර්තුව	*ගෙවිය යුතු කාලය*	*5% වට්ටම සඳහා නිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2023 ජනවාරි මස 01 සිට මාර්තු මස 31 දක්වා	2023 ජනවාරි මස 31
දෙවන කාර්තුව	2023 අප්‍රේල් මස 01 සිට ජුනි මස 30 දක්වා	2023 අප්‍රේල් මස 30
තුන්වන කාර්තුව	2023 ජූලි මස 01 සිට සැප්තැම්බර් මස 30 දක්වා	2023 ජූලි මස 31
හතරවන කාර්තුව	2023 ඔක්තෝබර් මස 01 සිට දෙසැම්බර් මස 31 දක්වා	2023 ඔක්තෝබර් මස 31

12 - 520/2

යටියන්තොට ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 08 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් ව්‍යාපාරයක් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2023 වර්ෂයේදී යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත ගාස්තුවක් අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා බලපත්‍ර ලබාදිය යුතු වෙළෙඳ හා ව්‍යාපාරික ස්ථාන සඳහා 2023 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර ආදාළ ගාස්තු ගෙවා බලපත්‍ර ලබාගත යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඩී. වසන්ත,
සභාපති,
යටියන්තොට ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 27 වැනි දින,
යටියන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2019.12.05 දිනැති අංක 2152/58 දරන පළාත් පාලන අති විශෙෂ *ගැසට්* පත්‍රයේ IV වැනි කොටසේ සබරගමු පළාත් ආණ්ඩුකාරතුමන් විසින් ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල, අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත 58, අන්තරාදායක ව්‍යාපාර හෝ කර්මාන්ත 31 සහ අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත 38, වෙනත් ව්‍යාපාර හෝ කර්මාන්ත 15ක් සඳහා යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී අති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට, යටියන්තොට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

	I වැනි තීරුව *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
2.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
3.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
4.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම	500 0	750 0	1,000 0
5.	රබර් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
6.	ඔට්ටපාලු ගබඩාකර තබා ගැනීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
7.	පොල්කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
8.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
9.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
10.	අලුත් ලෝහ හෝ පරණ ලෝහ මිලට ගැනීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
11.	ලෝහ සුන්බුන් හා අබලි ද්‍රව්‍ය මිළට ගැනීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
12.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ඔපදැමීම	500 0	750 0	1,000 0
13.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
14.	පොල් ලෙලි පෙඟවීම (පල් කිරීම)	500 0	750 0	1,000 0
15.	වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
17.	යන්ත්‍රානුසාරයෙන් දූව ඉරීම	500 0	750 0	1,000 0
18.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
19.	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
20.	සම්භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
21.	රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ නැවත ඇසිරීම	500 0	750 0	1,000 0
22.	ගෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
23.	පොටි නිපදවීම	500 0	750 0	1,000 0
24.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
25.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
26.	ලීයන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
27.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
28.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
29.	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
30.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
31.	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
32.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
33.	ටයර්, ටියුබ් වොල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
34.	සිමෙන්ති ගඩබා කිරීම, අස්බැස්ටස් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
35.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
36.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
37.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
38.	ගඩොල් පිළිස්සීම හා විකිණීම	500 0	750 0	1,000 0
39.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
40.	උළු නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
41.	භාවිතයට ගත් ගෝනි, බැරල් හා භාජන පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
42.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
43.	කුරුඳු, කරඳ මුංගු වේලා සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
44.	ගම්වර්ග නිපදවීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
45.	විෂබීජනාශක වර්ග නිෂ්පාදනය හෝ විකිණීම	500 0	750 0	1,000 0
46.	බැටරි පිරවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථායක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	පරණ බෝතල් එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	අවමංගල සේවාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	ගෘහ භාණ්ඩ නිපදවීම හා ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව, කටුවන ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘතියේ ජල ගාස්තු පහත සඳහන් ආකාරයට අය කිරීමට කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය".

උපලේඛනය

ගෘහස්ථ/රාජ්‍ය ආයතන

ඒකක		*ගාස්තුව රු. ශත*
1 - 10	-	20 0
11 - 15	-	30 0
16 - 20	-	40 0
21 - 25	-	60 0
26 - 30	-	80 0
31 - 40	-	100 0
41 - 50	-	150 0
51 ට වැඩි	-	200 0

ව්‍යාපාර/බැංකු	
ඒකක	ගාස්තුව *රු.ශත*
01-25	100 0
26-50	200 0

පාසල්/අධ්‍යාපනික ආයතන/ආගමික	*රු.ශත*
ඒකකයක්	20 0

ස්ථාවර ගාස්තු අය කිරීම:

ජල සැපයුම් ස්වභාවය	*ඒකක*	*ස්ථාවර ගාස්තුව (රුපියල්)*
ගෘහස්ථ	01-25	200 0
	26-50	300 0
	51-වැඩි	500 0
ව්‍යාපාර/බැංකු	01-25	300 0
	26-50	500 0
	51 - වැඩි	1000 0

ජල සැපයුම් ස්වභාවය	*ඒකක*	*ස්ථාවර ගාස්තුව (රුපියල්)*
ආගමික/පාසල්/රාජ්‍ය	01-25	200 0
	26-50	300 0
	51-වැඩි	500 0
ඉදිකිරීම්	ජල ඒකකයක් රු. 300 0	500 0

	රු. ශත
සන්ධි විසන්ධි කිරීමේ ගාස්තු	3,000 0
අයථා ජල පරිහරණ ගාස්තු	20,000 0
නව ජල තැන්පත්	5,000 0
නම වෙනස් කිරීම	1,000 0
නව ජල අයදුම්පත් ගාස්තු	100 0

නව ජල සම්බන්ධතා ගාස්තු තාක්ෂණ නිලධාරි ඇස්තමේන්තු මුදල + 25% දෙපාර්තමේන්තු ගාස්තු + සේවා හා නඩත්තු ගාස්තු

කටුවන ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සභාව සතු යන්ත්‍රෝපකරණ කුළියට දීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළ සභාව සතු යන්ත්‍රෝපකරණ කුළියට දීම 2022 ඔක්තෝබර් මස 20 වැනි දින පැවති මහා සභා තීරණ අංක 05-17-xiii යටතේ ලද යෝජනාව සභා සම්මත කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 20 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, කටුවන ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍රෝපකරණ කුලියට දීම 2023 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අය කිරීමට කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

අනු. අංකය	*වාහනය/යන්ත්‍රය*	*පැය/දින/ගමන් වාරයක්*	*ඉන්ධන (සහිත/රහිත)*	*ගාස්තුව (රු.)*
01.	JCB යන්ත්‍රය	මීටර් පැය 01	ඉන්ධන සහිතව	7,000 0
02.	මෝටර් ග්‍රේඩරය	මීටර් පැය 01	ඉන්ධන සහිතව	10,000 0
03.	රෝලර් යන්ත්‍රය	මීටර් පැය 01	ඉන්ධන රහිතව	4,500 0
04.	කොන්ක්‍රීට් කපන යන්ත්‍රය	දිනකට (පැය 08)	ඉන්ධන රහිතව, ක්‍රියාකරු සමඟ	9,000 0
05.	ටිපර් රථය (කියුබ් 2.7)	දිනකට (100km ක් තුළ)	ඉන්ධන සහිතව	30,000 0
		ගමන් වාරයකට (25km දක්වා)	ඉන්ධන සහිතව	10,000 0
06.	ටිපර් රථය (කියුබ් 1.5)	දිනකට (100km තුළ)	ඉන්ධන සහිතව	25,000 0
		ගමන් වාරයකට 25km දක්වා)	ඉන්ධන සහිතව	8,500 0
07.	ට්‍රැක්ටරය	දිනකට (පැය 08)	ඉන්ධන සහිතව	12,000 0
08.	ට්‍රැක්ටර් ජල බවුසරය (ගෘහස්ථ 3000 l)	එක් ගමන් වාරයකට (බල ප්‍රදේශය තුළ 25km දක්වා)	ඉන්ධන සහිතව	1,800 0
09.	ට්‍රැක්ටර් ජල බවුසරය (වාණිජ 3000 l)	දිනකට (10 km සීමාව තුළ)	ඉන්ධන සහිතව	3,500 0
10.	ට්‍රැක්ටර් ජල බවුසරය (ගෘහස්ථ 4000 l)	එක් ගමන් වාරයකට (බල ප්‍රදේශය තුළ 25km දක්වා)	ඉන්ධන සහිතව	2,000 0
11.	ට්‍රැක්ටර් ජල බවුසරය (වාණිජ 4000 l)	දිනකට (10km සීමාව තුළ))	ඉන්ධන සහිතව	4,500 0
12.	ලොරි ජල බවුසරය (4000 l - නිල් පැහැති)	එක් ගමන් වාරයකට (බල ප්‍රදේශය තුළ 25km දක්වා)	ඉන්ධන සහිතව	5,000 0
13.	ලොරි සුදු යකඩ ජල බවුසරය 6000 l - සුදු පැහැති) PTV පහසුකම් සහිත	එක් ගමන් වාරයකට (බල ප්‍රදේශය තුළ 25km දක්වා)	ඉන්ධන සහිතව	7,000 0
14.	ලොරි ජල බවුසරය (13,000 l - සුදු පැහැති දිග)	එක් ගමන් වාරයකට (බල ප්‍රදේශය තුළ 25km දක්වා)	ඉන්ධන සහිතව	12,000 0

මීට අමතරව පරිපාලන පහසුව සඳහා යන්ත්‍රෝපකරණ කුලී පදනම මත ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු පහත කොන්දේසි ද සංශෝධනය සඳහා ඉදිරිපත් කරමි.

1. දිනක් වශයෙන් සලකනු ලබන්නේ යන්ත්‍ර පැය 08 ක කාලයක් වේ. ට්‍රැක්ටරය සඳහා එය යන්ත්‍ර පැය 06 කි.
2. කුලී පදනම මත ලබා ගන්නා යන්ත්‍රෝපකරණ යන්ත්‍රයේ දෝෂයක්, ක්‍රියාකරුගේ දෝෂයක් නොමැතිව වැඩ නොකර රඳවා තබා ගන්නා සෑම දිනක් සඳහා ම යන්ත්‍රය සඳහා අයකරනු ලබන යන්ත්‍ර පැය 04 සඳහා අමතරව මුදල් ගෙවිය යුතු වේ.
3. ඉන්ධන සහිතව ලබා දෙනු ලබන යන්ත්‍ර ඉන්ධන රහිතව ලාබ දීමේ දී ලබාදුන් ඉන්ධන ප්‍රමාණයේ වටිනාකම මුළු ගාස්තු මුදලින් අඩු කරනු ලැබේ.
4. ටිපර් රථ හා ජල බවුසර් රථ සඳහා නියමිත ප්‍රමාණයට වඩා වැඩිවන සෑම 1km සඳහා රු. 300.00 අමතර මුදලක් ගෙවිය යුතුය.
5. ට්‍රැක්ටර් රථ හා ට්‍රැක්ටර් බවුසර් සඳහා නියමිත වැය ප්‍රමාණයන් ඉක්මවන සෑම 1km සඳහා සෑම පැයක් සඳහාම,රු. 125.00 ක අමතර මුදලක් ගෙවිය යුතුය.
6. ජල බවුසර් රඳවා තබා ගන්නේ නම් දිනකට රු. 1000.00 ක අමතර ගාස්තුවක් ගෙවිය යුතුය.
7. ජල බවුසරය ලබා ගැනීමේ දී බල ප්‍රදේශයෙන් පිටත කාර්යයන් හා අවශ්‍යතා සඳහා ලබා ගන්නා විට දී අදාළ ගාස්තුවලට අමතරව සම්පූර්ණ ගාස්තුවට 10% ක අමතර ගාස්තුවක් අයකරනු ලැබේ.

12-528/13

කටුවන ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ආදාහනාගාර පාවිච්චි කිරීම සඳහා ගාස්තු පැනවීම

කටුවන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළ ආදාහනාගාර පාවිච්චි කිරීම සඳහා ගාස්තු පැනවීමට 2022 ඔක්තෝබර් මස 20 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 05-17-xiv යටතේ ලද යෝජනාව සභා සම්මත කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 20 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

අංක 1811 හා 2013 මැයි 17 දින දකුණු පළාත් සම්මත අතුරු ව්‍යවස්ථාව මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව, 2023 වර්ෂයට කටුවන ප්‍රාදේශීය සභාව සතු ආදාහනාගාරය වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු පනවා අයකිරීමට කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

1. කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවකුගේ දේහය ආදාහනය කිරීම	රු. 15,000 0
2. කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවකුගේ දේහය ආදාහනය කිරීම	රු. 17,000 0

12 - 528/14

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එස්. එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2020 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට පහක (5%) වරිපනමක් 2023 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, සහ

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.''.

12-466/1

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එස්. එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනව

ාව''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල අනුව බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර එකක් මත 2023 වර්ෂය සඳහා රු. 2.50 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු බවටත් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

12-466/2

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ජලය සැපයීම වෙනුවෙන් ගාස්තු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එස්. එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදා 1988 අගෝස්තු මස 23 දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 34 දරන ජල සම්පාදන අතුරු ව්‍යවස්ථාව, එක් පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, මෙම බල ප්‍රදේශයේ ඇතුළත එක් ජලසම්පාදන අතුරු ව්‍යවස්ථාව අනුව පහත සඳහන් උපලේඛනයේ සඳහන් ගාස්තු 2023 වර්ෂයට පනවා අය කිරීමටත් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.''.

උපලේඛනය

අනු. අංකය	*ඒකක ගණන*	*මුදල රු. ශත*
01	ස්ථාවර ගාස්තු	160.00
02	1-10 (ජල ඒකක)	20.00
03	11-20 (ජල ඒකක)	25.00
04	21-25 (ජල ඒකක)	30.00
05	26-30 (ජල ඒකක)	35.00
06	30 වැඩි සෑම ඒකකයක් සඳහාම	50.00
07	ඉල්ලුම්පත්‍ර ගාස්තු	250.00
08	සේවා සැපයුම් ගාස්තු - (ඇස්තමේන්තුව අනුව තීරණය කරමි)	22000.00
09	නැවත නම් වෙනස් කර ගිවිසුම් අත්සන් කිරීම සඳහා	1000.00
10	ජල සැපයුම විසන්ධි කර නැවත සන්ධි කිරීමේ ගාස්තු	2000.00

12-466/3

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර පිළිබඳ ගාස්තු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එස්. එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය තුල දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ වන අවස්ථාවක, ඉහත 2 වන කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළෙහි හෝ 2023 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතු බවට බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යයන්*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750/= නොඉක්මවන අවස්ථාවක *රු. ශත*	*රු. 751/= ඉක්මවන එහෙත් රු.1500/= නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1501/= ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
01	බේකරියක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
02	තේ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
03	බත් කඩ හෝ ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
04	ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
05	සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
06	හෝටලයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
07	කිරි පට්ටියක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
08	කිරි වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
09	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
10	මිරිදිය මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
11	කරදිය මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
12	ගව මස් හෝ වෙනත් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
13	ගෝඝාතක මඩුවක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
14	සිසිල් බීම වෙළෙඳසලක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
15	රස කැවිලි නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
16	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
17	ශීත කළ මස් හෝ මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යයන්*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750/= නොඉක්මවන අවස්ථාවක *රු. ශත*	*රු. 751/= ඉක්මවන එහෙත් රු.1500/= නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1501/= ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
18	පැණි නිෂ්පාදන කරන හෝ ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
19	පලතුරු බීම හා ජෑම් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
20	සංචාරක වෙළඳසලක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
21	ගව ගාලක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
22	ලොන්ඩරියක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00

12-466/4

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 05 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එස්. එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.''

උපලේඛනය

	I වැනි තීරුව *බද්ද අදාල වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*		*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
1.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	.....	නැත
2.	රු. 6,000 ඉක්මවන වන නමුත් රු. 12,000 නොඉක්මවන විට	.....	90.00
3.	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	.....	180.00
4.	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	.....	360.00
5.	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	.....	1,200.00
6.	රු. 1,50,000 ඉක්මවන විට	.....	3,000.00

12-466/5

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීමේ ගාස්තු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 06 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එස්. එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.''.

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තය*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750/= නොඉක්මවන අවස්ථාවක	*රු. 750/= ඉක්මවන එහෙත් රු.1500/= නොඉක්මවන අවස්ථාවක*	*රු. 1500/= ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
02	ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
03	ශබ්දවාහිනී යන්ත්‍ර කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
04	විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
05	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම මැෂින් 01 සිට 05 දක්වා	500.00	750.00	1000.00
06	රූපවාහිනී යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
07	පිඟන් භාණ්ඩ, ඇලුමිනියම් භාණ්ඩ, ප්ලාස්ටික් භාණ්ඩ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
08	පාවහන් නිෂ්පාදන කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගන යාම සඳහා	500.00	750.00	1000.00
09	මිනී පෙට්ටි නිෂ්පාදනය කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
10	ගඩොල් හෝ උළු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
11	කම්හලක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
12	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
13	තේ කුඩු පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
14	පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් හෝ පාපැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වානෙ යාම	500.00	750.00	1000.00
15	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
16	සෙලියුලර් දුරකථන අලුත්වැඩියා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
17	පිංතූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
18	ටෙලෙක්ස්/ දුරකථන පණිවිඩ සේවාවන් සපයන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
19	කොන්ක්‍රීට් වැඩපළක් හා සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදන වැඩපළක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
20	වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් හෝ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
21	පරිගණක අලුත්වැඩියා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
22	විකිණීම සඳහා සුරතල් මසුන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
23	මැණික් කැපීමේ හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
24	පැළ තවාන් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
25	බිම්මල් වගා කිරීම හෝ අලෙවිකරණ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තය*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750/= නොඉක්මවන අවස්ථාවක *රු. ශත*	*රු. 750/= ඉක්මවන එහෙත් රු.1500/= නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1500/= ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
26	රත්තරං බඩු ඔප දැමීමේ හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
27	ගෘහ භාණ්ඩ විකිණීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
28	ටයර් හෝ ට්‍යුබ් වෝල්කනයිස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
29	රෙදි හා රෙදිපිළි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
30	සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
31	දුව විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
32	දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
33	දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
34	කොහු, ඉදල්, පාපිසි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
35	ලාක්ෂා කර්මාන්තයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
36	මෝටර් රථ වාහන වල විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
37	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
38	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
39	පොත්පත් හා ලිපි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
40	රූපලාවන්‍ය ස්ථානයක් හෝ මනමාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
41	භාණ්ඩ හෝ ද්‍රව්‍ය ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00

12-466/6

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එස්. එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ එකී පනතේ 148 වගන්තිය සඳහන් 4 වන උපලේඛනයේ විධිවිධාන වලින් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛණයේ 1 වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම එහි 11 වන තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.''

උපලේඛනය

	1 වැනි තීරුව	*11 වැනි තීරුව*
අනු අංකය		*ගෙවිය යුතු බද්ද රු.ශත*
01(I)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25.00
(II)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
	(අ) වෙළෙඳ කාර්ය සඳහා යොදවනවානම්	18.00
	(ආ) වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවනවානම්	4.00
(III)	සෑම කරත්තයක් සඳහා	20.00
(IV)	සෑම අත් කරත්තයක් සඳහා	10.00
(V)	සෑම රික්ෂෝවක් සඳහා	7.50
(VI)	සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15.00
(VII)	සෑම ඇතෙකු සඳහා	50.00
02	විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.	

12-466/7

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් සේවා සැපයීම වෙනුවෙන් ගාස්තු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එස්. එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් පිළිගන්නා ලද අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් අනපනත්වලින් මෙම සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර 2023 වර්ෂය සඳහා බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් පහත උපලේඛනයේ සඳහන් සහතික පත්‍ර දීමේදී හා අයදුම්පත්‍ර නිකුත් කිරීමේදී හා සේවා පහසුකම් සැපයීමේ දී 2023 වර්ෂයට පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අයකිරීම සඳහා සභාවට යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු අංකය	විස්තරය	රු. ශත
01	විථිරේඛා සහ නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ දී අයකරන ගාස්තුව	2,000.00
02	සභාවෙන් අවසර ලබා දී ඇති මාළු ලෑලි සඳහා මසකට	12,000.00
03	තක්සේරු බදු ලේඛනයේ අයිතිවාසිකම් ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කරන ඔප්පු සංක්ෂිප්ත විස්තරය ඇතුළත් අයදුම්පත්‍ර ගාස්තුව	300.00
04	සංවර්ධන කාර්යය සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ දී අය කරනු ලබන ගාස්තුව	600.00
05	ඉඩමක් අනු කොටස්වලට බෙදීමේ දී ඒ සඳහා වූ අයදුම්පත්‍ර ගාස්තු	500.00
06	ව්‍යාපාර කටයුතු සඳහා බඩල්කුඹුර ක්‍රීඩා පිටිය බදු දීමේ දී දිනකට අයකරන ගාස්තුව	5,000.00
07	ක්‍රීඩා කටයුතු සඳහා බඩල්කුඹුර ක්‍රීඩා පිටිය බදු දීමේ දී දිනකට අයකරන ගාස්තුව	5,000.00
08	බඩල්කුඹුර නගරයේ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා 15''X30'' භූමි කොටසක් බදු දීමේදී දිනකට අය කරන ගාස්තුව	4,000.00
09	බඩල්කුඹුර නගරයෙන් පිටත අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා 15''X30'' භූමි කොටසක් බදු දීමේදී දිනකට අය කරන ගාස්තුව	2,000.00
10	බඩල්කුඹුර ප්‍රාදේශීය සභා ක්‍රීඩා පිටිය ක්‍රීඩාගාරය සමග ලබා දීම එක් දිනක් (ක්‍රීඩාගාරය සඳහා අදළ විදුලි ගාස්තු ගෙවීම)	7,000.00
11	ගැල්වනයිස් බටයක් ලබා දීම සඳහා (පුණ්‍ය ස්ථාන හැර)	20.00
12	එක් ජල බවුසර ලබා දීම වරිපනම් (සීමාව තුළ)	1,500.00
13	එක් ජල බවුසරයක් වරිපනම් බදු අයකරන සීමාවෙන් පිටත ලබා දීම - ධාවන වන කි.මී. 01 ට (යාමට සහ ඒමට යන දුර ගණනය කරනු ලැබේ)	1,500.00 300.00
14	ජල බවුසරයක් රඳවා ගැනීමේ ගාස්තු එක් දිනක් සඳහා වරිපනම් බදු සීමාව - වරිපනම් බදු සීමාවෙන් පිටත	1,000.00 1,000.00
15	කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය ලබා දීම. (ක්‍රියාකරු සමග/ ඉන්ධන නොමැතිව) දිනකට	3,500.00
16	ට්‍රැක්ටර් රථය 0-5 (ගමන් කරන පළමු කි.මී. 05 සඳහා එක් කිලෝ මීටරයකට ගාස්තුව (මෙයින් දෙපසට ගමන් කරන දුර ගණනය කරනු ලැබේ) සෑම කි.මී. 01 කට රු. 500.00 මුදලක් අය කිරීම (500x5) කිලෝ මීටර් 05 ට වැඩි (එක් කි.මී. සඳහා)	 2,500.00 1,000.00
17	දීර්ඝකාලීනව රථ වාහන බදු දීමේ දී මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ තීරණය මත හා සභා තීරණය මත මිල ගණන් වෙනස් කළ හැකි වේ.	
18	වයිබ්‍රේටින් රෝලර් (ඉන්ධන සහිතව) පැයකට	5,000.00
19	ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව වෙන් කිරීම (දිනකට)	10,000.00
20	වැලි කියුබ් 01ක් ප්‍රවාහනය සඳහා	100.00
21	කොට ලොරියක් ප්‍රවාහනය සඳහා	5,000.00

අනු අංකය	විස්තරය	රු. ශත
22	කටුගහගල්ගේ වැව ආශ්‍රිතව -	
	* උද්‍යානය සඳහා ඇතුලත් වීමේ ගාස්තු (වැඩිහිටි/ළමා)	20.00
	* අවුරුදු 05ට අඩු ළමයින් සඳහා අය කිරීමක් නොමැත	-
	* හංස බෝට්ටුව දෙදෙනකු සඳහා විනාඩි 20 කට	500.00
	* මංගල අවස්ථාවක දී ඡායා රූප ගැනීම සඳහා	5,000.00
	* මංගල අවස්ථාවක දී බෝට්ටු සවාරියක් සඳහා ඡායා රූප ගැනීම සඳහා	10,000.00
	* හංස බෝට්ටුව සඳහා විදේශිකයින් 01 (එක) පුද්ගලයකු සඳහා	1,000.00
	* විදේශිකයින් 01 (එක) පුද්ගලයකු වැවට ඇතුල්වීම සඳහා	500.00
	* දිවා/ රාත්‍රී පවත්වන විවිධ උත්සව සඳහා (එක් උත්සවයක් වෙනුවෙන්)	15,000.00
23	වරිපනම් නාම සංශෝධන ගාස්තු	500.00
24	බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය සඳහා සේවා ගාස්තු (එක් වරකට)	20.00
25	කටුගහගල්ගේ වැවේ වැසිකිළි සඳහා සේවා ගාස්තු (එක් වරකට)	20.00
26	රබර්, ගම්මිරිස් තොග වෙළෙඳුන්ගෙන් කිලෝ 01ක් සඳහා (ශත 50)	0.50
27	ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් සඳහා අයදුම්පත්‍ර ගාස්තු	1,000.00
	පෙර පාසල් මාසික ගාස්තු	300.00
28	වරිපනම් ලේඛණයේ උධෘත ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තු	500.00
29	ගෝ ඝාතක ආඥාපනත යටතේ ආගමික උත්සව හා වෙනත් උත්සවයක් සඳහා ගවයෙකු ඝාතනය කිරීමේ තාවකාලික බලපත්‍ර ගාස්තු	2,000.00
30	ගවමස් ප්‍රවාහනය කිරීමේ තාවකාලික බලපත්‍ර ගාස්තු	10,000.00
31	පරිසර ආරක්ෂණ බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තු	200.00
	පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	100.00
	වසර 03 ක වලංගු කාලය සඳහා පරිසර ආරකෂණ බලපත්‍ර ගාස්තු	4,500.00
	පරීක්ෂණ ගාස්තු - අදළ කර්මාන්තයේ හෝ ව්‍යාපෘතියේ මූලික ප්‍රාග්ධන ආයෝජනය පදනම් කොට ගෙන නිශ්චය කරනු ලැබේ.	3,000.00
	<u>ආයෝජනය</u> <u>පරීක්ෂා කිරීමේ ගාස්තු</u>	
	10,00,000 8,000.00	
	500,001 - 1,000,000 4,000.00	
	250,001 - 500000 3,000.00	
	100,000 - 250,000 750.00	
	100,000 ට අඩු 400.00	
32	පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු	2.00
	පුස්තකාල සාමාජික ගාස්තු	100.00
	පුස්තකාල ප්‍රමාද දඩ (එක පොතක් සඳහා දිනකට)	5.00
	නැති වුන පොත් සඳහා අය කිරීම -	
	* පොතේ මිල	
	* 30% දෙපාර්තමේන්තු ගාස්තු	
	* ප්‍රමාද ගාස්තු	
	* රෙජිස්ට්‍රාර් ගාස්තු	

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දීමට අදාල ගාස්තු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 09 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එස්.එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ ඌව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදු 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/32 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 යටතේ බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව පිළිගෙන 2014 අගෝස්තු මස 01 වැනි දින අංක 1874 දරන පළාත් සභා *ගැසට් පත්‍රයේ* දැන්වීමක් පළ කර ඇත. ඉහත සඳහන් දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා අනුව බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් සඳහා පහත සඳහන් උපලේඛනයේ ගාස්තු 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

උපලේඛනයේ II වන කොටස

අවසර පත්‍රය සඳහා අයකරන ගාස්තු පැනවීම.

අනු අංකය	*ප්‍රචාරක දැන්වීම් විස්තරය*	*2023 වර්ෂයේ අවසර පත්‍රය සඳහා අයකරන ගාස්තු*		
		දින 01 සිට දින 15 දක්වා රු.ශත	*දින 15 සිට දින 30 දක්වා රු.ශත*	*මාසයක කාලයකට වැඩි හෝ වර්ෂයක කාලයක් සඳහා රු.ශත*
01	බිත්තියක හෝ තාප්පයක ප්‍රදර්ශනය කරන එක් හතරැස් අඩියකට (චිත්‍රපටි පෙන්වීම සම්බන්ධ දැන්වීම නොවන)	20.00	40.00	50.00
02	පුවරුවක ප්‍රදර්ශනය කරන දැන්වීමක් සඳහා	50.00	75.00	150.00
03	යම් තැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවිකොට ඇති දැන්වීමක් සඳහා වර්ග අඩියකට (වෙළෙඳ ව්‍යාපාර සඳහා භාවිතා කරන වාහන සඳහා අදළ නොවේ.)	15.00	30.00	50.00
04	චිත්‍රපට පෙන්වීම සම්බන්ධ එක් ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට	10.00	15.00	20.00
05	ප්‍රචාරක බැනරයක් සඳහා වර්ග අඩියකට	30.00	50.00	75.00
06	දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කරන විද්‍යුත් ප්‍රචාරක එම පුවරුවක් සඳහා වර්ග අඩියකට	50.00	100.00	250.00

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කසළ ඉවත් කිරීම පිළිබඳ ගාස්තු පැනවීමේ යෝජනාව

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එස්. එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (අනු ප්‍රාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ඌව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් සාදු අංක 1816/43 හා 2013 ජුනි 28 වැනි දින *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කසලශෝධන අතුරු ව්‍යවස්ථා 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වෙනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගෙන අංක 1901/15 හා 2015 පෙබරවාරි මස 11 වැනි දින *අති විශෙෂ ගැසට්* පත්‍රයේ IV (ආ) වැනි කොටස දැන්වීමක් පළ කර ඇත. කසල ශෝධන අතුරු ව්‍යවස්ථාවේ 1 වැනි උපවග න්තියේ මෙම අතුරු ව්‍යවස්ථාව බලපැවැත්වෙන බල ප්‍රදේශය වශයෙන්,

(1) බඩල්කුඹුර ග්‍රාම නිලධාරී වසම

ලෙසටත් පහත සඳහන් 2 වෙනි උපලේඛනයේ සඳහන් ගාස්තු අය කිරීමට බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

2 වන උපලේඛනය

කසල ඉවත් කිරීම සඳහා වූ ගාස්තු	ගාස්තු රු.ශත
වරිපනම් බදු අය නොකරන නිවාස හෝ කාර්යාල අයත් අයගෙන් හෝ එම දේපළවල පදිංචි අයගෙන් කාර්තුවට අයකරන	5,000.00
වරිපනම් බදු අය නොකරන ව්‍යාපාර දේපල හිමි අයගෙන් හෝ එම දේපලෙ හි ව්‍යාපාර කටයුතු කරන අයගෙන් කාර්තුවට අයකරන කසල ගාස්තු	10,000.00

12-466/10

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා පීඩාකාරී හා අන්තරායක ව්‍යාපාර සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එස්.එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

1952 අංක 06 දරන පාළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ඌව පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදා 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති පීඩාකාරී හා අන්තරායක වෙළඳාම පිළිබඳව අතුරු ව්‍යවස්ථා බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන 2015.02.11 වැනි දින අංක 1901/15 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති දැන්වීම හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 වැනි වගන්තිය සමග කිවයුතු පනතේ 147 වැනි වගන්තිය යටතේ බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් පහත අංක 01 උපලේඛනයේ පීඩාකාරී කර්මාන්ත හා අංක 02 උපලේඛනයේ අන්තරායක කර්මාන්ත සඳහා එම උපලේඛනවල සඳහන් බලපත්‍ර ගාස්තුවක් අයකළ යුතු බව බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

උපලේඛන අංක 01

	1 වැනි තීරුව	*11 වැනි තීරුව*		
අනු අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750/- නොඉක්මවන අවස්ථාවක *රු.ශත*	*රු. 750/-ඉක්මවන එහෙත් රු.1500/- නොඉක්මවන අවස්ථාවක* *රු.ශත*	*රු. 1500/- ඉක්මවන අවස්ථාවක* *රු.ශත*
01	කුකුළන් 50ට වැඩි කුකුළු ගොවිපළක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
02	ඌරන් 05 ට වැඩි ගොවිපළක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
03	යෝගට් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
04	ආහාර පිණිස කිරි මිදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
05	අයිස්ක්‍රීම් හෝ බීම පැකට් නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00

	1 වැනි තීරුව	11 වැනි තීරුව		
අනු අංකය	බලය දෙනු ලබන කාර්යය	පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750/- නොඉක්මවන අවස්ථාවක රු.ශත	රු. 750/-ඉක්මවන එහෙත් රු.1500/- නොඉක්මවන අවස්ථාවක රු.ශත	රු. 1500/- ඉක්මවන අවස්ථාවක රු.ශත
06	ගව කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
07	ධාන්‍ය හෝ මාංශ භෝග තොග හොන්ඩර් 02ට වඩා වැඩි ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
08	සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
09	යන්ත්‍රානුසාරයෙන් මිරිස්, කුළුබඩු, ධාන්‍ය වර්ග ඇඹරුම්හලක් හෝ ඇසුරුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	600.00	1000.00
10	අබලි යකඩ හා අබලි ද්‍රව්‍ය ගබඩා කර ලබා ගැනීම හා එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා	500.00	750.00	1000.00
11	පාවහන් නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
12	පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
13	සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
14	සිල්ලර බඩු හා තොග බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500.00	750.00	1000.00
15	තොග වශයෙන් ධාන්‍ය හා එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.	500.00	750.00	1000.00
16	එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
17	පලතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
18	බුලත් පුවක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
19	රබර් ෂීට් නිෂ්පාදනය හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00

උපලේඛන අංක 02

	1 වැනි තීරුව	*11 වැනි තීරුව*		
අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750/- නොඉක්මවන අවස්ථාවක *රු. ශත*	*රු. 750/-ඉක්මවන එහෙත් රු.1500/- නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1500/- ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
01	යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන වඩුමඩුවක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
02	යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන වඩුමඩුවක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
03	ගඩොල් හෝ වලන් පෝරණුවක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
04	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
05	ලෝහ පෑස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
06	විසිරි පින්තාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
07	වායු සම්කරණ හෝ ශීතකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
08	විදුලි බලය භාවිතා නොකරන වී මෝල්ක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
09	විදුලි බලයෙන් ක්‍රියා කරන වී මෝල්ක් පවත්වාගෙන යාම සඳහා	500.00	600.00	1000.00
10	යන්ත්‍රෝපකරණ මගින් ක්‍රියාත්මක කරන උක් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
11	වෙනත් ක්‍රම මගින් ක්‍රියාත්මක කරන උක් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
12	රටකජු පොතු ඉවත් කිරීමේ මෝල්ක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
13	මෝටර් වාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
14	කෝපි හෝ ධාන්‍ය මාංශ භෝග, කුළුබඩු ඇඹරීම හෝ ඇසුරුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
15	මෝටර් වාහන ඇළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
16	විද්‍යුත් ලෝහ ආලේපිත ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
17	ඇළුමිණියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
18	රසායනික පොහොර විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
19	කෘෂි රසායනික ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
20	විදුලි බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
21	අත් යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	350.00	550.00	800.00
22	ශිල්පීය ක්‍රම යොදා ගනිමින් (අත් යන්ත්‍ර භාවිතා නොකරන) කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	700.00	1000.00

අනු. අංකය	1 වැනි තීරුව	11 වැනි තීරුව		
	බලය දෙනු ලබන කාර්යය	පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750/- නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 750/-ඉක්මවන එහෙත් රු.1500/- නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 1500/- ඉක්මවන අවස්ථාවක රු. ශත
23	කාර්මික කැනීම් සහිත කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
24	ගෑස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
25	කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
26	බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
27	යන්ත්‍රෝපකරණ මගින් ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම සඳහා	500.00	750.00	1000.00
28	ඉන්ජෙක්ටර් පොම්ප අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා	500.00	750.00	1000.00
29	මෝටර් සයිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් සඳහා	500.00	750.00	1000.00
30	පාපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් සඳහා	500.00	750.00	1000.00

12-466/11

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අල්ලන ලද අයාලේ යන ගවයින් නිදහස් කිරීමේ ගාස්තු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 12 යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එස්.එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් මාර්ගයක හෝ මාර්ගයට යා හැකි වන පරිදි බැඳ දිගේලි කර හෝ නිදුල්ලේ යාමට සලස්වා ඇති ගවයකු, මී ගවයකු, එළුවකු හෝ වෙනත් සතෙකු නිසා මාර්ගයේ අනතුරු සිදු වීමට ඉඩ ඇත. එබැවින් ඉහත කී ස්ථානවල බැඳ දිගේලි කර හෝ නිදුල්ලේ යාමට සලස්වා ඇති සතුන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 66 (2) වගන්තිය ප්‍රකාර අල්ලා ගාල් කිරීමටත් එවැනි අල්ලා ගත් සතුන් නිදහස් කිරීමේ දී පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අය කිරීමට බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

අනු අංකය	1 වැනි තීරුව	11 වැනි තීරුව
	විස්තරය	ගෙවිය යුතු බද්ද රු. ශත
01	ලොකු ගවයෙකු, මී ගවයකු අල්ලා නිදහස් කිරීමේ දී අය කරන ගාස්තුව	3000.00
02	කුඩා ගවයෙකු හෝ කුඩා මී ගවයෙකු අල්ලා නිදහස් කිරීමේදී අයකරන ගාස්තුව	1500.00
03	එළුවෙකු අල්ලා නිදහස් කිරීමේ ගාස්තුව	1500.00
04	ගවයෙකු, මී ගවයෙකු, එළුවෙකු, කුඩා ගවයෙකු, කුඩා මී ගවයෙකු, ගාලෙහි එක් දිනක් රඳවා ගැනීමේ ගාස්තුව	2000.00

12 - 466/12

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සතිපොළ බදු අය කිරීමේ යෝජනාව

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 13 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එස්.එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් උගව පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදු 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති පොදු හෝ පෞද්ගලික වෙළෙඳපොළවල් අතුරු ව්‍යවස්ථා බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන 2015.02.11 වැනි දින අංක 1901/15 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති දැන්වීම හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 119 වැනි වගන්ති ප්‍රකාරව බඩල්කුඹුර සතිපොළ බදු අය කිරීමේ ගාස්තු උපලේඛනයේ සඳහන් පරිදි අය කිරීමට සුදුසු බව බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

අනු අංකය	*වෙළඳ ස්වභාවය*	*බිම් වර්ග අඩි 1 සිට 25 දක්වා හෝ වෙළඳ ස්වභාවය මත ගාස්තු* *රු.ශත*	*බිම් වර්ග අඩි 25 සිට 50 දක්වා හෝ වෙළඳ ස්වභවය මත ගාස්තු* *රු.ශත*	*බිම් වර්ග අඩි 50 සිට අඩි 100 දක්වා හෝ වෙළඳ ස්වභාවය මත ගාස්තු* *රු.ශත*
1	සිල්ලර මාළු වෙළෙඳුන්ගෙන්	735.00	1050.00	1365.00
2	තොග මාළු වෙළෙඳුන්ගෙන්	525.00	735.00	1500.00
3	කුළුබඩු තොග සහ සිල්ලර	315.00	420.00	630.00
4	කුළුබඩු සිල්ලර	210.00	315.00	420.00
5	අල, බී ළෑණු වෙළෙඳුන්ගෙන්	525.00	780.00	1100.00
6	මිශ්‍ර එළවළු වෙළෙඳුන්ගෙන්	210.00	315.00	420.00
7	එළවළු තොග වෙළඳුන්ගෙන්	315.00	420.00	525.00
8	පලා වෙළෙඳුන්ගෙන්	85.00	160.00	170.00
9	කරවල වෙළෙඳුන්ගෙන්	420.00	580.00	735.00
10	රෙදි වෙළෙඳුන්ගෙන්	315.00	420.00	525.00
11	විසිතුරු භාණ්ඩ වෙළෙඳුන්ගෙන්	265.00	390.00	525.00
12	මනි බඩු වෙළඳුන්ගෙන්	265.00	420.00	630.00
13	පළතුරු වෙළෙඳුන්ගෙන්	180.00	315.00	475.00
14	රසකැවිලි වෙළෙඳුන්ගෙන්	160.00	210.00	370.00
15	එක් කෙසෙල් කැණකින් (තොග මිල දී ගැනීම)	8.00(කුඩා)	9.00මධ්‍යම)	10.00(ලොකු)
16	වට්ටක්කා ගෙඩි 1කට (තොග මිල දී ගැනීම)	6.00(කුඩා)	7.00(මධ්‍යම)	10.00(ලොකු)
17	මැණික් වෙළෙඳුන්ගෙන්	265.00	525.00	790.00
18	ඉහත වර්ග නොකළ වෙනත් වෙළෙඳුන්ගෙන් ස්වභාවය මත අය කිරීම	265.00	420.00	525.00

සතිපොළ සීමා

උතුරට - බදුල්ල මොණරාගල මාර්ගයේ කරවිල හංදිය,

නැගෙනහිරට - බදුල්ල මොණරාගල මාර්ගයේ පන්සල් හංදිය,

දකුණට - බඩල්කුඹුර බුත්තල මාර්ගයේ අඹවත්ත හංදිය,

බස්නාහිරට - බදුල්ල මොණරාගල මාර්ගයේ බෝගහපැලැස්ස හංදිය.

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත ගාස්තු පැනවීම

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 14 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එස්.එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තියෙන් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බඩල්කුඹුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ *ස්ථාවර නැනහොන්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 10:1 ට වඩා අඩුවන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එකී සංවර්ධනය නොකළ ඉඩම් වශයෙන් සැලකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 1%ක වාර්ෂික බද්දක් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

12 - 466/14

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා විනෝද බදු පැනවීමේ යෝජනාව

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී යෝජනා අංක 15 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එස්.එම්. අබේසේකර,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව,
බඩල්කුඹුර.

යෝජනාව

(267 අධිකාරිය වන) විනෝද බදු, ආඥාපනතේ කාර්යය සඳහා අදාළ වන කිසියම් විනෝද කටයුත්තක් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශය තුළ සිදු කරන සෑම තැනැත්තෙකු විසින්ම එම විනෝද කටයුත්ත,

(අ) සිනමා දර්ශනයක් වන විට ඒ සඳහා ඇතුළත් කර ගන්නා තැනැත්තන්ගෙන් අය කර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට හතයි දශම පහක් (7.5%)ක ප්‍රමාණයට සමාන මුදලක්ද, සහ

(ආ) වෙනත් විනෝද කාර්යයක් වන විට ඒ සඳහා ඇතුළත් කර ගන්නා තැනැත්තන්ගෙන් අය කර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක ප්‍රමාණයට සමාන මුදලක්ද,

ඉහත කී විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියෙන් පළාත් පාලන ආයතනවලට ලැබී ඇති බලතල ප්‍රකාර විනෝද බද්ද වශයෙන් පනවා අයකර ගත යුතු බවත්, විනෝද බද්ද බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරන්නීය.

12 - 466/ 15

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.